# ඔලබොඩුව විහාර වංශය

පූජ්‍ය ඔලබොඩුවේ ධම්මික හිමි

CM 030910–2,000(2019/09)

# ඔලබොඩුව විහාර වංශය

ප්‍රථම මුද්‍රණය
2019 ඔක්තෝබර්

ISBN 978 – 624 – 95551 – 0 – 5

කවරය නිර්මාණය
**පොත්පිටියගේ ඉසුරු චතුරංග**

ඡායාරූපකරණය
**නලින්ද දර්ශන**

ආලේඛ්‍ය චිත්‍රකරණය
**ඉෂාන් උපමාල් ගුණතිලක**

පරිගණක අක්ෂරකරණය
**පූජ්‍ය කරගස්කඳුරේ සීලවිසුද්ධි හිමි**

මුද්‍රණය
**රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව**

ප්‍රකාශනය
ඔලබොඩුව රජ මහා විහාරය,
ඔලබොඩුව,
ගෝනපොල 12410
දුරකථන - 034 2254213



ශ්‍රී සර්වඥ ධාතු මාලිගාව

# පිළිගැන්වීම

මහනුවර උපෝෂිත, පුෂ්පාරාම විහාරද්වයාධිපති

අතිපූජ්‍ය තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගලාභිධාන

මහා විහාර වංශික ස්‍යාමෝපාලි මහා නිකායේ

මල්වතු මහා විහාර පාර්ශ්වයේ

ශ්‍රීමත් මහානායක මාහිමිපාණන් වහන්සේ

ප්‍රධාන සානුනායක ගරුතර කාරක මහා සංඝ සභාව වෙත

# පටුන

*පිටු අංක*

පෙරවදන xi

සම්භාවනාව xv

පළමුවන පරිච්ඡේදය 1

**රයිගම් කෝරළය**

1.1 රයිගම්පුර දේශය හා තදනන්තර පාලනය 2

1.2 රාජ්‍යත්වයේ විකාශනය හා ප්‍රභූ පවුල් 7

1.3 රයිගම්පුර සමාජය හා ආගමික පසුබිම 11

දෙවන පරිච්ඡේදය 17

**රයිගම්පුර උපුල්වන් ශ්‍රී විෂ්ණු මහා දේවාලය**

2.1 විෂ්ණු දෙවියන් හෙවත් ලක්දිව පුද ලබන උපුල්වන් දෙවියෝ 18

2.2 පොළොන්නරු යුගය හා නිශ්ශංකමල්ල රජු 24

2.3 රයිගම්පුර ඔලබොඩුවේ පිහිටි මහා දේවාලය 30

තෙවන පරිච්ඡේදය 39

**වීදියගොඩ සඟ පරපුර හා ඔලබොඩුව විහාර වංශය**

3.1 වීදියගොඩ සඟ පරපුරෙහි සමාරම්භය හා විකාශය 40

3.2 වීදියගොඩ සඟ පරපුරෙන් විකාශනය වූ ඔලබොඩුව විහාර වංශය 48

3.3 ඔලබොඩුව රජ මහා විහාරානුබද්ධ ශාඛා ආයතන 59

සිව්වන පරිච්ඡේදය 77

**ඔලබොඩුව රජ මහා විහාරය**

4.1 ඔලබොඩුව රජ මහා විහාරයෙහි සමාරම්භය 78

4.2 ඔලබොඩුව රජ මහා විහාරයේ පෞරාණික ප්‍රාසාදකරණය 84

4.3 ඔලබොඩුව රජ මහා විහාරයේ නූතන ප්‍රාසාදකරණය 103

පස්වන පරිච්ඡේදය 115

**පෙරහර මංගල්‍යය හා චාරිත්‍ර**

5.1 රයිගම්පුර ඓතිහාසික විෂ්ණු දේවාලගත පෙරහර හා පූජා චාරිත්‍ර විධි 116

5.2 ඔලබොඩුව යති පරපුරේ රූපාවලෝකනය 127

5.3 ඔලබොඩුව රජ මහා විහාරයෙහි මතක සංක්ෂිප්තය 131

# පෙරවදන

වැලිවිට අසරණ සරණ සරණංකර සංඝරාජයන් වහන්සේ විසින් සියම් දේශයෙන් නැවත උපසම්පදාව ගෙන ඒමට කටයුතු කොට ලක්දිව බුදු සසුන නැවතත් විචිත්‍රවත් කිරීම පිණිස ගන්නා ලද උත්සාහය හා කාර්ය සංසිද්ධිය ලක්දිව බෞද්ධ ඉතිහාසයේ සුවිශේෂී සන්ධිය අවස්ථාවක් වන්නේය. මේ උතුම් කාර්ය මහනුවර මල්වතු අස්ගිරි උභය විහාරයන් මූලික කරගෙන සිදුකළ ද එම ධර්ම විනය කාර්ය සංසිද්ධියේ ආලෝකය මුළු ලක්දිව පුරාම ව්‍යාප්ත විය. එහි ප්‍රතිඵලයක් ලෙස රයිගම්පුර ආශ්‍රිතව සිදු වූ බෞද්ධ පුනරුදය ද දැක්විය හැකි වන්නේය.

එහෙත් ඒ කාලය වන විට මහවනුවර මූලික වූ සෙංකඩගල රාජ්‍ය ශ්‍රී දළදා වහන්සේ මූලික කොටගත් බෞද්ධ රාජ්‍යයක් ලෙස පැවතියත් පහතරට ප්‍රදේශ බොහොමයක් පැවතියේ පෘතුග්‍රීසි, ලන්දේසි, ඉංග්‍රීසීන්ගේ පාලනය යටතේය. එබැවින් එම ප්‍රදේශවල බෞද්ධ ව්‍යාපාරයන් ඉස්මතු කිරීමට දැඩි වෙහෙසක් ගැනීමට එම ප්‍රදේශවල වාසය කළ බෞද්ධ නායක කාරකාදීන්ට සිදුවිය. එසේම පැවති පාලනයේ ආධාරය හෝ සහයෝගයන් ලබාගත හැකි මගක් කිසිදු ආකාරයකින් නොවූ අතර එම පාලනයන්ගේ උත්සාහය වූයේ මිෂනාරී ආගම් හා එම සංස්කෘතීන් එම ප්‍රදේශවල ව්‍යාප්ත කරලීමයි. එබැවින් එම ප්‍රදේශවල වැඩසිටි භික්ෂූන් වහන්සේලාට හුදකලා සටනක නිරතවීමට සිදුවිය.

එසේම රාජ්‍ය අනුග්‍රහය යටතේ ක්‍රියාත්මක වූ මිෂනාරී ආගමික ව්‍යාපාරයට මුහුණදීම පිණිස අසරණ වූ බෞද්ධ ජනයා ආරක්ෂා කරගැනීම පිණිස එම ප්‍රදේශවාසී ස්වාමීන්ද්‍රයන් වහන්සේලාට දැඩි කැපවීමක් කිරීමට සිදු වූ අතර ඒ සඳහා උන්වහන්සේලා බොහෝ දුරට උඩරට භික්ෂු සංඝයා සමඟ සම්බන්ධතා ගොඩනගාගෙන කටයුතු කරන්නට විය. ඒ අනුව අප වැලිවිට සරණංකර සංඝරාජයාණන් වහන්සේගේ බෞද්ධ ආගමික පුනරුද ව්‍යාපාරය පහතරට ප්‍රදේශවල ද ව්‍යාප්ත කිරීමට හැකිවිය.

උඩරට භික්ෂු සංඝයා වැලිවිට සරණංකර සංඝරාජයාණන් වහන්සේගේ නායකත්වයෙන් ක්‍රියාත්මක කළ බුද්ධ ශාසනික පුනරුද ව්‍යාපාරය රයිගම් කෝරළයේ ද ව්‍යාප්ත කිරීමේ වැඩපිළිවල ද ආරම්භ කළේ වැලිවිට සරණංකර සංඝරාජයන් වහන්සේගේ ශිෂ්‍යානු ශිෂ්‍ය පරපුරට අයත් වූ ගිනිගත්පිටියේ සංඝරක්ඛිත තෙරුන් වහන්සේය. උන්වහන්සේ වනාහි පළමුව සරණංකර සංඝරාජයාණන් සමඟ උපසම්පදා වූ හුලංගමුවේ තෙරුන් වහන්සේ ළඟ පැවිදි බව ලබා පසුව උපසම්පදා වී පහතරට සත් කෝරළයට වැඩමකොට කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමාගේ ද අනුග්‍රහය ඇතිව මැද්දෙපොල රජ මහා විහාරය සංවර්ධනය කොට එහි වැඩ වාසය කොට ඇත්තේය. මේ රජමහා විහාරයට රාජසිංහ රජතුමා සන්නස් පත්‍රයකින් මල්ගමුව නම් වූ නින්දගම ද පූජා කරන ලද්දේය. පසුකාලයේ රජතුමා විසින් මුන්වහන්සේට සත්කෝරළ මහ දිසාවේ ප්‍රධාන සංඝනායක ධුරය ද පිරිනමා ඇත.

මෙසේ ආරම්භ වූ පහතරට ධර්ම ශාස්ත්‍රීය ව්‍යාපාරය නොයෙකුත් බාධක ඔස්සේ පවත්වාගෙන යාමට පහතරට යතිවර මහා සංඝයා කටයුතු කරන ලද්දේය. එහි ප්‍රතිඵලයක් වශයෙන් සත් කෝරළයට අයත් පහතරට ප්‍රදේශවල බෞද්ධ විහාරාරාම රාශියක් ගොඩනැගුණු අතර ජරාවාස වී පැවති පුරාණ වෙහෙර විහාර රාශියක් ද නැවත ප්‍රතිසංස්කරණය කරන ලද්දේය. එහි ප්‍රතිඵලයක් ලෙස පොළොන්නරුවේ නිශ්ශංකමල්ල යුගයේ සිටම පැවති විෂ්ණු දේවාලය සහිත බෞද්ධ පුදබිමක් වූ ඔලබොඩුව රාජ මහා විහාරය සහිත විෂ්ණු දේවාලය ද ප්‍රතිසංස්කරණය විය.

මුල් කාලයේ දේවාලයට අනුබද්ධ ආවාසයක් ලෙස පැවැති මෙම විහාරය ස්ථිර වශයෙන්ම භික්ෂු සංඝයා වැඩවාසය කරන බෞද්ධ විහාරයක් බවට පත්විය. ඒ සඳහා මූලික වූයේ වීදියගොඩ මහා විහාර සඟ පරපුරට අයත් වූ බෙම්තර සුදස්සන තෙරුන් වහන්සේය. මුන්වහන්සේ වනාහි ඔලබොඩුව විෂ්ණු දේවාලය සහිත රජ මහා විහාරයේ ප්‍රථම අධිපති තෙරුන් වහන්සේ වශයෙන් ද පිළිගනු ලබන්නේය. මුන්වහන්සේ අයත් වූ වීදියගොඩ සඟ පරපුර වනාහි ගිනිගත්පිටියේ සංඝරක්ඛිත මහ තෙරුන්ට සම්බන්ධ වූවකි. එනම් සංඝරාජ තෙරුන්ගේ පරපුරට සම්බන්ධ වූවකි. මේ අනුව වීදියගොඩ හා එහි ශාඛාවක් ලෙස විකාශනය වූ ඔලබොඩුව රජ මහා විහාරය මහා විහාර වංශික සියම් මහා නිකායේ පහතරට පිහිටි ඉතා වැදගත් විහාර භූමියක් වන්නේය. එහි තදානුගත සඟ පරපුර ද සීලයෙන් ගුණයෙන් හා නුවණින් සුපුෂ්පිත වූ පූජනීය පිරිසකි.

මෙවැනි සංවිධානයක් පිළිබඳ නිවැරදි වූ තොරතුරු රැස්කොට ග්‍රන්ථයක් කිරීම වනාහි අප වැන්නෙකුට මහත් වූ අභියෝගයෙකි. එහෙත් එවැන්නක් යම් තරමින් හෝ සිදුකිරීමට මා හට හැකිවිය. එය මාගේ හපන් කමක් නොවේ. එය වනාහි වීදියගොඩ හා ඔලබොඩුව සඟ පරපුරේ මහ තෙරුන් වහන්සේලාත් සහෝදර සංඝයාත් ශිෂ්‍ය තෙරුන් වහන්සේලාත් එම ගොදුරුගම් ආශ්‍රිතව වාසය කරන ජනී ජනයාත් කුළුණු සිතින් ලබාදුන් අනුශාසනා හා මාර්ගෝපදේශකත්වය නිසාය. තව ද විශේෂයෙන් මෙම කටයුත්තට මාගේ ගුරුදේවයන් වූ වර්තමාන විහාරාධිපති බෝධිසත්ව ගුණෝපේත උඩුවේ හේමාලෝක මාහිමිපාණන් වහන්සේ මා වෙත දැක් වූ සහයෝගය හා ආශිර්වාදය මා හට මහත් අභිමානයක් විය. එසේම මෙම කෘතිය ශෝභමාන ලෙස අක්ෂර ගැළපීම හා ඡායාරූප කටයුතු මහත් වෙහෙසක් දරා සිදුකළ අපගේ ශිෂ්‍ය අප විහාරවාසී කරගස්කඳුරේ සීලවිසුද්ධි ආයුෂ්මතුන් ඇතුළු විහාරවාසී භික්ෂූන් වහන්සේලාද කරුණාවෙන් සිහිපත් කරමි.

මෙම කෘතිය මුද්‍රණය කිරීම පිණිස කටයුතු කළ අප විහාරස්ථ දායක සභාවටත්, ශ්‍රී සුධර්මා කුළඟන සමිතියටත්, නවම් මහ පෙරහර භාරකර මණ්ඩලයටත්, ශ්‍රී සුමංගල දහම් පාසලේ ගුරු භවතුන්ට හා සිසු දරුවන්ට මාගේ පුණ්‍යානුමෝදනාව හිමි වේ. එසේම මෙම කෘතිය වෙනුවෙන් පසුවදනක් ලියාදෙන ලෙස අප කිසිදු වත්පිළිවෙතකින් තොරව දුරකථනයෙන් කළ ඉල්ලීම එකෙනෙහිම භාරගෙන

ඉටුකර දුන් පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ඉතිහාස අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය හොරණ රාජමහා විහාරාධිපති ආචාර්ය මදුරාවල සෝභිත ස්වාමීන්ද්‍රයන් වහන්සේ වනාහි අපගේ පෙරපින් මහිමයට ලද යතිවරයෙකු වන්නේය. තවද මේ කෘතිය එළිදැක්වීම පිණිස සුදුසු ආකාරයෙන් සකස්කොට දීම පිළිබඳව අපගේ මාතලේ රත්න බණ්ඩාරයන් ද සිහිපත් නොකළහොත් අප අපගේ මිත්‍ර පැවැත්මට කැළලකි. එබැවින් එතුමාට හා පවුලේ සියලු දෙනාටද මාගේ ආශිර්වාදය හිමිවන්නේය. තවද කිසිදු අපේක්ෂාවකින් තොරව මා හදාවඩා සසුනට දුන් මාගේ දෙමාපියන්ටත් දැනුම් තේරුම් ඇත්තෙකු දක්වා මා පෝෂණය කළ මාගේ සියලු දායක කාරකාදීන්ද පිං දීමෙන් මතක් කරමු.

**ඔලබොඩුවේ ධම්මික හිමි**
විහාරාධිකාරී - ශ්‍රී ජයවර්ධනාරාම රාජ මහා විහාරය,
විහාරාධිපති - ලංකාරාමය, මිලානෝ, ඉතාලිය.

ශ්‍රී බු. ව. 2563 වප් මස.

# සම්භාවනාව

ඔලබොඩුව ගම හා විහාරස්ථානය ඈත අතීතයට විහිදී ගිය පැරණි ගමකි. ඒ පිළිබඳව තොරතුරු පැරණි අය විසින් වරින් වර ප්‍රකාශ කර ඇත. විශේෂයෙන් ඔලබොඩුව ශ්‍රී ජයවර්ධනාරාම රාජ මහා විහාරාධිපතිව වැඩ විසූ, අවුරුදු 104 ක් තරම් වූ කාලයක් නීරෝගීව, හොඳ මතක ශක්තියක් ඇතිව, ගම ගැන රට ගැන නොයෙක් තොරතුරු නිතර ප්‍රකාශ කරන ලද මහ තෙර නමකි ගරු පූජ්‍ය ඔලබොඩුවේ ධම්මානන්ද ලොකු හාමුදුරුවන් වහන්සේ. උන් වහන්සේ දිනක් පැවසූයේ එක්තරා රජ කෙනෙකු හෝ ප්‍රදේශාධිපතියකු දුන් සන්නසක් විහාරස්ථානයේ තිබුණු බවත් පසුව එය අතුරුදන්ව ඇති බවත්ය.

මෙසේ සිංහල රාජ වංශයෙන් ආශිර්වාදය ලත් ඔලබොඩුව ගම හා විහාරස්ථානය පිළිබඳ මුඛ පරම්පරාගත තොරතුරුත්, ලිඛිත සාධකත්, උපයෝගී කර ගනිමින් ගමේ පෞරාණිකත්‍වය පිළිබඳව මහත් වෙහෙසක් දරා, එක් රැස් කොට පොතක් වශයෙන් එළි දක්වා, අනාගත පරපුරට ඉතිරි කර තැබීමට අපේ ඔලබොඩුවේ ධම්මික හිමියන් ගත් උත්සාහය කාගෙත් පැසසුමට ලක් විය යුතුය. ශාස්ත්‍රීය නිබන්ධනයක් සේ ගම, විහාරස්ථානය, වීදියගොඩ සඟ පරපුර, ඔලබොඩුව සඟ පරපුර, හා වර්තමාන ඔලබොඩුව විහාරස්ථානයේ වත ගොත, ආදි තොරතුරු එක්රැස් කොට තැබීම යුග මෙහෙවරක් සේ දැක්වීම යුක්ති සහගතය. නුවර යුගයට නෑකම් කියන විහාරයේ චිත්‍ර අතරින් සූවිසි විවරණ සිතුවම්වල කවි කීපයක් මැකී ඇත. ඉතිරි කවි ටික ලියා ප්‍රවේශම් කළ තැනක් ද නැත. ධම්මික හිමියන් ඒ කවිපෙළ මේ පොතෙහි ඇතුලත් කිරීම සුරක්ෂිතවීමකි.

වර්තමාන ලංකාවේ භික්ෂු සමාජයේ ආරම්භය වැලිවිට අසරණ සරණ සරණංකර සංඝරාජ මාහිමිපාණන් වහන්සේගෙනි. උන්වහන්සේගේ ශිෂ්‍ය හාමුදුරුවන් වහන්සේ නමකගෙන් ඇරඹුණු වීදියගොඩ සඟ පරපුර හා එයින් බිහිවුණු ඔලබොඩුව විහාර පරපුර, ශිෂ්‍යානු ශිෂ්‍ය පරපුර, ගැන කදිම විවරණයක් කිරීම මතු පරපුරට මහත් මෙහෙයක් වනවා ඇත. එවැනි තොරතුරු විශ්වසනීයත්වය රැකෙන සේ ලියා තැබීම කාලෝචිතය.

බුදු පෙරහර, දේවාල පෙරහර, පැවැත්වීම අපේ බෞද්ධ සංස්කෘතික අංගයකි. දළදා මාලිගාවේ, රුහුණ කතරගම දේවාලයේ, චාරිත්‍රානුකූලව පෙරහර පැවැත්වීම වසර සිය ගණනක් පැරණි සිරිතකි. අප මහ බෝසතාණෝ දෙව් ලොවින් මනුලොවට එන්නේ දෙවියන්ගේ ආරාධනය අනුවය. මහාමායා දේවියගේ කුසින් බිහිවන විට බොසතුන්ව දෙවියන්ගේ දෝතට ගත් බව ද සඳහන්වේ. අභිනිෂ්ක්‍රමණය කර වනයට වැඩම කළ පසු බෝසතුන්ට සිවුරු දුන්නේද දෙවියෝයි. බුදුවන අවස්ථාවේ දෙවියන් බොසතාණන් වහන්සේට ආරක්ෂාව සැලසූ බව ද සඳහන්වේ. බුද්ධත්‍වයෙන් පසු දම් දෙසුමට මැලි බවක් දක්වන විට දෙවියන්ගේ ආරාධනයෙන් දහම් දෙසූහ. බුදු කිස සපිරීමේදී බුදුරජාණන්

වහන්සේට සහයෝගය දක් වූ දෙවියන්ට පෙරහරක් පවත්වා උපහාර දක්වීම කවර වරදද? ඔලබොඩුව පෙරහර චාරිත්‍රය බොහෝ ඈත කාලයකට විහිදී ගිය අයුරු දක්වීම ද ප්‍රශස්තය.

මනා කළමනාකරණ කුශලතාවක් ඇති අපේ ඔලබොඩුවේ ධම්මික හාමුදුරුවන් වහන්සේට ලේඛන කුශලතාව ද මැනවින් ඇත. ඒ අනුව තව තවත් මෙවන් කෘති බිහිකරමින් ලෝකයට ශාසනයට මහත් සේවයක් කිරීමට තුණුරුවන්ගේ පිහිටෙන් ශක්තිය ධෛර්යය ලැබේවායි අපි ද ආශීර්වාද කරම්හ.

**උඩුවේ හේමාලෝක මහා ස්ථවිර,**
ඔලබොඩුව රජ මහා විහාරාධිපති,
තලගල විපස්සනා භාවනා මධ්‍යස්ථානාධිපති.



චෛත්‍ය රාජයාණන් වහන්සේ



අභිනව බෝධි ප්‍රාකාරය

# පළමුවන පරිච්ඡේදය

## රයිගම් කෝරළය

**1 - 1 රයිගම්පුර දේශය හා තදනන්තර පාලනය**

**1 - 2 රාජ්‍යත්වයේ විකාශනය හා ප්‍රභූ පවුල්**

**1 - 3 රයිගම්පුර සමාජය හා ආගමික පසුබිම**

# 1-1
## රයිගම් දේශය හා තදනන්තර පාලනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ කළු ගඟට මායිම්ව එයින් උතුරු කොන රයිගම් කෝරළය පිහිටා ඇත. රයිගම් කෝරළයට මායිම්ව පවතින කෝරළ වන්නේ සල්පිටි කෝරළය, කුරුවිට කෝරළය, හේවාගම් කෝරළය, පස්දුන් කෝරළය, කුකුල් කෝරළය යන කෝරළයන්ය. එසේම රයිගම් කෝරළයට උතුරු දිසාවෙන් හේවාගම් කෝරළයත්, නැගෙනහිර දිසාවෙන් සබරගමුව පළාතත්, දකුණු දිසාවෙන් කළු ගඟත්, බස්නාහිර දිසාවෙන් පානදුර මුහුදු වෙරළ තීරයත් මායිම්ව පිහිටා ඇත.

රිවිගම, රෛගම, රයිගම බවට හඳුන්වන ලද මේ ප්‍රදේශය රෛ යන අදහසින් පුරාණ ජනයා හඳුන්වා ඇත්තේ මේ ප්‍රදේශයේ වාසය කළ ජනතාව සූර්ය වන්දනාවේ යෙදුණු පිරිසක් නිසා බවයි. එසේ වුවත් බුදුන් වහන්සේ මෙරටට වැඩමවීමට පෙර සිටම කෘෂි කර්මාන්තය හා වෙළඳාම ප්‍රධාන ජීවනෝපායක් කරගෙන සිටි අතර ඔවුන් සූර්ය වන්දනාවට මුල් තැනක් දී ඇත. එබැවින් මේ ප්‍රදේශය රයිගම යන ව්‍යවහාරය ලැබී ඇත. තවද රයිගමට නැගෙනහිර දිසාවෙන් සමනල කන්ද පිහිටා ඇති අතර ශ්‍රී පාදය පිහිටුවීමට පෙර මිනිසුන් සූර්ය වන්දනාව පිණිස මධ්‍යස්ථානයක් වශයෙන් ශ්‍රී පාද කන්ද යොදාගෙන ඇති බවට ජනප්‍රවාදයන් ද පවතී.

රාජග්ගාම, රෛග්‍රාම යන නම්වලින් ද ඓතිහාසික ග්‍රන්ථවල සඳහන් වන රයිගම පැරණි බෙදීම් වලට අනුව මායා රටට අයත්ය. රයිගම්පුර, රයිගම්නුවර යන නම්වලින් ද මෙම ප්‍රදේශය හඳුන්වා ඇත. එසේම එළු අත්තනගලුවංශය රයිගම හඳුන්වන්නේ රාජග්‍රාම ලෙසය. රයිගම් කෝරළය රාජධානියක් ලෙස වර්ධනය වීමට ප්‍රථම පුරාණ හෙලයන්ගේ ගනතන්ත්‍ර මණ්ඩලයක් මගින් පාලන කටයුතු සිදු වූ බව පෙනේ. මේ මණ්ඩලය හඳුන්වන ලද්දේ හිරණ්‍ය මණ්ඩලය නමිනි. මෙහි ප්‍රධාන ග්‍රාමය රයිගම හෙවත් රයිගම්පුරය බව ආචාර්ය හොරණ වජිරඤාණ හිමියන් ද පෙන්වා දී ඇත.[1] එසේම මහාවංශයේද අවස්ථා කිහිපයකදීම හිරඤ්ඤ මණ්ඩලය ගැන සඳහන් කරයි. ලෝකේශ්වර නම් ප්‍රභුවරයාට විරුද්ධව කීර්ති ශ්‍රී විජයබාහු කුමාරයා හා දේවමල්ල හා බුද්ධරාජ යන අමාත්‍යවරුන් සමග කළ සටනේදී රජු හිරඤ්ඤ දේශය අල්ලාගත් බව මහාවංශයේ සඳහන් වේ.[2]

එසේම රයිගම්පුරයේ අගනගරය ලෙසද හිරඤ්ඤ දේශය හෙවත් හොරණ හැඳින්විය හැක. මෙම ස්ථානය හොරණ හෙවත් හිරඤ්ඤය වූයේ හොරු කණ්ඩායමක් මේ ප්‍රදේශයේ සැඟවී සිටි නිසා යැයි අදහසක් ද ඇත. එසේම

1. රයිගම්පුර විත්ති - ආචාර්ය හොරණ වජිරඤාණ හිමි
2. මහා වංශය - 55 පරිච්ඡේදය 62 ගාථාව

වළගම්බා රජුගේ පුත්‍ර චෝර නාගයන් වාසය කළ නිසා හොරණ විය යැයි අදහසක් ද පවතී. සමහරවිට රෝහණ යන ශබ්දයේ අක්ෂර පෙරළීමක් සිදුවීමෙන් හොරණ යන පදය සකස් වී ඇතැයි යන්න අපගේ අදහසයි.

හොරණ ප්‍රදේශ ගතවූ රයිගම්පුරය තුළ ජනාවාසකරණය සිදුවන්නේ බුද්ධ කාලයටත් පෙරය යන අදහස බොහෝ විද්වතුන් අනුමත කරයි. මේ ප්‍රදේශය සමනල කඳුගිරි ප්‍රදේශයේ අධිපතිවරයෙකු ලෙස කටයුතු කළ සුමන නම් ප්‍රදේශාධිපතියාගේ කාලයේ යම් ජනප්‍රධානියෙකු යටතේ පාලනය වූ බෞද්ධ මුහුණුවරක් ගන්නා ලද ප්‍රදේශයක් වශයෙන් ද සැලකිය හැකිය. කෙසේ වෙතත් රයිගම් ජනපදයේ හෙවත් කළුගං මිටියාවතේ ඉතිහාසය පිළිබඳව අපට ලිඛිත මූලාශ්‍ර ලැබෙන්නේ පොළොන්නරුව යුගය තුළදීය. එකල පොළොන්නරු රාජ්‍ය තුළ පැවති දේශපාලනික වියවුල් සහගත තත්ත්වය සමනය කිරීම පිණිස රජදරුවන් හා දේශීය නායකයින් තම සියලු කටයුතු සූදානම් කරන ලද්දේ මේ ප්‍රදේශගතව කඳවුරු බැඳගෙනය.

කෙසේ වෙතත් ක්‍රි.ව. 1017 දී පමණ පළමුවන වීර රාජේන්ද්‍රයන්ගේ හමුදාව අනුරාධපුරයට පහර දී එවකට අනුරාධපුර පාලකයා වූ පස්වන මිහිඳු රජතුමා සිරකරුවෙකු ලෙස ඉන්දියාවට රැගෙන යාමත් සමඟ රජරට සියලු ජනයා හා ජන ප්‍රධානීන් දකුණ හා නිරිතදිග ලෙස සලකන දඹදෙණිය, යාපහුව, කුරුණෑගල, ගම්පොල, කෝට්ටේ, රයිගම ආදී ප්‍රදේශ වලට පලා ඇවිත් වාසස්ථාන පිහිටුවා ගත්තේය. ඉන් අනතුරුව මේ පාලකයන්ගේ සියලුම කාර්යය සංසිද්ධීන් ක්‍රියාත්මක වූයේ නිරිතදිග ප්‍රදේශ ගතවය.

විශේෂයෙන්ම චෝළයන්ගෙන් රජරට නිදහස් කරගැනීමේ දැවැන්ත සටන් ව්‍යාපාරය මෙහෙයවූ පළමුවන කීර්ති ශ්‍රී විජයබාහු රජතුමා දකුණු ප්‍රදේශයේ හම්බන්තොට ආශ්‍රිත ප්‍රදේශයක තම සේනාව සංවිධානය කොට මාර්ග දෙකකින් රජරට දේශයට හමුදාව මෙහෙයවීය. මේ එක් සේනාවක කාර්ය භාරය වූයේ බස්නාහිර වෙරළදිගේ ගමන් කොට මහාතිත්ථ වරායට පහරදී ඉන්දියාවෙන් පැමිණෙන ආධාර සේනාංක වලට බාධා කිරීමයි.

එසේම රජුගේ දෙවන සේනාව ගමන් කරන ලද්දේ රයිගම්පුරය හරහාය. කෙසේ වෙතත් විජයබාහු රජු රට එක්සේසත් කළද රජුගේ අභාවයෙන් පසු නැවතත් රට අස්ථාවර විය. දේශීය රාජ කුමාරවරුන් රජකම පිණිස අරගල ඇතිකර ගත්තේය. එකල පරාක්‍රම කුමාරයා රජ රටට විරුද්ධව තම හමුදාව මෙහෙයවීමේදී අකුරැස්ස මොරවක් කෝරළය කළුතොට, රයිගම ආදී ප්‍රදේශ හරහා තම හමුදා සේනාංක මෙහෙයවා ඇත. තවද රජු සුගලා දේවිය හා කළ සටනේදී රයිගම්පුර වැසියන් පරාක්‍රම රජුට සහයෝගය දුන් බව තත්කාලීන මූලාශ වලින් හෙලි වේ. කෙසේ වෙතත් නැවත වතාවක් පොළොන්නරුව එක්සේසත් කිරීම නිසා රටට සාමය උදාවිය. පසුකාලීනව නැවතත් සිදුවූ කාලිංග මාඝයන්ගේ පහරදීමත් සමඟම නැවතත් රජරට දේශපාලන කාර්යය සංසිද්ධිය

බිඳ වැටිණි. සුපුරුදු පරිදි ජන ප්‍රධානීන් හා ජනයා රයිගම ඇතුළු නිරිතදිග ප්‍රදේශයට පලා ආවේය.

එසේ පලා ආ පිරිස් අතර සිටි විජයබාහු නම් කුමාරයා දඹදෙණිය නම් ප්‍රදේශයේ පාලන මධ්‍යස්ථානයක් පිහිටුවාගෙන නැවතත් රජරට නිදහස් කරගැනීමට අවශ්‍ය කටයුතු සූදානම් කළේය. කෙසේ වෙතත් විජයබාහුගේ පුත්‍රයා වූ දෙවන පරාක්‍රමබාහු කුමාරයා මාඝ පාලනයෙන් රජ රට නිදහස් කරගත් අතර එතුමා දඹදෙණිය අගනුවර කරගනිමින් දෙවන පණ්ඩිත පරාක්‍රමබාහු නමින් රජ විය. මෙසේ රටේ පාලන මධ්‍යස්ථානය රට මැදට පැමිණීම උතුරු ප්‍රදේශගතව පිහිටා තිබුණු වරායන් පරසතුරු ආක්‍රමණ නිසා අභාවයට යෑමත් යන කරුණු නිසා දඹදෙණි පාලකයක්ට විදේශීය සම්බන්ධතා හා වෙළඳ කටයුතු සිදුකිරීමට නව වරායක අවශ්‍යතාවන්ද පැන නැගිණි. මෙහිදී රජුගේ අවධානය යොමුවූයේ බටහිර මුහුදු තීරයටයි. එහි ප්‍රතිඵලය වූයේ කොලොංතොට හා කළුතොට යන තොටු පොලවල් දෙක වරායන් ලෙස සංවර්ධනය වීමය.

කළුතොට වනාහි වර්තමාන කළුතර ආශ්‍රිත ප්‍රදේශය බව පැහැදිලිය. මේ ප්‍රදේශගතව රයිගම් දේශය ද ස්ථාන ගතවිය. මෙසේ රයිගම් දේශය මුල්කාලයේ විකාශනය වූයේ දේශපාලන මධ්‍යස්ථානයක් වශයෙන් නොව ආර්ථික හා වෙළඳ මධ්‍යස්ථානයක් වශයෙනි. දඹදෙණි යාපහු හා කුරුණෑගල පාලකයන් මෙම ප්‍රදේශයේ පාලන කටයුතු සඳහා විශේෂ නිළධාරියෙකු පත්කළ අතර මේ නිළධාරියාට පැවරුණු ප්‍රධාන වගකීම වී ඇත්තේ රජය විසින් පනවන ලද බදු එකතු කිරීම හා වෙළඳාමට අවශ්‍ය ආරක්ෂාව හා යටිතල පහසුකම් සකස් කිරීමයි. එසේම බොහෝදුරට සමනල කන්දේ බටහිර බෑවුම වර්තමාන රත්නපුර දේශයෙන් හමුවූ මැණික් මිළදී ගැනීම පිණිස කළුතොට වරායට ජාත්‍යන්තර වෙළඳුන් පැමිණෙන්නට ඇත්තේය යන ප්‍රකාශය විශ්වාසනීයය. එසේම එකල මග්ගොන බද්ද නමින් හඳුන්වන බද්දක් ගැන ද පැපිලියාන සන්නසේ දැක්වේ.

අපට ප්‍රථමවරට රයිගම්පුරයේ ස්වාධීන පාලකයෙකු සිටි බවට තොරතුරු ලැබෙන්නේ ගම්පොළ රාජධානි සමය තුළදීය. අලකේශ්වර යුද්ධය නම් කෘතියේ සඳහන් වෙන්නේ වීර අලකේශ්වර රයිගම රජකම් කළ අතර බුවනෙකබාහු ගම්පොල රජකම් කළේය. එසේම ආර්ය චක්‍රවර්ති නම් රජෙකු විසින් යාපන අර්ධද්වීපය පාලනය කළ බවට තොරතුරු ඇත. මෙසේ අලකේශ්වර හා ආර්යචක්‍රවර්ති ගම්පොල රජුගේ සාමාන්තවරුන්ද නැතිනම් ස්වාධීන පාලකයන් ද යන්න පැහැදිලි නොවන අතර මොවුන් එකිනෙකාට විරුද්ධ කටයුතු කළ බව අලකේශ්වර යුද්ධය ද සඳහන් කරන බැවින් මොවුන් ස්වාධීන මට්ටමේ පාලකයන් ලෙස කටයුතු කළ බව පෙනේ.

මොවුන්ගේ මෙම ස්වාධීනත්වය වැඩිකාලයක් පැවති බවට සාධක නැත. ගම්පොල කෝට්ටේ රජවරුන් ඔවුන්ගේ බලය බිඳදමා සාමාන්තවරුන් ලෙස කටයුතු කිරීමට සලස්වා ඇත. එහෙත් මොවුන් නිළ නොලත් රජවරුන් ලෙස සියලු සැප සම්පත් හා බලතල භුක්ති වින්දේය.

ගම්පොළ හා රයිගම ප්‍රදේශයන්හි එකිනෙකාට විරුද්ධ රජවරුන් දෙදෙනෙකු පාලනය කරන කාලයේ සිදු වූ විදේශ ආක්‍රමණයක් ගැන ද තොරතුරු ඇත. එහෙත් මේ ආක්‍රමණය සුපුරුදු ඉන්දියාවෙන් සිදු වූ දෙයක් නොවේ. චීනයෙන් සිදු වූ ආක්‍රමණයකි. එය එක් අවස්ථාවක මිත්‍රශීලි දූත ගමනක් වූ අතර තවත් අවස්ථාවක ආක්‍රමණයක් විය. ක්‍රි.ව.1432-33 කාලයේ ආසියාවේ බලය ගොඩනගාගෙන සිටි චීනයේ යුංලෝ අධිරාජ්‍යයා තම බලවත් නාවික හමුදා කණ්ඩායමක් සමග චෙංහෝ සෙන්පතියාගේ නායකත්වයෙන් ආසියාවේ විවිධ රටවලට යවා ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස යුංලෝ ලක්දිවට ද පැමිණි අතර එසේ පැමිණියේ රයිගම්පුර ආශ්‍රිත වරායකිනි.[1]

ඔහු රජුගේ තෑගි බෝගත් බෞද්ධ ආරාමවලට පූජා බඩුත් රැගෙන පැමිණියේ මිත්‍රශීලී ගමනකි. එහෙත් එවකට සිටි රයිගම පාලකයා චෙංහෝ සලකා ඇත්තේ සතුරෙකු ලෙසයි. මෙයින් කෝපයටපත් චෙංහෝ සියලු තෑගිබෝග හා පූජා භාණ්ඩ රැගෙන දෙවිනුවර උපුල්වන් දේවාලය වෙත ගොස් ඒ සියල්ල දේවාලයට පවරා ශිලා ලිපියක් ද පිහිටුවා චීනයට ගියේය. සමහරවිට එවකට රයිගම ස්වාධීන පාලකයෙක් සිටින්නට ඇත. ඔහු අලකේශ්වර පරපුරේ අයෙකු බවනම් නිසැකය.

මෙසේ මිත්‍රගමනක පැමිණි අයෙක් සතුරෙකු ලෙස සැලකීමට අලකේශවරයන් කටයුතු කර ඇත්තේ සමහරවිට මේ වන විට රයිගම් පාලනයේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වූ මැණික් ආදී භූගත සම්පත් වෙළඳාම තමන් අතට ගැනීම මාන බැලීමට පිණිස චෙංහෝ පැමිණියා විය හැකි බැවිනි. ටික කලක් ගතවිය. නැවතත් චෙංහෝ බලවත් නාවික හමුදා කණ්ඩායමක් සමග ලංකාව ආක්‍රමණය කළ අතර එහිදී අලකේශ්වරයන් සිරකරුවෙකු ලෙස චීනයට රැගෙන ගිය බවට පුවතක් සමකාලීන මූලාශ්‍රවල සඳහන් වේ.[2]

රයිගම ජනපදය ප්‍රබල රාජ්‍යයක් ලෙස විකාශනය වීමට විජයබා කොල්ලය ද බලපෑවේය. එවකට කෝට්ටේ පාලකයා වූ හයවන විජයබාහු රජුට විරුද්ධව ඔහුගේ පුත්‍රයන් තිදෙනා විසින් කැරැල්ලක් ඇතිකොට පියරජු මරා රාජ්‍ය පැහැරගෙන රාජ්‍ය කොටස් තුනකට බෙදාගෙන පාලනය කළේය. ඒ අනුව වැඩිමහලු පුත්‍රයා වූ හත්වන බුවනෙකබාහු කෝට්ටේ රජ වූ අතර දෙවැන්නා වූ බණ්ඩාරයන් රයිගම රජවිය. බාලයා වූ මායාදුන්නේ සීතාවක පාලකයා විය.මෙසේ සහෝදරයන් අතර ඇති වූ සමගි සන්ධානය වැඩිකලක් පැවතියේ නැත. රයිගම් පාලක බණ්ඩාරයන්ගේ හදිසි මියයෑම නිසා හිස් වූ රයිගම කෝට්ටේ රජුගේ අනුදැනුමකින් තොරව මායාදුන්නේ විසින් පවරා ගනු ලැබීය. මෙයින් සිදුවූයේ රයිගම රාජ්‍ය ලංකා ඉතිහාසයෙන් සදාකාලයටම මැකී යාමයි. මින්පසුව රයිගම නමින් වූ සාමාන්ත පාලනයක් ගැන හෝ පාලන මධ්‍යස්ථානයක් ගැන අසන්නට නොලැබේ.

1. ලංකා ඉතිහාසය - II - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව 57 පිටුව
2. ලංකා ඉතිහාසය - ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලය

මෙසේ වූ රයිගම් කෝරළය වර්තමානය වනවිට පත්තු හයක් යටතේ බෙදා වෙන්වී ඇත. එම පත්තු හය මෙසේය.

01. උඩුගහ පත්තුව
ඉංගිරිය හා එකී ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය

02. කුඹුක පත්තුව
කුඹුක ප්‍රදේශය සිට බැල්ලපිටිය දක්වාත්, ගුරුගොඩ සිට හේනගම පලන්නොරුව ඔලබොඩුව, තලගල දක්වා ප්‍රදේශය

03. අධිකාරි පත්තුව
බණ්ඩාරගම හා එකී ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය

04. තල්පිටියබද්ද පත්තුව
තල්පිටියේ සිට බොල්ගොඩ හන්දියෙන් බටහිර හිරණ දක්වා ප්‍රදේශය

05. තොටමුණ පත්තුව
පානදුර නගර සභා බල ප්‍රදේශය ඇතුළත් කලාපය

06. මුන්වත්තබාගේ පත්තුව
වාද්දූව සිට මොරොන්තුඩුව දක්වාත් වර්තමාන මිල්ලනිය හා මදුරාවල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය

රයිගම කෝරළය අතීතයේ පත්තු යටතේ වෙන්කර ඇති බෙදීම් අනුව එකී බල ප්‍රදේශය නියෝජනය වන ආකාරයෙන් පෙන්වන්නේ මනා සංවිධානයක් යටතේ සංවර්ධනය වී පැවති ප්‍රදේශයක් ලෙසිනි.[1]

ඒ ඒ කලාප වලට පැවරී තිබුණු යම් සුවිශේෂී කාර්යයන් පැවති බවට ද සාධක හමුවේ. අධිකාරී පත්තුව පාලනය හා ආගමික කේන්ද්‍රස්ථානය විය. කුඹුක පත්තුව අධ්‍යාපන හා ආගමික ආයතනයන්ගේ මූලස්ථාන ක්‍රියාත්මක වූ පත්තුවයි. තොටමුණ පත්තුව විදේශ වෙළඳාමේ කේන්ද්‍රස්ථානය විය. තල්පිටි බද්ද පත්තුව ධාන්‍ය නිෂ්පාදනාගාරයකි. මුන්වත්තබාගේ පත්තුව ගොවිකමට මෙන්ම වෙදකමට සුප්‍රසිද්ධ බල ප්‍රදේශයකි.

රයිගම් කෝරළය වර්තමාන පරිපාලන බෙදීම් අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල හයක් යටතේ වෙන්කර ඇත. හොරණ, ඉංගිරිය, මිල්ලනිය, මදුරාවල, බණ්ඩාරගම, පානදුර,[2] එම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයි.

1. අසිරිමත් රයිගම - ජානක තරංග ආරියරත්න
2. සැඟවුණු රයිගම් කෝරළය - කේ.දර්ශන ප්‍රියන්ත පීරිස්

# 1 - 2
# රාජ්‍යත්වයේ විකාශනය හා ප්‍රභූ පවුල්

රයිගම්පුර රාජ්‍ය වනාහි රජුන් තැනූ භූමියෙකි. එසේ නැතිනම් රජුන් රකින ලද භූමියකි. ලක්දිව කෘෂි ආර්ථික රටාව ආනයන අපනයන ආර්ථිකයක් වෙත ගෙනයාමේ ප්‍රධාන කාර්යය භාරය ඉටුකළ ප්‍රදේශයකි. මෙසේ වූ රයිගම රාජ්‍යයේ පාලකයන් හා නිළධාරීන් එකම පරපුරක් නියෝජනය කිරීමද විශේෂත්වයකි. එම පරපුර වූයේ අලගක්කෝනාර පරපුරයි. මේ පරපුර රයිගමට පමණක් නොව ගම්පොල රාජ්‍යයේ පාලන කටයුතුවලට පවා බලපෑම් කළ හැකි මට්ටමක සිටි වාණිජ ප්‍රභූ පවුලකි.

ගම්පොල රාජ්‍යය තුළ පැවති සුවිශේෂී පාලන ලක්ෂණ දෙකකි. එනම් මාමාගෙන් බෑණාට රජකම හිමිවීමේ සම්ප්‍රදාය හා රාජ සභාවේ සියලු බලතල ප්‍රභූ පවුල් දෙකක් අතර දෝලනය වීමයි. මින් එක් ප්‍රභූ පවුලක් වන්නේ රයිගම අලගක්කෝනාර හෙවත් අලකේශ්වර පරපුරයි. අනෙක් පරපුර වන්නේ සේනාධිලංකාර පරපුරයි. සේනාධිලංකාරවරුන් බොහෝ දුරට කුරුණෑගල සම්භවයක් ඇති පිරිසක් බව අනුමාන කළ හැක.

ප්‍රකට සංචාරකයෙකු වූ ඉබන් බතුතා ක්‍රි.ව.1334 දී පමණ සංචාරකයෙකු ලෙසින් ලක්දිවට පැමිණ උතුරේ පාලකයා මුනගැසී ඔහු ශ්‍රී පාදය වන්දනා කිරීම පිණිස පැමිණ ඇත. මෙසේ පැමිණෙන විට බතුතාට කෝනකර් නමින් නගරයක් හමු වූ අතර එම නගරයේ අධිපති ලෙස කටයුතු කළ අල්කෝනාර් නැමති ප්‍රභූවරයාද මුනගැසුණු බව ඔහුගේ සංචාරක වාර්තාවේ සඳහන් කරති. මෙසේ බතුතා කෝනකර් ලෙස සඳහන් කරන්නේ රයිගමයි. අල්කෝනාර් යනුවෙන් සඳහන් කරන්නේ අලකේශ්වරයන්ය. මේ ප්‍රභූවරයා ඉතා බලවත් අයෙකු ලෙස කටයුතු කළ බව ද මේ සංචාරය අතරතුරම කෝනර් නගරයේ ඇති වූ ගැටුමකින් අල්කෝනාර්ගේ ඇස්පවා අන්ධ කොට ඔහු බලයෙන් පහකොට ඔහුගේ පුත්‍රයා රාජ්‍ය පැහැරගත් බව බතුතා සඳහන් කරයි. මේ ප්‍රකාශය සත්‍යක් නම් මාමාගෙන් බෑනාට රජකම හිමිවීමේ සම්ප්‍රදාය හෙවත් සහෝදරියගේ පුත්‍රයාට රජකමදීමේ සම්ප්‍රදාය නිසා මෙසේ පිය පුත්‍ර ගැටුමක් ඇතිවන්නට ඇති බවය. කෙසේ වෙතත් බතුතාගේ ප්‍රකාශය සත්‍යක් නම් මේ වන විට රයිගම සිට ඇත්තේ සමාන්ත පාලකයෙකු නොව බලවත් ස්වාධීන පාලකයෙකුය. කිත්සිරිමෙවන් කැළණි ශිලා ලිපිය ද මීට සමාන තොරතුරක් දක්වති. මේ අනුව බලන කළ රයිගම් ප්‍රදේශය රාජධානිය ලෙස ගොඩනැගීමේ ගෞරවය හිමිවන්නේ අලගක්කෝනාර හෙවත් අලකේශ්වර පරපුරටය. මෙම රාජධානිය ගොඩනැගීමේ විශේෂ ගෞරවය නිශ්ශංක අලගක්කෝනාරයන්ට හිමිවේ.

අලගක්කෝනාර, කොනාර්, අලකේශ්වර යනුවෙන් හඳුන්වන්නේ පුරාණයේ ගිරි නමින් හඳුන්වන ලද වෙළඳාම හා මූල්‍ය කටයුතුවලට සම්බන්ධ වූ වංශයක් හෙවත් ගෝත්‍රයක් බව සෙනරත් පරණවිතාන සූරීන්ගේ අදහසයි. මේ පිරිස වෙළඳාම නිසා දියුණු වී යම් ධනයක් හිමිකරගත් ප්‍රභූ පන්තියේ ධනවතුන් පිරිසක් විය. ඉන්දියාවේ සෙට්ටි නමින් ද පසුව චෙට්ටියාර් නමින් ද හඳුන්වන ලද පිරිසට සමාන වූ පිරිසකි. පොළොන්නරුවේ පාලක පළමුවන පරාක්‍රමබාහු රජුගේ කුලී හමුදාවේ ප්‍රධාන සෙනවියා වූ නගරගිරි මහින්ද සෙනෙවියා කුලී හමුදාව සමඟ ලක්දිවට පැමිණ ලක්දිව කාන්තාවක හා විවාහ වී ලක්දිව පදිංචිවීම මෙම ගෝත්‍රයේ ආරම්භය ලෙස සලකනු ලබයි. බලවත් යුධ සෙනෙවියෙකු මෙන්ම වෙළඳ නිළධාරියෙකු ලෙස ද කටයුතු කළ නගරගිරි මහින්ද පරාක්‍රම රාජ සභාවේ භාණ්ඩාගාරික ධුරය ද දරා ඇත. ඔහු වනාහි ගිරි පරපුරේ ආදිතමයාය. මෙතුමා පළමුවන පරාක්‍රමබාහු විසින් සංවර්ධනය කොට ගොඩනගන ලද කොළොංතොට හා කළුතර වරායන් පාලනය කිරීමේ පහසුව තකා රයිගම්පුරයේ පදිංචි වන්නට ඇත.

මෙසේ රයිගම්පුරය වාස භූමිය කරගත් අලකේශ්වරවරුන් කිහිපදෙනෙකු පිළිබඳ තොරතුරු අසන්නට ලැබේ. ඒ අතර පොළොන්නරු යුගයේ රාජ භාණ්ඩාගාරික ධුරය හෙබවූ අලකේශ්වර, නිශ්ශංකමල්ල රජුගේ භාණ්ඩාගාරික ධුරය හෙබවූ අලකේශ්වර, මාඝයන් සමඟ දඹදෙණි පාලකයන් කළ සටනේදී මියගිය මාමා සහ බෑනා අලකේශ්වර යුගලය පළමුවන බුවනෙකබාහු රාජ්‍ය කාලයේ සිටි අලකේශ්වර ආදී වශයෙන් අලකේශ්වර පරපුරේ සිටි සියලුම ප්‍රභූන් රාජ්‍ය සේවයට කැපවී ඇත.

අලගක්කෝනාර හෙවත් අලකේශ්වර පරපුර ගැන වැදගත් තොරතුරු රාශියක් කුරුණෑගල හා ගම්පොල යුගවලට අයත් සාහිත්‍ය හා වෙනත් මූලාශ්‍ර විසින් ඉදිරිපත් කරනු ලැබේ. එහෙත් පවතින ගැටළුව වන්නේ මේ දෙයුගය අතර කාලය තුළ රජකම් කළ රජවරුන්ගේ රාජාවලිය සම්බන්ධව පවතින නොගැළපීම හා ගැටළු සහගත තත්වයයි.

කුරුණෑගල යුගයේ ආරම්භක පාලකයා ලෙස සලකනු ලබන්නේ හතරවන පණ්ඩිත පරාක්‍රමබාහු රජතුමාය. මෙතුමා දඹදෙණියේ විජයබාහු ආරම්භ කළ රජ පරපුරේ අවසාන පාලකයායි. එතුමාගෙන් පසු උදාවෙන වර්ෂ 15 ක කාලය රාජාන්තරයෙකි. එනම් රජ කෙනෙක් නැති කාලයකි. මේ කාලයෙන් පසුව පාලකයන් තිදෙනෙකු ගැන එකවර අසන්නට ලැබේ. මේ පාලකයන් තිදෙනා වන්නේ පස්වන සාවුළු විජයබාහු ඔහුගේ පුත්‍රයා වන තුන්වන වන්නි බුවනෙකබාහු රයිගම අලකේශ්වර යන පාලකයන්ය.

මේ කාලය තුළ කුරුණෑගල රාජ්‍යයේ පැවති අස්ථාවර තත්ත්වය නිසා අලකේශ්වරයන් ඉතා බලවත් තත්ත්වයක පසුවිය. ඔහු යටතේ වර්තමාන බස්නාහිර පළාත මෙන්ම සබරගමු පළාත දකුණේ ප්‍රදේශ කිහිපයකුත් පාලනය

වූ බව පෙනේ. මේ අලකේශවරයන් වනාහි කිත්සිරිමෙවන් ශිලා ලිපිය සඳහන් කරන අලකේශ්වරයන් නොවන බවට කරුණු දැක්වීම පිණිස සාධක ඇත්තේය. කිත්සිරිමෙවන් කැළණි ලිපිය සඳහන් කරන අලකේශ්වර හෙවත් අලගක්කෝනාර වන්නේ නිශ්ශංක අලගක්කෝනාරයි. මොහු රයිගම පාලකයා ලෙස කටයුතු කළේ ගම්පොල රාජ්‍යයට සමගාමීවය. ගම්පොල රාජ්‍ය කිසිවිටිකත් අගනුවරක් ලෙස ක්‍රියාත්මක වූ බවක් නොපෙනේ. එකල සවුල් විජයබාහුගේ පුත් හතරවන බුවනෙකබාහු ගම්පොල ද ඔහුගේ පුත්‍රයා වූ පස්වන පරාක්‍රමබාහු දැදිගම ද ආර්යචක්‍රවර්ති යාපන අර්ධද්වීපය ද, නිශ්ශංක අලගක්කෝනාර රයිගම සිටද පාලන කටයුතු මෙහෙයවා ඇත.

එකල සංඝරාජ ධුරය දැරූ විල්ගම්මුල නායක හාමුදුරුවෝ ගම්පොල අගනුවර වාසය කළයුතු වුවත් උන්වහන්සේ අලගක්කෝනාර රයිගම පාලකයාගේ උපකාරයෙන් කැළණි විහාරය පිළිසකර කරවා එහි වැඩ වාසය කළබව කිත්සිරිමෙවන් කැළණි ලිපියේ සඳහන් වේ. මෙම ලිපිය පිහිට වූ නායක හාමුදුරුවෝ රාජ්‍ය වර්ෂයක් හෝ රජෙකු ගැන කිසිදු සඳහනක් නොකරන අතර අලගක්කෝනාරයන් කළ උපකාර පමණක් සිහි කරති. මේ සිදුවීම කුරුණෑගල යුගයේ අවසාන භාගයේ හෝ ගම්පොල යුගයේ ආරම්භයේ සිදු වන්නට ඇත. එසේ ඉබන් බතුතාට හමුවන්නේ මේ අලගක්කෝනාරයි. ඉබන් බතුතා පැමිණි කාලයේ ආසන්නයේදීම විල්ගම්මුල සංඝරාජ හාමුදුරුවෝ අපවත් වන අතර එම තනතුර ලබන්නේ දෙවනගල වනරතන නායක හාමුදුරුවන්ය. උන්වහන්සේ වාසය සඳහා තෝරාගන්නේ ගම්පොළයි. එකල ගම්පොල පාලකයා වූයේ හතරවන බුවනෙකබාහු රජතුමාය.[1]

ගම්පොල නව පාලකයා හා අලුත් සංඝරාජ හිමියන් වූ වනරතන නායක හාමුදුරුවෝ ගම්පොල වාසය කිරීම තුළ අලගක්කෝනාරවරුන්ගේ බලය අඩු වූ බවක් පෙනේ. ඒ සමඟම සේනාධිලංකාර ප්‍රභූ පවුල කරලියට පැමිණීමත් සේනාධිලංකාර සෙනෙවියා හතරවන බුවනෙකබාහුගෙන් පසුව රජ වූ පස්වන පරාක්‍රමබාහු රාජ සභාවේ අගමැතිවරයා ලෙස කටයුතු කිරීම තුළින් අලගක්කෝනාරවරුන්ගේ බලය තව තවත් දුර්වල වූ අතර පෙර සඳහන් කළ දේශපාලන අර්බුදය ද මේ කාල පරාසය තුළ සිදුවිය.

පස්වන පරාක්‍රමබාහුට පසුව රජවන්නේ වික්‍රමබාහු කුමාරයාය. වික්‍රමබාහු රජකම ලබාගත්තේ තම මාමා වන පස්වන පරාක්‍රමබාහු පලවා හැරීමෙනි. මෙසේ රජ වූ තුන්වන වික්‍රමබාහුට උතුරේ ආර්ය චක්‍රවර්ති හා රයිගම අලගක්කෝනාරවරුන්ගේ සහය ලැබී ඇත. එහි ප්‍රතිඵලය වූයේ සේනාධිලංකාර පරපුර නැවතත් අප්‍රකට වී නිශ්ශංක අලගක්කෝනාරයන් වික්‍රමබාහු රාජ සභාවේ අගමැති පදවියට පත්වීමයි. අනතුරුව අලගක්කෝනාරයන් බොහෝ ශාසනික සේවාවන් රාශියක් තම රජු වෙනුවෙන් ඉටුකළ අතර දෙවනගල වනරතන නායක හාමුදුරුවන්ගෙන් පසුව සංඝරාජ පදවියට පත්වූ සීලවංශධම්මකිත්ති නායක

1. ලංකා ඉතිහාසය - II – අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව 210-211 පිටු

හාමුදුරුවන්ගේ අනුශාසනා පරිදි සංඝ සංශෝධනයක් ද ඇතිකරන ලද්දේය. මේ වන විට නිශ්ශංක අලගක්කෝනාර ගම්පොල රාජ සභාවේ බල සම්පන්න පුද්ගලයා බවට පත්ව සිටි අතර රයිගම්පුරයේ ස්වර්ණමය කාල පරාසය ද එම කාලය විය.

අගමැති පදවිය ලැබූ නිශ්ශංක අලගක්කෝනාරයන්ගේ ප්‍රධාන කාර්යය සංසිද්ධිය වූයේ ගම්පොල පැවති දුර්වල පාලනය නිසා යාපනයේ ආර්ය චක්‍රවර්ති විසින් අල්ලාගෙන සිටි බටහිර වෙරළේ නැව්තොටුපොලවල් නිදහස් කර ගැනීමයි. ඒ සඳහා ඔහු වර්තමාන කොළඹට නුදුරුන් පිහිටි කොට්ටේ නැමති ස්ථානයේ බල කොටුවක් ද ගොඩනගා ආර්යචක්‍රවර්ති අල්ලාගෙන සිටි මීගමුව, හලාවත, කොළඹ ආදී සියලුම නැව් තොටුපොළවල් නිදහස් කරගැනීමට සමත් විය.

තුන්වන වික්‍රමබාහුගෙන් පසුව ගම්පොල රජ වන්නේ පස්වන බුවනෙකබාහුය. ඔහු තුන්වන වික්‍රමබාහුගේ සහෝදරියගේ පුත්‍රයාය. බුවනෙකබාහු මියගොස් ටික කලකින් නිශ්ශංක අලගක්කෝනාර අගමැතිවරයා ද මිය යන්නේය. අනතුරුව රයිගම පාලකයා ලෙස හා අගමැතිවරයා ලෙස පත්වන්නේ නිශ්ශංක අලගක්කෝනාරගේ සහෝදරියගේ පුත්‍රයාය. ඔහු ප්‍රභූරාජ අලගක්කෝනාරය. මේ කාලයේ නැවත වරක් යාපනයේ ආර්ය චක්‍රවර්ති ඉන්දියානු පාලකයන්ගේද උපකාරයෙන් ගම්පොල රාජ්‍යයට පහර දෙන්නේය. මේ අවස්ථාවේ රජු ආරක්ෂාව පතා කොට්ටේ බලකොටුවට පලායන අතර පසුව ප්‍රභූ රජයන් සමඟ එකතුවී ආර්ය චක්‍රවර්ති හමුදාවන්ට පහරදී නැවතත් බලය ස්ථාපිත කර ගන්නේය. අනතුරුව බුවනෙකබාහු ගම්පොලට පැමිණි අතර ප්‍රභූරාජ අලගක්කෝනාර රයිගම්පුරයේම නැවතී ඇත.

මයුර සන්දේශය සඳහන් කරන ආකාරයට දෙවිනුවර බලායන මයුරා කැළණියට පැමිණ එතනින් ජයවර්ධනපුරය පසුකොට රයිගම් නුවරට පිවිසෙන්නේය. එහිදී ඔහු ප්‍රභූරාජ අලගක්කෝනාර හා ඔහුගේ සහෝදරයා වූ දෙව් හිමි ද හමු වූ බවයි.[1] පස්වන බුවනෙකබාහුගෙන් පසුව රජවන්නේ වීරබාහුය. වීරබාහුගේ සම්බන්ධය අප්‍රකටය. අස්ගිරි තල්පත පමණක් සඳහන් කරන්නේ දේවමන්ත්‍රී නම් ප්‍රභූවරයා වීරබාහු නමින් රජ කරවූ බවයි. එළු අත්තනගලුවංශය සඳහන් කරන්නේ දේවමන්ත්‍රී අලගක්කෝනාරයන්ගේ සහෝදරයකු බවයි. මේ තොරතුරු සත්‍ය නම් අවසානයේ රයිගම අලකේශ්වර පරපුර ගම්පොල අගරජ පදවිය දක්වා තම බලය පෝෂණය කරගත් බවයි.

1. මයුර සංදේශය - මඟ වැනුම හා ජයවර්ධනපුර වැනුම

# 1 - 3
# රයිගම්පුර සමාජය හා ආගමික පසුබිම

රයිගම්පුරය මුල්කාලයේ ජනාවාස වන්නේ සංක්‍රමණික ජනතාව මගිනි. බොහෝවිට සංක්‍රමණික ජනයා දකුණු රෝහණයේ සිට අනුරාධපුරය බලා යන පිරිස් හා එන පිරිස් විය. මේ පිරිසට රජදරුවන්, මැති අමැතිවරුන්, හා භික්ෂූන් ද අයත්ය. මේ පිරිස වනාහි සංක්‍රමණික හා සංචාරක පිරිසක් වශයෙන් තාවකාලික පදිංචිකරුවන් වූහ. එහෙත් මේ තත්ත්වය පසුකාලීනව වෙනස් වූ අතර එසේ යන එන ජනතාව ස්ථිර ජනාවාස පිහිටුවාගෙන පදිංචිකරුවන් බවටද පත්විය. ඔවුන්ගේ තාවකාලික වාසස්ථාන ස්ථිර නිවාස බවට පත්විය. විහාර දේවාලයන් ද ආවාස මට්ටමින් මිදී ස්ථිර විහාරාරාම බවට පත්විය. මේ තත්වය මධ්‍ය කාලය වන විට ස්ථාවර මට්ටමකට පත්ව තිබුණු අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් රයිගම්පුර රාජ්‍ය හා රාජ්‍ය තන්ත්‍රය බිහි විය. මේ තත්ත්වය වේගවත් වන්නේ අනුරාධපුරය හා පොළොන්නරුව බිඳවැටී ජනයා නිරිතදිගට සංක්‍රමණය වීමත් සමඟමය. විශේෂයෙන්ම ගම්පොල සහ කෝට්ටේ යුගවලදී රයිගම්පුරය විසින් ඉටුකරන ලද කාර්යය භාරය සුවිශේෂී වන්නේය. වෙළෙඳ පරපුරක් ලෙස ගොඩනැගුණු රයිගම් පාලකයෝ ගම්පොල හා කෝට්ටේ රාජ්‍යයන් සමග ඥාති සම්බන්ධතාවයන් පවා ඇතිකොටගෙන දේශපාලනික, සාමාජික, මෙන්ම ආගමික වශයෙන් ද වැදගත් කාර්යය භාරයක් ඉටු කළේය.

කොට්ටේ විශිෂ්ට පාලකයා මෙන්ම ලක්දිව අවසන්වරට එක්සත් කළ පාලකයා වන හයවන පරාක්‍රමබාහු රජතුමාගේ බාල කාලය ගෙවී යන්නේ රයිගම්පුර රාජ්‍ය තුළයි. එතුමාගේ පියා වූ ලැමැණි ජයමහාලෑන නම් ප්‍රභූවරයා හා මව්බිසව වූ සුනේත්‍රා මහා දේවිය රයිගම වැසියන් බව පෙනේ. පරාක්‍රම කුමාරයාට හා මව්බිසවට ආරක්ෂාව සපයනු ලබන්නේ ද වීදාගම මහා විහාරයේ මහ තෙරුන් වහන්සේය. මේ පුවත පිළිබඳව අපට හමුවන තොරතුරු අතර රාජාවලිය දක්වන තොරතුර පිළිබඳව අපගේ අවධානය යොමුවිය යුතුය. චීන සෙන්පති චෙංහෝ වීර අලකේශ්වරයන් සිරකරුවෙකු ලෙස චීනයට අල්ලාගෙන ගිය අවස්ථාවේ සුනේත්‍රා මහා දේවිය පරාක්‍රම කුමාරයා සමඟ වීදාගම විහාරයට පැමිණ ඇත. මෙසේ පැමිණීමට හේතු වී ඇත්තේ පරාක්‍රම කුමාරයාගේ පියා ද අලකේශ්වරයන් සමඟ චීනයට රැගෙන ගිය පිරිස අතරවීමයි. මේ අවස්ථාවේ වීදාගම මහ තෙරුන් වහන්සේ කුමාරයා සහ මව්බිසව සතර කෝරළයේ බෙලිගල නම් ප්‍රදේශයේ ගම් ප්‍රධානියෙකු වෙත ආරක්ෂාව පතා පිටත්කොට යවා ඇත. මේ අතර මේ පුවතට සම්බන්ධ වන බොහෝ ජනප්‍රවාදයන් ද අපට හමුවී ඇත. එයින් එකක් පමණක් දැක්වීම සුදුසුය.

කුමාරයා සහ මව්බිසව ආරක්ෂාව පතා සතර කෝරළය වෙත යන අතරවාරයේ ස්ථාන කිහිපයකම කුමාරයා සඟවා තැබීමට වීදාගම හිමියන් ඇතුළු පිරිසට සිදුවී ඇත. මෙසේ කුමාරයා ආරක්ෂා කරගැනීමට සිදුවූයේ චීන ඔත්තුකරුවන්ගෙන් ද නැතිනම් වෙනත් සතුරු බලවේගයකින්ද යන්න පැහැදිලි නැත. කෙසේ වෙතත් සතර කෝරළයේ දක්වා ඇති මාර්ගයේ ඔලබොඩුව නම් වූ ගම්වරයේ විෂ්ණු දේවාලය ආශ්‍රිත ප්‍රදේශයේ කුමාරයා කලක් ආරක්ෂිතව වාසය කොට ඇත. හරකුන් බලන දරුවෙකු ලෙස වෙස් වලාගෙන කුමරා මේ ප්‍රදේශයේ ඇතිදැඩිවිය. එහෙත් එම ප්‍රදේශයට කුමාරයා සොයමින් සතුරු පිරිස් පැමිණ එක් අවස්ථාවක ගවයන් රකිමින් සිටි පුද්ගලයෙකු වෙතට පැමිණ ඔත්තුකරුවන් පිරිසක් කුමාරයා පිළිබඳ තොරතුරු විමසා ඇත. එවිටම කුමාරයා ද එම ස්ථානයට පැමිණ ඇත. මේ අවස්ථාවේ උපායශීලි වූ ගවයන් රකින්නා ගවයන්ට ගසන කෙවිටෙන් කුමාරයාට පහර කිහිපයක් ගසා ගවයන් රකින්න යන ලෙස බැණවැදී එළවා ඇත්තේය.

මෙහිදී මෙම ළදරුවා රාජ කුමාරයා නම් මෙසේ තරවටු නොකරන බව සිතූ චරපුරුෂයෝ ආපසු ගියේය. මෙසේ කුමාරයා දිවි පරදුවට තියා ආරක්ෂා කරගත් මේ පිරිස ඔලබොඩුව විෂ්ණු දේවාලය හා විහාරය ආශ්‍රිත ගොදුරුගම් පියසේ මුරගේ පරපුර නමින් වර්තමානයේද වාසය කරන බවට තොරතුරු ඇත. කුමාරයා සඟවා තිබූ මෙම ප්‍රදේශය මීපාගල ලෙස ද හැඳින්වේ. කෙසේ වෙතත් මුරගේ පරපුර වනාහි සමහරවිට එකල ඔලබොඩුව විෂ්ණු දේවාලයට සම්බන්ධ රයිගම රජුට රාජකාරී කරන පිරිසක් ලෙසද හඳුන්වා දිය හැක. විශේෂයෙන්ම වීදාගම මහා ස්වාමීන්ද්‍රයාණන් කුමාරයා සහ මව්බිසව ඔලබොඩුව තලගල ප්‍රදේශයට කැඳවාගෙන ඒම පිණිස භාර කරන්නේ නැකත්කරුවෙකුටය.

මෙසේ නැකැත්කරුවෙකුම මේ සඳහා වීදාගම හිමිවරුන් තෝරාගනු ලබන්නේ එකල නැකත්කරුවන් හා විහාරස්ථාන අතර පැවති විශේෂ බැඳීමක් නිසා විය හැකිය. මේ නැකැත් කරුවා කුමාරයා සහ මව්බිසව නවත්වනු ලබන්නේ පළාතේ ගම් ප්‍රධානියාගේ නිවසේය. එකල ගමරාළ ලෙස හැඳින්වූ ගම් ප්‍රධානියා කුමරුගේ හා මව්බිසවගේ භාරකාරත්වය පවරා ගත් අතර මේ පරපුර වර්තමානයේ සම්භාවනීය පිරිසක් ලෙස ගමගේ නමින් ප්‍රකටව ඇත. එසේම කුමාරයා සහ මව්බිසව යන එන තැන යමින් ඔවුන් රැකගන්නා ලද්දේ මුරගේ පරපුර බව ජනප්‍රවාදයේ සඳහන් වේ.

රයිගම්පුර රාජ්‍ය වූ කල දේශපාලනික හා ආර්ථික වශයෙන් පමණක් වැදගත් වූ ප්‍රදේශයක් නොවේ. ආගමික හා සාහිත්‍ය වශයෙන් ද වැදගත් කාර්ය භාරයක් රයිගමින් ඉටුවිය. වීදාගම විහාරය හා සනාන්ද පිරිවෙන මෙම ප්‍රදේශයේ පැවති ප්‍රබල විද්‍යා පීඨයක් වූ අතර එහි වාසය කළ වීදාගම මහ තෙරුන් වහන්සේ හා උන්වහන්සේගේ ප්‍රධාන ශිෂ්‍යයා වූ තොටගමුවේ රාහුල තෙරුන් වහන්සේත් උන්වහන්සේගේ ශිෂ්‍යයෙකු වූ වෑත්තෑවේ තෙරුන් වහන්සේ රයිගම පමණක් නොව ලංකාද්වීපයේම භාෂා සාහිත්‍ය වර්ධනයේ පතාක යෝධයන්ය. මේ අතර

තොටගමුවේ රාහුල හිමියන් කාව්‍යශේඛරය, සැළලිහිණි සන්දේශය ඇතුළු ග්‍රන්ථ රාශියක්ම සම්පාදනය කරමින් රයිගම සාහිත්‍ය ආලෝකමත් කළ අතරම උන්වහන්සේ හයවන පරාක්‍රමබාහු රජුගේ මාලිගාවේම හැදී වැඩුණු රජුන් තනන යතිවරයන් වහන්සේ නමක් විය. සපුමල් කුමරු හෙවත් හයවන බුවනෙකබාහුට රජකම නොදී පරාක්‍රම රජුගේ දියණිය වූ උලකුඩය දේවියගේ පුත්‍රයා හත්වන පණ්ඩිත පරාක්‍රමබාහු නමින් කොට්ටේ රජකරවීමට කටයුතු කළේද තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන්ය. එහෙත් උන්වහන්සේගේ එම කාර්යය පසුව ආසාර්ථක විය. එහි ප්‍රතිඵලය වූයේ තොටගමුවේ රාහුල හිමියන්ගේ පසුබැසීමේ ආරම්භය ඇතිවීමයි.

වීදාගම විහාරයේ වැඩවාසය කළ වීදාගම නමින් හඳුන්වන ලද හිමිවරුන් කිහිප දෙනෙකුම වැඩ සිටි ආකාරයක් පෙනේ. මෙහිදී එම පරපුරේ තුන්වැන්නා වන්නේ වීදාගම මෛත්‍රිය මහ තෙරුන් වහන්සේය. හයවන බුවනෙකබාහු සමයේ සිදුකළ විනය කර්ම කටයුත්තට සම්බන්ධ වූ වීදාගම තෙරුන් වහන්සේ මුන්වහන්සේ නොවේ. ඒ වීදාගම මහ තෙරුන් වහන්සේය. කෙසේ වෙතත් ලෝවැඩ සඟරාව, බුදුගුණ අලංකාරය රචනා කරමින් ධර්ම ශාස්ත්‍රීය සේවාව සිදුකරන ලද්දේ එම පරපුරේ තුන්වැන්නා වූ වීදාගම මෛත්‍රී නාහිමියන්ය. එසේම ගුත්තිල කාව්‍ය සම්පාදනය කළ වෑත්තෑවේ හිමියන් ද රයිගම් පරපුරේ භික්ෂුවක් බව අමතක නොකළ යුතුය. මෙසේ බලන කළ රයිගම්පුරය වනාහි ආර්ථික හා සමාජ කාර්යය සංසිද්ධීන් මෙන්ම ආගමික හා සාහිත්‍ය කාර්යය සංසිද්ධීන් ද ගහන වූ ඉතිහාසයකට හිමිකම් කියන පුරවරයෙකි.[1]

1. රයිගම්පුර විත්ති - ආචාර්ය හොරණ වජිරඥාණ හිමි



සර්වඥ ධාතු කරඬුව වැඩමවීම - ඔලබොඩුව නවම් මහ පෙරහර මංගල්‍යය



අභිනව ධර්ම මන්දිරය

## දෙවන පරිච්ඡේදය

# රයිගම්පුර උපුල්වන් ශ්‍රී විෂ්ණු මහා දේවාලය

**2 - 1 විෂ්ණු දෙවියන් හෙවත් ලක්දිව පුද ලබන උපුල්වන් දෙවියෝ**

**2 - 2 පොළොන්නරු යුගය හා නිශ්ශංකමල්ල රජු**

**2 - 3 රයිගම්පුර ඔලබොඩුවේ පිහිටි මහා දේවාලය**

# 2 - 1
# විෂ්ණු දෙවියන් හෙවත් ලක්දිව පුදලබන උපුල්වන් දෙවියෝ

ලක්දිව ජනයාගේ ප්‍රධාන ආගම බුදුදහම වුවත් වෙනත් ඇදහිලි හා විශ්වාසයන් සඳහා ද යොමුවීමේ ස්වභාවයක් මුල් කාලයේ සිටම දක්නට ලැබිණි. ඒ අතර හින්දු දේව ඇදහිල්ල මෙන්ම ලක්දිව ප්‍රාදේශීය වශයෙන් පැවති දේව වන්දනාවන් ද ප්‍රධාන තැනක් ගනු ලැබීය. විශේෂයෙන්ම බුදු සමය හා ලක්දිව බෞද්ධ සංස්කෘතිය තුළද මෙයට අවස්ථාවක් හිමිවී තිබීම එය වර්ධනයට ප්‍රධාන හේතුවක් වූ අතර ලක්දිව ජනයා තෙරුවන් වන්දනාව හා දේව වන්දනාව කිසිදු මත භේදයකින් තොරව පවත්වාගනු ලැබීය.

ප්‍රාග් බෞද්ධ යුගයේ ලක්වැසි ජනතාව විශ්වාසය තැබූ දේව ඇදහිලි කිහිපයක් ගැන තොරතුරු වංශ කතාවල සඳහන් වේ. උපුල්වන් (උප්පලවණ්ණ) ලක්දිව බුදු සසුනෙහි හා රටෙහි ආරක්ෂකයා ලෙස පිළිගෙන උපුල්වන් දෙවියන් මෙරට බෞද්ධයන්ගේ ප්‍රධාන දේව ඇදහිල්ල බවට පත්විය. දේව වන්දනාවන් අතර ප්‍රධාන තැනක් ගත් උපුල්වන් දේව වන්දනාව ප්‍රධානත්වයට පත්වෙමින් බුද්ධ ශාසනය ආරක්ෂා කර ගැනීමේ වගකීම විෂ්ණු දෙවියන්ට පවරා ඇත යන අදහස ලක්දිව පුරාණ සාහිත්‍ය විසින් ද ජන හදවත් තුළට තහවුරු කොට ඇත.

යථෝක්ත දේව ඇදහිල්ල මෙරට සමාජ හා සංස්කෘතික ඉතිහාසයේ ඉතා වැදගත් වූ බැවින් ඒ පිළිබඳව අධ්‍යනයන්හි යෙදුණු ප්‍රාඥයන්ගේ අදහස් නූතනයේ අපට හමුවීම වැදගත්ය. උපුල්වන් දෙවියන් හා එම දෙවියන් උදෙසා ඉදිකළ දෙවුන්දර දේවාලය පිළිබඳව විශේෂ ලේඛනයක් මහාචාර්ය පරණවිතාන ශූරීන් 1948 වර්ෂයේදී ඉදිරිපත් කර ඇත.[1] ඇල්.එම්. ලීලසේන විසින් රචිත පැරණි දෙවිනුවර කෘතිය[2] මගින් හා පී.ඩී.එස්.වීරසූරියගේ දෙවුන්දර ඉතිහාසය[3] කෘතියෙහි උපුල්වන් දේව ඇදහිල්ල හා දේවාලය පිළිබඳ තොරතුරු රැසක් අපට හමුවේ. උපුල්වන් දේව ඇදහීම පිළිබඳව දැනුම වර්ධනය කළ හැකි පර්යේෂණයක් මාතර මානව වංශය හා පුරා විද්‍යාත්මක ඉතිහාසය[4] කෘතියෙන් පූජ්‍ය කඹුරුපිටියේ වනරතන හිමියන් ඉදිරිපත් කර ඇත.

විෂ්ණු දෙවියන් වන්දනා කිරීම ලක්දිව බෞද්ධ ජනයාට ස්වභාවයෙන්ම හුරු පුරුදු පිළිවෙතක් බැවින් පොළොන්නරු යුගයේ සිටම විෂ්ණු දේව වන්දනාව වෙනුවෙන් පූජනීය ස්ථාන ඉදිවීම සාමාන්‍ය සිද්ධියක් බවට පත්විය. විශේෂයෙන්ම විෂ්ණු දෙවියන් ඉන්දියාව තුළදී විෂ්ණු, වාසු, නාරායන, ක්‍රිෂ්ණ ආදී විවිධ වූ නම්වලින් ප්‍රචලිත වුවත් ලක්දිව බහුලව හඳුන්වන ලද්දේ උපුල්වන් දෙවියෝ යන

1. " upulvan Shirne at Devundara 1948 pp 37 – 41 - S.Paranavithana
2. ''පැරණි දෙවිනුවර'' 1949 - ඇල්.එම්.ලීලසේන
3. දෙවුන්දර ඉතිහාසය 1949 - පී.ඩී.එස්.වීරසූරිය
4. මාතර මානව වංශය හා පුරා විද්‍යාත්මක ඉතිහාසය කේ.වනරතන හිමි

නමිනි. එසේම විෂ්ණු දෙවියන් වනාහි දස අවතාරයක් ලෙස පැමිණ ජනයාට සෙත සලසන බව හින්දූන්ගේ විශ්වාසයයි. එම දස අවතාරය ලෙස ඔවුන් දක්වනු ලබන්නේ මත්ස්‍ය අවතාරය, කූර්ම අවතාරය, වරහා අවතාරය, නාසිංහ අවතාරය, වාමන අවතාරය, පරශුරාම අවතාරය, රාම අවතාරය, කෘෂ්ණ අවතාරය, බුද්ධ අවතාරය, කල්කි අවතාරය වශයෙනි.

ඉහත දක්වන දස අවතාරය බෞද්ධයාගේ විෂ්ණු වන්දනාව තුළ දක්නට නොවීය. ඔවුන් විෂ්ණු දෙවියන් සලකනු ලැබූයේ මතු බුදු බව පතන ලක්දිව හා බුද්ධ ශාසනය ආරක්ෂා කරදෙනු ලබන උත්තමයෙකු වශයෙනි. එබැවින් හින්දු සංකල්පයට වඩා බෞද්ධ සංකල්පය තුළ ජනයාට දෙවියන් වඩාත් ලං වූ කෙනෙකු වූ අතර ඔහු වෙනුවෙන් කරනු ලැබූ පුදපූජා හා පිළිවෙත් ද අවිහිංසාවාදී සරල පිළිවෙත් බවට ද පත්වී ඇත.

මතුවට ලක්දිවෙහි සම්බුද්ධ ශාසනය නිර්මලව පවතින්නේය. එබැවින් ලක්දිව ආරක්ෂාව විෂ්ණු දෙවියන්ට භාර වන්නේය යන අදහස පිළිබඳව මහාවංශය දක්වන කරුණින් ලක්දිව විෂ්ණු දෙවිඳුන්ගේ ආරක්ෂාව යටතේ පවතින්නේය යන සංකල්පය ලක්දිව ජනතාව තුළ මුල්බැසගෙන ඇති බව පැහැදිලිය. එබැවින් ලක්දිව විෂ්ණු දේව වන්දනාව ක්‍රිස්තු පූර්ව යුගය දක්වාම ඈතට දිව යන්නේය. එසේම ඉන්දියාවේ වන්දනාවට පාත්‍ර වූ විෂ්ණු දෙවියන් හා ලක්දිව වන්දනාවට පාත්‍ර වූ විෂ්ණු දෙවියන් යනු එක් දෙවි කෙනෙකු ද? එසේම ලක්දිව හඳුන්වන උපුල්වන් දෙවියන් වනාහි විෂ්ණු දෙවියන්ම ද ? යන ප්‍රශ්නයට පිළිතුරු සෙවීම වනාහි තරමක් අපහසු වුවත් විෂ්ණු දෙවියන් ඉන්දියානු හින්දු ජනයා පිළිගන්නා ආකාරයටම ලක්දිව වැසියන් පිළිගන්නේ නැත.

### විජය රජු හා උපුල්වන් දෙවිඳු

''දීපදෝත්තම සර්වඥයන් වහන්සේ වනාහි පරිනිර්වාණ සමයෙහි සිංහබාහු රජුගේ පුත් මේ විජය නම් ක්ෂත්‍රිය රජෙක් වන්නේ යැයි ප්‍රකාශ කළ සේක. එසේ ප්‍රකාශ කළ ඉක්බිතිව අප ශාස්තෘන් වහන්සේ එම්බා කෝසිය (ශක්‍රය) තොප ලංකාද්වීපය රැක ගැනීමට උත්සාහ ගැනීමට පමා නොවෙවැයි දේවේශ්වර වූ ශක්‍රයා අමතා පැවසූහ. සුජම්පති නම් වූ ශක්‍රයා සම්‍යක් බුදුන්ගේ වදන් අසා උපුල්වන් දෙවි රජුහට ලක්දිව ආරක්ෂා කිරීමට කරුණු කීයේය. මහත් වූ ඍද්ධි ඇති ඒ උපුල්වන් දෙව්පුත් තෙමේ ශක්‍රයාගේ වදන් අසා පරිවාර දෙවියන් සහිත ලක්දිව ආරක්ෂාවට එළඹ සිටියේය.[1] උපුල්වන් දෙවියන් ලංකාරක්ෂාව භාර ගැනීම පිළිබඳව මෙසේ දීපවංශය සඳහන් කර ඇත. දීපවංශයෙහි සඳහන් මෙම අදහසටම සමාන වූවක් මහාවංශයේ ද දක්නට ඇත. වැඩිදුරටත් මහාවංශය උපුල්වන් දෙවියන් පරිබ්‍රාජක වේශයෙන් ලක්දිවට පැමිණ විජය කුමරු ඇතුළු පිරිස ඉදිරියේ පෙනීසිට බිය නොවන ලෙස අවවාද කොට ඔවුන්ගේ අත්වල පිරිත් නූල් ගැටගසා පිරිත් පැන් ඉස අහසින් ගිය බව දක්වා තිබේ.[2]

1. දීපවංශය පරි.07, 05-09 ගාථා
2. මහාවංශය පරි.07, 05-09 ගාථා

එදා දිවයිනේ මුල් පදිංචිකරුවන් ලෙස යකුන් පිළිබඳ තොරතුරු ඇතුළත්ය. මෙම යුගයේ යකුන්ගේ රාජධානිය පිහිටා තිබුණේ ''සිරිසවත්ථු'' නගරයෙහිය. මෙම යක් පිරිස අතරින් විජයගේ පරිවාර ජනයාට ප්‍රථමයෙන්ම මුණගැසෙන්නේ යක්ෂ නායිකාවක වූ කුවේණියයි.

ඇය විසින් විජය ඇතුළු පිරිස නසා දැමීමට උත්සාහ දරා ඇත. එහෙත් එසේ කිරීමට නොහැකි වූයේ ඔවුන්ගේ අත්වල උපුල්වන් දෙවියන් විසින් බඳනා ලද ආරක්ෂක පිරිත් නූල් වල ආනුභාවයෙන් බව වංශකතා පවසයි. පසුව කුවේණිය විවාහ කරගන්නා විජය කුමරු ඇයගේ ආධාරයෙන් යකුන් පිළිබඳ තොරතුරු දැන ඔවුන් විනාශ කොට දැමීය. විවාහ මංගල්‍යයකට සියලු යකුන් රැස්ව සිටි අවස්ථාවක විජය කුමරු ඔවුන් නසා දැමීමට සූදානම්ව උපුල්වන් දෙවිඳුන්ගේ පිහිට ඇයැද සිටි බව සඳහන් වේ.[1]

උපුල්වන් දේව ඇදහීම පිළිබඳව වංසත්ථප්පකාසිනියෙහි දැක්වෙන විග්‍රහයට අනුව පැහැදිලි කරගත හැක්කේ පළමුව විජය ඇතුළු පිරිසට යක්ෂ උපද්‍රවවලින් ආරක්ෂාවීමට හා ඔවුන් නසා දැමීමට දෙවියන්ගේ ආධාරය ලැබුණු බවට ඇති විශ්වාසයයි. මේ අනුව වංසත්ථප්පකාසිනි කතුවරයා ජීවත් වූ අවධිය වන විට උපුල්වන් දේව ඇදහිල්ල වටා සංවිධිත වූ දේවාල චාරිත්‍ර විධි පැවතී ඇත.

### උපුල්වන් දෙවියන් හා සංදේශ සාහිත්‍යය

විෂ්ණු දේව නාමය අපට හමුවණ පුරාණ කෘතීන් අතර ප්‍රධානතම කෘතිය මහාවංශයයි. ඉන් අනතුරුව පපංචසූදනී අටුවාවේද සීතා කථාව රාමා කථාව ආදිය පිළිබඳව තොරතුරු දැක්වේ. එසේම පළමුවන සේන රජු විසින් කළ සියබස්ලකරේ ද විෂ්ණු දෙවියන් ගැන සඳහන් වේ. (ක්‍රි.ව.826-846)

''පළ විකුමෙන් යුතු වැ
නරණා විසින් සුරසියන්
සිරිසර කවර නොපැළැඳ
සුරනිඳුහු නොකවරපත්''[2]

මේ කවියෙන් විස්තර කරණු ලබන්නේ විෂ්ණු දෙවියන්ගේ වික්‍රමයන් ගැනය. මීට අමතරව අනුරාධපුර යුගයට අයත් හතරවන මිහිඳු රජතුමාට අයත් වන පුවරු ලිපියේද විෂ්ණු දෙවියන් ශ්‍රියාකාන්තාව සමඟ නාග යහනේ සැතපෙන අන්දමින් යැයි උපමාවක් ගලපා තිබේ.[3]

තිසර, මයුර, පරවි හා කෝකිල යන සංදේශ කාව්‍ය වලින් උපුල්වන් දෙවියන් පිළිබඳව උද්වේගී ලෙස දේව භක්තිය ප්‍රකට කර ඇති ආකාරය අපට හමුවේ. ගම්පොළ රාජධානි සමයේ සිව්වෙනි බුවනෙකබාහු (ක්‍රි.ව.1341-1351)

1. වංසත්ථප්පකාසිනි - මලලසේකර p-260 - 1935
2. සියබස්ලකර විවරුව-පද්‍ය 44
3. අනුරාධපුර යුගය, මිහිඳු ලිපිය 12

රජතුමා ගම්පොළ පාලනය ගෙන යද්දී සතර කෝරළයට අයත් දැදිගම තවත් රාජධානියක් පස්වෙනි පැරකුම්බා රජු (ක්‍රි.ව.1344-1359) පවත්වාගෙන යන ලදී. මෙම රජවරුන් දෙදෙනාම මුල්කොට සංදේශ දෙකක් රචනා වූ අතර එකී සංදේශ දෙකම දෙවුන්දර උපුල්වන් දෙවිඳුන් වෙත යොමුකර තිබේ.

දෙවුන්දර විසූ යතිවරයන් වහන්සේ නමක් විසින් රචිත තිසර සන්දේශය මගින් උපුල්වන් දෙවියන්ගේ ආසිරි පැතුමන් පස්වෙනි පැරකුම්බා රජුටත් රජ පවුලේ අයට සහ බලසෙන් සහිත ඇමතිවරුන්ටත් යොමුකර ඇත. කර්තෘ අඥාත මයුර සන්දේශයේද ගම්පොළ සිට දීර්ඝ මග ගෙවා දෙවුන්දර උපුල්වන් දේවාලය වෙත යොමුකොට ඇත්තේ සිව්වෙනි බුවනෙකබාහු රජු ඇතුළු පවුලේ අයට ආරක්ෂාව ලබාදෙන ලෙස යවන සන්දේශයෙකි. මෙහිදි මයුර සංදේශ කතුවරයා දෙවුන්දර ගැනද, උපුල්වන් දෙවියන් ගැන ද වර්ණනා කරමින් යවන අස්නකි.[1]

සපුමල් උතුරේ පාලනය ගෙන යද්දී ලක්දිව දකුණු කෙළවර දෙවුන්දර විසූ යතිවරයාණන් වහන්සේ නමක් විසින් ඔහුට උපුල්වන් දෙවිඳුන්ගේ ආශිර්වාදය පැතීමට අදහස් කළේය. භාෂාත්‍රයෙහි හසල දැනුමක් ඇති උන්වහන්සේ තිලක නම් පිරිවෙනෙහි අධිපති පදවිය දරමින් සිටියේය. උන්වහන්සේ කෝකිල සංදේශය රචනා කරන ලද්දේය.[2]

සවැනි පැරකුම්බා රජුට සතුරු උවදුරු වලින් තොරව රට පාලනය කළ හැකි වන සේ දෙවියන්ගේ ආශිර්වාදය ලබාදීම හංස සංදේශයෙහි අරමුණ විය. මෙහි දූතයා හංසයෙකි. මෙහි ඇත්තේ සෙසු සංදේශවල මෙන් දෙවියන්ගෙන් කරන ඉල්ලීමක් නොව දෙවියන්ට කරන නියෝගයකි. රතන සූත්‍රයෙන් පිරිත් කියා උපුල්වන් දෙවිඳුන් ප්‍රමුඛ සතර වරම් දෙවියන්ට පිං දී දෙවියන්ට මෙම නියෝගය කරන මෙන් හංස කතුවරයා කැරගල වනරතන හිමියන්ගෙන් ඉල්ලා සිටී.

මහත් තෙදැති පුල්වන් සුරිඳු මුල් කොට
දිමුත් සමන් බොක්සැල් සුරිඳු නෙක් කොට
සවත් සුරිඳු විබිසන ඈ සුරන් හට
පිරිත් කියා පින් දී සිත සතුටු කොට[3]

මෙහි සඳහන් උපුල්වන්, සමන්, ස්කන්ධ කුමාර හා විභීෂණ යන සතර දෙවිවරුන් මෙම යුගයේ ලංකාරක්ෂක සතර වරම් දෙවිවරුන් සේ සැලකූ බවට සාක්ෂි හමුවේ.

දඹදෙනියේ දෙවැනි පරාක්‍රමබාහු රජතුමා විසින් රචිත කව්සිළුමිණේ කිහිප අවස්ථාවකම විෂ්ණු දෙවියන් ගැන සඳහන් කර ඇත. සද්ධර්මරත්නාවලියේ විෂ්ණු හා ඊශ්වර වන්දනාව ගැන සඳහන් කරයි. හංස සංදේශය රචනා කර ඇත්තේ විදාගම මෛත්‍රී මාහිමියන් හෝ වීදාගම සඟ පරපුරේ භික්ෂුවක් විසිනි.

1. මයුර සංදේශය - පද්‍ය 130 - 150
2. කෝකිල සංදේශය - පද්‍ය 292
3. හංස සංදේශය - පද්‍ය 198



පුරා විද්‍යා දෙපාර්තමේන්තුව මගින් සුරක්ෂිත කර ඇති ශිලා ලේඛනයේ කොටසකි

කෝට්ටේ යුගයේ නැගී තිබූ හින්දු දේව පූජාවලට දැඩි සේ පහර ගසමින් බුදුගුණ අලංකාරය මගින් ශිව, විෂ්ණු ඇදහිලි වලට එල්ල කළ නිර්දය විවේචනයත් සිදුකරද්දී එකී සඟ පරපුරෙන්ම උපුල්වන් දෙවියන් ඇතුළු සතර වරම් දෙවිවරුන් කෙරෙහි දක්වූයේ ඊට වෙනස් ආකල්පයක් බව හංසයෙන් පැහැදිලි වේ.

හංස කතුවරයා උපුල්වන් දෙවිඳුන් ගැන භක්තියක් තිබූ බව පැරකුම්බා රජුගේ රාජ සභාවේ සන්නස් ලියන තිරුවංගමු මුකවෙට්ටි මැති ගැන කළ විස්තරයෙන් පැහැදිලිය.

මුනිඳුන් උපුල්වන් - සුරිඳුන් නරනිඳුන් වෙත
බැතිසිත රකින තම පණ සතර වැනි කොට
සත වෙත පතුරුවන මෙත් කුළුණු හැම විට [1]

දාහතර හා පහළොස්වන ශතවර්ෂයන්හි රචනා වී ඇති සංදේශ කාව්‍යයන් වලින් එදා සමාජයේ පැවති දේව භක්තිය පැහැදිලිය. එයින් තිසර, මයුර, පරෙවි හා කෝකිල සංදේශ කාව්‍යවලින් උපුල්වන් දෙවියන් ගැනත් සැළලිහිණි සංදේශයෙන් විභීෂණ දෙවියන් ගැනත් ගිරා සන්දේශයෙන් නාථ දෙවියන් ගැනත් කෙරෙන දේව වර්ණනා මගින් එදා සමාජයේ දෙවිවරු විශේෂ භක්තියකින් පුදනු ලැබූ බව පෙනේ.

1. හංස සංදේශය - පද්‍ය 50

විෂ්ණු දෙවියන් උපුල්වන් දෙවියන් වූයේ කෙසේ ද යන පැනයට පිළිතුරු සෙවීම තරමක් ගැටලු සහගතය. ලක්දිව උපුල්වන් දේව නාමය ස්ථාපිත වීමේ මුල්ම අවස්ථාව වන්නේ දෙවිනුවර උපුල්වන් දේවාලයයි. දෙවිනුවර දේවාල ඉදිකිරීම සම්බන්ධයෙන් මත අදහස් රාශියක් පවතී. කෙසේ වුවත් ඉන්දියාවේ ජනයා වන්දනා කරන විෂ්ණු දෙවියන්ට වඩා වෙනස් වූ ඉතිහාසයක් ලක්දිව වන්දනාවට පාත්‍ර වූ විෂ්ණු දෙවියන්ට පවතින බව පැහැදිලිය.

තව ද විෂ්ණු දෙවියන් වනාහි සතර වරම් දෙවි කෙනෙකු නොවන බව ද පැහැදිලිය. මේ අනුව විෂ්ණු හෝ උපුල්වන් දෙවියන් බෞද්ධ විහාරයට පිවිසුණු හින්දු දෙවි කෙනෙකු නොව බෞද්ධ වූ එසේම සම්බුද්ධ ශාසනය රකින පූජනීය දෙවිකෙනෙකු බව නම් පැහැදිලිය.

මහනුවර යුගය වන විට දළදා මැදුර ආසන්නයේ විෂ්ණු දේවාලය, හඟුරන්කෙත විෂ්ණු දේවාලය, දඹුල්ල විෂ්ණු දේවාලය, ගඩලාදෙණිය විෂ්ණු දේවාලය, ලංකාතිලක විෂ්ණු දේවාලය, තොටගමුව විෂ්ණු දේවාලය, දෙවුන්දර විෂ්ණු දේවාලය හා රයිගම්පුර විෂ්ණු දේවාලය (ඔලබොඩුව) ආදී දේවාලයන් විශේෂ තැනක් ගනු ලැබීය. විශේෂයෙන්ම ලක්දිව දක්වන විෂ්ණු දෙවියන් හෙවත් උපුල්වන් දෙවියන් බොහෝවිට නිර්මාණය කොට ඇත්තේ වාහනාරූඪව නොවේ. එසේම වර්ණය ද තද නැත. ලා නිල්පාට වර්ණයකින් දක්නට ලැබේ. මේ අනුව කුමන නමකින් හැඳින් වුවද ලක්දිව වන්දනාවට බඳුන් වන විෂ්ණු හෝ උපුල්වන් දෙවියන් වනාහි දස අවතාරගත හින්දු විෂ්ණු දෙවියන් නොවන බව නම් පැහැදිලිය.

# 2 - 2
# පොළොන්නරු යුගය හා නිශ්ශංකමල්ල රජු

අනුරාධපුර රාජධානිය බිඳවැටීමත් සමග ඇරඹුණ චෝල පාලනය යටතේ මෙරට හින්දු ආගමට විශේෂ ස්ථානයක් හිමිවිය. අනුරාධපුර යුගය අවසාන වී පොළොන්නරු යුගයේ ආරම්භයත් සමඟම ලක්දිව බෞද්ධ සංස්කෘතියේ ද විවිධ වෙනස්කම් ඇතිවන්නට විය. හින්දු දේව සංකල්පය ස්ථාපිතවීමේ ප්‍රවණතාවයක් දක්නට ලැබුණේය. මෙම නිසා තෙරුවන් වන්දනාවට අමතරව ලක්දිව ජනයා විවිධ දෙවියන් උදෙසා පුදපූජා තැබීම පිණිස ද උත්සුක වූ ප්‍රවණතාවයක් දක්නට ලැබුණේය. විශේෂයෙන්ම මේ තත්ත්වයට ප්‍රධාන හේතුව වන්නට ඇත්තේ ලක්දිව රජ පවුල් හා ඉන්දියානු රජ පවුල් අතර ඇති වූ සම්බන්ධතාවයන් සමඟ වීරරාජේන්ද්‍ර වැනි පාලකයන් බොහෝ කාලයක් රජරට පාලනය කළ නිසා විය හැක.

හින්දු ජන කණ්ඩායම් ලක්දිව යම් යම් ප්‍රදේශවල තම ආගමික පුදපූජාවන් පැවැත් වුවද එකී ඉන්දීය ඇදහිලි හා විශ්වාස ඒ ආකාරයෙන්ම ලක්දිව තුළ ව්‍යාප්ත වී නොමැත. ඒ වන විට ප්‍රබල සංස්කෘතියක පුනරුදයක් ළඟාකරගෙන සිටි බුදු සමය එකී ඇදහිලි හා විශ්වාසයන්ට ඉඩ ප්‍රස්තාව ලබා දුන්නේ ඒවායේ එන හිංසාවාදී පිළිවෙත බැහැර කරමින් බෞද්ධ සදාචාරයට අනුගත වන ආකාරයටය.

පොළොන්නරු රාජධානියේ හමුවන බොහෝ හින්දු කෝවිල් හා හින්දු ප්‍රතිමා එකී පාලන යුගයට අයත් ඒවා බව පෙනී යයි. හින්දු ආගම ප්‍රමුඛතාවය ලබාදෙන ශිව විෂ්ණු සම්ප්‍රදායන් දෙකම මෙම කාල පරිච්ඡේදය තුළ නැගී ආහ. එහෙත් එකල ඉන්දියාවේ පැවති ශිව දේව වන්දනය වැනි සංකල්පයන් ලක්දිව ස්ථාවර කිරීමට නොහැකි වූ අතර බුදු සමයට සමගාමී වූ දේව අදහස් පමණක්ම ලක්දිව තුළ ව්‍යාප්ත කිරීමට හැකි වී ඇත. ලංකාවේ ප්‍රධාන වශයෙන් පොළොන්නරු ආදී ප්‍රදේශ කිහිපයකම ශිව දේවාල නටඹුන් හමුවී තිබුණත් එම එක් දේවාලයක් හෝ වර්තමානයේ සක්‍රීය තත්වයෙන් නැත. එනම් රජ බිසෝවරුන්, හමුදා සෙබළුන් හා ඉන්දියාවේ සිට පැමිණ පිරිස් සිටින තාක් ශිව ඇදහිල්ල පැවතියත් එවැනි සංකල්පනාවන්ට දේශීය බෞද්ධ ජනයා හැඩගැසුණු ආකාරයක් නොපෙනේ.

එච්.සී.පී.බෙල් මහතා පුරා විද්‍යා කොමසාරිස්ව සිටියදී පොළොන්නරු ප්‍රදේශයෙන් විෂ්ණු දේවාල කිහිපයක්ම හඳුනාගෙන ඇත.

1. **අංක 01 විෂ්ණු දේවාලය**

   පොළොන්නරුවේ පැරණි නගරයේ ඊසාන දිග සීමාවට ආසන්නව නගර අභ්‍යන්තරයෙහි

2. **අංක 02 විෂ්ණු දේවාලය**
   පොළොන්නරුවේ පැරණි නගර සීමාවෙන් පිටත
3. **අංක 03 විෂ්ණු දේවාලය**
   මින්නේරි තෝපා වැව ආසන්නයෙහි
4. **අංක 04 විෂ්ණු දේවාලය**
   අලුත් ඔය මාර්ගයෙහි කිරිවෙහෙරට පිවිසුම් කුඩා මාර්ගයක් ආසන්නයෙහි
5. **අංක 05 විෂ්ණු දේවාලය**
   අංක 04 විෂ්ණු දේවාලය පිහිටා තිබූ ස්ථානයට සැතපුම් භාගයක් පමණ උතුරු දෙසට[1]

ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ කන්තලේ ''පොතානකඩ'' නම් ප්‍රදේශයෙන් හමුවී ඇති විෂ්ණු ප්‍රතිමාවේ හස්තයන්හි හක්ගෙඩිය, චක්‍රායුධය, යගදාව හා නෙළුම් මල දරා සිටීම විශේෂ ලක්ෂණයකි. මෙම ප්‍රතිමාව පළමුවන විජයබාහු රජුගේ හෝ නිස්සංකමල්ල රජුගේ කාලයට අයත් බව සැලකේ.[2]

පොළොන්නරු යුගය ඇතැම් අවස්ථාවලදී හින්දු ආගමික සම්ප්‍රදායන් බෞද්ධාගම සමඟ මනා සහයෝගීත්වයකින් කටයුතු කර ඇති ආකාරය පුරා විද්‍යා සාක්ෂි වලින් පැහැදිලි වේ. මහියංගන සෑයේ ධාතු ගර්භයේ සිතුවම්කර ඇති චිත්‍රය බුදුවීම දක්වන්නකි. බුද්ධත්වයට එළඹීමේදී නොයෙක් දිව්‍ය බ්‍රාහ්මණ ආදීන් බුදුන් පිදීමට රැස්වූ ආකාරය පෙන්වා විෂ්ණු දෙවියන් සිය අත් සතරින් දෑතට මල් බඳුනක් ගෙන සිටී. පරණ විතාන මහතාගේ කාල නිර්ණයට අනුව මෙම චිත්‍රය පොළොන්නරු යුගයේ පළමුවන විජයබාහු රජු විසින් මහියංගන සෑය ප්‍රතිසංස්කරණය කරන ලද අවස්ථාවේ බව චූල වංශයේ සඳහන් වේ.[3] ලක්දිව බෞද්ධ සිද්ධස්ථානයක් තුළ විෂ්ණු දේව රූපය නිර්මාණය කර ඇති ප්‍රථම අවස්ථාව ලෙස මහියංගන මහසෑයේ චිත්‍රය හඳුනාගෙන ඇත.

පොළොන්නරු ගල් විහාරයේ විද්‍යාධාර ගුහාවෙහි ඇති ප්‍රධාන ප්‍රතිමාව ධ්‍යාන මුද්‍රාවෙන් වැඩ සිටින බුද්ධ ප්‍රතිමාවකි. එහි පසු පසින් ඡත්‍රයක් එස වූ අයුරින් වියන දක්වේ. ඒ අතර විහිද ගිය ප්‍රභා මණ්ඩලය දෙපස ඉහළින් උඩුකය පමණක් දිස්වෙන දේවරූප දෙකක් නිරූපිතය. බුද්ධ ප්‍රතිමාවේ ආසනය දෙපස ඉහළින් වම්පස විෂ්ණු දෙවියන් දකුණු පසින් මහා බ්‍රහ්මයා බවත් බෙල් මහතා විසින් හඳුනාගෙන ඇත.[4] විෂ්ණු රූපයෙහි දෙඅතකින් බුදුන්ට නමස්කාර කරන ලීලාවද අනිත් දෙඅතෙහි චක්‍රායුධය හා සංකයද දක්වා ඇත. බෞද්ධ විහාර

1. බෞද්ධ ප්‍රතිමා සරය තුළට පිවිසි හින්දු දෙවියෝ - බෝගොඩ සීලවිමල හිමි
2. ශ්‍රී ලංකාවේ ථේරවාදී සම්ප්‍රදාය ආශ්‍රිතව විෂ්ණු දේව වන්දනය වර්ධනය වීම පිළිබඳ ඓතිහාසික විමර්ශනයක් - බෝගොඩ සීලවිමල හිමි
3. ශ්‍රී ලංකාවේ ථේරවාදී සම්ප්‍රදාය ආශ්‍රිතව විෂ්ණු දේව වන්දනය වර්ධනය වීම පිළිබඳ ඓතිහාසික විමර්ශනයක් - බෝගොඩ සීලවිමල හිමි
4. බෞද්ධ ප්‍රතිමා සරය තුළම පිවිසි හින්දු දෙවියෝ - බෝගොඩ සීලවිමල හිමි

මැදුරක් තුළ විෂ්ණු දේව ප්‍රතිමාවක් ඇතුළත් කර ඇති ප්‍රථම අවස්ථාවක් ලෙස විද්‍යාධාර ගුහාව පෙනීයයි.

හින්දු දෙවිවරුන් බුද්ධ වන්දනාව සිදුකිරීම පොළොන්නරු යුගයේ සාහිත්‍යයට ද එකතු වී ඇති ආකාරය ''සසඳාවතෙහි'' දම්සහා වැනුමෙහි දක්වේ. කවියාට උවමනා වී ඇත්තේ පොළොන්නරු යුගයේ පැවති හින්දු ඇදහිලි අභිබවා බුදුන්ගේ ශ්‍රේෂ්ඨත්වය කියා පෑමයි.

නැමී හිමි ගැවසී - සරණ නියරැස් පතරෙහි
සිටුතුවෙන් මෙහෙසුරු - සියකල් මුලාව බැලූ[1]

පොළොන්නරු යුගයේ සාහිත්‍ය කෘතීන් වන ''මුවදෙව්දාවතෙහි'' විෂ්ණු දෙවියන් හා සම්බන්ධ කොට කාව්‍ය සංකල්පනා ඉදිරිපත් කර තිබේ.[2]

හින්දු දේව කතාවන් නොරිස්සූ අයද මේ යුගයේ අපට හමුවේ. පපංචසූදනීයේ එන මතය නැවත වරක් පෙන්වා දෙමින් මහාභාරතයේ හා රාමායනයේ එන කතා නිරර්ථක ඒවා ලෙස ගුරුළුගෝමි විසින් අමාවතුරෙහි පෙන්වා දෙනු ලැබීය.[3]

සමස්තයක් වශයෙන් ගත්විට පොළොන්නරු යුගයේ විෂ්ණු ඇදහීම වර්ධනය වී තිබුණු බව ප්‍රකටය. එහෙත් ස්වකීය ආධිපත්‍ය යටතේ විෂ්ණු ඇදහීම බෞද්ධාගම විසින් කිසියම් දුරකට අන්තර්ගත කරගත් ආකාරයද දක්නට ලැබේ.

**මහා පරාක්‍රමබාහු රජතුමා (ක්‍රි.ව.1153-1186)**

පොළොන්නරු යුගයේ රාජ්‍ය පාලකයින් අතර මහා පරාක්‍රමබාහු රජතුමා ඉතිහාසයට එක්වන්නේ විශිෂ්ටතම රාජ්‍ය පාලකයෙක් ලෙසිනි. මුළු දිවයිනටම එකම පාලකයා බවට පත් මෙතුමා ලක්දිව සිව්දෙස අභිවෘර්ධිය වෙනුවෙන් රට එක් සේසත් කළ නරපතියෙකි. එහෙත් ඔහු අභාවයට පත් වන්නේ සිහසුන දැරීමට අනුප්‍රාප්තිකයෙකු නොමැතිවය.

**දෙවන විජයබාහු රජතුමා (ක්‍රි.ව.1186-1187)**

මහා පරාක්‍රමබාහු රජතුමාගේ සහෝදරියකගේ පුත්‍ර රත්නයක් වූ විජයබාහු කුමරු දෙවන විජයබාහු නමින් රාජ්‍යයත්වයට පත් වුවද ඔහුගේ රාජ්‍ය පාලනය වසරකට සීමා වේ. සයවැනි මහින්ද නම් කෙනෙකු ඔහු ඝාතනය කරනු ලැබීය.

**සයවැනි මිහිඳු රජතුමා (ක්‍රි.ව.1187)**

සයවැනි මිහිඳු රජතුමා රාජ්‍යත්වය ලබාගෙන දින පහක් පමණක් රට කරවූ රජ කෙනෙකි. දෙවන විජයබාහුගේ යුවරජු වූ නීත්‍යානුකූල රාජ්‍ය අනුප්‍රාප්තිකයා වූද කාලිංග වංශික කීර්ති නිශ්ශංක කුමාරයා විසින් ඔහු මරා දමන ලදී.

1. සසඳාවත - කේ.ඩී.පී.වික්‍රමසිංහ - 1954
2. මුවදෙව්දා විවරණය - මුනිදාස කුමාරණතුංග පද්‍ය 62
3. අමාවතුර - කෝදාගොඩ ඤාණාලෝක හිමි 93 පිට - 1959

## කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල රජතුමා (ක්‍රි.ව.1187-1196)

වසර නවයක පමණ කාලයක් රාජ්‍ය කර වූ කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල රජතුමා මහා පරාක්‍රමබාහු රජුගෙන් පසු රාජ්‍යත්වයට පැමිණි සාර්ථක පාලකයෙක් බවට පිළිගැනේ. මූලාශ්‍රයන්ට අනුව නිශ්ශංකමල්ල රජතුමාගේ ජාතභූමිය කාලිංගයේ සිංහපුරයයි. එබැවින් ඔහු කාලිංග වංශිකයෙකි. ඔහුගේ මව පාර්වතී මහ දේවිය වන අතර පියා ජයගෝප මහාරාජා ලෙසින් සඳහන් වී ඇත. ඔහුගේ මව්පියන් ඉන්දීය ඉතිහාසයේ පාලකයන් සේ සඳහන් නොවූ වා සේම නිශ්ශංකමල්ල රජතුමා ද ශ්‍රී ලංකාවේ රාජ පරම්පරාවට සබඳතාවයක් නොපවතී.

දෙවන විජයබාහු කුමරා රාජ්‍යත්වය ලබා ගැනීමට පැමිණෙන්නේ කාලිංග දේශයේ සිටය. දෙවන ගජබාහු හා පරාක්‍රමබාහු රජවරුන් අතර යුද්ධ පැවති සමයේදී දෙවන ගජබාහුගේ පවුලේ අය කාලිංග දේශයට පලා ගිය අතර විජයබාහු කුමාරයා ද ඒ සමඟ ගෙනයන්නට ඇතැයි පිළිගැනේ.

එබැවින් විජයබාහු කුමරු සමඟ නිශ්ශංකමල්ල රජු කාලිංග දේශයේ සිට පැමිණෙන්නට ඇතැයි විශ්වාස කෙරේ. විජයබාහු රජුගේ උප රජු ලෙස කටයුතු කිරීමට ආරාධනා කර ඇත්තේ විජයබාහු රජු විසින්මය. විදේශිකයෙක් වශයෙන් ඔහුගේ පාලනය පිළිබඳව ජනතාවගෙන් එතරම් ප්‍රසාදයක් හිමි වී නැත. එහෙත් ජනතා ප්‍රසාදය ලබාගෙන කටයුතු කිරීමට මහත් උත්සාහයක් දරා ඇති බව පෙනේ. නිශ්ශංකමල්ල රජතුමා ස්වකීය රාජ්‍ය කාලය තුළ චාරිකාවේ නිරත වූ රජ කෙනෙක් වශයෙන් ප්‍රසිද්ධය. එම රාජකීය චාරිකාවේදී ප්‍රාදේශීය හා පළාත් මට්ටමින් ජනතාවගේ මූලික අවශ්‍යතා සොයා බලා සම්පූර්ණ කර දීමට ද පියවර ගෙන ඇත.

නිශ්ශංකමල්ල රජතුමා හින්දු භක්තිකයෙකු බව මීට පෙරද සඳහන් කර ඇත. එහෙත් හින්දු දේව ඇදහිලි විශ්වාස කෙරෙහි මෙරට ජනතාව යොමු කිරීමට මේ යුගයේ ගත් උත්සාහය සාර්ථක වී නොමැත. එවැනි සංකල්පනාවන්ට දේශීය බෞද්ධ ජනයා හැඩගැසුණු ආකාරයක් නොපෙනේ. මෙකී ස්වභාවය මැනවින් අවබෝධ කරගත් පොළොන්නරු යුගයේ දක්ෂ පාලකයා වූයේ ද නිශ්ශංකමල්ල රජතුමාය.

පොළොන්නරුවේ ඉදි වූ ශිව දේවාල කිහිපයකම මෙතුමාට පෙර ඉදි වූ ඒවාය. රජතුමාගේ කල්පනාව වූයේ ශිව දේවාල ආදිය ඉදිකොට දේශීය ජනයාගෙන් ඈත්වීම නොව දේශීය ජනයා සංවේදී වන කරුණු සිදුකොට ඔවුන්ට තව තවත් සමීප වීමයි. එසේම එමගින් තමන්ගේ හා අනාගතයේ රජවන තම අනුප්‍රාප්තිකයාගේ පාලන තන්ත්‍රය ස්ථාවර කර ගැනීමයි. එබැවින් බෝසත්වරයෙකු ලෙස කටයුතු කිරීමට මෙතුමා උත්සාහ දරා ඇත. එසේ වුවත් මෙතුමා ද සම්පූර්ණයෙන්ම හින්දු දේව වන්දනාවෙන් බැහැර වූ බව කල්පනා නොකළ යුතුය. විශේෂයෙන්ම රංගිරි දඹුලු ලෙන් විහාරය ඉදිකර මෙතුමා ඒ

ආශ්‍රිතවම විෂ්ණු දේවාලයක් ද ඉදිකර ඇත. වර්තමානයේදී දඹුලු විහාරයේ විෂ්ණු දේවාලයක් පවතින්නේ ඒ නිසාවෙනි.

නිශ්ශංකමල්ල රජතුමා පසුකාලීනව බෞද්ධයෙකු වූවත් එසේ බෞද්ධයෙකු වීම එතුමාගේ දේශපාලනික පරමාර්ථයක් විය හැකිය. එහෙත් එතුමා උපතින්ම හා පරපුරෙන් විෂ්ණු දේව භක්තිකයෙකු වන්නට ඇති බව පැහැදිලි වේ. ලක්දිව බොහෝ ප්‍රදේශවල දක්නට ලැබෙන පුරාණ විෂ්ණු දේවාල ආශ්‍රිතව කළ පුරාවිද්‍යා සොයා බැලීම් අනුව මෙකී දේවාලයන්ගේ ඉතිහාසය පොළොන්නරු යුගය දක්වාම දිවයන්නකි. එසේ වුවත් පළමුවන විජයබාහු රජුට එතරම් දීප ව්‍යාප්ත කටයුත්තක් සිදු කිරීමට කාලයක් නොතිබුණ අතර පළමුවන පරාක්‍රමබාහු රජුගේ කාර්යය සංසිද්ධිය ද එවැන්නකට අවස්ථාවක් නොවීය. ඒ අනුව පැහැදිලි වන්නේ මේ කටයුත්තේදී දැඩි කාර්ය භාරයක් නිශ්ශංකමල්ලයන් විසින් ඉටුකළ බවයි.

නිශ්ශංකමල්ල රජතුමා ලක්දිව සෑම ප්‍රදේශයකම සංචාරය කරන අතරවාරයේ හමුවන වෙහෙර විහාර වැඳපුදාගත් බව සඳහන් වේ. එකී වෙහෙර විහාර සඳහා නොයෙක් පුද පූජාවන් ද සිදු කරනු ලැබීය. මෙසේ වන්දනාවේ යෙදුණු නිශ්ශංකමල්ලයන් බෞද්ධාගමික වෙහෙර විහාර හා බැඳුණු දේව සංකල්පගත පුද පූජාවන් හා කටයුතු වලටද තම අනුග්‍රහය ලබාදුන් බව පැහැදිලිය. මෙසේ විහාර චාරිකාවේ නියුතු නිශ්ශංකමල්ලයන්ගේ වන්දනා ගමන පොළොන්නරුවේ සිට වර්තමාන දකුණු පළාත දක්වාම ව්‍යාප්ත විය. බොහෝ දුරට එතුමාගේ වන්දනා ගමන වනාහි එතුමා විසින්ම සම්පාදනය කළ සංචාරයක් බව ශිලා ලිපි වලින් පැහැදිලි වේ.

**දඹුලු වන්දනාව**

නිශ්ශංකමල්ල රජතුමා කහවණු ලක්ෂයක් වියදම්කොට ප්‍රතිමා ද පිළිසකර කර රන් ආලේප කර දඹුලු විහාරය වැඳපුදා ගත් බව දඹුලු ලෙන අසලම ඇති පර්වතයේ කොටා ඇති ලිපියෙහි දැක්වේ.

**සමනළ පර්වතය වැඳපුදා ගැනීම**

සමනළ කන්දේ ශ්‍රී පාදය පද්මයට යාබද පර්වතයෙහි හැටන් පාර දෙසින් වූ ගල් කුළ මත කොටා ඇති සෙල් ලිපියේ රාජ්‍යත්වයෙන් නවවන වර්ෂයේ ශ්‍රී පාද වන්දනාවේ ගිය බව සඳහන් වේ. දෑත් එක්කොට මදක් නැමී වන්දනා කරනු ලබන රාජ රූපයක් ද පර්වත සටහන්වල දක්නට ලැබේ.

මේ අනුව නිශ්ශංකමල්ලයන්ගේ වන්දනාව වනාහි පොළොන්නරුව, දඹුල්ල, ශ්‍රී පාදය, කතරගම, දෙවිනුවර, හලාවත, පඬුවස්නුවර හා අනුරාධපුරය වශයෙන් සිදුකර ඇත. එතුමාගේ වන්දනාව වනාහි බෞද්ධාගමික වන්දනාවක්ම වූවා යැයි සිතිය නොහැකිය. එහි දේව වන්දනයට ද යම්තැනැක් හිමි වූ බව පෙනේ. දඹුල්ල විෂ්ණු වන්දනය, ශ්‍රී පාද අඩවියෙහි සමන් දේව වන්දනාව, දෙවි නුවර විෂ්ණු දේව වන්දනාව, කැලණිය විභීෂණ වන්දනාව, හලාවත මුන්නේශ්වරම් දේවාලය ආදී

බෞද්ධාගමික නොවන වන්දනාවන් ද රජු අතින් සිදු වන්නට ඇත. එසේම මේ ගමන් මාර්ගය තුළ සඳහන් නොවන තවත් පූජනීය ස්ථාන රාශියක්ම තිබෙන්නට ඇති බවත් රජතුමා ඒවාට නොයෙක් උපකාර කරන්නට ඇති බවත් පැහැදිලිය.

## නිශ්ශංකමල්ල රජුගේ තුලාභාර දානය

නිශ්ශංකමල්ල රජතුමා දන් දීමට මහත් කැමැත්තක් දක් වූ නිසා දානශාලා පිහිටුවා මහ දන් පැවැත්වීමට ප්‍රාදේශීය අමාත්‍යවරු පවා පත්කර තිබූ බව සඳහන්ය. එතුමා විසින් නිතර නිතර සිදුකළ ප්‍රධාන දානයක් වන්නේ ''තුලාභාර දානයයි'' එනම් එක් පුද්ගලයෙකුගේ ශරීර බරට බොහෝ වස්තු සහිත අවශ්‍ය ද්‍රව්‍ය ප්‍රදානය කිරීමයි. ඒ අනුව රජතුමාගේ කාලිංග වංශික කාල්‍යාණ මහා දේවිය, සුභද්‍රා දේවියගේ බරට, රජතුමාගේ පුත්‍ර වීරබාහු කුමරුගේ බරට, වීරබාහු කුමරුගේ දියණිය වූ සර්වාංග සුන්දරීගේ බරට ත්‍යාග ප්‍රදානය කොට තුලාභාර මහ දානය පවත්වා ඇත.[1]

මෙයට අමතරව දුගීමගී යාචකාදීන් සුඛිත මුදිත කිරීමට හා ප්‍රාදේශීයව ජීවත්වන මහ ජනතාවගේ මූලික අවශ්‍යතා වෙනුවෙන් සිදුකළ රන්, රිදී, මුතු මැණික් සහිත වස්තු දානයන් පිළිබඳව සෙල්ලිපිවල සඳහන් වේ. කලින් සඳහන් කළ රජතුමා අතිශයින් ප්‍රියකළ තුලාභාර දානය රටපුරා පැවැත් වූ රාජකීය චාරිකාවේදී ඒ ඒ පළාත් භාර අමත්‍යවරුන්ගේ නොමඳ සහායක් ලබාගෙන ඇත.

පොළොන්නරුව සිට දෙවිනුවරට යන චාරිකාවේදී රයිගම් පුරවරයට ඇතුල් වී ඕලබොඩුව බෝගහවත්ත නමින් අද හඳුන්වන ග්‍රාමවරයෙහි පිහිටි ඓතිහාසික පුණ්‍ය භූමියෙහි තුලාභාර දානය අපට විශේෂයෙන් වැදගත් වේ. එකී දෙවිනුවර චාරිකාවේම රයිගම් කෝරළය පසුකර පස්යොදුන් කෝරළයට අයත් වෙල්ගම ග්‍රාමවරයෙහි ද මෙකී විශේෂ දානය පවත්වා ඇත. මහාවංශය සඳහන් කරන වෙල්ගම මේ වෙල්ගම බවට පිළිගැනීමට ද සාධක ඇත.

1. දොරටියාව සන්නස - රුවන්වැලි දාගැබෙන් සොයාගත් සෙල්ලිපිය

# 2 - 3
# රයිගම්පුර ඔලබොඩුවේ පිහිටි මහා දේවාලය



උපුල්වන් ශ්‍රී විෂ්ණු මහා දේවාලය - (පුරාවිද්‍යා ස්මාරකයකි)

රයිගම් කෝරළයේ පිහිටි හොරණ පුරවරයට අතීතයේ සිටම හිමි වී ඇත්තේ ප්‍රමුඛස්ථානයකි. කළුගං මිටියාවතට නුඳුරුව පිහිටි මෙම ප්‍රදේශය සමනළ කන්දේ දකුණු හා බස්නාහිර බෑවුමයි. මෙහි ආගමික හා සංස්කෘතික නවෝදය වනාහි පුරාණ ප්‍රාග් යුගය දක්වාම ඈතට දිවයන්නේය. මහින්දාගමනයෙන් පසුව ලක්දිව තුළ මතු වූ බෞද්ධ ආගමික ප්‍රබෝධය මෙම දකුණුදිග ප්‍රදේශයේ ද ව්‍යාප්ත විය. පොළොන්නරු යුගයේ නිශ්ශංකමල්ල වැනි පාලකයන්ගේ වන්දනා සංචාරයන් ද මේ ප්‍රදේශ ආශ්‍රිතව සිදු වී ඇත. එකලම අපගේ ආගමික හා සංස්කෘතික පුනරුදය ද මේ ප්‍රදේශවල ව්‍යාප්ත වන්නට ඇත. විශේෂයෙන් මේ අතර නිශ්ශංකමල්ල යුගය ඉතා වැදගත් ස්ථානයක් ගනු ලබන්නේය. නිශ්ශංකමල්ල යුගයේ ඇති වූ ආගමික ප්‍රබෝධය ශ්‍රී පාදය ආශ්‍රිත ප්‍රදේශයන්හි පවා ව්‍යාප්ත වී ඇති බව පෙනේ. ශ්‍රී පාදය පිහිටා ඇති කන්දට දකුණින් පිහිටි ප්‍රදේශයත්, බස්නාහිරින් පිහිටි ප්‍රදේශයත් මේ අතර ප්‍රධාන තැනක් ගන්නේය.

මේ අනුව දකුණු ප්‍රදේශය වූයේ වර්තමාන රත්නපුර, පැල්මඩුල්ල, කලවාන, දෙවුන්දර, වැලිගම, කතරගම ආදී ප්‍රදේශයි. බස්නාහිර බෑවුම වන්නේ අවිස්සාවේල්ල ආශ්‍රිත කැලණි මිටියාවත හා හොරණ කළුතර දක්වා වූ කළුගං මිටියාවතයි. මේ දෙමිටියාවතේ තත්කාලීන ආගමික පරිසරය වනාහි ඉතා පෞරාණික වූවකි. එය මහින්දාගමනයටත් වඩා ඈතට දිව යන්නක් බව පුරා විද්‍යා හා සමාජ ජනප්‍රවාද වලින් පැහැදිලි වේ. අප ගෞතම බුදුරජාණන් වහන්සේ දිවාගුහාවට වැඩමවන ගමනේ උන්වහන්සේ ඇතුළු භික්ෂු මහා සංඝයාට දන්වැට පැවැත් වූ පුවතක් ද පවති.

මෙම ප්‍රදේශයේ බෞද්ධ පසුබිම බොහෝ ඈතට දිව යන්නට තවත් හේතු කාරණාවක් වන්නේ තථාගතයන් වහන්සේගේ ලංකාගමනයෙන් පසු බෞද්ධයෙකු වූ සුමන සමන් දිව්‍යරාජයාගේ පාලන ප්‍රදේශය මේ වන අතර ඔහු දේවත්වයෙන් සැලකූ පසු මේ ප්‍රදේශය භාර ප්‍රදේශාධිපතිවරයා වශයෙන් ද සඳහන් වී ඇත. සුමන සමන් බෞද්ධයෙකු වූවානම් මේ ප්‍රදේශගත ජනයා බෞද්ධ නොවීමට හේතු සාදක නොමැත්තේය. එබැවින් ලක්දිව පුරාණතම බෞද්ධයන් වාසය කළ ප්‍රදේශය ලෙස සැලකිය හැකි වන්නේ මේ කැලණි ගං මිටියාවත හා කළුගං මිටියාවතයි.

මෙකී කළුගං මිටියාවතේ පෞරාණික වෙහෙර විහාරයන් පිහිටි පුරාණතම භූමි ප්‍රදේශයක් ලෙස කළුතර ප්‍රදේශය පෙන්වා දිය හැකි වන්නේය. මේ ප්‍රදේශය ආශ්‍රිතව එනම් මධ්‍යකාලීන බෙදීම් අනුව මෙම ප්‍රදේශය රයිගම්පුර රාජධානියයි. රයිගම්පුර මහ දේවාලය නමින් කතා කරන්නේ ඔලබොඩුව බෝගහවත්තේ පිහිටි උපුල්වන් ශ්‍රී විෂ්ණු මහා දේවාලයයි. වර්තමානය වන විට මෙම ඓතිහාසික දේවාලය ඔලබොඩුව රජ මහා විහාරය ආශ්‍රිතව පිහිටා ඇත්තේය. එහෙත් සිදු වී ඇත්තේ එවැන්නක් නොව මහ දේවාලය පිහිටි පූජා භූමියෙහි පසුකාලීනව රජ මහා විහාරයක් ස්ථාපිත වීමයි.

ඔලබොඩුව රජ මහා විහාරස්ථානය ආශ්‍රිතව උපුල්වන් ශ්‍රී විෂ්ණු මහා දෙවිඳුන් උදෙසා දේවාල මන්දිර දෙකක් නිර්මාණය වී ඇත. එක් දේවාලයක් වන්නේ පෞරාණික විහාර මන්දිරයෙහි වම්පස පිහිටි පුරාවිද්‍යා ස්මාරකයක් වන පෞරාණික මහ දේවාලයයි. අනෙත් දේවාලය වන්නේ පොළොන්නරු යුගයට අයත් නිශ්ශංකමල්ල රජ දවස ඉදිකරන්නට ඇතැයි පිළි ගැනෙන ශිලාමය පාදමක ගොඩනගා ශිලාමය ප්‍රතිමාවක් තැන්පත් කර තිබූ ඓතිහාසික උපුල්වන් ශ්‍රී විෂ්ණු මහා දේවාලයයි. වර්තමානයේ අපට දැකිය හැකි වන්නේ නෂ්ඨාවශේෂව පැවති එකී දේවාලය ප්‍රති නිර්මාණය කර තිබීමයි. ප්‍රතිනිර්මාණය කර ඇති නව දේවාලය ද ශෛලමය නිර්මාණයන්ට මුල්තැන දෙමින් ගොඩනගා ඇත.

## ඔලබොඩුව ග්‍රාම නාමය

ඔලබොඩුව වනාහි දේවාලය පිහිටීම නිසා බොහෝ ඉතිහාසයකට හිමිකම් කියන ග්‍රාමවරයක් බව පැහැදිලිය. එහෙත් මෙම ග්‍රාමවරයේ නාමය හා සම්බන්ධයෙන් වර්තමාන වියතුන් කිහිප දෙනෙකු ඉදිරිපත් කර ඇති අදහස නොමග යවන සුළුය. ඔවුන් අදහස් කරන්නේ රයිගම්පුර සමාන්ත පාලක රජතුමාගේ කොණ්ඩය හා රැවුල් කපන ලද කරණවෑමියා වාසය කළ මෙම ප්‍රදේශය ඔලබොඩුව වූ බවයි. දිනක් කරණවෑමියා රජුගේ රැවුල කපන විට බෙල්ලේ තැනක් තුවාල වී ලේ ගලන්නට විය. මේ අවස්ථාවේ රජු බොලබොටුව බොලබොටුව යනුවෙන් පවසමින් කෑගසා ඇත. මේ බොලබොටුව ඔලබොඩුව වූ බව ඔවුන්ගේ අදහසයි. එහෙත් එම අදහස නොමග යවන සුළුය. අප විසින් විද්වතුන් කිහිප දෙනෙකුම සමඟ කළ සාකච්ඡාවේදී පැහැදිලි වූයේ මේ බොලබොටුව වනාහි බණ්ඩාරගම ගම්මන්පිල අසල ප්‍රදේශයේ පිහිටි බොලබොටුව බවයි. මේ ග්‍රාමය බොලබොටුව නොව ඔලබොඩුවයි. ඔලබොඩුව පෞරාණික වැව වටා බොලබොටු නම් ශාඛ විශේෂයක් වැවී තිබූ හෙයින් බොලබොටු වැව, බොලබොඩු වැව, ඔලබොඩුව වී ඇති බව ජනප්‍රවාදයේ සඳහන් වන්නකි. පුරාණයේ ග්‍රාම නාමයන් සකස් වන්නේ වැවක් හෝ විහාරයක් මුල්කරගෙනය. එබැවින් ජනප්‍රවාදගත අදහස සාධාරණය. තවද පන්නිල වෙල්යාය ඉස්මත්තේ වැඩුණු ශාඛ විශේෂයක් නිසා මේ නම ඇති වූ බවට අදහසක් ද ඇත.[1] කෙසේ වෙතත් පෙර නොමඟ යවන සුළු ප්‍රකාශයේ සඳහන් පරිදි ඔලබොඩුව යන නාමය රයිගම්පුර යුගයේ බිහිවූවක් නොවේ. එය පොළොන්නරු යුගය දක්වා ඈතට දිවයයි.

ඔලබොඩුව ඓතිහාසික මහ දේවාල භූමියෙහි ඉතිහාසය ආර්ය සංක්‍රමණයටත් වඩා ඈතට දිව යනු ලබන්නේය. ලක්දිව ප්‍රාග් ඓතිහාසික යුගය පිළිබඳව පර්යේෂණ කරනු ලබන විද්වතුන්ගේ අදහස වනුයේ ද මෙහි ඉතිහාසය බොහෝ ඈතට දිවයනු බවයි. සමන් දිව්‍ය රාජයා ලෙස වැඳුම් පිදුම් කරන දෙවියන් එකල සමන්ගිර පර්වතය ආශ්‍රිතව මේ ප්‍රදේශයේ පාලකයා වූ දේව වංශික ප්‍රදේශාධිපතියෙකු වූ බැවින් ඔහුගේ කාලයේ පවා මේ ප්‍රදේශය ජනාවාස වී තිබුණ බවත්ය.

තව ද මෑත කාලයේ එක් ජනශ්‍රැති පර්යේෂකයෙකු විසින් කළ පර්යේෂණයක් අනුව රාවනා යුගයට අයත් ලක්ෂණයන් ද මේ පූජා භූමියේ පවතින බව තහවුරු කළේය. එනම් පුරාණ යක්ෂ ගෝත්‍රික පාලකයන්ගේ ලාංඡනය වූ ත්‍රිකූටය මේ භූමියේ පිහිටා තිබීමයි. මේ ත්‍රිකූටයෙන් එක් ගල් පර්වතයක් මේ පරීක්ෂණයට පෙර නොදන්නාකමින් අතීතයේදී කළ සංවර්ධන කටයුතු වලදී ඉවත් කොට ඇති බව පෙනේ. ඉවත් කරන ලැදැයි සිතිය හැකි ගල් පර්වතයේ පුරාණ ශිලා ලේඛනයක ශේෂ වූ කොටසක් පමණක් වර්තමානයේදී අපට දැකගත හැක.

ඔලබොඩුව වනාහි නිශ්ශංකමල්ල රජුගේ චාරිකාගත මාර්ගය ආශ්‍රිතව පිහිටි භූමියක් බව මීට පෙර ද සඳහන් කර ඇත. ඒ අනුව එතුමාගේ තුලාභාර දානය

1. ඔලබොඩුවේ ශ්‍රී ධම්මානන්ද මාහිමිපාණන් සමඟ පැවැත් වූ සාකච්ඡාවකිනි

මේ බිමෙහි මහ දේවාලයට මූලික වී ඇත. නිශ්ශංකමල්ල රජ සමයේ එතුමාගේ නියමයෙන් මෙම ප්‍රදේශය පාලනය වූයේ ප්‍රාදේශීය අමාත්‍යවරයෙක් යටතේය. අමාත්‍යවරයා විසින් රජතුමාට විවේක ගැනීමටත් තුලාභාර දානය ප්‍රදානයටත් මෙම පූජා භූමියම තෝරාගෙන ඇත්තේ අද වුවත් කාටත් දැනෙන ආකර්ශනීය ආගමික පරිසරයක් පැවති ස්ථානයක් බව ප්‍රකට වන බැවිනි.

පුරාණයේ සිට ගම්භාර දේව වන්දනාවට ද ප්‍රධාන තැනක් හිමිකර ගෙන ඇති මෙම ස්ථානය දේව ඇදහිල්ලට සුදුසු වටපිටාවකින් සකස් වී තිබුණු බැවින් නිශ්ශංකමල්ලයන් මෙම පූජා භූමියෙහි මහ දේවාලය ඉදිකරන්නට ඇති බව සිතිය හැක. ප්‍රාග් ඓතිහාසික යුගය දක්වාම ඈතට දිවයන ඉතිහාසයක් පවතින මෙම පුණ්‍ය භූමිය වනාහි බුදු සමයේ අභිවර්ධනයට පමණක් නොව දේව සමයේ අභිවර්ධනයට ද  ඉතාම යෝග්‍ය භූමියක්ය යන අදහස මැනවින් තහවුරු වන්නේය.

මේ අනුව බලන කළ කාලිංග වැසියෙකු වූ නිශ්ශංකමල්ල රජතුමා විෂ්ණු දේව වන්දනාවට ප්‍රමුඛත්වය දීම පුදුමයට කරුණක් නොවේ. ලක්දිව රාජ්‍යත්වයට පත්වීමෙන් පසුව බුදු දහමට ප්‍රමුඛත්වය දෙනු ලැබුවත් විෂ්ණු දෙවියන්ගේ ආශිර්වාදය ලබා ගැනීම පිණිස රජතුමා මහත් වූ උනන්දුවක් දක්වා ඇති බව පැහැදිලිය.එම නිසා එතුමා විසින් ලක්දිව විෂ්ණු දේවාල ඉදිකිරීම පිණිස උත්සුක වූ අතර බෞද්ධයන්ගෙන් මේ සඳහා බාධාවක් එල්ල වූ බව නොපෙනේ. එබැවින් බෞද්ධ විහාර ආරාම ආශ්‍රිතව ද විෂ්ණු ප්‍රතිමා ඉදිකිරීම පිණිස රජතුමා කටයුතු කර ඇත. එසේම විෂ්ණු දේවාල පමණක් ඉදි වූ ස්ථානවල බෞද්ධ විහාර සහිත ආරාම ඉදිකරන්නට ද රජතුමා කටයුතු කර ඇති බව පැහැදලිය. එසේ නොවුනු තැන් ද පසුකාලීනව බෞද්ධ මධ්‍යස්ථාන බවට පත්වී බුදු සමය හා විෂ්ණු දෙවියන් අතර පවතින ඓතිහාසික සම්බන්ධය පදනම් කරගෙනය. එබැවින් රජතුමාගේ තුලාභාර දානයේ ප්‍රතිඵලයක් ලෙස ඔලබොඩුව බෝගහවත්තේ ඉදිවූ රයිගම්පුර ඓතිහාසික උපුල්වන් ශ්‍රී විෂ්ණු මහා දේවාලය සඳහන් කළ හැකිය.

ශතවර්ෂ ගණනාවක්ම විවිධ වූ රජවරුන් හා ප්‍රභූ පවුල්වල ආධාර උපකාර ලබමින් ලක්දිව සිව්දෙසින් පැමිණෙන ජනී ජනයාගේ ගෞරවණීය පූජා භූමියක් ලෙස රයිගම්පුර උපුල්වන් ශ්‍රී විෂ්ණු මහා දේවාලය විරාජමාන විය. ඒ අතර ප්‍රධාන යුග පරාසයක් වන්නේ ගම්පොළ හා කෝට්ටේ යුගයයි. ගම්පොළ යුගයේ ගම්පොළ වාසය කළ සේනාධිලංකාර පරපුර හා රයිගම සිටි අලගක්කෝනාර පරපුර මේ දේවාලයට අනුග්‍රහය දක්වමින් පුද පූජා සිදුකළ බව පැහැදිලිය. අලගක්කෝනාර පරපුරේ සිටි අලකේශ්වර නම් අමාත්‍යවරයා ශෛලමය විෂ්ණු ප්‍රතිමාවක් මේ ස්ථානයේ ඉදිකළ බවට පුවතක් පවතී. සමහරවිට එම අදහස තහවුරු කරන්නේ අලකේශ්වරයන් මේ දේවාලය ප්‍රතිසංස්කරණය කළ බවට දැක්වෙන ප්‍රවෘත්තියයි. එතැන් සිට මේ මහා දේවාලය බොහෝ දෙනාට සෙත සලසමින් ක්‍රියාත්මක වී ඇත්තේ රයිගම්පුර මහ දේවාලය නමිනි.

ශෛලමය දේවාලයක් ඉදිවෙන්නට පෙර සිටම මෙම ස්ථානයේ මහ දෙවිඳුන් උදෙසා පහන් දැල්වීම, පූජා පැවැත්වීම, භාරහාර වීම, පඬුරු වෙන් කිරීම ආදී ආශිර්වාද ලබා ගැනීම සිදුකර ඇත. එකී ආශිර්වාදය ලබාගෙන ඇත්තේ වර්තමානයේද පූජා භූමියේ වැඩ සිටින ඓතිහාසික නා බෝධි වෘක්ෂය මුල් කරගෙනය. මෙය ඔලබොඩුව රජ මහා විහාර භූමියේ ඇති පෞරාණිකම වස්තුවකි. දකුණට, උතුරට, නැගෙනහිරට හා බස්නාහිරට ගමන් ගන්නා ප්‍රධාන ගමන් මාර්ග ජාලය පිහිටා තිබුණේ මෙම ඓතිහාසික පුදබිම ආශ්‍රිතවය. එබැවින් වෙළෙඳුන්, ගැල් කරුවන්, යුධ භට පිරිස් සේනාවන් සහිත ජනී ජනයාගේ විවේකස්ථානය වූයේ ද මෙම පුණ්‍ය භූමියයි. විවේක ගෙන වෙහෙස නිවා ගමනට අවශ්‍ය පහසුකම් සපුරාගෙන මෙම නා බෝධි වෘක්ෂයේ ආශිර්වාදය ලබාගෙන ගමන් ආරම්භ කිරීම පුරාණ චාරිත්‍රයක් ලෙස ජනප්‍රවාදයේ දක්නට ලැබේ.

ඔලබොඩුව ඓතිහාසික මහ දේවාල පූජා භූමියෙහි වර්තමාන බෞද්ධ පසුබිමට මුල් වූයේ ද මෙම පූජා භූමිය ආශ්‍රිත ගමන් මාර්ගයයි. වැලිවිට අසරණ සරණ සරණංකර සඟරජ පෙළපතේ භික්ෂූන් වහන්සේලා පහත රටට වැඩමවීමේ ගමන් මඟ පිහිටි දේවාලය සහිත භූමිය ආවාසයක් ලෙස භාවිතා කළ බව වීදියගොඩ සඟ පරපුර විකාශන පරිච්ඡේදයේද සඳහන් කර ඇත.

විශේෂයෙන් රජරට වැඩසිටි භික්‍ෂූන් වහන්සේලා රෝහණය බලා වැඩමවන පුරාණ මාර්ගය වූයේ මහියංගනය මහවැලි ගංගාව තරණය කොට නැගෙනහිර දෙසින් බුත්තල කතරගම හරහාය. එහෙත් මේ වන විට ලක්දිව බස්නාහිර වයඹ ප්‍රදේශයන් ද ජනාවාස වී තිබුණු බැවිනුත් පෙර මාර්ගයේ පැවැති දුෂ්කරතාවය නිසාත් කුරුණෑගල, කැලණිය, හොරණ, රයිගම හරහා රෝහණයට වැඩම කිරීමේ නව ගමන් මාර්ගයක් විවෘතව තිබෙන්නට ඇත. මෙකී ගමන් මාර්ගය තුළ පිහිටි රයිගම්පුර උපුල්වන් මහ දේවාල භූමිය එසේ උතුරට හා දකුණට වැඩමකළ භික්ෂු සංඝයාගේ නැවතුම් පලක් වී ඇත. එයම පසුකාලීනව භික්ෂූන්ගේ ආවාසයක් ඉදිවීමට ද හේතු වන්නට ඇත.

**ගම්භාර දේවාලය**

ලක්දිව පවතින පුරාණ වූ අනාර්ය වූ දේව විශ්වාසයක් වන ගම්භාර දේව පූජාව හා සම්බන්ධ කරුණු ද මේ භූමිය ආශ්‍රිතව පිහිටා තිබේ. ගම්භාර යනුවෙන් ද ඔඩ්ඩිස යනුවෙන් ද හඳුන්වනු ලබන මේ දේව සංකල්පය ලංකාවේ අනාර්ය වූ යක්ෂ ගෝත්‍රික ජනයා විසින් පුද පූජා කළ, වැඳුම් පිදුම් කළ දේව සංකල්පයක් ලෙස හඳුනාගෙන ඇත්තේය. මෙම සූනියම් දේව සංකල්පයේ බලවත්වීම සම්බන්ධව පුරාණ යාග ගීතිකාවලින් ද පැහැදිලි වේ.

ඒ අනුව මහා සම්මත රජුගේ අග බිසව වූ මැණික්කඳ බිසවුන්ට හටගත් රෝග උපද්‍රවයකට පිළියම් කිරීම පිණිස ඍෂිවරුන් නව දෙනෙකු කැඳවා ඇත. එහෙත් මේ බිසවට ඇතුල් වී තිබුණ විෂ බන්ධනයට අධිපති වසවර්ති පොළඟා



ගම්භාර දේව මන්දිරය

බිසවගේ පිටුපසින් රියන් දහඅටක් උසට පෙනී සිටි අතර මෙයින් බියට පත් වූ ඍෂිවරුන් නව දෙනාම සිහිසුන් වූහ. පසුව රජුගේ වෛද්‍යවරයා වූ ජීවක පැමිණ ජලය ඉස ඍෂිවරුන්ට නැවතත් සිහිය ලබාදුන් අතර බිසවගේ විනය කැපීමට ඔවුන්ට නොහැකි විය. අනතුරුව මහා සම්මත රජතුමා විෂ්ණු දෙවියන්ගේ ආශිර්වාදයෙන් ඔඩ්ඩිස නැමැත්තා ගෙන්වාගෙන රජ බිසවගේ විනය කපා සුවපත් කරවීය. මේ ඔඩ්ඩිස ගම්භාර දෙවියන්ගේ විස්තර කතාවයි.

බොහෝ දුරට ලක්දිව වාසය කළ දෙවි කෙනෙකු ලෙස ගම්භාර දෙවියන් සම්බන්ධ දේවාලයක් හා පෞරාණික භූමියක් අද දක්වාම මේ පූජා භූමියට බද්ද වී පවති. ඒ අනුව මේ ගම්භාර දේවාලයේ ඉතිහාසයට ප්‍රාග් බෞද්ධ යුගය දක්වාම පුරාණයට යන බව සඳහන් කළ හැක.


පෙරහර කරඬුව


ශ්‍රී සර්වඥ පෙරහර ධාතු කරඬුව වැඩමවීම



විහාර මන්දිරයේ සමාධි බුද්ධ ප්‍රතිමාව

## තෙවන පරිච්ඡේදය

# වීදියගොඩ සඟ පරපුර හා ඔලබොඩුව විහාර වංශය

**3 - 1 වීදියගොඩ සඟ පරපුරෙහි සමාරම්භය හා විකාශය**

**3 - 2 වීදියගොඩ සඟ පරපුරෙන් විකාශනය වූ ඔලබොඩුව විහාර වංශය**

**3 - 3 ඔලබොඩුව රජ මහා විහාරානුබද්ධ ශාඛා ආයතන**

# 3 - 1
# වීදියගොඩ සඟ පරපුරෙහි සමාරම්භය හා විකාශය

ලක්දිව බුදු සමයේ හා සංස්කෘතික ඉතිහාසයේ ස්වර්ණමය යුග පරාසයන් හා අඳුරු යුග පරාසයන් ද දැකිය හැකි වන්නේය. කෙසේ වෙතත් ලක්දිව වනාහි සිංහල බෞද්ධ සංස්කෘතියක් මත පෝෂණය වූ දේශයකි. ඇතැම් විට හින්දු සංකල්පයන් ද මිශ්‍ර වුවත් ඒවාට ද බෞද්ධ මුහුණුවරක් ලැබිණි. එසේම මේ සංස්කෘතික උන්නතියේ පුරෝගාමීන් වූයේ ලක්දිව බෞද්ධ භික්ෂූන් වහන්සේලාය. එබැවින් උන්වහන්සේලාගේ ප්‍රගමනය අපගේ සංස්කෘතික ප්‍රගමනයට ද ප්‍රබල බලපෑමක් විය. එසේම උන්වහන්සේලාගේ බිඳවැටීම හෙවත් පරිහානිය අප සංස්කෘතියේ ද පරිහානියට හේතු සාධක සම්පාදනය කළේය.

එසේ බිඳවැටුණු අවස්ථාවන් කිහිපයක්ම ලක්දිව බුදු සමයේ ඉතිහාසය තුළ දක්නට ලැබේ. ඒ අතර එහි ප්‍රබල අවස්ථාව සටහන් වන්නේ පොළොන්නරුවේ පළමුවන පරාක්‍රමබාහු රජුගේ පාලනය තුළය. මේ කාලය වන විට භික්ෂු සංඝයා විසිරී ගොස් තිබුණි. දුසිල්වත් භික්ෂූන්ගෙන් පිරුණු ශාසනික විනය බිඳ වැටුණු අවිචාර යුගයක් දක්නට ලැබිණි. මේ තත්ත්වයට පිළියම් සකස් කළ පරාක්‍රමබාහු රජතුමා ඒ වන විට වනගතව භික්ෂු සංඝයාගෙන් වෙන් වී භාවනානුයෝගීව දිඹුලාගල වනයේ වැඩ සිටි දිඹුලාගල කාශ්‍යප නම් මහ තෙරුන් වහන්සේ හමු වී ඇත. උන්වහන්සේගෙන් අවවාද අනුශාසනා ලබාගත් රජතුමා දුසිල්වත් භික්ෂූන් බොහොමයක් සාමණේර තත්ත්වයට පත්කොට තවත් පිරිසක් උපැවිදි කර ශාසනයෙන් බැහැර කොට කතිකාවතක් ද ඇති කරන ලදී. ඒ මගින් නැවතත් ශාසනික පුනරුදයක් ඇති විය. දැනට ගල් විහාර ලිපියේ දැක්වෙන්නේ මේ සංඝ කතිකාවතයි. මේ වැඩපිළිවෙල නිසා දඹදෙණි යුගය දක්වාම සම්බුද්ධ ශාසනයේ පුනර්ගමනය සිදු විය. නැවත දඹදෙණියේ රජු වූ මහා පඬිවරයෙකු වූ පරාක්‍රමබාහු රජතුමා ද සංඝ කතිකාවතක් සකස් කොට ශාසනික පුනරුදයක් ඇති කළ බවට තොරතුරු ඇත.

### වැලිවිට අසරණ සරණ සඟරජ මාහිමි

වර්තමාන ලක්දිව භික්ෂු සමාජයේ හා බෞද්ධ සංස්කෘතියේ තීරණාත්මක අවධියක් ක්‍රි.ව. 16 වන ශතවර්ෂයේදී උදාවිය. මේ යුග පරාසය තුළදී බුදු දහම කෙතරම් පරිහානියකට ලක් වූයේද යන්න ලක්දිව භික්ෂූන්ගේ උපසම්පදාව පවා සම්පූර්ණයෙන්ම අභාවයට පත්විය. ථේරවාදී භික්ෂූන් වහන්සේලා යම් පූජක පිරිසක් ලෙස කටයුතු කරන තත්ත්වයක් දක්නට ලැබුණ අතර බොහෝ වෙහෙර විහාර පාලනය කරවූයේ සාමණේර භික්ෂූන් විසින්ය. මේ අවාසනාවන්ත තත්ත්වයෙන් ශාසනය ගොඩගැනීම පිණිස ඉදිරිපත් වූයේ වැලිවිට සරණංකර සාමණේරයන් වහන්සේය. ක්‍රි.ව.1698 දී උඩරට තුන්පනේ ප්‍රදේශයේ උපත ලබා

මහනුවර සූරියගොඩ විහාරයේදී ප්‍රවෘජ්‍යා භූමියට පත්ව ඇත. ඉතා දුෂ්කර වූ කාල පරිච්ඡේදයක් ගෙවා දමමින් නැවත ලක්දිව භික්ෂු සමාජය ගොඩනගා ශාසනික චිරස්ථිතිය ඇති කිරීම පිණිස කටයුතු කරනු ලැබීය.

සූරියගොඩ විහාරයේ වැඩ වාසය කළ සරණංකර සාමණේරයන් වහන්සේ කුඩා කාලයේම තම නිවසේ වාසය කරන විට ද සිල්වත් විය. ගුණවත් විය. පොහොය දිනයේ අටසිල් රැකීමට පවා පුරුදු වී සිටියේය. උන්වහන්සේ සාමණේරයකු වශයෙන් ද ඉතා පිරිසිදු සිල්වත් ජීවිතයක් ගෙවීමට උත්සුක විය. කෙසේ වෙතත් මේ සරණංකර සාමණේරයන්ගේ පැවිදි දිවිය ගත කළ කාලය වන විට භික්ෂු සමාජය පමණක් නොව ධර්ම විනය හා අධ්‍යාපනය ද සම්පූර්ණයෙන්ම පරිහානියට පත් වී තිබිණි. අධ්‍යාපනය ලැබීමට විද්‍යාස්ථාන තබා පොත පතක් හෝ ඒවා හැදෑරූ ගුරුවරයෙකු හෝ සොයා ගැනීම ඉතා දුෂ්කර වූ කටයුත්තක් විය. කෙසේ වෙතත් ශාසනික අභිවෘධිය ගොඩනැගීම පිණිස ධර්ම විනය ශාස්ත්‍රීය ඥාණය ලබා ගැනීම අත්‍යාවශ්‍ය කටයුත්තක් සේ උන්වහන්සේ අවබෝධ කරගත්හ.

විවිධ ස්ථාන කරා වැඩම වූ සරණංකර සාමණේරයන් වහන්සේ එකී තැන්වල වාසය කළ පිරිස් හමුවී ඔවුන් දන්නා වූ ධර්ම විනය කොටස් ඉගෙන ගනු ලැබීය. මේ කටයුත්ත කෙතරම් දුෂ්කර වූයේද යත් බාලාවතාරය දන්නා වූ ලෙව්කේ රාළ නැමැත්තෙකු සිර දඬුවම් විඳින බව දැනගෙන සිරගෙදරට ගොස් ඔහුගෙන් බාලාවතාරය ඉගෙන ගනු ලැබීය. මෙසේ ස්ව උත්සාහයෙන්ම පාලි, සිංහල, සංස්කෘත, බුද්ධ ධර්මය හා කාව්‍ය ශාස්ත්‍ර ආදිය ඉගෙන ගත් සාමණේරයන් වහන්සේ තමන්ගේ මේ කටයුත්තට කැමැත්තක් දක්වන තවත් සාමණේර හිමිවරුන් පිරිසක් ද එකතු කරගෙන සිල්වත් සමාගම නමින් සංවිධානයක්ද පිහිටුවා ගන්නා ලදී.

එකී සිල්වත් සමාගම සමඟ සිංහල පාලි පොත් සොයමින් ඒවා නැවත පිටපත් කරමින් ධර්ම විනය හදාරන්නට විය. එසේම උන්වහන්සේ විසින් බුදුගුණ විස්තර කරමින් සාරාර්ථ සංග්‍රහය නමින් කෘතියක් ද සම්පාදනය කරනු ලැබීය. කෙසේ වෙතත් සරණංකර සාමණේරයන් වහන්සේ එවකට රටේ රජතුමා වූ කීර්ති ශ්‍රී රාජසිංහ රජු සමඟ සම්බන්ධ වී රජතුමාගේ ද සහයෝගයෙන් උපසම්පදා භික්ෂු පිරිසක් වැඩමවාගෙන ඒම පිණිස සියම් දේශයට දූත පිරිසක් පිටත් කර යැවීය. එහිදී සියම් රජතුමා සියම් රටේ උපාලි තෙරුන් වහන්සේ ප්‍රධාන භික්ෂු කණ්ඩායමක් ලක්දිවට එවීමට කටයුතු කරන ලදී.

සියම් දේශයෙන් වැඩම කළ උපාලි මහ තෙරුන් වහන්සේ ප්‍රධාන වූ භික්ෂු සංඝයා මල්වතු මහා විහාරයට වැඩම කොට ඇත. බුද්ධ වර්ෂ 2296 වන වර්ෂයේ ඇසළ පුර පසළොස්වක් පොහොය දිනයේදී පළමු වන උපසම්පදා විනය කර්මය පැවැත්වීය.[1]

1. සංඝරාජ සාධු චරියාව - අකුරටියේ විමලවංශ හිමි

මෙම විනය කර්මයේදී කොබ්බෑකඩුවේ සාමණේරයන් වැලිවිට සරණංකර සාමණේරයන්, හුලංගමුවේ සාමණේරයන්, බඹරදෙණියේ සාමණේරයන්, තිබ්බොටුවාවේ සාමණේරයන්, අස්ගිරි විහාරවාසී නාවින්නේ සාමණේරයන් යන පිරිස උපසම්පදාවට පත් කරවමින් නැවත ලක්දිව උපසම්පදා භික්ෂු සමාජය පිහිටුවා වදාළහ. උපසම්පදාවට පත් සියලු භික්ෂූන් වහන්සේලා පසු පැලවිය දිනයේදී වස් සමාදන් වීම සිදුකර ඇත.[1]

## ගිනිගත්පිටියේ සංඝරක්ඛිත මාහිමි

සියම් දේශයෙන් වැඩමවා ආරම්භ කරන ලද උපසම්පදා විනය කර්මයේදී පළමු කණ්ඩායමට අයත් හිමිනමකි හුලංගමුවේ තෙරුන් වහන්සේ. උන්වහන්සේ වෙතින් ක්‍රි.ව.1721 දී පැවිදි බව ලබාගත් සංඝරක්ඛිත සාමණේරයන් ක්‍රි.ව.1708 දී ගිනිගත්පිටියේදී උපත ලැබූ අයෙකි. නොබෝ දිනකින්ම උපසම්පදා තත්ත්වයට පත් වූ උන්වහන්සේ සත් කෝරළයේ ශාසනික දියුණුවේ පුරෝගාමියා බවට පත්විය. කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමාගේ රාජ්‍ය අනුග්‍රහය යටතේ මැද්දේපොල රජ මහා විහාරයත් සකලාංගයන්ගෙන් පරිපූර්ණත්වයට පත්වූ සම්භාවනීය විහාරස්ථානයක් බවට පත්විය. ඒ සඳහා මුල් වී කටයුතු කර ඇත්තේ දෙවර ගම්පල සිල්වත් සාමණේරයන් වහන්සේ නමකි. උන්වන්සේගෙන් පසුව විහාරාධිපති ධුරයට පත්වන ගිනිගත්පිටියේ සංඝරක්ඛිත හිමිපාණන් මැද්දේපොළ විහාස්ථානයේ බොහෝ ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකර දර්ශනීය සූවිසි රියන් බුද්ධ ප්‍රතිමා වහන්සේ තවත් බුද්ධ ප්‍රතිමා වහන්සේලා ඉදිකරන ලදී. මේ පිළිබඳව අතිශයින් ප්‍රසාදයට පත් රජතුමා මල්ගමුව නැමති නින්දගම සහිත විහාරය සන්නස් පත්‍රයකින් පවරා දුන් බව සඳහන් වේ.[2]

සරණංකර සංඝරාජ මාහිමිපාණන් වහන්සේගේ ද ප්‍රධාන ශිෂ්‍යවරයෙකු වූ ගිනිගත්පිටියේ සංඝරක්ඛිත හිමිපාණන් සත්කෝරළ මහ දිසාවේ වෙහෙර විහාර භාරව කටයුතු කර තිබේ. එසේම පිරිහී ගොස් තිබූ ශාසනික පිළිවෙත් නැවත උපදවන පිණිස සත් කෝරළය මුල් කරගෙන ඉතා විශාල ශාසනික සේවයක් ඉටුකර ඇත. එපමණක් නොව එකී ප්‍රතිපත්ති තුළ හික්මවනු ලැබූ විශාල ශිෂ්‍ය පිරිසකට ශාසනික නායකත්වය ලබාදුන් හෙයින් කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා විසින් සත්කෝරළ මහ දිසාවේ ප්‍රධාන සංඝ නායක පදවිය පිරිනමා ඇත.[3]

## ගිනිගත්පිටියේ දීපංකර මාහිමි

අසරණ සරණ සරණංකර සංඝරාජ මාහිමිපාණන් වහන්සේ හා මහනුවර මල්වතු මහා විහාරය පහතරට රයිගම් කෝරළය හා සම්බන්ධ වන්නේ සරණංකර මහ තෙරුන් සමඟ උපසම්පදාවට පත් හුලංගමුවේ තෙරුන් වහන්සේගේ ශිෂ්‍යානු ශිෂ්‍ය පරපුර පදනම් කරගෙනය. එහෙත් එහි ප්‍රධාන අවස්ථාව උදාවන්නේ සත්

1. බිංගිරි රජ මහා විහාරය සහ ඓතිහාසික ගමන්මග - පඬිවෙල සෝරත හිමි
2. මැද්දෙපොල රජ මහා විහාර වතගොත - මිරිහානේ ධම්මපාල හිමි
3. මැද්දෙපොල රජ මහා විහාර වතගොත - මිරිහානේ ධම්මපාල හිමි

කෝරළයේ ප්‍රධාන සංඝනායක ධුරය දැරූ මැද්දේපොල රාජ මහා විහාරාධිපතිව වැඩ විසූ ගිනිගත්පිටියේ සංඝරක්ඛිත නාහිමිපාණන් වහන්සේගෙනි. සෙංකඩගල නුවර මුල් යුගයේ වාසය කළ භික්ෂූන් වහන්සේලා පස්නමක් ගැන මූලාශ්‍ර තොරතුරු දක්වන අතර එහිදී ගිනිගත්පිටියේ උන්නාන්සේ ලෙස සලකනු ලබන්නේ මේ සංඝරක්ඛිත තෙරුන් වහන්සේ විය හැකිය. එසේම ප්‍රධාන භික්ෂු සංඝයා අතර පෝයමළු පන්සලේ නායක හිමි, සූරියගොඩ විහාරයේ නායක හිමි, පල්කුඹුරේ අත්ථදස්සි සාමණේර හිමි, ගිනිගත්පිටියේ උන්නාන්සේ යන පස් නමයි.[1]

වැලිවිට සරණංකර හිමියන් විසින් ඇති කරන ලද සිල්වත් සමාගමට සම්බන්ධ සාමණේර වරුන්ගේ ලේඛනයක් ද දක්නට ලැබේ. එම ලේඛනයේ ගිනිගත්පිටියේ දීපංකර නම් සාමණේරවරයෙකුගේ නමක් ද සඳහන් වේ. මෙසේ ගිනිගත්පිටියේ දීපංකර යනුවෙන් ගිනිගත්පිටියේ සංඝරක්ඛිත හිමියන්ට ද ශිෂ්‍යයෙකු විය. සිල්වත් සමාගමට සම්බන්ධ දීපංකර හිමියන් හා සංඝරක්ඛිත හිමියන්ගේ ශිෂ්‍ය දීපංකර හිමියන් යන දෙනමම එක් අයෙකු විය හැකිය.

කුඩා ගිනිගත්පිටියේ දීපංකර හිමියන්ට වැළඳුණ ඇස් රෝගයකට ප්‍රතිකාර ගැනීම සඳහා පහතරට බෙන්තර ප්‍රදේශයේ වෛද්‍යවරයෙකු සොයා වැඩමවති. අසරණ සරණ සරණංකර සංඝරාජයන් වහන්සේගේ බෞද්ධාගමික සේවාව රයිගම් කෝරළයට ව්‍යාප්ත වීමේ ආරම්භය කුඩා ගිනිගත්පිටියේ දීපංකර මාහිමිපාණන් වහන්සේගෙන් සිදු වී ඇත. උඩරට සිට පහතරට ප්‍රදේශයට වැඩමවන භික්ෂූන් වහන්සේලා රයිගම් කෝරළය හරහා වැඩම කළ යුතුය. පෙර රජ දවස සිට රයිගම් කෝරළය හරහා දිවයිනේ සිව් දිසාවට ප්‍රධාන මාර්ග ජාලය සකස් වී තිබිණි. එසේ වැඩමවන මහා සංඝයාට ගමන් වෙහෙස නිවා ගැනීම හා ප්‍රත්‍ය පහසුව ලබා ගැනීමට ආවස කිහිපයක්ම මෙම ප්‍රදේශවල ගොඩනැගී පැවතුණි. කුඩා ගිනිගත්පිටියේ දීපංකර හිමියන් නවාතැන්ගත් එකී ආවාස ස්ථාන වන්නේ පුරාණ නාථ දේවාලය පිහිටි වීදියගොඩ පූජා භූමිය හා පුරාණ විෂ්ණු මහා දේවාලය පිහිටි ඔලබොඩුව බෝගහවත්ත පූජා භූමියයි.[2]

### දොපේ ගුණරතන අනු නාහිමි

කුඩා ගිනිගත්පිටියේ දීපංකර මාහිමිපාණන් තමන් වහන්සේට වැළඳී තිබූ ඇස් රෝගය සුවපත් කරගෙන නැවත උඩරටට වැඩම වන්නේ බෙම්තර දෝපේ ප්‍රදේශයෙන් පැවිදි කිරීම සඳහා කුඩා දරුවෙක් ද සමඟිනි. එසේ කැඳවාගෙන ගිය කුල කුමරුවන් මල්වතු මහා විහාරයේදී පැවිදි කරවන්නේ දෝපේ ගුණරතන නමිනි. මෙසේ ප්‍රව්‍රජ්‍යා භූමියට පත් දොපේ ගුණරතන හිමියන් ඉතා කෙටි කාලයක් තුළ පැවිදි ජීවිතයකට අවැසි ධර්ම විනය හා ශබ්ද ශාස්ත්‍රය හදාරා උත්තම පැවිදි දිවියෙන් සරුඵල නෙළාගත් සම්භාවනීය යතිවරයෙකි. පසුකාලීනව මල්වතු විහාර පාර්ශ්වයේ අනුනායක පදවිය ද ලැබ කරවීම සුවිශේෂි කරුණකි.[3]

1. මැද්දෙපොල රජ මහා විහාර වතගොත - මිරිහානේ ධම්මපාල හිමි
2. බොලබොටුවේ ශ්‍රී සුමංගල මාහිමි සමග ඔලබොඩුවේ ධම්මානන්ද මාහිමියන් පැවැත් වූ සාකච්ඡාවෙනි.
3. ලේකම් මිටිය - මල්වතු මහා විහාරීය කාර්යාලයෙනි

දොපේ ගුණරතන අනු නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ද සිය ගම්බිම් බලා දෝපෙට වැඩමවන්නේ ස්වකීය ආචාරයන් වහන්සේ නමක් වූ කුඩා ගිනිගත්පිටියේ දීපංකර මාහිමි ගමන්ගත් රයිගම් කෝරළය හරහා දිවෙන සුපුරුදු මාර්ගයෙනි. එබැවින් උන්වහන්සේ ද වීදියගොඩ අවාසයෙහි හා බෝගහවත්ත මහ විෂ්ණු දේවාලය පිහිටි ආවාසයේද විවේකයෙන් වැඩ සිට සිව්පසය ලබාගෙන ඇත.[1]

**බෙම්තර සුදස්සන මාහිමි**

දොපේ ගුණරතන අනු නාහිමිපාණන් වහන්සේ වීදියගොඩට වැඩමවා එකී අවාසයෙහි විවේක සුවයෙන් වැඩවාසය කරද්දී පිණ්ඩපාතය සඳහා වැඩමවීම, පැමිණෙන සැදැහැවතුන්ට අනුශාසනා කිරීම ආදී ආගමික කටයුතු ද යම් ප්‍රමාණයකට සිදුකර ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන් වීදියගොඩ සැදූහැවතුන් විසින් කුඩා කුටියක් සකස් කර එහි වැඩසිටීමට දොපේ ගුණරතන අනු නාහිමියන්ට ආරාධනා කර ඇත. එහෙත් මල්වතු මහා විහාරයෙන් තමන් වෙත පැවරී ඇති ශාසනික කාර්යභාරය නිසිලෙස ඉටුකිරීම තමන් වහන්සේගේ වගකීම බැවින් තම ශිෂ්‍යවරයන් වහන්සේ නමක් වූ බෙම්තර සුදස්සන හිමියන් මේ සඳහා ලබා දී ඇත. එතැන් පටන් වීදියගොඩ මහා විහාරයේ ප්‍රථම විහාරාධිපතීන් වහන්සේ බවට පත්වන්නේ බෙම්තර සුදස්සන හිමියන්ය. සුදස්සන හිමියන් අනුනායක මාහිමිපාණන්ගේ ශිෂ්‍යයෙකු වූවා මෙන්ම ඥාති පුත්‍රයෙකු ද වන්නේය.

මෙසේ වීදියගොඩ මහා විහාරයේ විහාරාධිපති ධුරයට පත්වන බෙම්තර සුදස්සන හිමිපාණන්ට ඊට නුදුරුව පිහිටි ඔලබොඩුව බෝගහවත්තේ ඓතිහාසික උපුල්වන් ශ්‍රී විෂ්ණු මහා දේවාලය පිහිටි බිමෙහි ආවාස විහාරය ද එහි පාලක සභාව සමඟ දායක දායිකාවන් විසින් පූජා කරනු ලැබීය. සුදස්සන හිමියන්ට ස්වකීය ගමට වැඩමවීමේදී ඔලබොඩුව වීදියගොඩ ප්‍රදේශ දෙකෙහිම අවාස ආශ්‍රිත සැදූහැවතුන් ඇසුරු කළ හෙයින් මෙම ස්ථාන දෙකෙහිම ශාසනික ආගමික අභිවෘධිය වෙනුවෙන් නායකත්වය දීමට සිදුවිය. වීදියගොඩ මහා විහාරයේ අධිපතිත්වයට පත්වීමත් සමඟ උන්වහන්සේ වෙත පැවරූ ඉහත සඳහන් භාරධූර කාර්යයන් දෙකම නිසිලෙස ඉටු කරමින් ශාසනාභිවෘධිය වෙනුවෙන් කළ ප්‍රශංසනීය සේවාව අගය කළ යුතුය.[2]

**විසිදාගම ශ්‍රී සෝභිත මාහිමි**

බෙම්තර සුදස්සන මාහිමිපාණන්ගේ අපවත්වීමෙන් පසු උන්වහන්සේගේ ශිෂ්‍ය විසිදාගම සෝභිත හිමිපාණන් වීදියගොඩ මහා විහාරයේ විහාරධිපති ධූරයට පත්විය. චතුර ධර්ම දේශකයන් වහන්සේ නමක් ලෙස ප්‍රකට උන්වහන්සේ ආදර්ශමත් සුපේශල ශික්ෂාකාමී පැවිදි ජීවිතයක් පවත්වාගෙන ගිය මහතෙර නමකි. ස්වකීය වාග් කෞශල්‍යයෙන් හා මනා සංවිධාන ශක්තියකින් පිරිපුන් සෝභිත මාහිමිපාණෝ වීදියගොඩ මහා විහාරය කේන්ද්‍ර කරගෙන පළාතේ

1. වීදියගොඩ සඟ පරපුර - කරඳන පඤ්ඤාලංකාර නාහිමි
2. ඔලබොඩුවේ ධම්මානන්ද මාහිමිපාණන් සමඟ ඔලබොඩුවේ ධම්මික හිමියන් පැවැත් වූ සාකච්ඡාවෙනි

ශාසනික ප්‍රබෝධයක් ඇති කිරීමෙහිලා මහත් සේවාවන් රාශියක් සිදුකර ඇත. තම ගුරු දේවයන් වහන්සේගෙන් දායද වූ වීදියගොඩ මහා විහාරයෙහි අධිපතිත්වය සමඟ ඔලබොඩුව බෝගහවත්තේ ඓතිහාසික උපුල්වන් ශ්‍රී විෂ්ණු මහා දේවාල පරිශ්‍රයෙහි විහාර ආරාමයෙහි ද ප්‍රධානත්වය උසුලමින් කටයුතු කරන්නට සිදුවිය.

සම්බුද්ධ ශාසනයේ අභිවෘධිය හා චිරපැවැත්ම උදෙසා දූන උගත් ශිෂ්‍ය පරපුරක් බිහිකිරීමට නායකත්වය හා ආචාර්යයත්වය ලබාදී ඇත. වීදියගොඩ මහා සඟ පරපුරේ විකාශනය ද මෙසේ ආරම්භ වන්නේ විසිදාගම සෝභිත මාහිමිපාණන්ගෙනි. ආගමික කටයුතු මෙහෙයවීමට දක්‍ෂතා ඇති ශිෂ්‍ය පරපුරක් බිහිවීමෙන් පසු උන්වහන්සේට යම් විවේකයක් ලැබිණි. එකී ලබාගත් විවේකය ප්‍රයෝජනයට ගත් සෝභිත මාහිමිපාණෝ එතැන් සිට විහාරානුබද්ධ ශාඛා ආයතනයන්ට වැඩම කර ඇත. ඔලබොඩුව බෝගහවත්තේ උපුල්වන් ශ්‍රී විෂ්ණු මහා දේවාලය පිහිටි ආවාසයෙහි ද වසර කිහිපයක් වස් වසා වැඩසිට ඇත. ඔලබොඩුව රජ මහා විහාරයේ ප්‍රථම විහාරාධිපතින් වහන්සේ වශයෙන් ගෞරවයට පාත්‍ර වන්නේ ප්‍රථමයෙන් වස් වැසූ භික්‍ෂූන් වහන්සේ නිසාය. උන්වහන්සේගේ ශිෂ්‍යවරයන් වහන්සේලා හත්නමකි.මඩපාත සිද්ධාර්ථ හිමි, කුඹුකේ මේධංකර හිමි, පුංචිමාහේනේ රේවත හිමි, මහාමාහේනේ සංඝරක්ඛිත හිමි, මීවනපලානේ සෝභිත හිමි, පුංචි මඩපාත සෝනුත්තර හිමි හා උරාවෙල ධම්මරක්ඛිත යන ශිෂ්‍ය භික්‍ෂූන් වහන්සේලාය.[1]

## පුංචි මඩපාත සෝනුත්තර මාහිමි

විසිදාගම සෝභිත මාහිමිපාණන් වහන්සේගේ ශිෂ්‍ය පිරිසෙන් සයවැනි ශිෂ්‍ය රත්නය වන්නේ පුංචි මඩපාත සෝණුත්තර හිමියන්ය. ස්වකීය ගුරු දේවයන් වහන්සේගේ අපවත් වීමෙන් පසු වීදියගොඩ මහා විහාරයෙහි විහාරාධිපතිත්වයට පත්ව ඇත. සෝනුත්තර හිමියන් තම සහෝදර ස්වාමීන් වහන්සේලා සමඟ මනා සම්බන්ධතාවයකින් කටයුතු කළ හිමි නමකි. අනෙකුත් ශාඛා ආයතනයන්ට මූලස්ථානයෙන් ඉටුවිය යුතු යුතුකම් නොපිරිහෙලා ඉටුකළ අතර වීදියගොඩ මහා විහාරයේ බොහෝ සංවර්ධන කාර්යයන්ට මුල් වූ හිමි නමකි. තම ගුරු දේවයන් වහන්සේගේ මඟ පෙන්වීමෙන් හා අනුශාසකත්වයෙන් පවත්වාගෙන ගිය ඔලබොඩුව බෝගහවත්ත ඓතිහාසික උපුල්වන් ශ්‍රී විෂ්ණු දේවාල පූජා භූමියෙහි නායකත්වයට ද පත්වූ උන්වහන්සේ වරින් වර බෝගහවත්ත ආවාසයෙහි වස්වසා වැඩසිට ඇත. ආයතනයේ අභිවෘධියටත් සැදැහැවතුන්ගේ කුදු මහත් ආගමික සේවාවන්ටත් මුල් තැන ලබා දෙමින් ප්‍රසංශනීය සේවාවක් සිදුකර ඇත. වාර්ෂික පෙරහර මංගල්‍යය සමඟ පැවති දේවාල චාරිත්‍ර විධීන් සඳහා ආගමික වත්පිළිවෙත් සිදුකර ඇත්තේ ද පුංචි මඩපාත සෝනුත්තර මාහිමියන් විසිනි.[2]

ක්‍රි.ව.1891 වර්ෂයේදී සෝනුත්තර මාහිමිපාණන් වහන්සේගේ අපවත්වීම සිදු වී ඇත. අපවත් වන තෙක්ම වීදියගොඩ ඔලබොඩුව ආයතනයන්ට නායකත්වය

1. වීදියගොඩ සඟ පරපුර - කරඥන පඤ්ඤාලංකාර නාහිමි
2. ඔලබොඩුවේ ධම්මානන්ද මාහිමිපාණන් සමඟ ඔලබොඩුවේ ධම්මික හිමියන් පැවැත් වූ සාකච්ඡාවෙනි



ෂඩ් මහා දේව මන්දිරය

ලබාදුන්නාසේම එකී ශාසනික ආයතනයන්ගේ මතු පැවැත්ම උදෙසා ද පියවර ගෙන ඇත. දනුළගත් යතිවර පෙළක් දායාද කිරීම උන්වහන්සේගේ ශාසනික මෙහෙවරෙහි වැදගත් අවස්ථාවකි. ඒ අනුව කරඳන සෝභිත හිමි, මකුළුදූවේ අත්ථදස්සි හිමි, බොලබොටුවේ සුමංගල හිමි, ගම්මම්පිල ගුණරතන හිමි, මාම්පේ සරණපාල හිමි හා ගම්මම්පිල දේවානන්ද හිමි වශයෙන් සය නමකි.[1]

ඔලබොඩුව බෝගහවත්ත ඓතිහාසික උපුල්වන් ශ්‍රී විෂ්ණු මහා දේවාල පූජා භූමියෙහි සිදුවෙන ආගමික කටයුතු වලට අමතරව ප්‍රාදේශීය වශයෙන් ගොදුරුගම් බිහිවීම, සතර පේරුවේ සීමා මායිම් පුළුල්වීම, සතර පේරුවට අමතරව මිල්ලෑව, කිරිවත්තුඩුව, පිටිපන, හොරගල ආදී ප්‍රදේශවලින් පවා ඔලබොඩුව පූජා භූමියට පැමිණෙන සැදැහැවතුන්ගේ ප්‍රමාණය වැඩිවීම කරණ කොටගෙන දායක පිංවතුන්ගේ දැඩි ඉල්ලීමට සවන් දීමට සිදුවිය. එනම් ආගමික කටයුතු වස් කාලයට පමණක් සීමා නොකොට අඛණ්ඩව පවත්වාගෙන යාම පිණිස නිත්‍ය නේවාසික ස්වාමීන් වහන්සේ නමකගේ අවශ්‍යතාවයයි. මෙකී අවශ්‍යතාවය හඳුනාගත් සෝනුත්තර මාහිමිපාණෝ ඒ සඳහා තම ශිෂ්‍ය පිරිස අතරින් තම විශ්වාසය දිනාගත් හිමිනමක් ලබාදීමට එකඟ විය.

ආගමික කටයුතු මෙහෙයවීමේ මනා දක්ෂතාවයක් ඇති බොලබොටුවේ ශ්‍රී සුමංගල තරුණ යතිවරයාණන් වහන්සේ නිත්‍ය නේවාසිකත්වයට පත්කලා පමණක් නොව ඔලබොඩුව රජ මහා විහාරයේ විහාරාධිපතිත්වයට ද පත්

1. වීදියගොඩ සඟ පරපුර - කරඳන පඤ්ඤාලංකාර හිමි

කරවන ලදී. ඕලබොඩුව බෝගහවත්ත පූජාභූමිය මෙතෙක් පවත්වාගෙන ගිය පරිපාලන ක්‍රමවේදය වූයේ වීදියගොඩ මහා විහාරාධිපති ධුරය යටතේය. බොලබොටුවේ ශ්‍රී සුමංගල හිමිපාණන්ට විහාරාධිපති ධුරය පවරා දීමෙන් පසු එතෙක් පැවති පරිපාලන ව්‍යුහය වෙනෙතකට යොමුවී ස්වාධීන පරිපාලනයක් ආරම්භ වීම ඕලබොඩුව රජ මහා විහාරස්ථාන ඉතිහාසයේ අපට හමුවන විශේෂ සංධිස්ථානයකි.[1]

1. බොලබොටුවේ ශ්‍රී සුමංගල මාහිමි සමඟ ඕලබොඩුවේ ධම්මානන්ද හිමි පැවැත්වූ සාකච්ඡාවකිනි

# 3-2

# වීදියගොඩ සඟ පරපුරෙන් විකාශනය වූ ඔලබොඩුව විහාර වංශය

**පූජ්‍ය වැලිවිට අසරණ සරණ සරණංකර සංඝරාජ මාහිමි**

↓

**පූජ්‍ය ගිනිගත්පිටියේ ශ්‍රී සංඝරක්ඛිත මාහිමි**
(වැලිවිට සරණංකර මාහිමිගේ තෘතීය ශිෂ්‍ය)

↓

**පූජ්‍ය කුඩා ගිනිගත්පිටියේ ශ්‍රී දීපකංර මාහිමි**
(ප්‍රතිකාර ලබා ගැනීමට පහතරටට වැඩම වූ නාහිමි)

↓

**පූජ්‍ය දෝපේ ශ්‍රී ගුණරතන අනුනාහිමි**
(මහනුවර මල්වතු මහා විහාරයේ අනුනාහිමි - පහතරටින් පැවිදි කළ ශිෂ්‍ය)

↓

**පූජ්‍ය බෙම්තර ශ්‍රී සුදස්සන මාහිමි**
(දොපේ අනුනාහිමිගේ ඥාති ශිෂ්‍ය - වීදියගොඩ ප්‍රථම විහාරාධිපති)
ඔලබොඩුව රජ මහා විහාරය සඟ සතු කොට පූජා කිරීම)

↓

**පූජ්‍ය විසිදාගම ශ්‍රී සෝභිත මාහිමි**
(වීදියගොඩ සඟ පරපුර විකාශනයේ නියමුවාණෝ - වීදියගොඩ දෙවන විහාරාධිපති
ඔලබොඩුව රජ මහා විහාරාධිපති)

↓

01. **පූජ්‍ය මඩපාත ශ්‍රී සිද්ධාර්ථ මාහිමි**
(කොළමැදිරිය ගනේ විහාරාධිපති)
02. **පූජ්‍ය කුඹුකේ ශ්‍රී මේධංකර මාහිමි**
(හොරණ රජ මහ විහාරාධිපති)
03. **පූජ්‍ය පුංචිමාහේනේ ශ්‍රී රේවත මාහිමි**
(ලෙනවර රජ මහා විහාරාධිපති)
04. **පූජ්‍ය මහාමාහේනේ ශ්‍රී සංඝරක්ඛිත මාහිමි**
(ගුංගමුව පුරාණ මහා විහාරාධිපති)

05. **පූජ්‍ය මීවනපලානේ ශ්‍රී සෝභිත මාහිමි**
(දඹර පුහුවල ගංගාතිලක විහාරාධිපති)
06. **පූජ්‍ය පුංචි මඩපාත සෝනුත්තර මාහිමි**
(වීදියගොඩ ශ්‍රී මහා විහාරාධිපති - ඔලබොඩුව රජ මහා විහාරාධිපති)
07. **පූජ්‍ය උඟරාවල ශ්‍රී ධම්මරක්ඛිත මාහිමි**
(වීදියගොඩ ශ්‍රී මහා විහාරවාසී)

06. **පූජ්‍ය පුංචි මඩපාත ශ්‍රී සොනුත්තර මාහිමි**
(වීදියගොඩ තෙවන විහාරාධිපති- ඔලබොඩුව
රජ මහා විහාරාධිපති - ශිෂ්‍යවරයෝ හයනමකි)
↓

01. **පූජ්‍ය කරඳන ශ්‍රී සෝභිත මාහිමි**
(මාම්පේ ශ්‍රී විජයවර්ධනාරාමාධිපති)
02. **පූජ්‍ය මකුළුදූවේ ශ්‍රී අත්ථදස්සි මාහිමි**
(මඩපාත ශෛලන්තරාරාමාධිපති)
03. **පූජ්‍ය බොලබොටුවේ ශ්‍රී සුමංගල මාහිමි**
(වීදියගොඩ විහාරාධිපති යටතේ පැවති ඔලබොඩුව රජ මහ විහාරාධිපතිත්වය පැවරීමෙන් පසු නිත්‍ය නේවාසික හා විහාරාධිපති)
04. **පූජ්‍ය ගම්මම්පිල ශ්‍රී ගුණරතන මාහිමි**
(ගම්මන්පිල ශෛලබිම්බාරාමාධිපති)
05. **පූජ්‍ය මාම්පේ ශ්‍රී සරණපාල මාහිමි**
(කොළඹ තිඹිරිගස්යාය අශෝකාරාමාධිපති)
06. **පූජ්‍ය ගම්මම්පිල ශ්‍රී දේවානන්ද මාහිමි**
(වීදියගොඩ ශ්‍රී මහා විහාරාධිපති)

03. **පූජ්‍ය බොලබොටුවේ ශ්‍රී සුමංගල මාහිමි**
(ඔලබොඩුව රජ මහ විහාරාධිපති - ශිෂ්‍යවරයෝ තෙනමකි)
↓

01. **පූජ්‍ය තලගල ශ්‍රී ධම්මරතන මාහිමි**
(ඔලබොඩුව රජ මහ විහාරය, හොරගල ගුණතිලකාරාමය, තලගල මංගලාරාමය, පිටිපන සේනානායකාරාමය යන ආයතනයන්හි විහාරාධිපති)
02. **පූජ්‍ය ඇමටියගොඩ ශ්‍රී විමලතිස්ස මාහිමි**
(හොරගල ගුණතිලකාරාමාධිපති)
03. **පූජ්‍ය ඔලබොඩුවේ ශ්‍රී ධම්මානන්ද මාහිමි**
(බොලබොටුවේ ශ්‍රී සුමංගල, තලගල ධම්මරතන හා ඇමටියගොඩ විමලතිස්ස යන මාහිමිපාණන් වහන්සේලා තුන්නමගේම ශිෂ්‍ය රත්නයකි)
(ඔලබොඩුව රජ මහ විහාරය, හොරගල ගුණතිලකාරාමය, පිටිපන සේනානායකාරාමය, තලගල මංගලාරාමය, කහටපිටිය ධර්මාශ්‍රමය යන ආයතනයන්හි විහාරාධිපති)

**පූජ්‍ය ඇමටියගොඩ ශ්‍රී විමලතිස්ස මාහිමි**
(හොරගල ගුණතිලකාරාමාධිපති ශිෂ්‍යවරයෝ තෙනමකි)

01. **පූජ්‍ය ඔලබොඩුවේ ධම්මානන්ද මාහිමි**
02. **පූජ්‍ය බුත්තල ධම්මානන්ද හිමි**
03. **පූජ්‍ය කුරුගල පියතිස්ස හිමි**

**පූජ්‍ය කුරුගල පියතිස්ස හිමියන්ගේ ශිෂ්‍යවරයන් වහන්සේලා**
(හොරගල ගුණතිලකාරාමාධිපති)
↓

01. **පූජ්‍ය මාදුළුවාවේ ගුණානන්ද හිමි**
(හොරගල ගුණතිලකාරාමවාසී)
02. **පූජ්‍ය මාබිම විමලතිස්ස හිමි**
(හොරගල ගුණතිලකාරාමවාසි)

**පූජ්‍ය මාදුළුවාවේ ගුණානන්ද හිමියන්ගේ ශිෂ්‍යවරයන් වහන්සේලා**
↓

01. **පූජ්‍ය බැද්දේකුඹුරේ නන්දාලෝක හිමි**
(මාහේන මාබිම විහාරවාසී)
02. **පූජ්‍ය මාබිම පඤ්ඤානන්ද හිමි**
(කතරගම අභිනවාරාමාධිපති)

**පූජ්‍ය තලගල ධම්මරතන මාහිමියන්ගේ හා පූජ්‍ය ඔලබොඩුවේ ධම්මානන්ද මාහිමිගේ ශිෂ්‍යවරයෝ හයනමකි.**
↓

01. **පූජ්‍ය හෙයියන්තුඩුවේ ශ්‍රී රේවත මාහිමි**
(කුරුගල ශෛලන්තරාරාමධිපති)
02. **පූජ්‍ය ඔලබොඩුවේ ශ්‍රී රතනපාල නාහිමි**
(රත්මලාන රතනාරාමාධිපති)
03. **පූජ්‍ය තලගල ශ්‍රී වනරතන මාහිමි**
(ඔලබොඩුව ශ්‍රී රජ මහ විහාරවාසී)
04. **පූජ්‍ය වීදියගොඩ ශ්‍රී පේමරතන මාහිමි**
(තලගල මංගලාරාමාධිපති - තලගල විපස්සනා භාවනා මධ්‍යස්ථානාධිපති)
05. **පූජ්‍ය කුඹුකේ ශ්‍රී ගුණරතන මාහිමි**
(පිටිපන උත්තරාරාමාධිපති - හොරගල ගුණතිලකාරාමාධිපති)
06. **පූජ්‍ය තලගල ශ්‍රී ආනන්ද මාහිමි**
(සුවාරපොල ශ්‍රී තපෝදාරාමාධිපති)

**පූජ්‍ය ඔලබොඩුවේ ධම්මානන්ද මාහිමි**

↓

**පූජ්‍ය තලගල ධම්මාවාස මාහිමි**

(කහටපිටිය ධර්මාශ්‍රමාධිපති)

(ඔලබොඩුවේ ධම්මානන්ද මාහිමියන්ගේ ආචාර්යත්වයෙන් පමණක් පැවිදි වූ ශිෂ්‍යවරයෙකි)

**පූජ්‍ය හෙයියන්තුඩුවේ ශ්‍රී රේවත මාහිමි**

(කුරුගල ශෛලන්තරාරාමාධිපති - ශිෂ්‍යවරයෝ දෙනමකි)

01. **පූජ්‍ය හෙයියන්තුඩුවේ ශ්‍රී ධම්මරක්ඛිත මාහිමි**
    (කුරුගල ශෛලන්තරාරාමාධිපති)
02. **පූජ්‍ය හෝමාගම සිරිධම්ම මාහිමි**
    (කුරුගල ශෛලන්තරාරාමය, මාදුළුවාව සුධර්මාරාමය යන උභය විහාරාධිපති, හෙයියන්තුඩුවේ රේවත, හෙයියන්තුඩුවේ ධම්මරක්ඛිත යන මාහිමියන් දෙනමගේම ශිෂ්‍යවරයෙකි)

**පූජ්‍ය හෝමාගම සිරිධම්ම මාහිමියන්ගේ ශිෂ්‍යවරයෝ සය නමකි.**

01. **ගල්පොත්යායේ ධම්මරතන හිමි**
02. **ජුලම්පිටියේ සරණධම්ම හිමි** (අපවත් වී ඇත)
03. **කිතුලහේනේ සමිතධම්ම හිමි**
04. **කෝන්කටුවේ සුභූතිධම්ම හිමි**
05. **නිවිතිගල සුජාතධම්ම හිමි**
06. **වෙල්ලත ශාන්තධම්ම හිමි**

**පූජ්‍ය ඔලබොඩුවේ ශ්‍රී රතනපාල නාහිමිගේ ශිෂ්‍යවරයා**

(රත්මලාන රතනාරාමාධිපති)

↓

**පූජ්‍ය නිවුන්ගම ශ්‍රී සුමන නාහිමි**

**පූජ්‍ය වීදියගොඩ ශ්‍රී පේමරතන මාහිමිපාණෝ**

(තලගල මංගලාරාමාධිපති, තලගල විපස්සනා භාවනාමධ්‍යස්ථානාධිපති ශිෂ්‍යවරයෝ

↓

01. **පූජ්‍ය කුරණ සිරිසුමන මාහිමි**
    (ඇහැලියගොඩ නාගල විහාරාධිපති - වෙනත් නිකායකට සම්බන්ධ වී ඇත)

02. **පූජ්‍ය තලගල සුමනරතන නාහිමි**
(තලගල මංගලාරාමය, සුවාරපොළ තපෝදාරාමය යන උභය විහාරාධිපති)
03. **පූජ්‍ය හාල්අටුතැන්නේ විමලජෝති මාහිමි**
(තලගල විපස්සනා භාවනා මධ්‍යස්ථානවාසී)
04. **පූජ්‍ය උඩුවේ හේමාලෝක මාහිමි**
(ඔලබොඩුව රජ මහ විහාරාධිපති - තලගල විපස්සනා භාවනා මධ්‍යස්ථානාධිපති, කහටපිටිය ධර්මාශ්‍රමාධිපති)
05. **පූජ්‍ය තලගල විමලධම්ම මාහිමි**
(වැලිමඩ, උඩුකිරින්ද විපස්සනා භාවනා මධ්‍යස්ථානාධිපති)

**පූජ්‍ය වීදියගොඩ පේමරතන මාහිමි, පූජ්‍ය තලගල සුමනරතන නාහිමි, පූජ්‍ය හාල්අටුතැන්නේ විමලජෝති මාහිමි, පූජ්‍ය උඩුවේ හේමාලෝක මාහිමි, පූජ්‍ය තලගල විමලධම්ම මාහිමි**
යන පස්නමගේ ශිෂ්‍යවරයෝ

↓

01. **පූජ්‍ය මාරඹ මහානාම හිමි**
(අනුරාධපුර සිරිසුගත යෝගාශ්‍රමාධිකාරී)
02. **පූජ්‍ය මිල්ලෑවේ මහින්ද හිමි**
(අවිස්සාවේල්ල සුමනගිරි අරණ්‍ය සේනාසනාධිපති)
03. **පූජ්‍ය ඊරියගස්උල්පත ධම්මාරාම හිමි**
(තලගල විපස්සනා භාවනා මධ්‍යස්ථානවාසී)
04. **පූජ්‍ය ඔලබොඩුවේ ධම්මික හිමි**
(ඉතාලිය මිලානෝ ලංකාරාමාධිපති/ඔලබොඩුව රාජ මහා විහාර භාරකාර)
05. **පූජ්‍ය යටදොලවත්තේ අරියධම්ම හිමි**
(තලගල මංගලාරාමාධිකාරී)
06. **පූජ්‍ය බෝවල්ගහ බුද්ධරංසි හිමි** (අපවත් වී ඇත)
(තලගල විපස්සනා භාවනා මධ්‍යස්ථානවාසී)
07. **පූජ්‍ය බටුවන්දර සුමනතිස්ස හිමි** (අපවත් වී ඇත)
(තලගල විපස්සනා භාවනා මධ්‍යස්ථානවාසී)
08. **පූජ්‍ය හෝමාගම ධම්මපාල හිමි** (අපවත් වී ඇත)
(තලගල විපස්සනා භාවනා මධ්‍යස්ථානවාසී)
09. **පූජ්‍ය කහතුඩුවේ සද්ධාතිස්ස හිමි** (අපවත් වී ඇත)
(තලගල විපස්සනා භාවනා මධ්‍යස්ථානවාසී)
10. **පූජ්‍ය ගංගොඩවිල විමල හිමි** (අපවත් වී ඇත)
(තලගල විපස්සනා භාවනා මධ්‍යස්ථානවාසී)

**පූජ්‍ය තලගල සුමනරතන නාහිමි, පූජ්‍ය හාල්අටුතැන්නේ විමලජෝති මාහිමි, පූජ්‍ය උඩුවේ හේමාලෝක මාහිමි, පූජ්‍ය තලගල විමලධම්ම මාහිමි**

යන සිව්නමගේ ශිෂ්‍යවරයෝ

↓

01. **පූජ්‍ය තලගල නන්ද හිමි**
(සුවාරපොල තපෝදාරාමාධිකාරී)
02. **පූජ්‍ය වීදාගම නාගිත හිමි**
(අනුරාධ තිසරණ චිත්ත විවේකාශ්‍රමාධිපති)
03. **පූජ්‍ය මාරඹ චන්දවිමල හිමි**
(කොට්ටාව නිග්‍රෝධාරාමාධිපති)
04. **පූජ්‍ය හෝමාගම මෙත්තානන්ද හිමි**
(අනුරාධපුර සිරිසුගත යෝගාශ්‍රමාධිපති - අපවත් වී ඇත)
05. **පූජ්‍ය බිබිලිගමුවේ සුදස්සි හිමි**
(තලගල මංගලාරාම විහාරවාසී)
06. **පූජ්‍ය මාරපන අරියරතන හිමි**
(හඳපාන්ගොඩ සම්බෝධි භාවනා මධ්‍යස්ථානාධිපති)
07. **පූජ්‍ය වංගියකුඹුරේ ඤාණවිමල හිමි**
(බෙරගල, කළුපහනවත්ත ඉසිපතනාරාමාධිපති)
08. **පූජ්‍ය වාහල්කඩ සුමේධ හිමි**
(තලගල මංගලාරාම විහාරවාසී)
09. **පූජ්‍ය බටුවිට සුමනසිරි හිමි**
(තලගල විපස්සනා භාවනා මධ්‍යස්ථානවාසී)
10. **පූජ්‍ය කොටිකාවත්තේ ධම්මකුසල හිමි**
(කඩුවෙල, කොරතොට, තුන්අඳහේන සිරිසුධර්මායාන සේනාසනාධිපති)
11. **පූජ්‍ය නේපාලේ සුවණ්ණ හිමි**
(තලගල මංගලාරාම විහාරවාසී)
12. **පූජ්‍ය විජයබාපුර අත්ථකුසල හිමි**
(තිස්සගිරි විහාරාධිපති, පිටිදූව, හබරාදූව)
13. **පූජ්‍ය වල්පිට ඉන්දරතන හිමි**
(තලගල මංගලාරාම විහාරවාසී)
14. **පූජ්‍ය කනිච්චිගල සුධම්ම හිමි**
(තලගල මංගලාරාම විහාරවාසී)
15. **පූජ්‍ය ඉටිතැන්පොල මුදිත හිමි**
(වැලිමඩ භාවනා මධ්‍යස්ථානවාසී)
16. **පූජ්‍ය බුලත්සිංහල සමිත හිමි**
(තලගල විපස්සනා භාවනා මධ්‍යස්ථානවාසී)

**පූජ්‍ය තලගල සුමනරතන නාහිමි,**
**පූජ්‍ය උඩුවේ හේමාලෝක මාහිමි, පූජ්‍ය තලගල විමලධම්ම මාහිමි**
යන තෙනමගේ ශිෂ්‍යවරයෝ

↓

01. **පූජ්‍ය කනිච්චිගල පඤ්ඤාසාර හිමි**
    බෙරගල, කළුපහනවත්ත ඉසිපතනාරාමවාසී)
02. **පූජ්‍ය කන්දකැටියේ පුඤ්ඤරතන හිමි**
    (වැලිමඩ භාවනා මධ්‍යස්ථානවාසී)
03. **පූජ්‍ය රූපහ පඤ්ඤාදස්සන හිමි**
    (වැලිමඩ භාවනා මධ්‍යස්ථානවාසී)
04. **පූජ්‍ය තිස්සමහාරාමයේ අරියවිසුද්ධි හිමි**
    (වැලිමඩ භාවනා මධ්‍යස්ථානවාසී)
05. **පූජ්‍ය හිඟුරුකඩුවේ ධම්මගවේසි හිමි**
    (ඔලබොඩුව රජ මහ විහාරවාසී)
06. **පූජ්‍ය කැප්පෙට්ටිපොල දේවමිත්ත හිමි**
    (වැලිමඩ භාවනා මධ්‍යස්ථානවාසී)
07. **පූජ්‍ය මීවනපලානේ පවරධම්ම හිමි**
    (තලගල මංගලාරාමවාසී)
08. **පූජ්‍ය සූරියපොකුණේ අමතගවේසි හිමි**
    (තලගල මංගලාරාමවාසී)
09. **පූජ්‍ය අමුහේන්කන්දේ මෙත්තාජීව හිමි**
    (තලගල මංගලාරාමවාසී)
10. **පූජ්‍ය අමුහේන්කන්දේ පඤ්ඤානන්ද හිමි**
    (තලගල මංගලාරාමවාසී)
11. **පූජ්‍ය අමුණේකඳුරේ ඉන්දානන්ද හිමි**
    (සුවාරපොළ තපෝදාරාමවාසී)
12. **පූජ්‍ය අමුණේකඳුරේ දේවානන්ද හිමි**
    (සුවාරපොළ තපෝදාරාමවාසී)
13. **පූජ්‍ය නන්නපුරාවේ සතීන්ද්‍රිය**
    (සුවාරපොළ තපෝදාරාමවාසී)

**පූජ්‍ය උඩුවේ හේමාලෝක මාහිමි, පූජ්‍ය තලගල විමලධම්ම මාහිමි,**
**පූජ්‍ය මිල්ලෑවේ මහින්ද හිමි**
යන තෙනමගේ ශිෂ්‍යවරයා

↓

01. **පූජ්‍ය එරත්නේ ඤාණාලංකාර හිමි**
    (සුමනගිරි අරණ්‍ය සේනාසනවාසී)

**පූජ්‍ය දිවියාගහ යසස්සි නාහිමි, පූජ්‍ය උඩුවේ හේමාලෝක මාහිමි, පූජ්‍ය බද්දේගම කුසල හිමි**

යන තෙනමගේ ශිෂ්‍යවරයා

↓

01. **පූජ්‍ය ඔලබොඩුවේ මුදිත හිමි**
    (ඉතාලිය, මිලානෝ ලංකාරාමාධිකාරී)

**පූජ්‍ය තලගල සුමනරතන නාහිමි, පූජ්‍ය උඩුවේ හේමාලෝක මාහිමි, පූජ්‍ය තලගල විමලධම්ම මාහිමි, පූජ්‍ය ඔලබොඩුවේ ධම්මික හිමි, පූජ්‍ය මාරපන අරියතරන හිමි, පූජ්‍ය ඔලබොඩුවේ මුදිත හිමි, පූජ්‍ය හිඟුරුකඩුවේ ධම්මගවේසි හිමි**

යන සත්නමගේ ශිෂ්‍යවරයා

↓

01. **පූජ්‍ය කරගස්කඳුරේ සීල විසුද්ධි හිමි**
    (ඔලබොඩුව රාජ මහා විහාරාවාසී)

**තලගල විමලධම්ම හිමියන්ගේ ශිෂ්‍යවරයෝ**

↓

01. **පූජ්‍ය දෙහිපොල පියරතන හිමි**
    (දෙහිපොල ධම්මචේතිය විවේක සේනාසනවාසී)
02. **පූජ්‍ය උඩුහාවර පඤ්ඤාජීව හිමි**
    (කොට්ටාව නිග්‍රෝධාරාම විහාරවාසී)
03. **පූජ්‍ය මිරහවත්තේ කෝලිත හිමි**
    (උඩුකිරින්ද විපස්සනා භාවනා මධ්‍යස්ථානවාසී)
04. **පූජ්‍ය මාදුළුවාවේ ධම්මින්ද හිමි**
    (උඩුකිරින්ද විපස්සනා භාවනා මධ්‍යස්ථානවාසී)
05. **පූජ්‍ය මිරහවත්තේ කුසල හිමි**
    (උඩුකිරින්ද විපස්සනා භාවනා මධ්‍යස්ථානවාසී)
06. **පූජ්‍ය බෝගහකුඹුරේ ශාසනවංස හිමි**
    (උඩුකිරින්ද විපස්සනා භාවනා මධ්‍යස්ථානවාසී)

**පූජ්‍ය තලගල විමලධම්ම මාහිමි, පූජ්‍ය වංගියකුඹුරේ ඤාණවිමල හිමි**

යන දෙනමගේ ශිෂ්‍යවරයෝ

↓

01. **පූජ්‍ය වැල්ලවායේ පියදස්සන හිමි**
    බෙරගල, කළුපහනවත්ත ඉසිපතනාරාමවාසී)
02. **පූජ්‍ය කනිච්චිගල රතනසාර හිමි**
    බෙරගල, කළුපහනවත්ත ඉසිපතනාරාමවාසී)

### පූජ්‍ය මිල්ලෑවේ මහින්ද හිමිපාණන්ගේ ශිෂ්‍යවරයෝ

01. **පූජ්‍ය පින්නකන්දේ සෝභිත හිමි**
(මුණ්ඩිගල අරණ්‍ය සේනාසනවාසී)
02. **පූජ්‍ය දැරණියගල සෝරත හිමි**
(මුණ්ඩිගල අරණ්‍ය සේනාසනවාසී)
03. **පූජ්‍ය කොළඹගම ශාසනවංස හිමි**
(මුණ්ඩිගල අරණ්‍ය සේනාසනවාසී)

### පූජ්‍ය මාරඹ චන්දවිමල හිමියන්ගේ ශිෂ්‍යවරයෝ

01. **පූජ්‍ය රාජගිරියේ විපුලඥාණ හිමි**
(කොට්ටාව නිග්‍රෝධාරාමවාසී)
02. **පූජ්‍ය බුලත්සිංහල විමලශාන්ත හිමි**
(කොට්ටාව නිග්‍රෝධාරාමවාසී)
03. **පූජ්‍ය විරපාන චන්දරතන හිමි**
(කොට්ටාව නිග්‍රෝධාරාමවාසී)
04. **පූජ්‍ය මොරටුවේ විමලතිස්ස හිමි**
(කොට්ටාව නිග්‍රෝධාරාමවාසී)
05. **පූජ්‍ය කොස්වත්තේ චන්දානන්ද හිමි**
(කොට්ටාව නිග්‍රෝධාරාමවාසී)
06. **පූජ්‍ය රාජගිරියේ සම්මාබුද්ධි හිමි**
(කොට්ටාව නිග්‍රෝධාරාමවාසී)
07. **පූජ්‍ය කොට්ටාවේ විමලධම්ම හිමි**
(කොට්ටාව නිග්‍රෝධාරාමවාසී)
08. **පූජ්‍ය කලවානේ විමලරතන හිමි**
(කොට්ටාව නිග්‍රෝධාරාමවාසී)

### පූජ්‍ය තලගල සුමනරතන නාහිමි, පූජ්‍ය උඩුවේ හේමාලෝක මාහිමි
යන දෙනමගේ ශිෂ්‍යවරයන් වහන්සේ

01. **පූජ්‍ය ඔලබොඩුවේ සිරිරතන හිමි**
(ඔලබොඩුව රජ මහා විහාරවාසී)

### පූජ්‍ය කුඹුකේ ශ්‍රී ගුණරතන මාහිමිගේ හා පූජ්‍ය ඔලබොඩුවේ රතනපාල හිමියන්ගේ ශිෂ්‍ය වරයන් වහන්සේ

01. **පූජ්‍ය නිවුන්ගම ශ්‍රී සුමන හිමි**
(හොරගල ගුණතිලකාරාමය,කුරුගල, පිටවිල බෝධිරුක්ඛාරාමය යන උභය විහාරාධිපති)

**පූජ්‍ය ඔලබොඩුවේ ධම්මානන්ද හිමියන්ගේ හා පූජ්‍ය ඔලබොඩුවේ රතනපාල හිමියන්ගේ ශිෂ්‍ය වරයන් වහන්සේ**

↓

01. **පූජ්‍ය තලගල විමලකිත්ති හිමි**

**පූජ්‍ය කුඹුකේ ගුණරතන මාහිමිපාණන් වහන්සේගේ ශිෂ්‍යවරයන් වහන්සේලා**

↓

01. **පූජ්‍ය නිවුන්ගම ශ්‍රී සුමන නාහිමි**
    (හොරගල ගුණතිලකාරාමය,කුරුැගල, පිටවිල බෝධිරුක්ඛාරාමය යන උභය විහාරාධිපති)
02. **පූජ්‍ය පිටිපන උදිත හිමි**
    (පිටිපන උත්තරාරාමවාසි)
03. **පූජ්‍ය මාදුළුවාවේ ධම්මික හිමි**
    (පිටිපන උත්තරාරාමය, හොරගල ගුණතිලකාරාමය, කුරුැගල, පිටවිල බෝධිරුක්ඛාරාමය යන විහාරත්‍රයාධිපති)

**පූජ්‍ය නිවුන්ගම ශ්‍රී සුමන නාහිමියන්ගේ ශිෂ්‍යවරයන් වහන්සේලා**

↓

01. **පූජ්‍ය බුලත්සිංහල රතනසාර හිමි**
    (පිටවිල බෝධිරුක්ඛාරාමවාසී)
02. **පූජ්‍ය සොරණාතොට චන්දරතන හිමි**
    (හොරගල ගුණතිලකාරාමවාසී)

**පූජ්‍ය තලගල සුමනරතන නාහිමි, පූජ්‍ය හාල්අටුතැන්නේ විමලජෝති හිමි, පූජ්‍ය උඩුවේ හේමාලෝක හිමි, පූජ්‍ය තලගල විමලධම්ම හිමි, පූජ්‍ය මාදුළුවාවේ ධම්මික හිමි**

යන හිමිවරුන්ගේ ශිෂ්‍යවරයන් වහන්සේ

↓

01. **මාරඹ චන්දවිමල හිමි**
    (කොට්ටාව නිග්‍රොධාරාමාධිපති)



පූජා භූමියෙහි පිහිටි පෞරාණික ත්‍රිකූටය

**පූජ්‍ය මාදුළුවාවේ ධම්මික හිමියන්ගේ හා පූජ්‍ය බුලත්සිංහල රතනසාර හිමියන්ගේ ශිෂ්‍යවරයන් වහන්සේලා**

↓

01. **පූජ්‍ය කල්තොට විනීත හිමි**
(පිටිපන උත්තරාරාමවාසී)
02. **පූජ්‍ය සූරියආරේ සුනීත හිමි**
(පිටිපන උත්තරාරාමවාසී)

**පූජ්‍ය මාදුළුවාවේ ධම්මික හිමියන්ගේ ශිෂ්‍යවරයෝ**

↓

03. **පූජ්‍ය සමනලගම සුගතසාර හිමි**
(පිටිපන උත්තරාරාමවාසී)
04. **පූජ්‍ය අඹේවෙල විජිත හිමි**
(පිටිපන උත්තරාරාමවාසී)

# 3 - 3
# ඔලබොඩුව රජ මහා විහාරානුබද්ධ ශාඛා ආයතන

01. හොරගල ගුණතිලකාරාමය (ක්‍රි.ව.1869)
02. පිටිපන උත්තරාරාමය (ක්‍රි.ව.1908)
03. තලගල මංගලාරාමය (ක්‍රි.ව.1925)
04. කුරුගල ශෛලන්තරාරාමය (ක්‍රි.ව.1927)
05. තලගල විපස්සනා භාවනා මධ්‍යස්ථානය (ක්‍රි.ව.1956)
06. කහටපිටිය ධර්මාශ්‍රමය (ක්‍රි.ව.1962)
07. සුවාරපොළ තපෝධාරාමය (ක්‍රි.ව.1960)
08. මාදුළුවාව සුධර්මාරාමය (ක්‍රි.ව.1971)
09. රත්මලාන රත්නාරාමය
10. අවිස්සාවේල්ල මුණ්ඩිගල අරණ්‍ය සේනාසනය
11. වැලිමඩ උඩුකිරින්ද විපස්සනා භාවනා මධ්‍යස්ථානය
12. මහියංගන වෙහෙරලාගල විපස්සනා භාවනා මධ්‍යස්ථානය
13. අනුරාධපුර තිසාවැව සිරි සුගත යෝගාශ්‍රමය
14. අනුරාධපුර තිසරණ චිත්ත විවේකාශ්‍රමය
15. හඳපාන්ගොඩ සම්බෝධි භාවනා මධ්‍යස්ථානය
16. බෙරගල ඉසිපතන විහාරය
17. දෙහිපොල ධම්මචේති විවේක සෙනසුන
18. කුරුගල පිටවිල බෝධිරුක්ඛාරාමය
19. කොට්ටාව නිග්‍රෝධාරාම විහාරය
20. හොරගල කන්දේ බෝධි භාවනා මධ්‍යස්ථානය
21. දැරණියගල බෝධිනාගරුක්ඛාරාමය
22. මාදුළුවාව ලුතිනල් චාන්දි වැලිකල ශිරෝම්මාලාරාමය
23. තිස්සගිරි විහාරය, පිටිදූව, හබරාදූව

## 01. හොරගල ගුණතිලකාරාමය (ක්‍රි.ව.1869)

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළයේ, මැදපත්තුවේ, හෝමාගම මැතිවරණ බල ප්‍රදේශයට අයත් පාදුක්ක, හොරගල ශ්‍රී ගුණතිලකාරාම විහාරස්ථානය ඔලබොඩුව රාජ මහා විහාරස්ථානයට අයත් ප්‍රධාන ශාඛා ආයතන අතරින් එකකි. ඔලබොඩුව මූල මහා විහාරස්ථානයෙන් පවත්වාගෙන ආ වස් පොළක් වශයෙන් සංවිධානය වී තිබුණි. මෙම ස්ථානයේ වස් වැසීමට ස්වාමීන් වහන්සේලා වැඩම වන්නේද ඔලබොඩුව මූල මහා විහාරස්ථානයෙනි. එදා හොරගල, කුරුගල හා මාදුළුවාව ආදී ප්‍රදේශවල ආගමික කටයුතු සඳහා මහා සංඝයා වැඩම වන්නේ ද ඔලබොඩුව රජ මහා විහාරස්ථානයෙනි. එබැවින් මෙම හොරගල පූජා භූමිය ඔලබොඩුව රජ මහා විහාරස්ථානයට පවරා පූජා කර ඇත්තේ හොරගල ගම් වැසි සැදැහැවතුන් විසිනි.

ආරම්භක යුගයේ ස්ථිර වශයෙන් නායකත්වයට ස්වාමීන් වහන්සේ නමක් පත් නොකළ ද ඔලබොඩුව රජ මහා විහාරාධිපති මාහිමියන් විසින්ම මෙම ආයතනයේ පාලන කටයුතු මෙහෙයවන ලදී. සබරගමු පළාතේ ප්‍රසිද්ධ වළව්වක් වූ ඇමටියගොඩ වලව්ව සිංහල බෞද්ධ ප්‍රභූන් ජීවත් වූ විශේෂ ස්ථානයකි. එකී වලව්වේ සාමාජිකයෙකු මහත් ශ්‍රද්ධාවෙන් ප්‍රව්‍රජ්‍යා භූමියට පත් වී තිබුණි. එහෙත් උන්වහන්සේ පැවිදි වී තිබුණේ ශ්‍රී ලංකා අමරපුර නිකායට අයත් විහාරස්ථානයකය. ඔලබොඩුව රජ මහා විහාරය ආශ්‍රිතව පැවති පැරණි ගමන් මාර්ගයෙන් නිතර කළුතර දිසාවට වැඩමවන ඇමටියගොඩ හිමියන්ගේ විවේකස්ථානය වී තිබුණේ ද ඔලබොඩුව රජ මහා විහාරයයි. එවකට විහාරධිපතිව වැඩ විසූ බොලබොටුවේ ශ්‍රී සුමංගල විහාරාධිකාරී තලගල ධම්මරතන යන මාහිමිපාණන් වහන්සේලා ඇමටියගොඩ වලව්වේ තරුණ යතිවරයන් වහන්සේ සමඟ කළ්‍යාණ මිත්‍රත්වයක් ගොඩනැගී තිබුණි.

කෙටි කාලයක් තුළ තම විහාරස්ථානයේ කෙනෙකු මෙන් පැවැත් වූ සමීප සම්බන්ධතාවය නිසා ඇමටියගොඩ හිමියන්ට ඔලබොඩුව රජ මහා විහාරය තමන්ගේම ආයතනයක් බවට පත්වීමට වැඩි කාලයක් ගත නොවීය. උන්වහන්සේ අමරපුර නිකායට අයත් වුවත් ඇමටියගොඩ සම්භාවනීය පෙළපත නිසා මෙම ඇසුර වඩාත් සමීප කරවන්නට හේතු වී ඇත. ඇමටියගොඩ තරුණ යතිවරයාණන් වහන්සේ තම පැවිදි ජීවිතයේ කාලයක සිට ඇති වී තිබෙන කලකිරීම හා පසුබෑම ඔලබොඩුව රජ මහා විහාරයේ වගකිව යුතු මාහිමිවරු සමඟ ප්‍රකාශ කර තිබුණි. එය නම් අමරපුර නිකායේ භික්ෂුවක් වීම නොදැන සිදු වී ඇති බවත් එය තමන් වහන්සේට බලපා ඇති මානසික වෙහෙසක් බවත්, එපමණක් නොව එය තම ඇමටියගොඩ පෙළපතේ ඥාතීන්ට ද යම් බලපෑමක් ඇති වී ඇති බව විශ්වාසවන්තව පවසා ඇත. එබැවින් තමන් වහන්සේව සියම් මහා නිකායේ පැවිදි වීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස ඉල්ලීමක් කර ඇත. ඒ අනුව බොලබොටුවේ ශ්‍රී සුමංගල හා තම ශිෂ්‍ය තලගල ධම්මරතන

යන මාහිමිපාණන් වහන්සේලා දෙනමගේ ශිෂ්‍යයෙකු ලෙස නැවතත් පැවිදි උපසම්පදා කරවීම ඇමටියගොඩ හිමියන් ලද වාසනාවන්ත අවස්ථාවකි.[1]

ඔලබොඩුව රජ මහා විහාරය යටතේ පවතින හොරගල ගුණතිලකාරාමයට නේවාසික භික්ෂූන් වහන්සේ නමකගේ අවශ්‍යතාවය දැඩිව දැණුනු අවධියක ඇමටියගොඩ හිමියන්ගේ නැවත පැවිදිවීම හොරගල ගුණතිලකාරාමය ඇතුළු හොරගල ගම්වාසීන් ලැබූ භාග්‍යවන්ත අවස්ථාවකි. බොලබොටුවේ ශ්‍රී සුමංගල මාහිමිපාණන්ගේ ආශිර්වාදයෙන් හොරගල වස් පොලෙහි ඉදිකර තිබූ කුඩා ආවාස කුටියට වැඩමවීම සිදුවන්නේ ඒ අයුරිනි. ඇමටියගොඩ හිමියෝ හොරගලට වැඩමවා නොබෝ දිනකින් හොරගල ගුණතිලකාරාමය සීඝ්‍ර දියුණුවක් ලබා ඇත. තම ඤාති ප්‍රභූන්ගේ ආධාර උපකාර මේ සඳහා නොමදව ලැබී ඇත. වසර කිහිපයකට පසු උන්වහන්සේගේ ක්‍රියා කෞශලයන් දුටු තලගල ධම්මරතන මාහිමිපාණන් වහන්සේ හොරගල ගුණතිලකාරාම විහාරස්ථානය ඇමටියගොඩ විමලතිස්ස හිමියන්ට ලිඛිතව පවරා භාරදී ඇත. ඒ හොරගල විහාරස්ථානයේ සමාරම්භයයි. ඒ පිළිබඳ හරිහැටි දින වකවානු සඳහන් නොවූවත් හොරගල විහාරස්ථානය ආරම්භ කර ඇත්තේ 1869 වර්ෂයේදීය.[2]

ඉන්පසු ඔලබොඩුව හොරගල විහාරස්ථාන අතර පවත්වාගෙන ගිය ශාසනික සම්බන්ධතාවය මතුවටත් අඛණ්ඩව පැවතීමේ අරමුණින් බොලබොටුවේ ශ්‍රී සුමංගල, තලගල ධම්මරතන හා ඇමටියගොඩ විමලතිස්ස යන මාහිමිපාණන් වහන්සේලාගේ ආචාර්යයත්වයෙන් ඔලබොඩුවේ ධම්මානන්ද හිමිපාණන්ගේ උපසම්පදා විනය කර්මය සිදු වී ඇත.[3] හොරගල ගුණතිලකාරාමය සියලු විහාරාංගයන්ගෙන් සම්පූර්ණත්වයට පත්කර ඇමටියගොඩ මාහිමිපාණෝ වර්ෂයේදී අපවත් වී වදාළහ. උන්වහන්සේගේ ශාසනික මෙහෙවර කොපමණ ද යැයි කිවහොත් අපවත් වීමෙන් පසුවද එකී විහාරස්ථානයේ අභිවෘධිය පතා දේව ආත්මයක සිට වැඩමවා වැඩ සිටින බව හොරගල සැදැහැවතුන්ගේ විශ්වාසයයි. ඉන්පසු ගුණතිලකාරාම විහාරස්ථානයේ අධිපතිත්වයට පත්වන්නේ විමලතිස්ස හිමියනගේ ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යරත්නයක් වූ කුරුගල පියතිස්ස හිමියන්ය. උන්වහන්සේ ද මෙම විහාරස්ථානයේ දියුණුව වෙනුවෙන් මහත් වූ සේවාවන් රැසක් සිදුකර තිබුණි. එහෙත් උන්වහන්සේගේ ශිෂ්‍යවරයන් වහන්සේලා දෙනම උපැවිදි වී ඇති හෙයින් අනතුරුව පිටිපන උත්තරාරාමාධිති කුඹුකේ ගුණරතන මාහිමිපාණෝ ඔලබොඩුවේ ධම්මානන්ද මාහිමියන්ගේ ආශිර්වාදයෙන් අධිපතිත්වයට පත් වූහ.

කුඹුකේ ගුණරතන මාහිමියනගේ ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය නිවුන්ගම සුමන හිමියන්ට ගුණතිලකාරාමයේ භාරකාරත්වය පැවරීය. එහි ප්‍රතිඵලය වූයේ ඉතා කෙටි කාලයක් තුළ ගුණතිලකාරාම විහාරස්ථානය සීඝ්‍ර සංවර්ධනයකට පත් වීමයි. අදද

1. ලේකම් මිටිය - මල්වතු මහා විහාරය
2. මාබිම විමලතිස්ස හිමි සමඟ පැවැත් වූ සාකච්ඡාවෙනි
3. උපසම්පන්න භික්ෂූන් පිළිබඳ ප්‍රකාශය අංක 5135 - බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව

බොහෝ දෙනා ආශිර්වාද ලබා ගන්නා පෞරාණික බෝධීන් වහන්සේ නමක් මෙම විහාරස්ථානය සතු වටිනා සම්පතකි. එම බෝධීන් වහන්සේගේ ආශිර්වාද ලබාගෙන බෝධි පූජා පැවැත්වීමට එකල සිටි රාජ්‍ය නායකයන් හා බොහෝ මැතිඇමතිවරු පවා පැමිණ ඇති ස්ථානයකි. සිරිමාවෝ බණ්ඩාරනායක, රණසිංහ ප්‍රේමදාස, චන්ද්‍රිකා බණ්ඩාරනායක, අනුර බණ්ඩාරනායක වැනි ප්‍රභූන් ඒ අතරින් සඳහන් කළ හැක.[1] නිවුන්ගම සුමන හිමියන්ගේ ශාසනික සේවය අගයමින් මහනුවර මල්වතු මහා විහාරයීය වින්සත් වර්ගික කාරක මහා සංඝ සභාව වෙතින් බස්නාහිර පළාතේ ද්වතීය සංඝ නායක පදවියද පිරිනමා තිබුණි. උන්වන්සේ ද හදිසියේ රෝගාතුර වී අපවත් වී වදාළ හෙයින් පිටිපන උත්තරාරාමාධිපති මාදුළුවාවේ ධම්මික හිමිපාණන් විහාරාධිපතිත්වයට පත්ව කටයුතු කරනු ලබයි.

පසුගිය වසර කිහිපය ගුණතිලකාරාම විහාරස්ථානය අරාජික වීම පැවිදි ගිහි සබඳතා දුරස්වීම නීතිමය ගැටළුවලට මුහුණදීම ආදී අර්බුද රැසක් මතු වූ අවස්ථාවේ ඒ සඳහා නොසැලි කටයුතු කරමින් මාදුළුවාවේ ධම්මික හිමියන් මෙම ආයතනය ආරක්ෂා කර ගැනීමට ගත් ශාසනික ව්‍යායාමය අගය කළ යුත්තකි. මාදුළුවාවේ ධම්මික හිමියන්ගේ ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය මාරඹ චන්දවිමල හිමියන් ද වසර කිහිපයක් මෙහි භාරකාරත්වය උසුලමින් ඔලබොඩුව මූල මහා විහාරය ඇතුළු වීදියගොඩ සඟ පරපුර වෙනුවෙන් සිදු කරන ලද අගනා ශාසනික සේවය ප්‍රශංසා කටයුතුය.

**02. පිටිපන උත්තරාරාමය (ක්‍රි. ව. 1908)**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළයේ, පල්ලේ පත්තුවේ හෝමාගම මැතිවරණ කොට්ඨාසයට අයත් පිටිපන ග්‍රාමයේ පිහිටි සම්භාවනීව විහාරස්ථානයකි උත්තරාරාමය. මෙහි ආරම්භය සිදු වී ඇත්තේ 1908 වර්ෂයේදීය. විහාරස්ථානයක් ඉදිකර ආරම්භ කිරීමට මෙම වටිනා ඉඩම පූජා කර ඇත්තේ පිටිපන ප්‍රදේශයේ සම්භාවනීය පරපුරක් වන සේනානායක පරපුරෙනි. එවකට ඉඩම් හිමි වැවිලි කරුවෙකු ලෙස ප්‍රදේශයේ ප්‍රභූ ජීවිතයක් ගතකළ දොන් බස්තියන් සේනානායක යන අය විසිනි.[2]

පිටිපන උත්තරාරාමය ද වස් කාලයට පමණක් ස්වාමීන් වහන්සේලා වැඩමවා වැඩසිටි වස් පොලකි. එකී වස් කාලය සඳහා ස්වාමීන් වහන්සේලා වැඩම කරවාගෙන ඇත්තේ ඔලබොඩුව රජ මහා විහාරස්ථානයෙනි. එම යුගයේ පිටිපන ප්‍රදේශ වලද ආගමික කටයුතු සඳහා ස්වාමීන් වහන්සේලා වැඩම කරවාගෙන ඇත්තේ ඔලබොඩුව රජ මහා විහාරස්ථානයෙන් බැවිනි. ඔලබොඩුවේ ධම්මානන්ද හිමිපාණන් උපසම්පදා වීමට පෙර සාමණේර අවධියේ පිටිපන වස් පොළෙහි නේවාසිකව වැඩසිට ඇත. උන්වහන්සේගේ උපසම්පදා ලියාපදිංචි

1. ජොතීර්වේදී මාදුළුවාවේ උපාලි මහතා සමග පැවැත් වූ සාකච්ඡාවෙනි
2. කුඹුකේ ශ්‍රී ගුණරතන මාහිමියන් සමග පැවත් වූ සාකච්ඡාවෙකිනි



ඔලබොඩුව රජමහා විහාරස්ථානයෙහි ඉපැරණි සංඝාවාසය

ලේඛනයෙහි ද නේවාසික විහාරස්ථානය වශයෙන් ලේඛණගත කර ඇත්තේ පිටිපන සේනානායකාරාමය යනුවෙනි.[1] මුල් අවධියේ මෙම ආරාමය පූජා කරන ලද සැදැහැවතුන්ගේ නමින් නම් කර තිබුණි. ඔලබොඩුවේ ධම්මානන්ද හිමිපාණන් ඇතුළු ස්වාමීන් වහන්සේලා වරින්වර වැඩමවා වැඩසිටි මෙම උත්තරාරාමයට නිත්‍ය නේවාසික ස්වාමීන් වහන්සේ වශයෙන් විහාරාධිපතිත්වයට පත්කර ඇත්තේ කුඹුකේ ගුණරතන ස්වාමීන් වහන්සේය. කුඹුකේ ගුණරතන හිමිපාණන් 1926 ජුනි 27 වන දින ප්‍රව්‍රජ්‍යා භූමියට පත් වන්නේ එවකට විහාරාධිපතිව විසූ තලගල ධම්මරතන මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ හා ඔලබොඩුවේ ධම්මානන්ද ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ අචාර්යත්වයෙනි. 1933 මැයි මස 31වන දින මහනුවර මල්වතු මහා විහාරයීය රාජ පූජිත මංගල උපෝසථාගාරායේදී උපසම්පදා ශීලයට පත් වී ඇත.[2]

උපසම්පදාවෙන් පසු වසර කිහිපයක් ඔලබොඩුව රජ මහා විහාරස්ථානයේ ස්වකීය ගුරු ඇසුරේ වාසය කර ඇත. ඉන්පසු තම ගුරු දේවයන් වහන්සේලාගේ ආශිර්වාදයෙන් පිටිපන උත්තරාරාමයේ භාරකාරත්වයට පත්ව එකී විහාරස්ථානයේ ශාසනික අභිවෘධියට කටයුතු කර ඇත.

හොරගල ගුණතිලකාරාමයෙහි විහාරාධිපති ධුරය හෙබවූ කුරුැගල පියතිස්ස මාහිමිපාණන්ගේ අපවත්වීමෙන් පුරප්පාඩු වූ එකී විහාරස්ථානයේ

1. උපසම්පන්න භික්ෂූන් පිළිබඳ ප්‍රකාශය - අංක 5135 - බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව
2. උපසම්පන්න භික්ෂූන් පිළිබඳ ප්‍රකාශය -අංක 7089 - බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව

විහාරාධිපතිත්වයට ද පත්වන කුඹුකේ ගුණරතන මාහිමිපාණෝ මෙම ආයතන දෙකෙහිම දියුණුවත් මතු ආරක්ෂාවත් වෙනුවෙන් අගය කළයුතු ශාසනික සේවාවක් සිදු කළහ. නිවුන්ගම සුමන හා මාදුළුවාවේ ධම්මික නමින් ශිෂ්‍ය පුත්‍රයන් වහන්සේලා දෙනමක් ප්‍රව්‍රජ්‍යා භූමියට පත්කර එම ආයතන දෙකෙහිම භාරකාරත්වය පවරා ඇත. 1995 වර්ෂයේ අගනා ශාසනික මෙහෙවර අවසන් කොට අපවත්වීමෙන් පසු මාදුළුවාවේ ධම්මික හිමියන් පිටිපන උත්තරාරාමාධිපති වශයෙන් පත්විය. කුඹුකේ ගුණතරන මාහිමි හා තත් ශිෂ්‍ය මාදුලාවේ ධම්මික හිමියන්ගේ මෙකී යුග පරාසය වනාහි පිටිපන උත්තරාරාමයේ ස්වර්ණමය යුගය වශයෙන් සනිටුහන් කළ හැක.[1]

### 03. තලගල මංගලාරාමය (ක්‍රි.ව.1925)

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, රයිගම් කෝරළයේ කුඹුක පත්තුව බද තලගල ග්‍රාමයේ පිහිටි තලගල මංගලාරාමය ආරම්භක යුගයේ හඳුන්වා ඇත්තේ අභිනවාරාමය යනුවෙනි. ඔලබොඩුව රජ මහා විහාරස්ථානයෙහි ප්‍රධාන ශාඛා විහාරස්ථාන අතර තලගල මංගලාරාමය ප්‍රධාන ආයතනයකි. ඔලබොඩුව රජ මහා විහාරාධිපතිව වැඩ විසූ තලගල ධම්මරතනාභිධාන මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ තමන් වහන්සේගේ උපන් ගමට යම් සේවයක් සලසනු වස් ප්‍රධාන කාර්යයන් දෙකක් ආරම්භ කරන ලදී. පළමුව ප්‍රභූ ජනයාගේ ආධාර උපකාරයෙන් ගොඩනැගූ තලගල පාසලයි. දෙවනුව තලගල ගමට බෞද්ධ විහාරස්ථානයක් දායද කිරීමයි.[2]

තලගල ගම්වැසි ජනතාවගේ දායක විහාරස්ථානය ඔලබොඩුව රජ මහා විහාරස්ථානයයි. තලගල සියලු ගම්වැසියන්ගේ ආගමික කටයුතු ඔලබොඩුව රජ මහා විහාරස්ථානය මුල්කරගෙන එදා සිදු වී ඇත. තලගල පදිංචි ගම් ප්‍රධානියෙක් වූ කේ.ඩී.බර්තෝලමියුස් වෛද්‍යාචාර්යතුමා විසින් 1924 වර්ෂයේදී තම නිවසෙහි ස්වාමීන් වහන්සේ නමක් වස් වසවා ගැනීමේ අරමුණින් ඔලබොඩුව රජ මහා විහාරස්ථානයට පැමිණ ගරු කටයුතු තලගල ධම්මරතන මාහිමිපාණන් වහන්සේට ආරාධනා කර උන්වහන්සේවම වස් වැසීම සඳහා වැඩම කරවාගෙන ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන් 1925 වර්ෂයේ වස් වැසීම අද විහාරස්ථානය පවතින භූමි භාගය තෝරාගෙන කුඩා කාමරයක් සහිත අතු සෙවිලි කළ ශාලාවක් ඉදිකරගෙන ඇත. ඒ සඳහාද තලගල ධම්මරතන ස්වාමීන්ද්‍රයන් වහන්සේවම වැඩම කරවාගෙන ඇත. 1925 වර්ෂයේ ඔක්තෝබර් මස පැවති කඨින පිංකමට සමගාමීව මෙම භූමිය විහාරස්ථානයක් සඳහා සඟ සතු කර පූජා කිරීම සිදුකරන ලදී. 1927 වර්ෂයේ හුණුපිටිය ගංගාරාමාධිපති දෙවුන්දර ශ්‍රී ජිනරතනාභිධාන නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් සීමා සම්මතය සිදු කර ඇත්තේ ද ධම්මරතන මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ ප්‍රධානත්වයෙනි.[3]

1. ඔලබොඩුවේ ධම්මානන්ද මාහිමි ඔලබොඩුව විහාර වංශය පිළිබඳ පැවැත් වූ දේශනයකිනි
2. මංගලාරාම විහාරස්ථානයේ වතගොත - වීදියගොඩ පේමරතන මාහිමි
3. මංගලාරාම විහාරස්ථානයේ වතගොත - වීදියගොඩ පේමරතන මාහිමි

1930 වර්ෂයේදී ස්ථිර සංඝාවාසයක් සාදවා විවෘත කිරීම, 1941 වර්ෂයේදී ස්ථිර ධර්ම ශාලාවක් ඉදිකිරීමේ වැඩ ආරම්භ වුවත් එතෙක් ස්ථිරව වැඩ සිටීමට ස්වාමීන් වහන්සේ නමක් නොමැති විය. නේවාසිකව වැඩ සිටීමට භික්ෂූන් වහන්සේ නමකගේ අවශ්‍යතාවය ගම්වැසියන් විසින් ඔලබොඩුව විහාරස්ථානයට ගොස් තලගල මාහිමියන්ට කිහිපවරක්ම දැනුම් දෙන ලදී. නැවත නැවතත් කරන ලද ඉල්ලීමේ ප්‍රතිඵලයක් වශයෙන් ස්වාමීන් වහන්සේ නමක් තලගල විහාරස්ථානයට වැඩම කරවා ගැනීමට හැකි විය. රත්මලාන පරමධම්ම චේතිය පිරිවෙනෙහි අධ්‍යාපන කටයුතු අවසන් කර ඔලබොඩුව විහාරස්ථානයෙහි නේවාසිකව වැඩසිටි වීදියගොඩ පේමරතන ස්වාමීන් වහන්සේ 1941 නොවැම්බර් මස 21 වන දින තම ගුරු දේවයන් වහන්සේලාගේ මග පෙන්වීම යටතේ තලගල මංගලාරාමයට වැඩම කරවන ලදී.

පේමරතන ස්වාමීන්ද්‍රයන් වහන්සේ පළාතේ සැදැහැවතුන්ගේ ආධාර උපකාර ඇතිව ඉතා කෙටි කාලයක් තුළ විහාරස්ථානයට අවශ්‍ය විහාරාංග සම්පූර්ණ කිරීමට මූලිකත්වය ගෙන කටයුතු කරන ලදී. 1941 වර්ෂයේදී දායක සභාව හා පුණ්‍යවර්ධන කුළඟන සමිතිය පිහිටුවාගෙන ඇත. 1942 වර්ෂයේ ශ්‍රී සද්ධර්මෝදය නමින් ප්‍රදේශයේ දූ දරුවන්ගේ දහම් අධ්‍යාපන වෙනුවෙන් දහම් පාසල ආරම්භ කර ඇත.

සංඝාරාම ස්ථම්භය, දාන ශාලාව සහිත සංඝාවාසය, ගිනිහල් ගෙය, ළිං පොකුණු, මලසුන් ගෘහය, විහාරය වටා ප්‍රාකාරය, බෝධීන් වහන්සේ රෝපණය කිරීම, සීමා මන්දිරය හා දර්ශනීය බුද්ධ මන්දිරය පේමරතන මාහිමියන්ගේ අනුශාසකත්වයෙන් ඉදි කරන ලදී. 1956 මැයි 23 වන දින තලගල විපස්සනා භාවනා මධ්‍යස්ථානය ආරම්භ කිරීමේ ප්‍රධානත්වය ඉසිලූ වීදියගොඩ පේරමරතන මාහිමිපාණෝ 1964 වර්ෂයේ දැනට පවතින ස්ථානයේ භාවනා මධ්‍යස්ථානය ස්ථිරව ගොඩනගන ලදී. 1961 වර්ෂයේ අගෝස්තු 24 වන දින තලගල සුමනරතන හා උඩුවේ හේමාලෝක නමින් කුල දරුවන් දෙදෙනෙක් සසුන්ගත කිරීම සිදුවිය. 1978 වර්ෂය දක්වා තලගල මංගලාරාමයේ සියලු ශාසනික ආගමික කටයුතු වලට නායකත්වය දුන් වීදියගොඩ පේමරතන මාහිමිපාණන් ඉන්පසු තලගල භාවනා මධ්‍යස්ථානයෙහිම වැඩවාසය කළේ තලගල මංගලාරාමයෙහි භාරකත්වය ස්වකීය ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය තලගල සුමනරතන හිමියන්ට පවරමිනි.[1]

ඔලබොඩුව විහාර වංශ කතාවේ රන් සළකුණක් බඳුව විරාජමාන වන තලගල සුමනරතන හිමිපාණන් 1948 ජනවාරි 25 වන දින උපත ලබා ඇත්තේ ඔලබොඩුව ග්‍රාමයෙහිය. 1961 වර්ෂයේදී ප්‍රව්‍රජ්‍යා භූමියට පත් වන්නේ වීදියගොඩ පේමරතන මාහිමිපාණන්ගේ ආචාර්යත්වයෙනි. 1968 වර්ෂයේ මල්වතු මහා විහාරයීය මංගල උපෝසථාගාරයේ අධිශීල සංඛ්‍යාත උපසම්පදාවට පත්විය. හොරණ රජ මහා විහාරස්ථ ශ්‍රී ධම්මරතන මහ පිරිවෙනෙන් මූලික අධ්‍යාපනය

1 පූජ්‍ය උඩුවේ හේමාලෝක මාහිමිපාණන් සමඟ පැවැත් වූ සාකච්ඡාවකිනි

ලබාගෙන ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් ගෞරව උපාධි ලබා වටිනා ධර්ම ශාස්ත්‍රීය සේවාවක් සිදුකරමින් වැඩසිටි. රත්මලාන පරමධම්ම චේතිය පිරිවෙන, රත්මලාන මල්ලිකාරාම පිරිවෙන, වීරකැටිය රාජපක්ෂ විද්‍යාලය, පළන්නොරුව මධ්‍ය මහා විද්‍යාලය, ඔලබොඩුව මහා විද්‍යාලය හා කොළඹ ඩී.එස්.සේනානායක විද්‍යාලය යන ආයතනයන්හි ධර්මාචාර්යන් වහන්සේ නමක් වශයෙන් ඉතා උසස් සේවයක් සිදුකරනු ලැබීය.

මංගලාරාම විහාරස්ථානය කේන්ද්‍ර කරගෙන ශ්‍රී සිද්ධාර්ථ පදනම නමින් පිහිටුවාගත් පොදුජන සේවා සංවිධානය මගින් ප්‍රදේශය ඇතුළු ලංකාව පුරාම අගනා ජාතික ආගමික හා සමාජීය සේවාවන් රැසක් සිදුකරමින් පවතී. එකී පරාර්ථ සේවාව නිසාම 1990 වර්ෂයේ සර්වෝදය ව්‍යාපාරය මගින් ලෝකාර්ථචාරී නම් ගෞරව සම්මානය ද, ධම්මශූරී යන ජනාධිපති සම්මානයෙන් පවා අප නාහිමියෝ පිදුම් ලැබූහ. යුද්ධයෙන් පීඩාවට පත් ජනතාවට උපකාර කිරීම, දිවයිනේ දුෂ්කර පළාත්වල වෙහෙර විහාරස්ථාන සංවර්ධනය කිරීම, වාර්ෂිකව සිදුකරන ගිරිභණ්ඩ පූජාව, පාසල් හා පිරිවෙන් අධ්‍යාපනය ලබන සිසුන් වෙනුවෙන් අධ්‍යාපන හා සුභසාධන සේවා දියත් කිරීම ආදිය නාහිමිපාණන්ගේ පොදු සේවා වශයෙන් සඳහන් කළ හැක.

වීදියගොඩ සඟ පරපුරේ සමගිය හා උන්නතිය වෙනුවෙන් පිහිටුවා ඇති සාමග්‍රී ධර්ම මහා සංඝ සභාවේ සභාපතිත්වය උසුලමින් පරපුරේ සංඝයා වෙනුවෙන් උත්තරීතර ශාසනික සේවයට නායකත්වය ගෙන කටයුතු කරනු ලබයි. මහා විහාර වංශික ශ්‍යාමෝපාලි මහා නිකායේ මල්වතු විහාර පාර්ශ්වයේ අතිගරු මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ වරප්‍රමුඛ සානුනායක කාරක මහා සංඝ සභාව විසින් 1999 වර්ෂයේදී 'සද්ධර්ම කීර්ති ශ්‍රී සිද්ධාර්ථ' යන ගෞරව සම්මුති නාමය සහිත පානදුර තොටමුණ ඇතුළු රයිගම් සල්පිටි දෙකෝරළයේ ප්‍රධාන අධිකරණ සංඝනායක ධුරයෙන් පිදුම් ලැබූහ. මෙසේ වීදියගොඩ සඟ පරපුරටත් ඔලබොඩුව විහාර වංශයටත් පොදුවේ සම්බුද්ධ ශාසනයටත් අමිල මෙහෙවරක් සිදු කරනු ලබන තලගල නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ තලගල මංගලාරාමය කේන්ද්‍ර කරගෙන විශිෂ්ට ආගමික හා ශාසනික සේවාවක් සිදුකරන්නේය.

### 04. කුරුගල ශෛලන්තරාරාමය (ක්‍රි.ව.1927)

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළයේ, මැද පත්තුවේ හෝමාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් පාදුක්ක, කුරුගල ශෛලන්තරාරාම විහාරස්ථානය වසර 92 ඉපැරණි පෞරාණික විහාරස්ථානයකි. මෙහි නිර්මාතෘවරයාණෝ හෙයියන්තුඩුවේ රේවත හිමිපාණන්ය. 1892 වර්ෂයේ හෙයියන්තුඩුවේදී උපත ලබා 1916 පෙබරවාරි මස 19 වන දින හෙයියන්තුඩුව පුරාණ විහාරස්ථානයේදී හෙයියන්තුඩුවේ රේවත නමින් ප්‍රව්‍රජ්‍යා භූමියට පත්ව ඇත. 1916 වර්ෂයේදී ම ඔලබොඩුව රජමහා විහාරස්ථානයට වැඩමවන උන්වහන්සේ වසරක් වැනි කාලයක් නේවාසිකව වැඩසිට ඇත. 1917 ජුනි මස 23

වන දින එවකට ඔලබොඩුව රජමහා විහාරාධිපතිව වැඩ විසූ තලගල ධම්මරතන මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ හා විහාරාධිකාරී ඔලබොඩුවේ ධම්මානන්ද ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ ආචාර්යත්වයෙන් අධිශීල සංඛ්‍යාත උපසම්පදාව මහනුවර මල්වතු මහා විහාරයීය රාජ පූජිත මංගල උපෝසථාගාරයේදී සිදුකර ඇත.[1]

උපසම්පදාවෙන් පසු ඔලබොඩුව රජ මහා විහාරස්ථානයේ නේවාසිකව වැඩ සිටින රේවත හිමිපාණන් මෙහි ශාඛා ආයතනයක් වන හොරගල ගුණතිලකාරාම විහාරස්ථානයේ ආගමික කටයුතු සඳහා ද වැඩමවා ඇත. එහිදී රේවත හිමිපාණන්ට කුරුගල පදිංචිව සිටි ගාල්ලගේ යුවානිස් යන අයගේ ආරාධනාවට අනුව ඔහුගේ නිවසේ වරක් වස් වසා වැඩසිටීමට සිදුවිය. එම වස්පොළට ආසන්නව පිහිටි මෙම කුරුගල කන්ද සහිත විශාල ගල වෙත පැමිණි රේවත හිමියන් මෙම ස්ථානයේ විවේකයෙන් වැඩ සිටීමට සුදුසු කුටියක් ඉදිකර ගැනීමට අදහස් කර ඇත. පළමුව තාවකාලික කුටියක් සාදවා වැඩ සිටින උන්වහන්සේට කුරුගල පදිංචිව සිටි ගාල්ලගේ යුවානිස් මහතා සහ වල්පොලගේ දාවිත් සිංඤෝ මහතා යන දෙදෙනා විසින් 1927 ඔක්තෝබර් මස 06 වන දින ගල් බැම්මෙන් උඩ පර්චස් 13 පමණ ඉඩම් ප්‍රමාණයක් සතර දිගින් වඩින මහා සංඝයාට සඟසතු කර නීත්‍යානුකූලව පූජා කරන ලදී.[2]

1927 වර්ෂයේ සිට 1976 ජුනි මස 07 වන දින අපවත් වන තෙක්ම විහාරාධිපතිත්වය හෙබවූයේ හෙයියන්තුඩුවේ රේවත හිමියන් විසින්ය. හෙයියන්තුඩුවේ රේවත මාහිමිපාණන්ගේ අපවත් වීමෙන් පසු උන්වහන්සේගේ ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය හෙයියන්තුඩුවේ ධම්මරක්ඛිත හිමිපාණන් විහාරාධිපතිත්වයට පත්වී ඇත. ක්‍රි.ව.1917 දී උපත ලැබූ ධම්මරක්ඛිත හිමිපාණන්ගේ ද උපන්ගම සියනෑ කෝරළයේ පිහිටි හෙයියන්තුඩුවයි. හෙයියන්තුඩුවේ රේවත මාහිමිපාණන්ගේ ආචාර්යත්වයෙන් 1932 නොවැම්බර් මස 10 වන දින කුරුගල ශෛලන්තරාරාම විහාරස්ථානයේදී ප්‍රව්‍රජ්‍යා භූමියට පත්වේ. 1936 ජුනි මස 20 වන දින මල්වතු මහා විහාරයීය මංගල උපෝසථාගාරයේදී උපසම්පදා ශීලයට පත්වන්නේද හෙයියන්තුඩුවේ රේවත මාහිමිපාණන්ගේ ආචාර්යත්වයෙනි. ස්වකීය ගුරු හිමිපාණන්ගෙන් දායද වූ විහාරස්ථානය නව විහාරාංග රාශියකින් සංවර්ධනය කළා සේම කුඩාවට පිහිටි භූමිය පුළුල් කරගෙන සංවර්ධනය කරගැනීමට නායකත්වය දී ඇත. 1976 වර්ෂයේ සිට 1983 දෙසැම්බර් 18 වන දින අපවත් වන තෙක්ම කුරුගල ශෛලන්තරාරාම විහාරස්ථානයේ විහාරධිපතිත්වය හොබවා ඇත්තේ හෙයියන්තුඩුවේ ධම්මරක්ඛිත හිමිපාණන් විසිනි.

හෙයියන්තුඩුවේ රේවත, හෙයියන්තුඩුවේ ධම්මරක්ඛිත යන ස්වාමීන් වහන්සේලා දෙනමගේ ම ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය හෝමාගම සිරිධම්ම හිමිපාණන් 1944

1. උපසම්පන්න භික්ෂූන් පිළිබඳ ප්‍රකාශය අංක 63 - බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව
2. පූජ්‍ය හෝමාගම සිරිධම්ම හිමියන් සමඟ පැවැත් වූ සාකච්ඡාවකිනි

නොවැම්බර් මස 18 වන දින උපත ලබා ඇත්තේ හෝමාගමදී ය. 1966 ජූලි මස 30 වන දින පැවිදි දිවියට පත් සිරිධම්ම හිමියන් 1971 මැයි මස 18 වන දින හෙයියන්තුඩුවේ ධම්මරක්ඛිත හිමිපාණන්ගේ ආචාර්යත්වයෙන් මහනුවර මල්වතු මහා විහාරයීය මංගල උපෝසථාගාරයේදී උපසම්පදා ශීලයට පත්වේ. 1983 වසරේ සිට විහාරාධිපතිත්වයට පත් වූ හෝමාගම සිරිධම්ම හිමියෝ 2018 ජූලි 31 වන දින අපවත් වන තෙක්ම එම ධූරයෙහි කටයුතු කර ඇත. සිරිධම්ම හිමිපාණන් දෙස් විදෙස් ජනප්‍රියත්වයට පත් ධර්ම කථිකයන් වහන්සේ නමකි. උන්වහන්සේ ද රෝගාතුර වී හදිසියේ අපවත් වූ හෙයින් උන්වහන්සේගේ ශිෂ්‍ය නමක් වූ කිතුලහේනේ සමිතධම්ම හිමිපාණන් වර්තමාන විහාරාධිපතිත්වයට පත්ව කටයුතු කරයි. සුවිශාල ගල් පර්වතයක් මත ඉතා රමණීය නිසංසල භූමියක පිහිටි මෙම විහාරස්ථානයේ විශේෂත්වය වන්නේ කළුගල් පර්වතය හාරා සමාධි බුද්ධ ප්‍රතිමා වහන්සේ නමක් සමාධි මුද්‍රාවෙන්ම නෙලා තිබීමයි. එහි ගෞරවය හිමිවන්නේද නිර්මාතෘ හෙයියන්තුඩුවේ රේවත හිමිපාණන්ටය.[1]

### 05. තලගල විපස්සනා භාවනා මධ්‍යස්ථානය (ක්‍රි.ව.1956)

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, රයිගම් කෝරළයේ කුඹුක පත්තුවබද තලගල ග්‍රාමයේ පිහිටා ඇති තලගල භාවනා මධ්‍යස්ථානය 1956 වර්ෂයේ මැයි මස 22 වන දින ආරම්භ කරන ලදී. මෙහි නිර්මාතෘවරයාණෝ වීදියගොඩ පේමරතන මාහිමිපාණන් වහන්සේය. 1909 වර්ෂයේ වීදියගොඩ ග්‍රාමවරයෙහි උපත ලැබූ මේ පින්වත් කුල කුමරු ඔලබොඩුව රාජ මහා විහාරාධිපතිව වැඩ විසූ තලගල ධම්මරතන, විහාරාධිකාරී ඔලබොඩුවේ ධම්මානන්ද යන ස්වාමීන්ද්‍රයන් වහන්සේලාගේ ආචාර්යත්වයෙන් පැවිදි දිවියට පත් වන්නේ ඔලබොඩුව රජ මහා විහාරස්ථානයේදී ය. එනම් 1928 නොවැම්බර් මස 02 දින ය. ඉහත සඳහන් නාහිමිපාණන් වහන්සේලාගේ ආචාර්යත්වයෙන්ම 1929 ජුනි මස 19 වන දින මහනුවර මල්වතු මහා විහාරයීය මංගල උපෝසථාගාරයේදී උපසම්පදා ශීලයට පත්ව ඇත.[2]

1956 ජනවාරි මස 08 වන දින කඳුබොඩ විපස්සනා භාවනා මධ්‍යස්ථානය කඳුබොඩ වත්ත බංගලාවේදී ආරම්භ කරන ලද්දේ කහටපිටියේ සුමතිපාල නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසිනි. උන්වහන්සේ මියන්මාර රාජ්‍යයේ කලක් වැඩ වාසය කරමින් ලබාගත් භාවනා දැනුම තවත් බොහෝ ගිහි පැවිදි පිරිසකට ලබාදීමේ අරමුණින් මෙම භාවනා මධ්‍යස්ථානය ආරම්භ කරන ලදී. වීදියගොඩ මාහිමිපාණන් වහන්සේ හා කහටපිටියේ සුමතිපාල නාහිමිපාණන් අතර කුඩා කල සිටම පැවති කල්‍යාණ මිත්‍රත්වය නිසා කලක් භාවනා වැඩීම සඳහා කඳුබොඩට වැඩමවීමට ආරාධනාවක් ලැබිණි. එකී ආරාධනාව පිළිගත් පේමරතන මාහිමිපාණෝ භාවනාව සම්බන්ධයෙන් විශේෂ නේවාසික පුහුණුවක් ලබාගත්තේය.

1. අසිරිමත් කුරුගල ශෛලන්තරාරාම විහාරය - අජන්තා චන්ද්‍රනී ගාල්ලගේ
2. උපසම්පන්න භික්ෂූන් පිළිබඳ ප්‍රකාශය 5096 - බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව

භාවනා ගුණධර්ම දියුණු කරගෙන නැවත මංගලාරාමයට වැඩම වූ පේමරතන මාහිමියන්ට කඳුබොඩදී ලබාගත් යහපත් අත්දැකීම් සම්භාරය තම දායක පිංවතුන්ටත් ලබාදීමේ අදහසක් ඇති විය. දායක පිංවතුන් ද බොහෝ දෙනෙක් තමන්ටත් භාවනා ගුණධර්ම දියුණු කර ගැනීමට මඟ පෙන්වන ලෙස උන්වහන්සේගෙන් ඉල්ලීමක් කළ නිසා තලගල ප්‍රදේශයේ භාවනා මධ්‍යස්ථානයක් ආරම්භ කිරීමට අවස්ථාව උදාවිණි. තම විහාරාධිපතිත්වයෙන් පැවති තලගල මංගලාරාමය ඒ සඳහා යොදා නොගෙන භාවනාව සඳහා ම වෙනම ස්ථානයක් සොයද්දී එවකට තලගල ගමෙහි රජ්ජුරුවෝ නමින් හැඳින් වූ ඉඩම් හිමි වැවිලි කරුවෙකු වූ කේ.ඩී.කරෝලිස් අප්පුහාමි මහතා විසින් තමන්ගේ පැරණි දෙමහල් නිවස ඒ සඳහා ලබාදෙන ලදී. කහටපිටියේ සුමතිපාල නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ ආශිර්වාදය ඇතිව වෑවල ගංගාරාමාධිපතිව වැඩ විසූ තුම්බෝවිල මේධානන්ද ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ ද සහාය ඇතිව 1956 මැයි මස 22 වන දින තලගල විපස්සනා භාවනා මධ්‍යස්ථානය ආරම්භ කරන ලදී.[1]

වර්ෂ කිහිපයක් ඉහත ස්ථානයේම පවත්වාගෙන ගිය භාවනා මධ්‍යස්ථානය තවත් පහසුකම් ඇති සුදුසු ස්ථානයකට රැගෙනයාමේ අදහස පේමරතන මාහිමිපාණන්ට ඇති වූ නිසා තලගල ප්‍රදේශයෙන්ම ඒ සඳහා සුදුසු භූමියක් සොයන්නට විය. එහිදී තලගල කේ.ඩී.කරෝලිස් රජ රාළහාමිගේ පුත්‍ර රත්නය වන කේ.ඩී.තිලකරත්න මහතා විසින් මහත් ශ්‍රද්ධාවෙන් වර්තමානයේ භාවනා මධ්‍යස්ථානයේ පවත්වාගෙන යන තමන්ට අයිති ඉඩමෙන් අක්කර 02 ක් පමණ ප්‍රමාණයක් පූජා කරන ලදී.

එකී භූමිභාගයේ දස මසක් ඉක්මවීමට පෙර භික්ෂු කුටියක්, ධර්ම ශාලාවක්, උපාසිකාරාමයක් හා උපාසකාරාමයක් ඉදිකර 1964 වෙසක් මාසයේදී අභිනව භාවනා මධ්‍යස්ථානය විවෘත කරන ලදී. සියලු විහාරාංග සමඟින් භික්ෂූන් වහන්සේලා වෙනුවෙන් නේවාසික කුටි උපාසක උපාසිකාවන් වෙනුවෙන් අවශ්‍ය කුටි පහසුකම් සහිතව අංග සම්පූර්ණ භාවනා මධ්‍යස්ථානයක් නිර්මාණය කර ගැනීමේදී ගිහි පැවිදි බොහෝ දෙනෙකුගේ දායකත්වය ලැබිණි. එවකට පේමරතන මාහිමිපාණන් වහන්සේ සමඟ කළ්‍යාණ මිත්‍රත්වයෙන් ඇසුරු කළ සිංහල, පාලි, සංස්කෘත භාෂාත්‍රය ඇතුළු ධර්ම විනය සමඟ ශාසනික වත්පිළිවෙත් පිළිබඳ හසල දැනුමක් ඇති කිරිවානේ විජිත මාහිමිපාණන් වහන්සේගෙන් ලැබුණු ශාසනික මෙහෙවර ද සැමදා කෘතවේදීත්වයෙන් සිහිපත් කරන්නකි.[2]

වර්තමානය වන විට තලගල විපස්සනා භාවනා මධ්‍යස්ථානය කේන්ද්‍ර කරගෙන වීදියගොඩ සඟ පරපුරට දායාද වූ භික්ෂු පිරිස 50 කට අධිකය. භාවනා ගුණ දියුණු කරගත් මහා සංඝරත්නය හා ගිහි උපාසක උපාසිකාවන් දහස් ගණනකි. දිවයිනේ බොහෝ පළාත්වල තලගල මූලස්ථානය කරගෙන බිහි වූ ශාසනික ආයතන ද රාශියකි. සියම් නිකායේ මල්වතු විහාර පාර්ශ්වයට බිහි වූ

1. ශාසන මකරන්ද - දික්වැල්ලේ උපතිස්ස හිමි
2. පූජ්‍ය උඩුවේ හේමාලෝක මාහිමි සමඟ පැවැත් වූ සාකච්ඡාවකිනි

ප්‍රථම විදර්ශනා භාවනා මධ්‍යස්ථානය ලෙස ද ශාසන ඉතිහාසයට එකතු වී තිබීම විශේෂත්වයකි.

ප්‍රතිපත්ති ශාසනයට සිදුකරන ලද උදාර ශාසනික සේවය අගයනු වස් මහනුවර මල්වතු මහා විහාරයේ අතිපූජ්‍ය මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ වරප්‍රමුඛ සානුනායක කාරක සංඝ සභාව මගින් පූජනීය වීදියගොඩ පේමරතන මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේට 'ප්‍රතිපත්ති ශාසන විශාරද' ගෞරව නාම සම්මුතිය සහිත විශේෂ උපාධ්‍යාය පදවියෙන් සම්මානයට පත්කර ඇත.[1] 1996 වර්ෂයේදී උන්වහන්සේගේ අපවත් වීමෙන් පසු පේමරතන මාහිමියන්ගේ තෘතීය ශිෂ්‍ය කර්මස්ථානාචාර්ය උඩුවේ හේමාලෝක ස්වාමීන්ද්‍රයන් වහන්සේ භාවනා මධ්‍යස්ථානාධිපති වශයෙන් පත්කර ඇත. වීදියගොඩ මාහිමිපාණන් වහන්සේගේ ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය රත්නය වන තලගල සුමනරතන නාහිමිපාණන්ට මෙම ස්ථානයේ අධිපතිත්වය හිමිවිය යුතු වුවද උන්වහන්සේ තම පැවිදි සහෝදර හේමාලෝක හිමියන්ට මෙම ආයතනයේ අධිපතිත්වය පවරා දෙන්නේ මහත් සොම්නසින් හා ආශිර්වාද පූර්වාංගවමය. මෙය වර්තමාන භික්ෂු සමාජයට තලගල භාවනා මධ්‍යස්ථානයෙන් ලබාදී ඇති පූර්වාදර්ශයකි. පූජ්‍ය උඩුවේ හේමාලෝක ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින් මෙතෙක් පවත්වාගෙන ආ ශාසනික මෙහෙවර ඉදිරියටත් ඒ ආකාරයෙන්ම පවත්වාගෙන යාම ප්‍රශංසනීය කටයුත්තකි.

### 07. සුවාරපොල තපෝදාරාමය (ක්‍රි.ව.1960)

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් පිළියන්දල සුවාරපොල ග්‍රාමයෙහි පිහිටි තපෝදාරාමය ද ඔලබොඩුව රජ මහා විහාරස්ථානයේ ශාඛා ආයතනයකි. 1960 වර්ෂයේදී මෙම විහාරස්ථානය ආරම්භ කර ඇත. නිර්මාතෘවරයාණෝ තලගල ආනන්ද මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේය.

ඔලබොඩුව රජ මහා විහාරාධිපතිව වැඩ විසූ තලගල ධම්මරතන මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ හා ඔලබොඩුවේ ධම්මානන්ද මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ ශිෂ්‍ය රත්නයක් ලෙස 1936 දී මැයි මස 18 වන දින ප්‍රව්‍රජ්‍යා භූමියට පත් තලගල ආනන්ද හිමියෝ තලගල ධම්මරතන මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ ආචාර්යත්වයෙන් 1943 මැයි මස 08 වන දින මල්වතු මහා විහාරයීය මංගල උපෝසථාගාරයේ දී උපසම්පදා ශීලයට පත්ව ඇත.[2] කාලයක් ඔලබොඩුව රාජ මහා විහාරස්ථානයේ ම නේවාසිකව වැඩ සිටි උන්වහන්සේ ඉන්පසු තලගල මංගලාරාමය, රත්මලාන රත්නාරාමය, තලගල විපස්සනා භාවනා මධ්‍යස්ථානය ආදී ස්ථානවල වැඩ වාසය කර ඇත. කඳුබොඩ විපස්සනා භාවනා මධ්‍යස්ථානයෙන් හා තලගල විපස්සනා භාවනා මධ්‍යස්ථානයෙන් භාවනා පුහුණුව ලබාගත් උන්වහන්සේ භාවනා උපදේශක ස්වාමීන් වහන්සේ නමක් වශයෙන් බොහෝ දෙනාට කර්මස්ථාන ලබාදුන් භාවනා ආචාර්යවරයෙකි. තමන්

1. සාංවත්සරික මහ සභා වාර්තාව ඇසුරිනි - වීදාගම නාගිත හිමි
2. උපසම්පන්න භික්ෂූන් පිළිබඳ ප්‍රකාශය අංක 9953 - බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව

වහන්සේ විසින් පවත්වාගෙන යනු ලැබූ සීල භාවනා සහිත ආගමික වැඩසටහන් වඩාත් හොඳින් ඉදිරියට ගෙනයාමේ පරමාර්ථයෙන් මෙම තපෝදාරාම භාවනා මධ්‍යස්ථානය ආරම්භ කර ඇත.

සුවාරපොල ගමෙහි සම්භාවනීය ජීවිතයක් ගත කළ පාරම්පරික ඉඩම් හිමිකරුවෙකු වශයෙන් කටයුතු කළ සන්දනායකගේ වෙලුම් අප්පුහාමි නමැති අය විසින් පිළියන්දල නගරයට ආසන්නයේ මෙම අගනා ඉඩම ශාසනයට පූජා කර ඇත්තේ තලගල ආනන්ද හිමියන් මුල්කරගෙනය. පසුව ආසන්නයේ තිබෙන කුඩා ඉඩම් කැබලි කිහිපයක් සම්බන්ධ කරගෙන විහාර භූමිය පුළුල් කර ගැනීමට ආනන්ද හිමියන් සමත් වී ඇත.[1]

ආරම්භක මුල් කාලයේ සුවාරපොල තපෝදාරාම භාවනා මධ්‍යස්ථානය භාවනා කටයුතු සඳහා පමණක් වෙන් වූ ආයතනයක් වශයෙන් පවත්වාගෙන යන ලදී. එහෙත් වර්තමානයේ භාවනා මධ්‍යස්ථානයට සිදුවෙන ආගමික සේවාවන්ට අමතරව විහාරස්ථානයකින් සිදුවෙන ආගමික සේවාව යන දෙක ම මෙම තපෝදාරාමයෙන් සිදුවෙන ආකාරයට සංවර්ධනය කර තිබීම අතිශයින් වැදගත්ය.

මෙම තපෝදාරාම භාවනා මධ්‍යස්ථානයේ මතු පැවැත්ම වෙනුවෙන් යටවර කාශ්‍යප නමින් ශිෂ්‍ය හිමිනමක් ශාසනයට දායාද කොට ඇත්තේ තලගල ආනන්ද හිමියන්ගේ ආචාර්යත්වයෙනි. යටවර කාශ්‍යප හිමියන් රාජකීය පණ්ඩිත උපාධි සමත්ව අවිස්සාවේල්ල සුධර්මාරාම පිරිවෙන් විහාරස්ථානයේ පරිවේණාධිපති ධුරයට පත්ව පිරිවෙන් අධ්‍යාපන අංශයට මහගු සේවාවක් සිදු කරමින් සිටියදී හදිසියේම අපවත්වීම ස්ථානයටත් ඔලබොඩුව විහාර වංශයටත් සිදු වූ බලවත් පාඩුවකි.[2] ඉන්පසු තලගල ආනන්ද ලොකු හාමුදුරුවන් වහන්සේ ද කලක් රෝගාතුරව වැඩසිට අපවත් වී වදාළහ.

අපවත්වීමට පෙර ස්වකීය මූල මහා විහාරයෙහිම සඟ පරපුරට අයත් වගකිව යුතු යතීන්ද්‍රයන් වහන්සේ නමක් වන තලගල සුමනරතන ස්වාමීන්ද්‍රයන් වහන්සේ වෙත සියලු වගකීම් පවරා ඇත්තේ මතු ආරක්ෂාව හා දියුණුව අපේක්ෂාවෙනි. තලගල සුමනරතන ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ අධිපතිත්වයෙන් උන්වහන්සේගේ ශිෂ්‍ය, රත්මලාන පරම ධම්මචේතිය පිරිවෙනෙහි ආචාර්ය තලගල නන්ද ස්වාමීන්ද්‍රයන් වහන්සේ තපෝදාරාමයෙහි භාරකාර ස්වාමීන් වහන්සේ වශයෙන් කටයුතු කරයි. වර්තමානය වන විට ඉහත නායකත්වයෙන් පවතින කොළඹ දිස්ත්‍රික්කයේ පිළියන්දල නගරයට ආසන්නව අංග සම්පූර්ණ බෞද්ධ මධ්‍යස්ථානයක් වශයෙන් විරාජමානව පවතින බව සිහිපත් කළ යුතුය.

1. තලගල නන්ද හිමියන් සමඟ පැවැත් වූ සාකච්ඡාවෙකිනි
2. චරිතාපදානය - යටවර කශ්‍යප හිමි

## 08. මාදුළුවාව සුධර්මාරාමය (ක්‍රි.ව.1971)

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළයේ, මැද පත්තුවේ, හෝමාගම මැතිවරණ බල ප්‍රදේශයේ පිහිටි පාදුක්ක මාදුළුවාව ශ්‍රී සුධර්මාරාමය ද ස්වභාව සෞන්දර්යයෙන් අනූන සුන්දර ගම් පියසක නිර්මිත පැරණි පුණ්‍ය භූමියකි. මෙම විහාරස්ථානයෙහි ආරම්භය කවදා දැයි පැහැදිලි නැත. ශ්‍රී සුධර්මාරාමය නමින් හැඳින්වීමට පෙර පින්වත්තේ පන්සල ලෙස ව්‍යවහාර කර ඇත. බෝපේ විමලතිස්ස නම් හිමි නමක් මෙහි නේවාසිකව වැඩ වාසය කර ඇත. මුල් යුගයේ කුඩා සංඝාවාසයක් පමණක් පැවති අතර එහි වැඩසිටි විමලතිස්ස හිමියන් ද මෙම ආරාමය අතහැර වෙනත් තැනකට වැඩම කිරීම නිසා අරාජිකව පැවති විහාරස්ථානයකි. ස්වාමීන් වහන්සේ නමක් නොමැතිව දස වසරක් ද ඉක්මවා ගිය පසු මෙම පින්වත්තේ පන්සල නැවතත් නගා සිටුවා ප්‍රතිෂ්ඨාපනය කිරීමට ගමේ දායක පිරිසක් මූලිකත්වය ගෙන කටයුතු කළේය.[1]

මාදුළුවාව ගමෙහි පදිංචිව සිටි පින්වත්ත ආවාසයට මහත් ශ්‍රද්ධාවෙන් දායකත්වය ලබාදුන් පතිරගේ වෙලුන්සිංඤෝ නම් කවුරුත් කතා කළ වෙලුම් ආතා මෙම දායක පිරිස අතර ප්‍රධානත්වය ගෙන ඇත. එකී දායක පිරිස කුරුගල විහාරස්ථානයට ගොස් විහාරාධිපති හෙයියන්තුඩුවේ රේවත හා විහාරාධිකාරි හෙයියන්තුඩුවේ ධම්මරක්ඛිත මාහිමිපාණන් වහන්සේලා හමුවී මාදුළුවාව විහාරස්ථානයට ස්වාමීන් වහන්සේ නමකගේ වැඩමවීමේ අවශ්‍යතාවය දන්වා ඇත. උන්වහන්සේලා දෙනමගේ ම කැමත්ත හා ආශිර්වාදය ඇතිව තම ශිෂ්‍ය හෝමාගම සිරිධම්ම හිමිපාණන්ව මාදුළුවාව විහාරස්ථානයට වැඩම කරවාගෙන විහාරස්ථානයේ කටයුතු නැවත ආරම්භ කරන ලදී. උන්වහන්සේගේ වැඩමවීම පිළිබඳ දින වකවානු පැහැදිලි නැති වුවද 1971 වර්ෂයේ උපසම්පදා සම්පත්තියට පත්වීමෙන් පසුව සිදුවී ඇත.[2]

සිරිධම්ම හිමිපාණන්ගේ ක්‍රියා කෞශල්‍යයෙන් හා දායක පින්වතුන්ගේ කැපවීම හා නොමසුරු දායකත්වය නිසා ඉතා ඉක්මනින් සුධර්මාරාම විහාරස්ථානය අංග සම්පූර්ණ විහාරස්ථානයක් බවට පත්වී ඇත. සිරිධම්ම හිමියන්ගේ ප්‍රධාන ශිෂ්‍යරත්නයක් වූ පන්නිපිටිය විද්‍යාලංකාර පිරිවෙනෙහි ආචාර්ය ජූලම්පිටියේ සරණධම්ම හිමිපාණන් මෙම සුධර්මාරාමයෙහි විහාරාධිකාරී වශයෙන් කටයුතු කර ඇත.

තම ගුරු දේවයන් වහන්සේගේ මඟ පෙන්වීම යටතේ සුධර්මාරාමයට අත්‍යවශ්‍ය තවත් සුවිසල් විහාරාංග එකතු කරමින් බෞද්ධ විහාරස්ථානයකින් මහජනතාවට විශාල ආගමික සේවාවක් සිදුකරන ලදී. සීල භාවනා සංවිධානය හා ක්‍රමවත් ලෙස පවත්වාගෙන යන දහම් පාසලක් ද ආරම්භ කිරීමේ ගෞරවය සරණධම්ම හිමියන්ට හිමිවිය යුතුය. කෝට්ටේ නාග විහාරාධිපතිව වැඩ විසූ

1. හෝමාගම සිරිධම්ම හිමියන් සමඟ පැවැත් වූ සාකච්ඡාවෙනි
2. උපසම්පන්න භික්ෂූන් පිළිබඳ ප්‍රකාශය - 18051 බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව

චිරප්‍රසිද්ධ ධර්ම කථිකයන් වහන්සේ නමක් වූ මාදුළුවාවේ සෝභිත හිමියන් සරණධම්ම හිමියන්ගේ ශාසනික සේවය අගය කරමින් තම උපන් ගමෙහි විහාරස්ථානය වූ සුධර්මාරාමයෙහි අභිවෘද්ධියට විශාල දායකත්වයක් ලබාදීම ද අගය කළ යුතුය. කවුරුත් නොසිතූ අවස්ථාවක විහාරාධිකාරී ජූලම්පිටියේ සරණධම්ම හිමියෝ අපවත් වූහ. විහාරාධිපතිත්වය හෙබවූ හෝමාගම සිරිධම්ම හිමියන් ද 2018 ජූලි මස 31 වන දින අපවත් වීමෙන් පසු උන්වහන්සේගේ ශිෂ්‍ය නමක් වන කොන්කටුවේ සුභූතිධම්ම හිමි විහාරාධිපතිත්වයට පත්ව සුධර්මාරාමයෙහි ආගමික කටයුතු මෙහෙයවමින් විහාරස්ථානයටත් ගමටත් නායකත්වය දෙමින් කටයුතු සිදු කරනු ලබයි.





උපෝසථාගාරයෙහි විනය කර්ම කටයුතු



උපෝසථාගාරයෙහි විනය දේශනා කරන ආසනය

# සිව්වන පරිච්ඡේදය

# ඔලබොඩුව රජ මහා විහාරය

4.1 ඔලබොඩුව රජ මහා විහාරයෙහි සමාරම්භය

4.2 ඔලබොඩුව රජ මහා විහාරයේ පෞරාණික ප්‍රාසාදකරණය

4.3 ඔලබොඩුව රජ මහා විහාරයේ නූතන ප්‍රාසාදකරණය

# 4.1
# ඔලබොඩුව රජ මහා විහාරයෙහි සමාරම්භය

වීදියගොඩ සඟ පරපුරේ ක්‍රමවත් විකාශනය ආරම්භ වන්නේ විසිදාගම සෝභිත මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේගෙනි. බහුශ්‍රැත, විනයගරුක ශිෂ්‍ය පිරිසක් බිහි කිරීම වනාහි වීදියගොඩ සඟ පරපුරේ ස්වර්ණමය යුගයකි. වීදියගොඩ මහා විහාරය මල්වතු විහාර පාර්ශ්වයේ විහාරස්ථානයක් ලෙස සංවර්ධනය වන්නේ උඩරට සිට භික්ෂූන් වහන්සේලා රයිගම්පුර හරහා දකුණු ප්‍රදේශයට වැඩමවීම නිසයි. විශේෂයෙන් කුඩා ගිනිගත්පිටියේ දීපංකර, දෝපේ ගුණරතන හා බෙම්තර සුදස්සන යන ස්වාමීන් වහන්සේලා පහතරට වැඩමවන ගමනේදී ප්‍රධාන විවේකස්ථානය වශයෙන් වීදියගොඩ මහා විහාර භූමියෙහි වැඩ සිටියා සේම එකල බෝගහවත්ත ලෙස හැඳින් වූ ඔලබොඩුව උපුල්වන් ශ්‍රී විෂ්ණු මහා දේවාල භූමි පරිශ්‍රයෙහි වැඩ වාසය කර ඇත.

පොළොන්නරු යුගයට අයත් රයිගම්පුර උපුල්වන් ශ්‍රී විෂ්ණු මහා දේවාලය හා ඊටත් ඉපැරණි යැයි සැලකෙන ගම්භාර දේවාලය පිහිටි මෙම භූමිය පහත රටට මෙන්ම දකුණට වැඩමවන භික්ෂූන් වහන්සේට පමණක් නොව ගිහි ජනතාවට ද සුවදායක අපූරු නවාතැන් බිමක් විය. උඩරට හා දකුණ අතර සංචාරය කරන මහ ජනතාවට රයිගම්පුර හරහා පානදුර තොටමුණ දක්වා දේශීය, විදේශීය වෙළඳාමේ නියුතු වෙළඳුන්ට නවාතැන් ස්ථානය වී තිබුණේ මෙම පුණ්‍ය භූමියයි. වන්දනා චාරිකාවේ නියුතු මහජනතාව රුවන්පුර මහ සමන් දේවාලය, ශ්‍රී පාදස්ථානය, කතරගම දේව වන්දනාව ආදී ස්ථානයන් වැඳපුදා ගැනීමට යන චාරිකාවේදී බෝගහවත්ත නම් මෙම ස්ථානයේ නවාතැන් පහසුකම් සලසාගෙන ඇත.

මහ දේවාලයේ වාර්ෂික පෙරහර මංගල්‍යයට සමගාමීව සිදුවෙන ආගමික වත්පිළිවෙත් සිදු කරනු ලැබුවේ වීදියගොඩ මහා විහාරයේ විහාරාධිපතීන් වහන්සේගේ නායකත්වයෙනි. විසිදාගම සෝභිත නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගෙන් පසුව වීදියගොඩ මහා විහාර නායක පදවියට පත් වූ පුංචි මඩපාත සෝනුත්තර ස්වාමීන්ද්‍රයන් වහන්සේ රයිගම්පුර උපුල්වන් ශ්‍රී විෂ්ණු මහා දේවාලය සහිත පූජා භූමිය ගැන විශේෂ අවධානයක් යොමු කළ යතිවරයන් වහන්සේ නමකි. උන්වහන්සේ බොහෝ අවස්ථාවලදී බෝගහවත්ත අරමෙහි නේවාසිකව වැඩවාසය කරමින් සියලු ආගමික කටයුතු මැනවින් සිදුකර ඇත.

ඔලබොඩුවේ දායකකාරකාදීන් වීදියගොඩ මහා විහාරයට ගොස් ඔලබොඩුව පූජා භූමියට ස්ථිරවම වැඩ සිටීමට සුදුසු ස්වාමීන් වහන්සේ නමකගේ අවශ්‍යතාවය වරක් දෙවරක් නොව කිහිපවරක් ම දන්වා ඇත. එහි ප්‍රතිඵලය වූයේ පුංචි මඩපාත සෝනුත්තර මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ ශිෂ්‍යවරයන් වහන්සේලා

අතරින් බොලබොටුවේ ශ්‍රී සුමංගල ස්වාමීන්ද්‍රයන් වහන්සේ ඔලබොඩුව රජ මහා විහාරයේ විහාරාධිපති වශයෙන් පත්කොට නිත්‍ය නේවාසිකත්වයට පමුණුවීමයි.

## බොලබොටුවේ ශ්‍රී සුමංගල මාහිමි

වීදියගොඩ මහා විහාරාධිපති පදවිය ලැබ කරවූ පුංචි මඩපාත සෝනුත්තර මාහිමියන්ගේ ශිෂ්‍යවරයන් වහන්සේලා සයනමකි. එයින් තෘතීය ශිෂ්‍ය රත්නය වන බොලබොටුවේ ශ්‍රී සුමංගල ස්වාමීන්ද්‍රයන් වහන්සේ වීදියගොඩ පුරවරයට නොදුරු ගම්මම්පිල ග්‍රාමයේ උප ගම්මානයක් වන බොලබොටුවේ උපත ලබා ඇත. විදියගොඩ මහ වෙහෙරේ පැවිදිව සියම් මහා නිකායේ මල්වතු විහාර පාර්ශ්වයේ මංගල උපෝසථාගාරයේදී උපසම්පදා සම්පත්තියට පත්වීමෙන් පසු වැඩම කර ඇත්තේ ඔලබොඩුව රජ මහා විහාරයටයි. ස්වකීය ගුරු දේවයන් වූ පුංචි මඩපාත මාහිමියන් විවේකයක් ලද සෑම අවස්ථාවකදී ඔලබොඩුව ආවාසයට වැඩමවන බොහෝ අවස්ථාවලදී තම තනියට කැඳවාගෙන එනු ලබන්නේ බොලබොටුවේ සුමංගල සාමණේරයන් වහන්සේය. එබැවින් කුඩා කල සිටම සුමංගල සාමණේරයන් වහන්සේට ඔලබොඩුව ආරාමය ඉතා හොඳින් හුරුපුරුදු තැනක් විය. මහ දේවාලය ආශ්‍රිත පූජා භූමියෙහි බෞද්ධාගමික පරිසරයක් නිර්මාණය කරමින් විහාරාංග කිහිපයක් සංවර්ධනය කරන ලදී. තලගල සම්භාවනීය පරපුරක් වන මුරගේ පරම්පරාවෙන් හා ඔලබොඩුවේ සම්භාවනීය පරම්පරාවකට අයත් පිටිපනගේ පරපුරෙන් කුල දරුවන් දෙදෙනෙක් පැවිදි කරවනු ලැබුවේ තලගල ධම්මරතන හා ඔලබොඩුවේ ධම්මානන්ද යන නමිනි. සුමංගල මාහිමිපාණන් වහන්සේ කුඩාකල සිට ශික්ෂාකාමී සිල්වත් ස්වාමීන් වහන්සේ නමක් වශයෙන් කටයුතු කර ඇත. එබැවින් මහජනතාව මහත් ගෞරවයෙන් බෝසත් ගුණ ඇති තෙරුන් වහන්සේ නමක් සේ සලකා ඇත.

## තලගල ශ්‍රී ධම්මරතන මාහිමි

ඔලබොඩුව රජ මහා විහාරාධිපතිව වැඩ විසූ බොලබොටුවේ ශ්‍රී සුමංගල මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ ප්‍රථම ශිෂ්‍යරත්නය වන්නේ තලගල ධම්මරතන ස්වාමීන්ද්‍රයන් වහන්සේය. තලගල තල්ගහවත්තේ විසූ තලගල මුරගේ බබාඅප්පුහාමි මහතාගේ දරුවෙක් ලෙස 1868 වර්ෂයේ උපත ලබා ඔලබොඩුව රජ මහා විහාරාධිපතිව වැඩ විසූ ඔලබොඩුවේ සුමංගල මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ ආචාර්යත්වයෙන් 1883 වර්ෂයේදී ප්‍රව්‍රජ්‍යා භූමියට පත්ව ඇත. 1891 මැයි මස 17 වන දින මල්වතු මහා විහාරයීය මංගල උපෝසථාගාරයේදී අධිශීල සංඛ්‍යාත උපසම්පදා සම්පත්තියට පත්ව ඇත. ස්වකීය ගුරුදේවයන් වහන්සේගේ අපවත්වීමෙන් අධිපති ධුරයට පත්වන ධම්මරතන ස්වාමීන්ද්‍රයන් වහන්සේ තම පාලන කාලය තුළ මෙම පූජා භූමියෙහි සැලකිය යුතු සංවර්ධනයක් ඇති කළහ.

තලගල ධම්මරතන මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ පාලනය කාලය වන විට රයිගම් කෝරළයේ හා මුහුදුබඩ ප්‍රදේශවල මිශනාරී ආගමික ව්‍යාප්තියක් ආරම්භ වී තිබිණි. එහෙත් මේ සියලු අභියෝග පහසුවෙන් ජයගත් මහ තෙරනමකි

ධම්මරතන මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ. මිශනාරි ආගමික නායකයන් විසින් අස්සක් මුල්ලක් නැරම තම ආගමික මතවාදයන් ප්‍රචලිත කිරීමේ දැවැන්ත ව්‍යාපාරයක් දියත් කොට තිබුණේය. විශේෂයෙන් ඔවුන් විසින් තම ආගම ව්‍යාප්ත කිරීමේ ප්‍රධාන මෙවලමක් ලෙසට භාවිතා කළේ අධ්‍යාපනයයි. එබැවින් ඔවුන් තම ආගමික ආයතන ආශ්‍රිතව පාසල් ආරම්භ කිරීමේ වැඩපිළිවෙලක් දියත් කළේය. විවිධ පහසුකම් යටතේ ක්‍රියාත්මක වන මෙම පාසල් සඳහා දරුවන් ඇතුළත් කරගෙන ඇත්තේ තම ආගම වැළඳගත් අය පමණි.

බොදු දරුවෙකු පාසලකට ඇතුළත් කිරීමේ ගැටලු සහගත තත්වයට පිළියමක් වශයෙන් ධර්මපාලතුමා සමඟ හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා වැනි අය එක්ව පරම විඥානාර්ථ බෞද්ධ සමාගම පිහිටුවා ගත්තේය. එහි ප්‍රතිඵලයක් වූයේ දිවයින පුරා බෞද්ධ පාසල් ආරම්භ වීමයි. 1886 දී ඔලබොඩුව අතුකෝරළගොඩ හන්දියෙහි ඔලබොඩුව සමාගම් පාසල ආරම්භ කෙරිණි. ඒ සඳහා මූලික වූ කොරතොට සෝභිත හිමියන් හදිසියේ අපවත් වූහ. ඉන් අනතුරුව භාරකාරත්වය උසුලමින් ඔලබොඩුව පාසල සංවර්ධනය කිරීමට මහත් වෙහෙසක්ගත් රයිගම ස්වර්ණජෝති හිමිපාණන්ගේ ද අපවත්වීම සිදුවිය. නැවතත් මෙම පාසල කෝට්ටේ මිශනාරි සමාගමක් යටතට පත් කිරීමට උත්සහ ගනිද්දී තලගල ධම්මරතන මාහිමිපාණන් වහන්සේ 1907 වර්ෂයේදී ඔලබොඩුව රජ මහා විහාර භූමියෙහි ස්ථාපිත කර එහි භාරකාරත්වයට පත්විය.[1]

ඔලබොඩුව රජ මහා විහාරයෙන් දිවයිනේ වෙනත් ප්‍රදේශවල අනුබද්ධ ශාඛා ආයතන බිහිවන්නේ ද ධම්මරතන මාහිමියන් වහන්සේගේ පාලනය කාලය තුළය. පිටිපන සේනානායකාරාමය(උත්තරාරාමය), කුරුගල ශෛලන්තරාරාමය, හොරගල ගුණතිලකාරාමය හා තලගල මංගලාරාමය යන ආයතන සඳහන් කළ හැක. ඔලබොඩුව විහාර වංශයෙහි විකාශනය සිදුවන්නේ ද ධම්මරතන මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ පාලන කාලය තුළය. ඔලබොඩුවේ ධම්මානන්ද, හෙයියන්තුඩුවේ රේවත, තලගල වනරතන, වීදියගොඩ පේමරතන, කුඹුකේ ගුණරතන හා තලගල ආනන්ද යන සත් නමක් සසුනට දායාද කළහ.

**ඔලබොඩුවේ ධම්මානන්ද මාහිමි**

ඔලබොඩුවේ සම්භාවනීය පරපුරක් වන පිටිපනගේ පරපුරෙන් පැවත එන පිටිපනගේ දොන් ආගිරිස් විදානේ යන අයගේ පුත්‍ර රත්නයක් ලෙස 1892 අප්‍රේල් මස 30 වන දින උපත ලබා ඇත. එවකට ඔලබොඩුව රජ මහා විහාරාධිපතිව වැඩ විසූ බොලබොටුවේ ශ්‍රී සුමංගල මාහිමිපාණන්ගේ හා විහාරාධිකාරී, තලගල ධම්මරතන මාහිමිපාණන් වහන්සේගේ ආචාර්යත්වයෙන් 1906 මැයි මස 06 වන දින ප්‍රව්‍රජ්‍යා භූමියට පත් වී ඇත. ඉහත නම් සඳහන් ආචර්යයන් වහන්සේලා දෙනමගේ හා හොරගල ගුණතිලකාරාමාධිපතිව වැඩ විසූ ඇමටියගොඩ

1. ඔලබොඩුව අපේගම - බන්දුල ආර්.ගුලවත්ත

විමලතිස්ස යන ස්වාමීන්වහන්සේලා තෙනමගේ ආචාර්යත්වයෙන් 1912 ජුනි මස 08 වන දින මහනුවර මල්වතු මහා විහාරයීය මංගල උපෝසථාගාරයේදී අධිශීල සංඛ්‍යාත උපසම්පදා ශීලයට පත්ව ඇත. ස්වකීය ගුරුදේව තලගල ධම්මරතන මාහිමිපාණන් අපවත්වීමෙන් පසු 1947 වර්ෂයේදී ඔලබොඩුව රජ මහා විහාරයේ භාරකාරත්වයට පත්ව ජාතික, ආගමික හා අධ්‍යාපනික සේවාවන් රැසක් සිදුකර ඇත.

ඔලබොඩුව රජ මහා විහාරය ඇතුළු ශාසනික ආයතන කිහිපයකම ප්‍රධානත්වය දැරූ ධම්මානන්ද හිමිපාණෝ ඔලබොඩුව මහා විහාර වංශය ශෝභාමත් කර වූ මංගල ගත සලකුණකි. කොළඹ මාලිගාකන්දේ විද්‍යෝදය මහ පිරිවෙනින් සිංහල, පාලි, සංස්කෘත භාෂාත්‍රයන්ගෙන් ප්‍රවීණත්වය ලබා ධර්ම විනය පිළිබඳ ලබාගත් පාණ්ඩිත්වයෙන් ස්වකීය පැවිදි ජීවිතය ආලෝකමත් කරගත් පඬිරුවනකි.

ආගමික හා ශාසනික සේවාවන්ට අමතරව ජාතික වශයෙන් ද වැදගත් වූ සේවාවන් රැසකට නායකත්වය දී ඇත. 1958 දී ඔලබොඩුව රජ මහා විහාරස්ථානයේ වඩු කාර්මිකයන් පුහුණු කරන වෘත්තීය අභ්‍යාස මධ්‍යස්ථානයක් ආරම්භ කිරීම, 1981 වර්ෂයේ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව යටතේ පේෂකර්ම මධ්‍යස්ථානයක් ආරම්භ කිරීම සඳහන් කළ හැක. 2500 සම්බුද්ධ ජයන්තිය නිමිත්තෙන් විහාරස්ථානය කේන්ද්‍ර කරගෙන ආගමික සේවාවන් කිහිපයක්ම සිදුකර ඇත.

එවකට වැඩසිටි බෝධිසත්ව ගුණෝපේත මහෝ සුමේධ හිමිපාණන් සමඟ චෛත්‍ය රාජයාණන් වහන්සේ සම්පූර්ණයෙන්ම නෙළුම් මල්වලින් හා විදුලි බුබුලින් සරසා ආමිස පිංකම් කිහිපයක්ම සිදුකිරීම දෙවන ලෝක යුද්ධ සමයේ ඇති වූ ආහාර දුර්භික්ෂයට පිළියමක් වශයෙන් වගා ව්‍යාපාරයකට ග්‍රාමීය ජනතාව පෙළගැස්වීම රයිගම් කෝරළයේ වැඩසිටි යතිවරයන් වහන්සේලා සමඟ 1956 දී ප්‍රගතිශීලී සටන් ව්‍යාපාරයට නායකත්වය ලබාදීම ස්වකීය ආරාමයෙහි මල් පළතුරු සහිත දුර්ලභ ඖෂධ වර්ග රෝපණය කර පරිසර හිතකාමී සෞන්දර්යාත්මක වැඩසටහන් පවත්වාගෙන යාම යන සේවාවන් ද අගය කළ යුතුය. කේශර සිංහ රාජයෙකු මෙන් අයුක්තිය, අසාධාරණය ඉදිරියේ අභීතව නැගී සිටිමින් ලබාදුන් එඩිතර නායකත්වය ඔලබොඩුව විහාර වංශයටම මහත් අභිමානයකි. 1994 පෙබරවාරි මස 02 වන දින වසර 103ක් ආයු වළඳා අපවත් වී වදාළ ඔලබොඩුවේ ධම්මානන්ද මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ සසුනඹර දීප්තිමත් කළ දිදුළන පහන් තාරකාවකි.

## පූජ්‍ය උඩුවේ හේමාලෝක මහා ස්වාමීන්ද්‍රයෝ

අප විහාරයේ වර්තමාන විහාරාධිපති ධූරය හොබවනු ලබන්නේ අප ගුරුදේවෝත්තම පූජනීය උඩුවේ හේමාලෝක මහා ස්වාමීන්ද්‍රයාණන් වහන්සේය. උන්වහන්සේ අප තත් විහාරයේ විහාරාධිපති ධූරයට පත් වී ගත වූ කාල පරාසය වනාහි අප විහාරයේ මෙන්ම ඔලබොඩුව සඟ පරපුරේ ද ස්වර්ණමය අවස්ථාවක් සනිටුහන් කරති. යනුවෙන් අර්ථ දැක්වීම අතිශයෝක්තියක් ලෙස සැලකීම නුසුදුසුය. එසේම අප මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ ඔලබොඩුව රජ මහා විහාරයේ වර්තමාන සංවර්ධනයේ ප්‍රධාන නියමුවා ද වන්නේය.

ව්‍යවහාර වර්ෂ 1961 වර්ෂයේ පූජනීය වීදියගොඩ පේමරතන මහ තෙරුන් වහන්සේගේ ආචාර්යත්වයෙන් පැවිදි බිමට පත් වූ අප ස්වාමීන්ද්‍රයන් වහන්සේ හොරණ විද්‍යාරත්නයේ දීප්තිමත් ශිෂ්‍යයෙකු වශයෙන් ධර්ම ශාස්ත්‍රය හදාරා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයට ඇතුළත් වී ශාස්ත්‍රවේදී උපාධිය ද ලබාගෙන 1970 වර්ෂයේ දී මල්වතු මහා විහාරයීය උපෝසථාගාරයේදී උතුම් වූ උපසම්පදා ශීලයට ද පත් වී උසස් වූ තම ශාසනික මෙහෙය ආරම්භ කළ යතිවරයාණන් වහන්සේ නමකි.

තව ද අප උඩුවේ හේමාලෝක ස්වාමීන්ද්‍රයන් වහන්සේ තම කාරුණික සේවය ආගමික අංශයට පමණක් සීමා නොකර අධ්‍යාපනික අංශයට ද යොමුකොට ලංකාවේ විවිධ පළාත්වල පාසල් ගණනාවකම ගුරුවරයෙකු වශයෙන් දහස් ගණනක් වූ සිසු දරු දැරියන්ගේ නුවණැස පෑදීම පිණිස කටයුතු කළේය. මෙසේ අප ස්වාමීන්ද්‍රයන් වහන්සේ හම්බන්තොට, කිරම ධම්මානන්ද විද්‍යාලය ආදී ඈත දුර බැහැර ප්‍රදේශවල පිහිටි පාසල්වල පවා සේවය කරනු ලැබීය.

මේ අතර අප ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ ගුරුවරයාණන් වහන්සේ වූ වීදියගොඩ පේමරතන මහ තෙරුන් වහන්සේගේ ගුරුවරයා වූ ඔලබොඩුවේ ධම්මානන්ද ලොකු හාමුදුරුවෝ මහලුව වයස්ගතව රෝගාතුර වී ඔලබොඩුව රජ මහා විහාරයේ වැඩසිටි අතර උන්වහන්සේ රැකබලා ගැනීමටත් තත් විහාරයේ කටයුතු සිදු කිරීමටත් අපේ හාමුදුරුවන් වහන්සේට පැවරුණු බැවින් උන්වහන්සේ ඔලබොඩුව රාජ මහා විහාරයට වැඩමකොට තම ආචාර්ය පදවිය ද ඔලබොඩුව විද්‍යාලයට මාරුකරගනු ලැබීය. එතැන් සිට විශ්‍රාම යන තෙක්ම ඔලබොඩුව ශ්‍රී සුමංගල මහා විද්‍යාලයේ ආචාර්යවරයෙක් වශයෙන් කටයුතු කළ අතරම ඔලබොඩුව රජ මහා විහාරයේ අධිපති පදවියට 1994 දී පත් වූ අප ලොකු හාමුදුරුවන් වහන්සේ අද පවතින තත්වයට ගෙන ඒම පිණිස සියලු කටයුතු සිදු කළ මහා වීරයාණන් වහන්සේ විය.

පැවිදි දිවියේ සීමාව නිතරම මෙනෙහි කරමින් උපාදානයෙන් තොරව මේ භෞතික වූ විහාර දේවාලයන් පාලනය කරන්නේ කෙසේ ද යන පාඩම ලෝකයාට කියා දෙමින් පැවරිය යුතු දෙය, පැවරිය යුතු වේලාව, පැවරීමට සුදුසු

පුද්ගලයාට පවරමින් නිරාමිස වූ පැවිදි දිවියක් ගත කරන අප ලොකු හාමුදුරුවන් වහන්සේ වර්තමාන සඟ පරපුරට ලබාදෙන පූර්වාදර්ශය සුළුපටු නොවේ.

වර්තමාන විහාර පරිපාලනයේදී අප සංසරත්නය කායිකව මෙන්ම මානසිකව ද මහත් වූ වෙහෙසට පත් වන්නේය. එහෙත් අප ස්වාමීන්ද්‍රයන් වහන්සේ බැඳීමක් නොමැතිව, ඇලීමෙන් තොරව විහාරයන් පාලනය කරන්නේ කෙසේ ද යන්න අපට කියා දෙන්නේය. එසේම මේ කුමන කටයුත්තක් නිසා හෝ පැවිදි දිවියේ අභිමතාර්ථයන් බිඳීයාමට ඉඩ නොදිය යුතුය යන අදහස ඉදිරිපත් කරන උන්වහන්සේ පැවිදි දිවියේ නිරාමිස මෙන්ම පිරිසිදු භාවය ද රැකගෙන එය රැක ගැනීම පිණිස අප ද පොළඹවන උත්තම ගනයේ යතිවරයාණන් වහන්සේ නමකි.

සතර පේරුවේ දායක ගම් රාශියකින් සමන්විත ඔලබොඩුව රජ මහා විහාරයට අයත් දායක කාරකාදීන්ගේ මෙන්ම රජ මහා විහාරයට සම්බන්ධ සියලු චාරිත්‍ර හා වත්පිළිවෙත් කිසිදු බරකින් හෝ වෙහෙසකින් තොරව ඉටු කරන අප ස්වාමීන්ද්‍රයන් වහන්සේ තමන් වහන්සේගේ අනුශාසකත්වයෙන් පවතින තලගල විපස්සනා භාවනා මධ්‍යස්ථානයට ද වැඩම කරමින් එහි වැඩසිටින භාවනායෝගී භික්ෂු සංඝයාට මෙන්ම යෝගාවචර උපාසක උපාසිකාවන්ට ද සුදුසු කමටහන් දෙමින් ඔවුන් ආර්ය මාර්ගයට යොමුකරමින් තමන් ද කර්මස්ථාන වඩමින් කටයුතු කරන ආකාරය පුදුමාකාරය. මෙසේ ආමිසය විසින් ඇතිකරන පීඩනයෙන් මිදී විදර්ශනාගතව කටයුතු කරන්නේ කෙසේ ද එලෙස කටයුතු කිරීම වනාහි ආර්ය භික්ෂුවකගේ සීමාව බව අප ස්වාමීන්ද්‍රයන් වහන්සේ මුවෙන් නොපවසා හදවතට කියාදෙනු ලබන්නේය.

# 4 - 2

# ඔලබොඩුව රජ මහා විහාරයේ පෞරාණික ප්‍රාසාදකරණය

**පුරාවිද්‍යා ස්මාරක**

1. පෞරාණික විහාර මන්දිරය
2. පෞරාණික උපුල්වන් ශ්‍රී විෂ්ණු මහා දේවාලය
3. ඓතිහාසික උපුල්වන් ශ්‍රී විෂ්ණු මහා දේවාලය
4. ඓතිහාසික ඇසතු බෝධීන් වහන්සේ
5. ඓතිහාසික නා බෝධීන් වහන්සේ
6. ශෛලමය විහාර ගෘහයෙහි පාදම
7. පෞරාණික බණ මඩුව
8. ශෛලමය පැන් පොකුණ - 01
9. ශෛලමය පැන් පොකුණ - 02

**පෞරාණික විහාරාංග**

10. වෙහෙර වහන්සේ
11. සංඝාවාසය සහිත දාන ශාලාව
12. ශෛලමය සණ්ඨාර ස්ථම්භය
13. ගම්භාර දේවාල මන්දිරය
14. ගණදෙවි දේවාලය
15. පැරණි පාසල් ශාලාව

**නව විහාරාංග**

16. සර්වඥ ධාතු මාළිගාව
17. හේවිසි මණ්ඩපය, තේවාභාර කුටිය, වන්දනා ශාලාව, මංගල ඇත් පියීකාව
18. උපෝසථාගාරාය
19. දෙව් විමනක් බඳු පිරිත් මණ්ඩපය
20. සියම් විහාරය සහිත ධර්ම මන්දිරය
21. අටවිසි බුද්ධ මන්දිරය
22. බෝධි මළුවෙහි වන්දනා ශාලාව
23. මලසුන් ගෘහය
24. ස්කන්ධ කුමාර ටැම්පිට දේවාලය



පෞරාණික විහාර මන්දිරය (පුරාවිද්‍යා ස්මාරකයකි)

25. සැරියුත් මුගලන් දෑගසව්වෝ
26. ෂඩ් මහා දේව මන්දිරය
27. නව බෝධි මණ්ඩපය
28. නවම් පෙරහර මාවත
29. නිශ්ශංකමල්ල රජ මාවත

ඕලබොඩුව රජ මහා විහාරය හා රයිගම්පුර උපුල්වන් ශ්‍රී විෂ්ණු මහා දේවාලය යන පෞරාණික ඉදිකිරීම් මෙම පූජා භූමියෙන් හමුවන විශිෂ්ට ගනයේ විහාරාරාම නිර්මාණයන්ය. මෙහි කලාත්මක ගෘහ නිර්මාණය පිළිබඳව යුග කිහිපයක් යටතේ හඳුන්වා දිය හැක. එකී ගෘහ නිර්මාණ තාක්ෂණය පුරාණ මෙන්ම නූතන ඉදිකිරීම් වලින් සමන්විත වන්නේය.

## පෞරාණික විහාර මන්දිරය

මෙම පෞරාණික විහාර මන්දිරය ගෘහ නිර්මාණ ශිල්ප කිහිපයකටම ආභාෂය ලද ගොඩනැගිල්ලකි. මෙහි විහාර මන්දිරයෙහි ආලින්දයක් ඇත. පෘතුගීසි හා ලන්දේසි යුගවල ඉදිකරන ලද සියලු ගොඩනැගිලිවල ආලින්දයක් දක්නට ලැබේ. එහෙත් එය බෞද්ධ පසුබිමට ගැළපෙන ආකාරයෙන් ඉදිකර තිබීම වැදගත්ය. ගරාදි දක්නට නොලැබේ.

මෙම විහාර නිර්මාණ කලාව අපට සිහිගන්වනු ලබන්නේ ගඩලාදෙණිය ලංකාතිලක යන විහාර සම්ප්‍රදායයි. විහාරයට ප්‍රධාන ආලින්දයෙන් ඇතුළු වන විටම දක්නට ලැබෙන්නේ මකර තොරණයි. තොරණ දෙපස මුර දේවතා රූපයන් දෙක සුපුරුදු පරිදි ඉදිකොට ඇත. එසේම ප්‍රධාන පිළිම ගෘහයට පිවිසීමට පෙර තවත් අභ්‍යන්තර සතරැස් ආලින්දයක් දක්නට ලැබේ. මෙම ආලින්දයේ බිත්ති හා සිවිලිම විවිධ වූ චිත්‍රවලින් සිතුවම් කොට ඇත. මෙම චිත්‍ර අතර සත් සතිය නිර්මාණය කර ඇත. එහි එක් තැනක දිවා ගුහාවේ භාග්‍යවතුන් වහන්සේ සැතපෙන ආකාරය හා ශ්‍රී පාදයේ ශ්‍රී පාද පද්මය නිර්මාණය කර ඇත්තේය. එම ස්ථානයේම ස්ථූපයක් පෙරළී ඇති ආකාරය දක්නට ලැබීම පුදුම සහගත සිද්ධියකි.

මේ කලාකරුවා බොහෝ දුරට උඩරට ගැතිවාදියෙකි. ඔහුගේ චිත්‍රවල දක්නට ලැබෙන්නේ මහනුවර වාසීන්ගේ චිත්‍රයි. එහෙත් පහතරට වාසීන්ගේ මානව රූපයන් ද දක්නට ලැබේ. මේ විහාර චිත්‍ර කර්මාන්තය වූ කලී එක් කලාකරුවෙකුගේ නොව කලාකරුවන් දෙදෙනෙකු වූ උඩරට ගැති හා පහතරට ගැති එකමුතු නිර්මාණයක් ලෙස සැලකීම යුක්ති යුක්තය. අභ්‍යන්තර ආලින්දයේ චිත්‍ර උඩරට මිශ්‍රණයකි. මේ කලාකරුවා විසින් පෙරළුණු ස්ථූපය නිර්මාණය කොට ඇත. සමහරවිට රයිගම් කෝරළයේ බුදු දහමට එවකට එල්ල වී තිබුණ බලපෑම මේ පෙරළුණු ස්ථූපයෙන් පෙන්වා දීමට කලාකරුවා ගත් උත්සාහයක් ලෙස ද මේ කරුණු තේරුම්ගත හැකි වන්නේය.

මේ පුරාණ විහාර ලක්ෂණයන් දෙස බලන කල බහුලව දක්නට ලැබෙන්නේ බුද්ධ කාලීන හා බුද්ධ චරිතයට සම්බන්ධ සිතුවම් හා එයට ගැළපෙන මානව රූපයන්ය. එහෙත් මේ විහාරයේ චිත්‍රයන් වර්ග දෙකම තුළ බුද්ධ චරිතයේ යම් යම් සිදුවීම් පැහැදිලි කළත් මානව රූප හා ගොඩනැගිලි එකල තත් ලාංකික සමාජයේ පැවති ආකාරයට නිර්මාණය කර තිබීම විශේෂත්වයකි. මෙම පළමු කලාකරුවාගේ චිත්‍ර නිර්මාණය තුළ බුද්ධ චරිතයට මෙන්ම ලක්දිව ඓතිහාසික සිදුවීම් ද විස්තර කර ඇත. එසේම ඔහු පිළිම ගෘහයේ චිත්‍රවලින් සිව්වනක් පිරිස හා දෙවියන්ගේ බිතුසිතුවම් නිර්මාණය කර ඇති අතර යම් ප්‍රභූ පිරිසකගේ චිත්‍රයක් ද දක්නට ලැබේ. මේ ප්‍රභූන්ගේ ඇඳුම් හා ආභරණයන් දෙස බලන කළ පහතරටට අයත් ප්‍රභූ පිරිසක් බව සිතිය හැකිය. සමහරවිට අලගක්කෝනාර, සෙනාධිලංකාර වැනි මේ විහාරයට අනුග්‍රහය දක් වූ ප්‍රභූ පවුලක් විය හැකිය.

විහාරයේ ප්‍රධාන මූලාශ්‍රය වූ බුද්ධ ප්‍රතිමාවේ කලාත්මක ලක්ෂණය සෙවීම තරමක් ගැටලු සහිතය. ප්‍රතිමාවේ බඳ ප්‍රදේශය, උදරය හා පපුව අතර පූර්ණ බවක් දක්නට නොලැබේ. චීවරය ද ශරීරයෙන් මතුව පැවතිය ද එහි කලාත්මක තාක්ෂණය එතරම් උසස් මට්ටමක පවතින්නේ යැයි පැවසීම අපහසුය. එසේම පසුකාලීනව මෙම ප්‍රතිමාව ප්‍රතිසංස්කරණයට ලක් වූවාදැයි අදහසක් ද පවතින්නේය. මැටි නිර්මාණවලට යම් යම් හානි සිදුවෙන නිසා එවැනි දෙයක් සිදු වන්නට ඉඩ ඇත්තේය.

අපගේ දෙවන කලාකරුවා වනාහි පහත රටියෙකි. නැතිනම් පහතරට එවකට පැවති කලා සංස්කෘතීන්ට ගරු කළ අයෙකුය. ඔහුගේ චිත්‍රවලට ලා පාට භාවිතාකොට ඇත. තද පාට භාවිතා කොට ඇත්තේ ඉතා විරල වශයෙනි. එසේම ජාතක කතා සිතුවමට නගා ඇත. සිතුවම් ආශ්‍රිතව රෝස මලට සමාන මලක් ද නිර්මාණය කොට ඇත්තේය. එහෙත් අපට විහාර චිත්‍ර කර්මාන්තයන් තුළින් බහුලව හමුවන්නේ නෙළුම්, මානෙල්,ඕලු, සල් හා නා වැනි මල් වර්ගය. මේ චිත්‍රයේ දක්නට ලැබෙන්නේ නා මල හෝ රෝස මලයි. රෝස මල නම් එය තවත් සුවිශේෂී අවස්ථාවකි. මෙය නා මල විය යුතු බව අපගේ ද හැඟීමයි. එසේම සුපුරුදු පරිදි අලි ඇතුන් හා අශ්වයන් දක්නට ලැබේ. අශ්වයන් වැඩිබවක් පෙනේ. කෙසේ වෙතත් මේ සියලු චිත්‍ර සම්ප්‍රදායන් වසර 150 වඩා පැරණි බව නම් ඉතා පැහැදිලිය.

සිවිලිමේ චිත්‍ර නිර්මාණයේදී කලාකරුවන් දෙදෙනාම ඉතා සරල ක්‍රමයක් උපයෝගී කරගනු ලැබේ. මේ විහාරයෙහි ඉතා වැදගත්ම නිර්මාණය ලෙස සැලකිය හැක්කේ සූවිසි විවරණයයි. තථාගතයන් වහන්සේ විවරණයන් ලබාගත් ආකාරය සිතුවමකින් දක්වා එයට අදාළ කවියක් ද ඒ අසලින් දක්වා තිබීම එහි ඇති සුවිශේෂිතාවයයි.

ඇතුල් ආලින්දයේ පිළිම ගෘහයට පිවිසෙන දොරටුව උඩින් අපූරු චිත්‍රයක් දක්නට ලැබේ. එම චිත්‍රයෙන් පිළිබිඹු කරනුයේ ධාතු කරඬුව, පුස්කොළ පොත් දෙකක්, වටාපතක්, දැල් වූ පහනක් වශයෙනි. මෙයින් පැහැදිලි කරනුයේ ධාතු කරඬුවෙන් බුද්ධ රත්නය, පුස්කොළ පොතින් ධර්ම රත්නය, වටාපතින් සංඝරත්නය හා දැල් වූ පහනින් තෙරුවන් ගුණෙන් සියලු අඳුර දුරුවන බව විය හැකිය. මෙවැනි සිතුවම් පණිවිඩයක් අපට හමුවන්නේ ප්‍රථම වතාවටයි.

විහාරයේ බටහිර දිසාවේ ආලින්දගත චිත්‍රවලින් ජාතක කතාවන් විස්තර කරනු ලබන අතර ඒවා සාමාන්‍ය ගනයේ විස්තරයන් ය. එහෙත් රූප ඇඳීම එතරම් ප්‍රශස්ත මට්ටමක පවතින්නේ යැයි කිව නොහැකි වුවත් ඒවා සියල්ලම මහනුවර යුගයේ චිත්‍රයන් ය. එම එක චිත්‍රයකින් තුලාභාර දානයක් පිළිබඳව සිතුවම් කරයි. එනම් තරාදියක එක් පැත්තකට යම් අයෙකු නන්වා අනෙක් පසට ඔහුගේ බරට සමාන වස්තුව පුරවා පූජා කිරීමයි. මෙවැනි පූජාවන් ගැන අසන්නට ලැබෙන්නේ පොළොන්නරුවේ නිශ්ශංකමල්ල රජු සමයේය. ඔහු තම පුත්‍රයා වූ සහස්සමල්ලගේ බරට දන් දුන් බව පැහැදිලි වේ. එසේම මේ දේවාල සහිත පූජා භූමියේ නිර්මාතෘ ලෙස ද සලකනු ලබන්නේ නිශ්ශංකමල්ලයන්ය. ඒ අනුව මේ සිතුවමින් පැහැදිලි කරන්නේ නිශ්ශංකමල්ලයන්ගේ තුලාභාර දානය බව ඉතා පැහැදිලිය.

කෙසේ වෙතත් ඔලබොඩුව රජ මහා විහාරයේ විහාර මන්දිරය ඉදිකිරීම වනාහි ශ්‍රී ලාංකීය බෞද්ධ ඉතිහාසයේ ඉතා වැදගත් කඩඉමකි. විශේෂයෙන්ම ක්‍රි.ව.15 වන ශතවර්ෂය වන විට පෘතුගීසි ඕලන්ද බලපෑමට හසුව තිබුණ රයිගම්

කෝරළය ආශ්‍රිත පහතරට ප්‍රදේශවල නැවත බෞද්ධ පුනරුදය ගොඩනැගීමේ එක් අවස්ථාවක් වශයෙන් ද මේ විහාර කර්මාන්තය හැඳින්විය හැකිය. එසේම විවිධ බලපෑම් හා අභියෝග මැද සම්පත් හිඟයට ද මුහුණ දෙමින් නැවතත් බෞද්ධ සංස්කෘතියේ අභිමානය පැතිරවීම පිණිස ගත් අනභිමානී උත්සාහයක් ලෙස මේ විහාර කර්මාන්තය පෙන්වා දිය හැකිය. රාජ්‍ය අනුග්‍රහයෙන් හා දානපති අනුග්‍රහයන් ද ඉතා අඩු වූ යුගයක කරන ලද උසස් ගනයේ නිර්මාණයක් ලෙස මේ විහාර කර්මාන්තය පෙන්වා දිය හැකි වන්නේය.

එසේම පහතරට ප්‍රදේශයන් කුමන දේශපාලන බලපෑමක් යටතේ පාලනය වුවත් ඔවුන් සෙංකඩගල සංස්කෘතියට පැවති හිතෛෂී භාවය පෙන්වා දෙන අවස්ථාවක් වශයෙන් ද මේ විහාර කර්මාන්තය සඳහන් කළ හැකිය. එනම් එම විහාර ගෘහය ඉදිකළ නිර්මාණකරුවන් හැකිතාක් මහනුවර කලාව හා ගෘහ නිර්මාණ ශිල්පය උපයෝගී කරගැනීම පිණිස ගත් උත්සාහය මේ විහාර කර්මාන්තයෙන් හෙළිවීමයි. තවද මේ විහාරස්ථානය වනාහි මහා විහාර පරපුරක ශුද්ධ භූමියකි. මෙම විහාරස්ථානයේ වැඩවාසය කළ භාරකාර ස්වාමීන් වහන්සේලා නිතරම මහනුවර මල්වතු හා අස්ගිරි උභය සංඝයා සමග සබඳතාවන් පවත්වාගෙන ගියේය. එබැවින් මහනුවර කලාකරුවන්ගේ සහයෝගය මේ විහාර කර්මාන්තයට ලබාගැනීම උන්වහන්සේලාට ගැටලුවක් ද නොවීය. කෙසේ වෙතත් මේ විහාර කර්මාන්තය වනාහි රයිගම් කලාව තව තවත් ඔප්නන්වන නිර්මාණයක් ලෙස දැක්වීම සුදුසුය.

සූවිසි විවරණයෙන් හෙළිවෙන කතා ප්‍රවෘත්තිය කවියකින් විස්තර කර තිබුණත් මේ වන විට එම කවි බොහොමයක් මැකී ගොස් තිබීම බලවත් වූ අපරාධයකි. තවද මේ කවි ලියා දැක්වීමේදී 'න,ණ' භේදය ගැන වඩාත්ම සැලකිලිමත් වී ඇත. 'න' යෙදිය යුතු යැයි වර්තමානයේ අප විස්තර කරන බොහෝ තැන්වල ද මූර්ධජ 'ණ' යොදා ඇත්තේය. 'ර' පරව නම් 'ණ' ම යොදා ඇත්තේය. තව ද මේ කවි රචනාවන්වල ශ්‍රැතිය වනාහි කෝට්ටේ කවියාගේ රිද්මයට බොහෝ සෙයින් සමානය. රයිගම්පුරය කවීන්ගේ දේශයකි. එබැවින් එවැන්නන්ගේ කවීත්වය ගැන පැවසීම අප වැන්නන්ට සුදුසු නැත. මන්ද යත් ඔවුන් වනාහි කවියන්ගේ ද ගුරුන් වන නිසාය. දැනට ශේෂව ඇති කවි කිහිපයක් මේ කෘතියට අන්තර්ගත කිරීම එහි මතු ආරක්ෂාවට හේතුවක් වනු ඇත.

**අංක 04 කවිය**

පමණ කල නොහැකි කෙලෙසුන් නසා හැම
සුමණ නම් තිලොගුරු මුනිතුමා පෙම
එදින අතුල දිව නා රජ වූ උත්තම
සුදන ඒ බෝසත් විවරණ ලත් මහිම

## අංක 05 කවිය

රැබර සිරිත් සව්සත හැම නිගා    කර
රේවත බුදුන් සමයේ පවඟ    ආකර
බෝසත අති දේව බමුණුව    දයාබර
මෙතතු බලවි විවරණ ලබන    අදර

## අංක 06 කවිය

පසිඳු තිලෝගුරු සෝභිත බුදුන්    කල
ලොවිඳුතුමා දඹදිව සසිරි    සුවකල
සොමිඳු කුල සුජාත නම් බමුණු    කල
මුණිඳුතුමා දැක විවරණ කල ලැබූ    කල

## අංක 07 කවිය

ගුණ ග    තිලොගුරු
ලොව    බුදු බවට ලොව්තුරු
නව තෙද බෝසත්    මහරු
බුදු වේ මැයි විවරණ ලත් ඒ    ගුරු

## අංක 08 කවිය

මුළු ලොව පියුම් වැසි වස්වා දණ    පමණ
අළුකර අඳුර බුදුඋන පදුම    නමකිණ
රළු ගුණ කෙසර සිහ රජ බෝසත්    එදිණ
බැලූ ඇස් නොපියමින් විවරණ ගති    බැතිණ

## අංක 09 කවිය

සාර ගුණැති නාරද මුණි තුමා    කලේ
සාධු ගුණග තාපසයෙක් වහි    මතුලේ
නැර බුදු බවට සිත තුටු විය    එකලේ
පැදි සිතින් විවරණ ලැබු වසු    විපුලේ

## අංක 10 කවිය

සව් ගුණැති මුණි සඳ පියුම මුණි    කල
සව්සිරි සැපකි සේනාපති නම්    ජටිල
සව්ගල මුණිඳු සිරිපාද නැම    සලකල

**අංක 11 කවිය**

සිරිබර සුමේදා නම්ලත් පබඳ
පිරිවරමින් සඟතුර දෙපස පිරිසඳ
සිරිදර උතුම් උතුරු නම් මනෙ විදිය නද
පිරිදර සිතින් ගත් විවරණ මෙසේ වද

**අංක 12 කවිය**

වදු තිලෝ කුස බුදුගුණ ගිය පැතිර
සුජාත නම් මුණි බුදු වූ සඳ පවර
උදාරතර තෙද සක්විති රජව පෙර
එදා ලැබූ විවරණ මේ බල මිතුර

**අංක 18 කවිය**

ගණදුර බිඳින තෙද රැස් රිවිලේ සඟුවන
ගුණමිනි කිරණ මුනිරජ ඵුස්ස නම් වන
දිනපති කුල විජිත රජ වස සෝභන
දිනමිණි සිදු සේම බල විවරණ ලබන

**අංක 19 කවිය**

සඳක් සේ දිලින වට රැස් කඳ නිතර
විපස්සි බුදුන් සමයේ මුනිඳු පෙර
දමක් සේ රජත දිවඋර හිඳු පවර
නොලස් සේ ලබන විවරණ බල මිතුර

**අංක 20 කවිය**

දූකී අතට පත් සිතුමිණි සේ අමුතු
සිකි බුදුන් සමයේ අපගේ බෝසතු
රකී රට අරින්දම රජව ලෙස සිතු
එකී විවරණය බල මිතුර වැද පැතු

**අංක 21 කවිය**

කෙලෙස් රුපු රිස්ස හැර ලොවට සෙත් කරා
තොලස් මුණි වෙස්සභූ මුනිතුම ලොව්තුරා
සුදස්ස නර රජව අප බෝසතු එවරා
මෙලස්සන බලව් විවරණ ලත් පවරා

**වෙහෙර වහන්සේ**

ඔලබොඩුව රජ මහා විහාර ගොඩනැගිලි කලාවේ සුවිශේෂී ස්ථානයක් ගනු ලබන නිර්මාණයක් ලෙස දාගැබ පෙන්වා දිය හැකිය. එහෙත් දාගැබ ඉදිකිරීමේදී විහාර හා දේවාල ගෘහයට සමීපයෙන් ඉදිකොට ඇති නිසා එම භූමියේ පැවති යම් යම් පෞරාණික නටබුන් යටවී ගියාදැයි අප තුළ සැකයක් මතු වන්නේය. කෙසේ වෙතත් වෙහෙර වහන්සේ නිර්මාණය කිරීම වනාහි විහාර භූමියට ලබාදුන් ආලෝකය අතිමහත් ය.

දාගැබ ඉදිකිරීමේදී එම දාගැබ පාදම ලෙස යොදාගෙන ඇත්තේ ගල් කුලකි. මේ ගල්කුල මත සකස් කළ ස්ථානයක ධාතු නිදන් කරවා ඒ වටා දාගැබ ඉදිකළ බවට තොරතුරු සනාථ වී ඇත. මෙවැනි නිර්මාණයක් අපට හමුවන්නේ පළමු වතාවටයි. එසේම මේ ගල්කුල මත ධාතූන් තැන්පත් කිරීම කුමක් හෝ විශේෂතාවයක් සලකා ගෙන බවට නම් ඉතා පැහැදිලිය. ඒ මන්දයත් දාගැබ ඉදිකිරීම පිණිස ඕනෑ තරම් ඉඩකඩ තිබියදීත් මේ ගල්කුලම තෝරාගෙන දාගැබ ඉදිකිරීම තුළින් එය මැනවින් පැහැදිලි වේ. සමහරවිට මේ ගල්කුල ආශ්‍රිත භූමිය තුළ යම් ඓතිහාසික හෝ ආගමික වශයෙන් වැදගත් සුරක්ෂාවක් පිණිස මෙසේ ඉදිකළා යැයි සැලකිය හැකි වන්නේය.

දාගැබ ඉදිකිරීමේ ගෞරවය ලැබෙන්නේ පරම පූජනීය තලගල ධම්මරතනාභිධාන මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේට ය. රජ මහා විහාර නායක පදවිය ඉසිලූ උන්වහන්සේ වනාහි යම් බලයක් හෝ අධ්‍යාත්මික බවකින් යුත් මහ තෙරුන් වහන්සේ නමකි. උන්වහන්සේ ගන්නා වූ යම් තීරණයක් ඒ අයුරින්ම පිළිගැනීම එවකට සිටි දායක කාරකාදීන්ගේ සිරිත විය. එසේම උන්වහන්සේ ගන්නා වූ තීරණයන් එසේ ගනු ලබන්නේ කුමක් හෝ හේතුවක් නිසා බව ජනයා විශ්වාස කළේය. එබැවින් උන්වහන්සේ මේ ස්ථානයේ දාගැබ තැනීමට ද තෝරා ගත්තේද යම් වැදගත්කමක් උන්වහන්සේගේ සිතට දැනුණු නිසා විය හැකිය.

දාගැබේ ධාතු නිදන් උත්සවය ඉතා උසස් අන්දමින් පවත්වා තිබේ. මේ ධාතු ගර්භයේ ධාතු නිදන් කිරීමේදී එම ධාතූන් වැඩම කිරීම හා උත්සව කටයුතු සියල්ලම සංවිධානය කිරීමේදී එවකට විහාරාධිපති පදවිය දැරූ බොලබොටුවේ ශ්‍රී සුමංගල මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ කල් ඇතිවම අවවාද අනුශාසනා ලබාදී තිබුණි. උන්වහන්සේ අපවත් වුවද වැඩසිටි කාලයේදී ලබාදුන් අනුශාසනා අනුව කටයුතු කරන්නට ධම්මරතන මාහිමිපාණෝ කටයුතු කළහ. එවකට යොවුන් වියේ පසු වූ තරුණ යතිවරයාණන් වහන්සේ නමක් වන ඔලබොඩුවේ ධම්මානන්ද ස්වාමීන්ද්‍රයන් වහන්සේට ධාතූන් වහන්සේලා සහිත නිදන් වස්තු එක්රැස් කිරීමේ වගකීම පැවරිණි. ලංකාවේ අටමස්ථානය ඇතුළු පෞරාණික විහාරස්ථාන සමග ධම්මානන්ද මාහිමියන් සමීප සම්බන්ධතාවයක් පවත්වාගෙන ගොස් ඇත. එකී සම්බන්ධතා ඔස්සේ කාර්යශූර යතිවරයෙකු වූ මුන්වහන්සේ

තමන් වෙත පැවරුණු කාර්යය අකුරටම ඉටුකිරීමට උත්සාහ ගෙන ඇත. ශිලාමය ධාතු ගර්භයෙහි තැන්පත් කිරීම පිණිස ස්ථාන 84 කින් ධාතූන් හා නිදන් වස්තු වැඩම කරවාගෙන ඇත. මේ ස්ථාන 84 කින් ධාතූන් වහන්සේ වැඩම කරනු ලැබුයේ අසූහාරදහසක් ධර්මස්කන්ධය සිහිවීම පිණිස විය හැකිය.

ඔලබොඩුවේ ධම්මානන්ද හිමිපාණන් වහන්සේ මෙම ස්ථූපයේ තැන්පත් කිරීම පිණිස ධාතූන් වහන්සේලා වැඩමවීමටත් පූජා වස්තූන් සකස් කිරීම පිණිසත් ලක්දිව බොහෝ ප්‍රදේශවලට සැලකිය යුතු දුරකතරක් ගෙවාගෙන වැඩම කරවා ඇත. එම වැඩමවන ගමනේදී උන්වහන්සේ අනුරාධපුර අටමස්ථානාධිපති නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ බැහැදකීම පිණිස ද වැඩම කොට ඇත. කාලයක සිට ශ්‍රී මහා බෝධිය සමඟ ඔලබොඩුව රජ මහා විහාරස්ථානය පවත්වාගෙන ගිය සම්බන්ධතාවය අනුව තමන් විසින් පැමිණි අරමුණ අටමස්ථානාධිපති නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේට පවසා ඇත්තේය. ඒ අවස්ථාවේ තම විහාර පරම්පරාවට අයත් ඔලබොඩුව රජ මහා විහාරස්ථානයේ සිදුකරනු ලබන මේ උදාර සද්කාර්යය පිළිබඳව ඉතාමත් සන්තෝසයට පත් උඩමළුවේ නායක ස්වාමීන් වහන්සේ තමන් සතු පූජා අල්මාරි විවෘත කොට ධාතූන් වහන්සේලාට අමතරව මෙහි තැන්පත් කර තිබෙන ඕනෑම දෙයක් ස්ථූපයේ තැන්පත් කිරීම පිණිස රැගෙන යන ලෙස ධම්මානන්ද හාමුදුරුවන්ට දන්වා ඇත. එවිට උන්වහන්සේ ඉන් එක් පූජාභාණ්ඩ අල්මාරියක පසෙක දමා තිබුණ දුර්වර්ණ වූ බුදු පිළිමයක් දැක එම පිළිම වහන්සේ චෛත්‍යයේ තැන්පත් කිරීමට ලබා ගත්තේය. මෙතරම් බොහෝ දේවල් තිබියදී මේ තරුණ ස්වාමීන් වහන්සේ දුර්වර්ණ වූ පිළිමය පමණක් තෝරාගැනීම ගැන පුදුමයට පත් වුවද උඩමළුවේ නායක හාමුදුරුවන් වහන්සේ තව බොහෝ පූජා වස්තූන් චෛත්‍යයේ තැන්පත් කිරීම පිණිස ලබා දී ඇත.

අනුරාධපුරයෙන් ලබාගත් ධාතූන් වහන්සේලා සහිත පූජා වස්තූන් රැගෙන නැවතත් දුම්රියෙන් කොළඹට වැඩමකර ඔලබොඩුව රජ මහා විහාරයට පැමිණි ධම්මානන්ද හාමුදුරුවන් වහන්සේ මෙකී සියලු තොරතුරු තම ගුරු දේවයන් වහන්සේට දන්වා දුර්වර්ණ වූ පිළිම වහන්සේ පවිත්‍ර කිරීම පිණිස විහාරස්ථානය ආසන්නයේම වාසය කළ දක්ෂ රන් ශිල්පියෙකු වූ ගබෝ නයිදේ නම් තැනැත්තාට භාර කරන ලදී. ගබෝ නයිදේ යනු ඔලබොඩුව රජ මහා විහාර ඉතිහාසයේ නොමැකෙන සටහනක් තැබූ පරපුරක එක් ශිල්පියෙකි. ඔවුන් මේ ගම ආශ්‍රිතව වාසය කළ රන්කරුවන් හෙවත් රන් කර්මාන්ත ශිල්පීන්ගේ පරපුරයි. මේ පිරිස රජවරුන්ගෙන් පවා රාජ්‍ය සම්මාන ලත් දක්ෂ කලාකරුවන් පිරිසකි. විහාර ඉතිහාසයේ මුල්යුගයේ සිට ම විහාරස්ථානයේ හා දේවාලයේ සියලු පූජා භාණ්ඩ සකස් කිරීම, පෙරහර හා දේවාල භාණ්ඩ ඔප දැමීම මොවුන්ගේ ප්‍රධාන කාර්යයක් බවට පත්ව තිබුණේය. මෙම පරපුර එකී කාර්යයන් තමන්ට දෙවියන් විසින් පැවරූ රාජකාරියක් ලෙස සැලකූ අතර එය තම පරපුරේ අභිමානීය අයිතියක් ලෙස ද සලකා සිදුකරනු ලැබීය.

ඔලබොඩුවේ ධම්මානන්ද හිමිපාණන් විසින් රන්කරුට පවරා ඇති මෙකී ප්‍රතිමාව පිරිසිදු කිරීම සමඟ ඉතා වැදගත් දෙයක් සිදුවී ඇත්තේය. ඒ කථා ප්‍රවෘත්තිය මෙසේය. ගබෝ නයිදේ කලා ආචාර්යවරයා මේ පිළිම වහන්සේ පිරිසිදු කරන විට විශාල ආලෝකයක් ප්‍රතිමාවෙන් විහිදෙන්නට විය. මෙයින් කලබලයට පත් වූ ඔහු විහාරස්ථානයට පැමිණ ඒ ප්‍රතිමා වහන්සේ විහාරභාර හිමිවරුන්ට ම භාර දී ඇත. ඒ මන්ද මේ ප්‍රතිමාව දඹරන් පිළිමයක් බව හඳුනාගත් නිසාය. එහි බර රාත්තල් 7 1/2 කි. මේ දඹරන් ප්‍රතිමා වහන්සේ සමඟ මිල කළ නොහැකි පූජා භාණ්ඩ ද, අසූ හතර නමකට අධික ධාතූන් වහන්සේ ද තැන්පත් කරමින් ධාතු නිදානෝත්සවය සිදුකර ඇත.

වෙහෙර වහන්සේගේ ධාතු නිධානෝත්සවය ගැන ගමේ වාසය කළ පැරණි අය පැවසූ කතාන්දර තවමත් ජනප්‍රවාදයේ පවතී. දඹරන් ප්‍රතිමාව වෙහෙර වහන්සේ අභ්‍යන්තරයෙහි තැන්පත් කරන අවස්ථාවේ එකී ප්‍රතිමාවෙන් හා ධාතු නිදානයෙන් පසු වෙහෙර වහන්සේගෙන් බුදුරැස්මාලා විහිදීයාම ප්‍රකට කරුණකි. මූලික ධාතු නිධානෝත්සව දෙකකි. 1927 ජුනි මස 09 වෙනි දින පස්වරු 1 පසු වී මිනිත්තු 45 ට වෙහෙර වහන්සේගේ ශෛලමය ආසනයෙහි ධාතු නිදානය 27 වෙනිදා රාත්‍රී 10.15 ට සුබ මොහොතින් නිදන් කටාරම වසා තබන ලද්දේය.[1]

ශ්‍රී බුද්ධ වර්ෂ 2472 ක් වූ දුරුතු මස පුර විසෙනිය ලත් ගුරු දින පෙරවරු 10.36ට යෙදුණු සුබ මොහොතින් අනුරාධපුර නුවර වැව බුලන්කුලමේ වලව්වේ සූරිය කුමාර වන්නිසිංහ ලොකු බණ්ඩාර මහදිසා මන්ත්‍රීවරයාණන්ගේ ප්‍රධානත්වයෙන් දේවතා කොටුවෙහි ධාතු නිදානය සිද්ධ කළාහ.[2]

බු.ව.2472 ක් වූ දුරුතු මස සියම් මහා නිකායේ මල්වතු පාර්ශ්වයේ අතිගරු මහානායක ධූරන්දර පහමුණේ ධර්ම කීර්ති ශ්‍රී සරණංකර සුමංගලාභිධාන මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ සුරතින් විවෘත කරන්නට යෙදුණා ඇත.[3]

සංඝාකාර කලා සම්ප්‍රදායට ඉදිකොට ඇති මෙම ස්තූපය වනාහි විශිෂ්ට වූ විහාර කර්මාන්තයෙකි. කුඩා ස්තූපයක් වුවත් පැරණි ස්තූපයන් හා සමානවම සියලු ස්තූප අංගයන්ගෙන් ද සමන්විත වී ඇත. එසේම මෙම ස්තූප කර්මාන්තය තුළ කලාත්මක දක්ම මැනවින් පරිපූර්ණය. එසේම ස්තූපය වටා ඉදිකර ඇති මලසුන් ගෘහයන් ඉදිකොට ඇත්තේ මහසෑයේ වාහල්කඩ ස්වරූපයෙනි. කුඩා ස්තූපයකට වාහල්කඩ ඉදිකිරීම සාමාන්‍යයෙන් විරල සිද්ධියකි. වාහල්කඩ ඉදිකිරීමේදී වාහල්කඩ මුදුනට පක්ෂියෙකුගේ රූපයක් මූර්තිමත් කොට ඇත.

---

1. ඓතිහාසික ඔලබොඩුව රජ මහා විහාර වෙහෙර වහන්සේ ඉදිකිරීමේ වතගොත - පූජ්‍ය තලගල ධම්මරතන මාහිමි
2. ඓතිහාසික ඔලබොඩුව රජ මහා විහාර වෙහෙර වහන්සේ ඉදිකිරීමේ වතගොත - පූජ්‍ය තලගල ධම්මරතන මාහිමි
3. ඓතිහාසික ඔලබොඩුව රජ මහා විහාර වෙහෙර වහන්සේ විවෘත කිරීමේ පුණ්‍යෝත්සවය සඳහන් විශේෂ සන්නස - පූජ්‍ය ඔලබොඩුවේ ධම්මානන්ද මාහිමි



ජය ශ්‍රී මහා බෝධි ශාඛාව සමඟ ආනන්ද බෝධි ශාඛාව

බොහෝ විට රයිගම්පුර සාහිත්‍ය තුළ පක්ෂීන් ගැන බහුලව සඳහන් වීම නිසා මෙසේ නිර්මාණයක් කරන්නට ඇතැයි අනුමාන කළ හැකිය. තවද මේ ස්ථානයේ තිබුනේ යැයි සලකන මල් ආසනයක් දැනට විහාරස්ථානයේ සමාධි ප්‍රතිමාව ආශ්‍රිතව තැන්පත් කොට ඇත. තවද වාහල්කඩේ බුද්ධ වර්ෂ 2473 යන්නෙන් සඳහන් කර ඇත. ඒ අනුව ස්ථූපය හා වාහල්කඩ එකම කාලසීමාවකදී ඉදිවී ඇති බව අපට නිගමනය කළ හැක.

**ඓතිහාසික බෝධීන් වහන්සේ**

ඔලබොඩුව රජ මහා විහාරස්ථානය පෙර යුගයේදී හඳුන්වන්නේ බෝගහවත්ත යන නාමයෙනි. පැරණි ලිපි ලේඛන සහිත නීත්‍යානුකූල ලේඛනයන්හි ද එකී නම ම භාවිතා කර ඇත. එදා මෙම භූමිය ස්වාභාවික ගල් කුළු අතර මහත් වූ වනස්පතීන්ගෙන් සැදුම්ලත් පුදබිමක් නිසාත් විශේෂයෙන් දැනට වැඩසිටින ඓතිහාසික බෝ සමිඳුන්ට ප්‍රථම වෙහෙර වහන්සේත් බෝධීන් වහන්සේත් අතර පුරාණයේ මහා ඇසතු බෝධීන් වහන්සේ නමක් වැඩසිටි නිසා බෝගහවත්ත යන නම ව්‍යවහාර වන්ට ඇත.[1]

වර්තමාන ප්‍රතිසංස්කරණයට හා නවීන සංවර්ධනයට භාජනය වූ ස්ථානයක් ලෙස බෝධීන් වහන්සේ ආශ්‍රිත භූමිභාගය සැලකිය හැක්කේය. මෙහි නවීන

1. ඔලබොඩුව රජ මහා විහාර වතගොත - ඔලබොඩුවේ ධම්මානන්ද මාහිමියන්ගේ සටහනකිනි.

ඉදිකිරීම් බොහොමයක් දක්නට ලැබුණත් ඒ ඉදිකිරීම් රාශියම පෞරාණික ගොඩනැගිලි කලාව නොඉක්මවා ඉදිකොට තිබීම අගය කළ යුතුය. ඒ සඳහා ද බොහෝ දුරට ශෛලමය ඉදිකිරීම් යොදාගෙන ඇත. එසේම නවීන ඉදිකිරීම් තුළින් මෙම පූජා පරිශ්‍රයෙහි පෞරාණික බවට හා නිදහස් නිසංසල බවට හානියක් සිදුනොවීම ද විශේෂත්වයකි.

මෙම ඓතිහාසික බෝධීන් වහන්සේ සහිත බෝධි මළුව පිහිටා ඇත්තේ විහාරස්ථානයට නැගෙනහිර දිසාවේ කෙළවර ය. හිරු ආලෝකය නිදහසේ ලැබෙන එසේම සඳ එළිය නිදහසේ ගලා බසින වෙල්යායට යාබදව පිහිටි නිසා පිරිසිදු වාතය හා සුළඟ ලැබෙන භූමිභාගයක පිහිටා තිබෙන මෙහි භූගෝලීය හා විශ්වීය වටිනාකම ඉහළ මට්ටකට පවත්වාගෙන යාමට හේතුවක් වී ඇත.

ඇසතු බෝධින් වහන්සේ ප්‍රාකාර රන්වැට සහිත තුන්බෝධියකි. අවට ගස් පරීක්ෂා කිරීමේදී ශාඛා දෙකකින් හෝ තුනකින් සමන්විතව පවතී. මේ සුවිශේෂී ස්වභාවය විද්‍යාත්මක ඇසින් කෙසේ දුටුවත් අධ්‍යාත්මික ඇසට නම් සුවදායකය. බෝධි මළුවට පැමිණෙන කවර සැදැහැවතකුගේ වුව ද ශ්‍රද්ධාව වඩවන්නකි. පෞරාණික විහාර මන්දිරය දෙසට වැඩී පැතිරී ඇති ශාඛා දෙක දඹදිව විජය ශ්‍රී ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ අංකුරයක් සහ අනුරාධපුර මහමෙව්නාවේ ජය ශ්‍රී මහා බෝධින් වහන්සේගේ අංකුරයක් වශයෙනි.

අහස දෙසට කෙළින්ම වැඩී පැතිරී ඇති ශාඛාව දඹදිව ආනන්ද බෝධීන් වහන්සේගෙන් වැඩම කරවූ අංකුර ශාඛාවකි.[1] මේ අයුරින් රෝපණය වී ඇති තුන් බෝධිය රෝපණය කර ඇත්තේ කුමන කාලයදැයි පැහැදිලි නැත. නව බෝධි ප්‍රාකාරය ඉදිකිරීමට ප්‍රථම කල් ඉකුත් වී දිරාපත්ව ඇදහැලෙමින් තිබූ පැරණි ප්‍රාකාරය ඉවත් කරන ලද්දේ දෙදහස් තුන වර්ෂයේදී ය. ඒ වන විටත් එකී පැරණි ප්‍රාකාරය වසර 150 ඉක්මවා ඇති බව සටහන්ව තිබුණි.

මෙම පුරාණ බෝධින් වහන්සේ ඉතා පෞරාණික වූවක් බව නම් පැහැදිලිය. ඉඩකඩ ඇති බෝධි මළුවෙහි දකුණ දිශාවේ කෙළවර අටවිසි බුදුරජාණන් වන්සේලා වැඩ සිටින කුටිපෙල ඉදිකොට ඇත්තේය. බෝධි මළුව පුරාම පැරණි වෘක්ෂයන් වන අටවිසි බෝධීන් වහන්සේලා රෝපණය කර වැඩී ඇති නිසා එමගින් මහත් සිසිලසක් ඇති කරයි. එසේම බෝධි මළුවෙහි රෝපණය වී තිබෙන කට්ටකුමංජල හා හොඬපොර වැනි ඖෂධීය වෘක්ෂයන් ද බොහෝ පැරණිය. බෝධි මළුවෙහි බිම කළුගල් අතුරා සලපතල මළුවක් සේ සකස් කොට ඇත. අදාළ ස්ථාන වෙත පහසුවෙන් ගමන් කිරීමට ශෛලමය මංපෙත් ඉදිකර තිබීම ද අලංකාරය.

1. ඕලබොඩුවේ ධම්මානන්ද මාහිමියන් විසින් පැවැත් වූ ඕලබොඩුව රජ මහා විහාර බෝධි වංශ කථාව ඇසුරෙනි.


පෞරාණික නා බෝධි වෘක්ෂය

## ඓතිහාසික නා බෝධීන් වහන්සේ

ඓතිහාසික ඇසතු බෝධීන් වහන්සේට නැගෙනහිර දිසාවෙන් යාබදව ම පිහිටා ඇති නා බෝධීන් වහන්සේ පූජා භූමියෙහි පෞරාණිකම ස්වාභාවික වස්තුවකි. විහාරස්ථානයේ වැඩසිටි සියලු භාරකාර යතිවරු මහත් සැලකිල්ලෙන් ආශිර්වාදය ලබාගත් ස්ථානය ලෙස ද නා බෝධින් වහන්සේ ප්‍රකටය. විහාරස්ථානයේ සිදුකෙරෙන සියලු යහපත් කටයුත්තකදී විහාර භාර ස්වාමීන් වහන්සේ විසින් මෙම ස්ථානයේ පහනක් දල්වා ආශිර්වාදය ලබා ගැනීම පෞරාණික චාරිත්‍රයකි. මේ නා බෝධීන් වහන්සේට සමාන තවත් පුරාණ නා වෘක්ෂයක් පූජා භූමියෙහි දකුණු දිසා කෙළවර වැඩසිට ඇත. ඒ පිළිබඳව අපේගම නම් කෘතියෙහි ද බන්දුල ආර්. ගුලවත්තයන් සඳහන් කර ඇත.

දනට වැඩසිටින ඓතිහාසික බෝ සමිඳුන්ටත් වඩා ඉපැරණි මෙම නා බෝධි වෘක්ෂයට ප්‍රාර්ථනා බෝධිය ලෙස ද ව්‍යවහාර කරන්නේ බොහෝ යහපත් ප්‍රාර්ථනා ඉෂ්ඨ කර ගැනීමට අධිෂ්ඨාන ඇතිකර ගන්නා ස්ථානයක් බැවිණි. පැරණි ජනතාව හා ජනප්‍රවාදයෙහි එන තොරතුරු අනුව මෙම සුවිශේෂී ස්ථානය වනාහි උපුල්වන් ශ්‍රී විෂ්ණු මහා දෙවියන්ගේ වැඩමවීම සිදුවන ස්ථානය බවයි. උන්වහන්සේ මෙම නා වෘක්ෂයට සජීවීම වැඩමවන ස්ථානය බවට සාක්ෂි නූතනයේ අප ද අත්විඳ ඇත.

ත්‍රිශූලයක ආකාරයෙන් වැඩී තිබෙන මෙම ඓතිහාසික නා බෝධියෙහි විෂ්ණු දෙවියන් වැඩ වාසය කරන නිසා පැතුම් සඵල කර ගැනීම විශේෂයෙන්



පෞරාණික විහාර මන්දිරයෙහි තුලාභාර දානය නිරූපිත විහාර සිතුවම

රෝගීන් සුවපත් වීම පඬුරු වෙන් කර භාරවන ස්ථානයක් බවට ජනතාව විසින්ම පත්කරගෙන ඇත. එන යන පිරිස් මෙම ස්ථානයේදී පූජා සත්කාර කරමින් පිං අනුමෝදන් කරන්නේ විෂ්ණු හෝ උපුල්වන් යන නමින් නොව මහ දෙවියන් ලෙසය. විෂ්ණු හෙවත් උපුල්වන් දෙවියන් මහ දෙවියන් ලෙස සලකා වැඳුම් පිදුම් කිරීම සම්බන්ධ පුවතක් අපට හමු වූ මුල් අවස්ථාව මෙය වන්නේය. විශේෂයෙන් නා බෝධීන් වහන්සේ අභියස දී බොහෝ රෝගීන් ආශිර්වාද ලබාගෙන සුවපත් වන සිද්ධිය ප්‍රකට වී ඇත්තේ අතීතයේ සිටය. එහෙත් මේ දිනවල ලංකාවේ විවිධ ප්‍රදේශවල විශ්ව ශක්තීන් රෝගීන් සුවපත් කරන වැඩසටහනක් දීගොඩ කුමාර මහතා විසින් සිදුකරගෙන යනු ලබයි. මෙම වැඩසටහන වර්තමානයේ දස දහස් ගණන් රෝගීන් එක්රැස් වී සුවපත් භාවය ප්‍රාර්ථනා කරන්නකි. එකී වැඩසටහනේ මුල්ම ආරම්භය මෙම ඓතිහාසික නා බෝධීන් වහන්සේ අභියස මීට වසර කිහිපයකට උඩදී ආරම්භ කිරීම ද සුවිශේෂි කරුණකි. එහිදී දීගොඩ කුමාර මහතා කලක් ප්‍රගුණ කරන ලද අධ්‍යාත්මික ශක්තියට මහ දෙවිඳුන්ගේ ආශිර්වාදය පමුණුවා ගත්තේ මෙම නා බෝ සමිඳුන් අභියසය.

## පෞරාණික උපුල්වන් ශ්‍රී විෂ්ණු මහා දේවාලය

පෞරාණික විහාර මන්දිරය සහිත උපුල්වන් ශ්‍රී විෂ්ණු මහා දේවාලය පුරාවිද්‍යා ස්මාරකයකි. විහාර මන්දිරයෙහි විහාරානුබද්ධව නැගෙනහිර දෙසින් උතුරු දිසාභිමුඛව පිහිටා ඇත. දේව ප්‍රතිමාව උසස් නිර්මාණ මට්ටමක පවතින්නකි.

මානුෂීය ප්‍රමාණයට ම ඉදිකර ඇත. දඹුලු ලෙන් විහාරගත විෂ්ණු ප්‍රතිමාවට ද සමානතාවයක් දක්වන්නකි. වාහනාරූඪ නොවන අයුරින් නිර්මිතය. මෙම දේවාලයෙහි නැගෙනහිර හා බටහිර දිසා බිත්ති මත කතරගම, සුමන සමන්, විභීෂණ හා ගම්භාර යන දෙවිවරුන්ගේ ප්‍රතිමා රූප වාහන සහිතව ම ඇඳ ඇත. විෂ්ණු ප්‍රතිමාව නිර්මාණය කර ඇත්තේ අඩි 1 1/2 තරම් උස් ආසනයක් මතය.

දේවාලයේ සිවිලිම වෙනත් දේවාලවල සිවිලිමට වඩා විශේෂත්වයක් උසුලන්නකි. එනම් මෙහි ලග්න දොළස ම රූපීව දක්වා තිබීමය. ප්‍රතිමාවේ පූර්ණ බවක් දක්නට ලැබෙන අතර පිටුපස බිත්තියට බද්ධ වී ඇත. එවැන්නක් දඹුලු පිළිමයේ දක්නට නොමැත. දේවාල ගෘහයේ චිත්‍ර නිරවුල් වන අතර ඉතා සරල ය. සායම් භාවිතය ද නිරවුල් බවකින් පවතී. ප්‍රතිමාවට තද නිල් පාට භාවිතා කොට ඇති අතර පසුකාලීනව ප්‍රතිමාව පමණක් සායම් කළ නිසා මෙසේ තද වර්ණයකින් දක්නට ලැබේද යන්න අපට පැහැදිලි නැත.

පෙර සිටම දේවාලයෙහි ඇතුල් මාළිගයට පිවිසීමට අවසර නැත. ප්‍රතිමාව ආවරණය කර ඇත. දර්ශනය නොවේ. ප්‍රතිමාව ආසන්නයට පිවිසෙන්නේ තේවාභාර තැන පමණි. පෞරාණික ප්‍රතිමාවට ඉදිරියෙන් තනි පිත්තලෙන්ම නිර්මාණය කර ඇති උපුල්වන් ශ්‍රී විෂ්ණු දේව ප්‍රතිමාව දර්ශනය වීමට සලස්වා ඇත. සළුපිළි ආභරණවලින් සමලංකෘතය. එකී ප්‍රතිමාව උපුල්වන් ශ්‍රී විෂ්ණු මහා දේවාල පෙරහරේ වැඩමවන විශේෂ ප්‍රතිමාවයි. මහ පෙරහරෙහි දේව ප්‍රතිමා වැඩමවීමේ අවස්ථාව හා දේවාභරණ වැඩමවන අවස්ථාවට ජනතාව මහත් හරසරින් පෙළගැසී සම්බන්ධ වන්නේ මහ දෙවිඳුන්ගේ හා මහ දේවාලයේ ආශිර්වාදය ලබාගැනීමේ පැතුමෙනි.

**ඓතිහාසික උපුල්වන් ශ්‍රී විෂ්ණු මහා දේවාලය**

අභිනවයෙන් ඉදිකර ඇති උපුල්වන් ශ්‍රී විෂ්ණු මහා දේවාලය පෞරාණික උපුල්වන් ශ්‍රී විෂ්ණු දේවාලයට දකුණු පසින් ඉදිකර ඇත. එකී ස්ථානය ඓතිහාසික ස්ථානයකි. එනම් මෙම පූජා භූමියේ නිශ්ශංකමල්ල රජතුමා විසින් කරවූ ශිලාමය නිර්මාණ සහිතව ඉදිකළ පෞරාණික ස්ථානයයි. අද ද එකී පෞරාණික දේවාලයෙහි ශිලාමය නෂ්ඨාවශේෂ අපට හමුවේ.

නව දේවාල නිර්මාණය පෞරාණික දේවාලයෙහි නිර්මාණයට හානියක් නොවන ආකාරයෙන් ඉදිකොට තිබීම විශේෂත්වයකි. මේ දේවාලය නව නිර්මාණයක් වුවත් පුරාණ ශිලා නිර්මාණයක ස්වරූපය දක්නට ලැබේ. මෙහි පිහිටුවා ඇති ශිලාමය උළුවහු දැකීමෙන් අපට සිහි වන්නේ යාපහුව රාජධානියයි. එසේම වහලය දරා සිටින සුවිසල් කණු නොබිඳුණු ශිලා ස්ථම්භය

මෙහි දක්නට ලැබෙන නිර්මාණ අනුරාධපුර පොළොන්නරු ගෘහ කලාවට අනුගත වන අකාරයට ඉදිකොට ඇත. දේවාලය වටා දිය අගලක් නිර්මාණය කර එහි දියේ පිපෙන මල් හා මත්ස්‍යයන් පිහිනා යන පොකුණක් බවට පත් කර



ප්‍රතිනිර්මාණය කරන ලද ඓතිහාසික උපුල්වන් ශ්‍රී විෂ්ණු මහා දේවාලය

ඇත. ප්‍රධාන ද්වාර දෙකකින් පිවිසෙන දේවාලයේ පිටත මාළිගාව හා වැඩසිටින මාළිගාව වශයෙන් කොටස් දෙකකි. බිමට කළුගල් අතුරා ඇත. දේවාලය නැගෙනහිර දිසාභිමුඛව නිර්මාණය කර ඇත්තේ ඓතිහාසික නා බෝධීන් වහන්සේ දර්ශනය වන ආකාරටය.

දේවාලයේ සිවුකොන නැගෙනහිර, දකුණ, බටහිර හා උතුර යන දිසා හතරෙහි විශේෂ පහන් ගෘහයන් හතරක් ස්ථිරව සාදා ඇත. එය ධෘතරාෂ්ඨ, විරූඪ, විරූපාක්ෂ හා වෛශ්‍රවණ යන සතරවරම් මහ දෙවිවරු වෙනුවෙනි. දේවාල මළුවෙහි නැගෙනහිර ධෘතරාෂ්ඨ පහන් ගෘහය ආසන්නයේ සතර වරම් දෙවිවරුන්ගේ පහන් ගෘහ අභ්‍යන්තරයේ පෙරහර මංගල්‍යයෙහි චාරිත්‍රානුකූල කප් සිටුවීම සඳහා වෙන්කර ඇති ස්ථානය දැකගත හැක.

ඇතුල් මාළිගාව හෙවත් වැඩසිටින මාළිගාවේ ප්‍රතිමාව තැන්පත් ආසනය අඩි 02 ක් උසැතිව නිර්මාණය කර ඇත. එය ශිලාමය ආසනයකි. ඒ මත මානවරූපී ප්‍රමාණයට ශිලාමය ප්‍රතිමාව නිර්මාණය කොට ඇත. දේව ප්‍රතිමාවේ දකුණු පාදය ඉදිරියට තබා ගමන් කිරීමට සූදානම් වන විලාසයට නිර්මාණය කර ඇත්තේ ප්‍රතිමාවට සජීවී බවක් එක් කිරීමටය. කලාකරුවාගේ එකී පරමාර්ථය උපරිමයෙන්ම මල්ඵල ගැන්වී ඇත. ප්‍රතිමාවේ සංඛය, ඡත්‍රය, නෙළුම් මල හා යගදාව යන සංකේත හතරම දරාගෙන ඇත. ශිලාමය ප්‍රතිමාවේ හිසමත රන්රිදී, මුතු මැණික් සහිත අගනා ඔටුන්නක් පළඳා ඇත. සියලු සළුපිළි ආභරණ ද



ශෛලමය සමාධි ප්‍රතිමා ගෘහ පාදම (පුරාවිද්‍යා ස්මාරකයකි)

නොඅඩුව පළඳා ඇති ආකාරය දක්නට ලැබේ. මෙම ප්‍රතිමාව මහජනතාවට ප්‍රදර්ශනය වන්නේ වර්ෂයට එක්වරකි. එනම් එක් දිනයක එක් හෝරාවකදී පමණි. ඒ පෙරහර මංගල්‍යයට සමගාමීව චාරිත්‍රානුකූලව නානුමුර පවත්වා නව සළුපිලි ආභරණ පැළැන්දවීමෙන් පසුවය.

## සමාධි බුද්ධ ප්‍රතිමා වහන්සේ වැඩසිටින ශෛලමය ගෘහයෙහි පාදම

මෙම විහාර භූමිය නිරීක්ෂණය කිරීමෙන් අපට හමුවන තවත් ස්ථානයක් ලෙස සුවිසල් විහාර ගෘහයක ශෛලමය පාදම දැක්විය හැකිය. මෙම ශෛලමය ගොඩනැගිල්ල මහත් පරිශ්‍රමයක් යොදා ගොඩනැගුවත් ඒ මත ඉදිවෙන විහාරයේ කටයුතු අවසන් කිරීමට අපොහොසත් වී ඇත. පුරාණ ගෘහ නිර්මාණ කලාවට අනුව මෙම ශෛලමය පාදම උසස් කලා නිර්මාණයක් ලෙස පෙන්වා දිය හැක. සමචතුරස්‍රාකාර හැඩයෙන් යුතුව ගොඩනගා ඇති මෙම පාදමට අනුව බුදු රජාණන් වහන්සේ වැඩසිටින ප්‍රධාන ඉරියව් තුන යටතේ ඉදිකරන්නට අපේක්ෂා කර ඇති විහාරයකි. එනම් හිඳි පිළිමය, හිටි පිළිමය හා සැතපෙන පිළිමය වශයෙන් ප්‍රතිමාකරණයකට සැලසුම් කර ඇත. විහාර ගෘහයෙහි බිම ගල් අතුරා සලපතල මළුවක් සේ නිර්මාණය කරන්නට සැලසුම් කර තිබුණත් දැනට සුදුවැලි අතුරා ඇත. ප්‍රධාන කුළුණු පද්ධතියක් මත පෞරාණික නුවර සම්ප්‍රදායේ එන පත්තිරිප්පු වහලයක් සහිතව ගොඩනැගීමට සැලසුම්කර තිබුණත් එකී විහාර කර්මාන්තය අතරමග නතර වී ඇත්තේ කිනම් කරුණක් නිසාදැයි කීමට අපහසුය.



පෞරාණික බණ මඩුව (පුරාවිද්‍යා ස්මාරකයකි)

විහාර භූමියේ ඊසාන දිසාවෙන් දකුණු දිසාභිමුඛව ඉදිකර ඇති මෙම විහාර කර්මාන්තයේ ශෛලමය පාදම පොළොන්නරු යුගයේ නිර්මාණ කලාවට නෑකම් කියන අයුරින් ගොඩනගා ඇත. වර්තමානයේ විහාර භාරකාරත්වය උසුලන හිමිවරු මෙහි සමාධි බුද්ධ ප්‍රතිමා වහන්සේ නමක් තැන්පත් කර ඇත. මෙම විහාර ගෘහයට පිවිසෙන කාහට වුවද ආයාසයකින් තොරව බුද්ධානුස්සතිය වැඩෙන ආකාරයට ඉදිකර ඇති නිර්මාණයකි. එබැවින් සමාධි බුද්ධ ප්‍රතිමා පරිශ්‍රය පැමිණෙන සැදැහැවතුන්ගේ සිත් නිවාගත හැකි සුපහන් විහාරාංගයක් ලෙස සඳහන් කළ හැක.

**පෞරාණික බණ මඩුව**

පැරණි විහාර සම්ප්‍රදාය වනාහි සතර දිසින් වඩින මහා සංඝරත්නය වෙනුවෙනි යන අදහස තව දුරටත් විකාශනය වෙමින් සතර දෙසින් පැමිණෙන සැදැහැවතුන්ට ද යහපත සලසන ස්ථානයක් ලෙස බෞද්ධ ආරාමය සලසා ඇති බව පෙනේ. විහාරස්ථානවල ඉදිකර ඇති පැරණි බණ මඩු සම්ප්‍රදායෙන් ද එය මනාව පැහැදිලි වේ. සිව් පේරුව සිහිගන්වමින් පේරු සතරේ දායක පිරිසට සහභාගී විය හැකි සේ පැරණි බණ මඩුව නිර්මාණය කර ඇත. මෙහිද පෝටිපෝ සතරකි. නැගෙනහිර, දකුණ, බටහිර හා උතුර යන සිව් දිසාවට ප්‍රධාන දොරටු සතරකි. වහලය මහල් තුනකින් නිර්මාණය කර තෙවැනි වහලයේ මුදුන මත කොතකින් සරසා ඇත.



ගණදෙවි දේවාලය

පැරණි බණ මඩුව බොහෝවිට උපයෝගී කරගෙන ඇත්තේ පිරිත් දේශනා සඳහාය. ඔලබොඩුව රජ මහා විහාරයේ ද සතිය, සති දෙක, සති තුන හා මාස දෙක තුන වශයෙන් අඛණ්ඩව පිරිත් දේශනා සිදුකර ඇති විහාරස්ථානයකි. එබැවින් මෙම බණ මඩුවේ මැද ස්ථිර වූ පිරිත් මණ්ඩපයක් ඉදිකර තිබීම විශේෂත්වයකි. මෙවැනි බණමඩු සම්ප්‍රදායේ ගොඩනැගිලි අප රටේ බහුලව දක්නට ලැබේ.

මෙම බණ මඩුව සම්පූර්ණයෙන්ම සුවිසල් කණු මත ඉදිකොට ඇත්තේය. ඉතා ශක්තිමත් හා විශාල කණු සහිත වූ මෙම නිර්මාණය තුළ කණු ඉදිකර ඇත්තේ ගඩොල් ආධාරයෙනි. මෙම ධර්ම ශාලාවට අවශ්‍ය සියලු ගඩොල් සකසා පෝරණුවක් මත පුළුස්සා නිම කරගෙන ඇත්තේ මෙම පූජා භූමයේදීමය. සිව් දිසාවට කැටයම් සහිත වාහල්කඩ සතරකි. මේ ආකාරයේ ගොඩනැගිලි විශේෂයක් අභයගිරිය ආශ්‍රිතව ද කළ කැණීම්වලින් සොයාගෙන ඇත. ඒවා හඳුන්වා ඇත්තේ පංචාවාස නමිනි. පංචාවාසවල ද පිවිසීමේ දොරටු සතරක් හා කොටස් පහකින් යුක්ත ගොඩනැගිලි විශේෂයක් බව පුරාවිද්‍යා විද්වතුන්ගේ මතයයි.[1]

මෙම බණ මඩුව ප්‍රතිනිර්මාණය කර නැති අතර ප්‍රතිසංස්කරණ කටයුතු වලට භාජනය වී ඇත. එහෙත් එකී ප්‍රතිසංස්කරණ කටයුතු පැරණි කලා නිර්මාණයට කිසිදු හානියක් නොවන අයුරින් සිදුකර තිබීම ඇගයිය යුතුය. එහි එන පිරිත් මණ්ඩපය පමණක් ප්‍රතිනිර්මාණය කොට ඇත. අද වන විට වසර සියයක් ඉක්මවා සතර පේරුව සහිත අවට ප්‍රදේශවාසීන්ට බුදුරදුන්ගේ නිර්මල ධර්මය සන්නිවේදනය කිරීමට සෙවන දුන්නා වූ මෙම බණ මඩුව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ පුරාවිද්‍යා ස්මාරකයක් වශයෙන් ගැසට් කර ඇති බව සඳහන් කළ යුතුය.

# 4 - 3
# ඔලබොඩුව රජ මහා විහාරයේ නූතන ප්‍රාසාදකරණය



ශ්‍රී සර්වඥ ධාතු මාලිගාවෙහි හේවිසි මණ්ඩපය, මංගල ඇත් පීඨිකාව

## සර්වඥ ධාතු මාලිගාව

තථාගත පරිනිර්වාණයෙන් පසුව බෙදා දෙන ලද ශ්‍රී ශරීරගත සර්වඥ ධාතූන් වහන්සේලා ලෝකයේ නොයෙක් දෙස පූජා සත්කාර ලබන්නේය. ඒ අතර ධාතූන් වහන්සේලා වැඩි ප්‍රමාණයක්ම වන්දනාවට පාත්‍ර වන්නේ ලංකාව තුළයි. එයිනුත් ප්‍රධාන ශ්‍රී ධාතූන් වන සතර දළදාවන්ගෙන් දෙකක්ම වැඩසිටින්නේ ලංකාවේය. ඒ මහනුවර ශ්‍රී දන්ත ධාතූන් වහන්සේ හා සෝමාවතී ස්ථූපගතව වැඩසිටින ශ්‍රී දන්ත ධාතූන් වහන්සේය. ඒ අනුව තථාගතයන් වහන්සේගේ පමණක් නොව රහතන් වහන්සේලාගේ ද ශ්‍රී ශරීරගත ධාතූන් වහන්සේලා ලක්දිව බොහෝ වෙහෙර විහාරස්ථාන හා පුරාණ ප්‍රභූ පවුල්වල නිවාස තුළ වන්දනා ලබති.

ඔලබොඩුව රජ මහා විහාරයෙහි තැන්පත් කර ඇති පෞරාණික ධාතූන් වහන්සේලා නිසා සුවිශේෂි ස්ථානයක් හිමි වී ඇත. බොහෝ රහතන් වහන්සේලාගේ හා සර්වඥ ධාතූන් වහන්සේලා වැඩි ප්‍රමාණයක් මෙම විහාරගතව ඈත අතීතයේ සිටම වැඩවාසය කරන්නේය. මෙකී සියලු ධාතූන් වහන්සේලා සුරක්ෂිතව වඩා

හිඳුවා අවශ්‍ය පූජා සත්කාර පැවැත්වීමේ දැඩි අවශ්‍යතාවයක් වර්තමාන භාරකාර ස්වාමීන් වහන්සේලාට ඇතිවීමේ ප්‍රතිඵලයක් වශයෙන් වර්තමාන ශ්‍රී සර්වඥ ධාතු මන්දිරය නිර්මාණය විය. ශ්‍රී බුද්ධ වර්ෂ 2558 වර්ෂයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කර ඇති මෙම සර්වඥ ධාතු මන්දිරය හා බැඳුණු තොරතුරු ගණනාවක්ම අපට හමුවේ.

ශ්‍රී සර්වඥ ධාතු මන්දිරයේ ඉදිකිරීම වනාහි එක් අතකින් තරමක් අනපේක්ෂිතව සිදු වූවකි. එයට හේතුව වන්නේ විහාරස්ථානයේ වැඩවාසය කළ ස්වාමීන් වහන්සේලාගේ ප්‍රමාණය හා ආගන්තුකව බැහැරින් වැඩම කළ ප්‍රමාණය ද ක්‍රමයෙන් වැඩි විය. මේ නිසා පුරාණ සංඝාවාස ගොඩනැගිල්ල ප්‍රාමාණවත් නොවූ නිසා එම ගොඩනැගිල්ලට නැගෙනහිර දිශාවෙන් කාමර කිහිපයක් ඉදිකිරීමට යෝජනා විය. එකී ඉදිකිරීම් කොටසට ස්ලැබ් එකක් දමා මතු දිනයක ඒ මත සර්වඥ ධාතු මන්දිරය ඉදිකරවන්නේය යන අදහසින් යුතුව සංඝාවාසයේ වැඩ කටයුතු අවසන් කරනු ලැබීය. කෙසේ වෙතත් කාලය ගත විය. එය සියලු දෙනාගේම මතකයෙන් තරමක් ඈත් විය. විහාරස්ථානයට බෙහෙවින් හිතවත් දානපති පවුලක් වන රාජගිරියේ පදිංචි සුමිත් රන්වත්ත මහතා සහ එම මැතිනිය දිනක් මෙම විහාරස්ථානයට පැමිණි අතර මෙම විශාල ස්ලැබ් එක ගැන විස්තර ඇසීය. එවිට අනාගත අපේක්ෂාව පැහැදිලි කරන ලදී. ඒ අවස්ථාවේ මේ පින්වත් යුවල සර්වඥ ධාතු මාලිගාව ඉදිකිරීමට ඇස්තමේන්තුවක් සකස් කර දෙන ලෙස පැවසීය. ඉන් අනතුරුව මෙම සැදැහැවතුන් විහාරස්ථානයට පැමිණි අවස්ථා කිහිපයකම මෙම කරුණ ගැන මතක් කළද එය ඉටුවන බවක් නොවීය. කෙසේ වෙතත් මේ යුවලගේ බලවත් ඉල්ලීම නිසා ඇස්තමේන්තුවක් සකස් කොට රන්වත්ත පවුල වෙත යැවීය. පෙර පින් ඇති මේ යුවල විශාල ධනස්කන්දයක් වියදම් වන මෙම සත්කාර්යය ඉටු කිරීමට භාරගත් අතර නව ශ්‍රී සර්වඥ ධාතු මාලිගාවේ ඉදිකිරීම් කටයුතු මෙලෙස ආරම්භ විය.

ශ්‍රී දළදා මාලිගාවට සම්බන්ධ ශිල්පීන්ගේ හා උඩරට නිර්මාණ ශිල්පීන්ගේ දායකත්වයෙන් ඉදිකෙරෙනු මේ සර්වඥ ධාතු මාලිගාව ධාතූන් වහන්සේලාට උපරිම ගෞරවයක් ලැබෙන ආකාරයට නිර්මාණය වී ඇත. ඇතුළු මාලිගය පිට මාලිගය, තේවාහාර කුටිය, හේවිසි මණ්ඩපය, ගාථා සජ්ඣායනා වන්දනා මණ්ඩපය, ධාතු කරඬුව තැන්පත් කිරීමේ විශේෂ පිඨිකාව, පෙරහර මංගල්‍යය චාරිත්‍රය පැවැත්වීමේ ශාලා පරිශ්‍රය යන අංගයන්ගෙන් සමන්විත වන සේ මෙම ප්‍රාසාදය ඉදිකර තිබීම ප්‍රශංසාජනකය.

කෙසේ වෙතත් රජ මහා විහාරානුබද්ධ නව ඉදිකිරීම් අතර අභිමානනීය නිර්මාණයක් ලෙස ශ්‍රී සර්වඥ ධාතු මන්දිරය පෙන්වා දිය හැක්කේය. විශේෂයෙන්ම මහා විහාර වංශික පෞරාණික විහාරයන්හි ධාතූන් වහන්සේලා බහුල වශයෙන් දක්නට ලැබෙන අතර ඒ අතරින් රයිගම් කෝරළයේ ඉදි වූ විශිෂ්ට ගණයේ ධාතු මන්දිරයක් ලෙස මෙම ඉදිකිරීම හැඳින්විය හැක්කේය.

ඇතුළු මාලිගය, පිට මාලිගය වශයෙන් කොටස් දෙකක් ලෙස ඉදිකොට ඇති ධාතු මන්දිරය දළදා මාලිගාවේ සම්ප්‍රදායට අනුගත වන පරිදි ඉදිකොට තිබීම විශේෂත්වයකි, ඇතුළු මාලිගයේ සියලු වර්ණිත ඉදිකිරීම් සඳහා පිත්තල භාවිතා කොට ඇත. මේ පිත්තල කර්මාන්ත බොහොමයක් මහනුවර කලා කරුවන්ගේ කලා සම්ප්‍රදාය ගුරුකොට ගන්නා ලද නිර්මාණ බව පැහැදිලිය. එකී නිර්මාණ අතර ඇතුළු මාලිගයේ පිත්තල උළුවස්ස සහිත දොරටුව ප්‍රධාන තැනක් ගනී. මෙම උළුවස්ස කැටයමින් අලංකාර කොට ඇති අතර ලියවැල, හංස පූට්ටු, දොරටුපාල රූප, ගජසිංහ රූප ආදී නව කැටයමින්ද කැටයම් කොට ඇත. එමෙන්ම ඉර හඳ, නාරිලතා මල්, පුන් කලස, ගජ රූපයන්ගෙන් දොරටු පියන් අලංකාර කොට ඇත. හෙළ පිත්තල කලාවේ උසස් ගණයේ නිර්මාණයක් ලෙස ඇතුළු මාලිගාවේ මෙකී නිර්මාණ හඳුන්වාදිය හැක.

එසේම ශ්‍රී සර්වඥ ධාතු මන්දිරයේ ඇතුළු මාලිගාවේ ප්‍රධාන කරඬුවට අමතරව තවත් කරඬු දෙකක් දෙපස තැන්පත් කොට ඇත්තේය. ඒ අතර දකුණු පැත්තෙන් තැන්පත් කොට ඇති කරඬුව පෙරහර කරඬුවයි. වම් පැත්තේ කරඬුව විශේෂ කරඬුවකි. එනම් එම කරඬුවේ තැන්පත් කොට ඇත්තේ බක්කුල මහ රහතන් වහන්සේගේ ශරීරගත ශ්‍රී ධාතුන්ය.

පෙර සිටම ලෙඩ දුක් කරදර දුරුවීම ආදියට කුසල් වැඩීම පිණිස බොහෝ ජනයා ඔලබොඩුව රජ මහා විහාරයට ද පැමිණෙන්නේ මේ බක්කුල මහ රහතන් වහන්සේගේ ශ්‍රී ධාතුන් මේ භූමියේ වැඩවාසය කරන නිසා විය හැකිය.

රන්වත්ත පවුලේ හා සැදැහැවතුන්ගේ අපේක්ෂාව මුදුන්පත් විය. කෝටි දෙකකට ආසන්න ධනස්ඛන්ධයක් වියදම් කරමින් ශ්‍රී සර්‍වඥ ධාතු මන්දිරය සය මසක් වැනි කෙටි කාලයකින් ඉදිකිරීම් කටයුතු නිමවිය. ශ්‍රී බු.ව.2558 නවම් මාසයේ දී විවෘත කිරීමේ පුණ්‍ය මහෝත්සවය මහා විහාර වංශික සියම් මහා නිකායේ අස්ගිරි පාර්ශ්වයේ මහානායක පරම පූජනීය උඩුගම බුද්ධරක්ඛිත ස්වාමින්ද්‍රයන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් සිදුකොට ඇත්තේය. එසේම මෙම පුණ්‍යොත්සවයට මහා විහාර වංශික සියම් මහා නිකායේ මල්වතු පාර්ශ්වයේ අනුනායක ධුරන්දර අතිපූජනීය නියංගොඩ විජිතසිරි නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ මහා විහාර වංශික සියම් මහා නිකායේ කොට්ටේ පාර්ශ්වයේ අතිගරු මහානායක ඉත්තෑපානේ ධම්මාලංකාර ස්වාමීන්ද්‍රයන් වහන්සේ ප්‍රධාන කොට ත්‍රෛයිනිකායික මහා සංඝරත්නය සියක් නමකට අධිකව වැඩමවීම ද විශේෂත්වයකි. එසේම මහනුවර ශ්‍රී දළදා මාලිගාවේ දියවඩන නිලමේ ධුරය හොබවන ප්‍රදීප් නිලංග දැල බණ්ඩාර ශ්‍රීමතාණන් ඇතුළු දායක කාරකාදීන්ගේ සම්බන්ධවීමෙන් සිදු කළ ආකාරය ශිලා පලකයේ සඳහන් වේ.[1]

1. ශිලා ලේඛනය - සර්වඥ ධාතු මාලිගාව

ශ්‍රී තථාගත ධාතූන් වහන්සේලා වර්ෂ පන්දහසක් කල් ලෝකයේ පූජා සත්කාර ලබන්නේය. ඉන් අනතුරුව තුන් ලෝකයේම වැඩසිටින සියලු සර්වඥ ධාතූන් එක්වී බුද්ධකායක් නිර්මාණය වන්නේය. දම්සක් පැවතුම් සූත්‍රය දේශනා කළ ස්ථානය ඇතුළු තවත් බොහෝ ස්ථානවල බුදු පෙළහර පෑම සුවිශේෂී අවස්ථාවකි. දඹදිව බුද්ධගයා බෝ මැඩදී නිර්මිත බුද්ධකායෙන් විශේෂ පෙළහර පා තථාගත ශ්‍රී ධාතු පරිනිර්වාණය සිදු වන්නේය.[1] මෙසේ ධාතු පරිනිර්වාණය දක්වාම කුසල් වඩවන මහානීය පිංකමක් ලෙස ඔලබොඩුව රජ මහා විහාරයේ ශ්‍රී සර්වඥ ධාතු මන්දිර කර්මාන්තය පෙන්වාදිය හැක්කේය.

**දෙව් විමනක් බඳු පිරිත් මණ්ඩපය**

පෞරාණික බණ මඩුවෙහි ඉදිකර ඇති පිරිත් මණ්ඩපය ඔලබොඩුව රජ මහා විහාරයෙහි නව නිර්මාණ අතර සුවිශේෂී ස්ථානයක් ගනී. මෙය දැවමය නිර්මාණයකි. මෙම බණ මඩුවෙහි යුගයෙන් යුගයට පිරිත් මණ්ඩප ස්ථිරවම ඉදිකර තිබුණි. ඔලබොඩුව රජ මහා විහාරස්ථානයේ නිතර පිරිත් සජ්ඣායනාවන්ට මුල් තැනක් ලබාදී තිබූ හෙයින් සෑම කල්හිම සුවිශේෂී පිරිත් මණ්ඩපයක් ඉදිකර තිබුණි. පෙර දවස ඉදිකර තිබූ පිරිත් මණ්ඩපයට ස්වාමීන් වහන්සේලා වැඩමවා වැඩසිටි පසු ඉතා සියුම්ව හා සෙමින් භ්‍රමණය වන ආකාරයට සකස් කර තිබූ බව ද අප සමග පැරණි සැදැහැවතුන් පවසා ඇත.

බණ මඩුවේ මැද පුරාණයේ පැවති මණ්ඩපයේ ස්ථිර පාදම මේ සඳහා යොදාගෙන ඇත. එකී පාදම ධර්ම ශාලාවේ බිම් මට්ටමේ සිට රියන් 1 1/2 ක් පමණ උසය. එසේම අෂ්ඨාකාරයට නිර්මිතය. පිරිත් මණ්ඩපයෙහි සැලසුම් නිර්මාණය ශ්‍රී දළදා මාලිගාවේ පත්තිරිප්පුව සිහියට නැගෙන ආකාරයට නිර්මාණය කර ඇත. ප්‍රධාන දොරටුව නැගෙනහිර දිශාභිමුඛව තබා ඇත. පියගැට පහකින් යුත් පඩිපෙළකින් පිවිසිය යුතුය. මෙම නිර්මාණය සඳහා සුදුසු දැව සෙවීමේ කාර්යයේදී මේ සඳහා වෙන්ව තිබූ වසර 200 කටත් වඩා ඉපැරණි වට අඩි 12 කින් යුත් විශාල කොස් ගසක් ලැබීම වාසනාවකි. එකී කොස් ගසෙන් ලැබුණු ලී ප්‍රමාණය මණ්ඩපයේ නිර්මාණ කටයුතු සඳහා ප්‍රමාණවත් වී ඇත.

පිරිත් මණ්ඩපයෙහි ස්වාමීන් වහන්සේලාගේ වැඩසිටින ආසන සංඛ්‍යාව ඉරට්ටේ සංඛ්‍යාවක් විය යුතු බැවින් යුගාසනය ඇතුළු මුළු ආසන සංඛ්‍යාව විස්සකි. සියලු ආසන නැදුන් ලීයෙන් නිර්මිතය. යුගාසනයට විශේෂ ප්‍රමුඛතාවයක් ලැබෙන ආකාරයට කැටයම් කර ඇත. පිරුවානා පොත් වහන්සේ ඇතුළු පූජා භාණ්ඩ තැන්පත් කිරීමට ග්‍රැනයිට් අතුරා විශේෂ මේසයකි. පිරිත් පැන් කල තුනක් සඳහා ද ග්‍රැනයිට් ඇතිරූ විශේෂ කුඩා මේස තුනකි. සර්වඥ ධාතු කරඬුව වැඩමවා තැන්පත් කිරීමට මණ්ඩපයේ ප්‍රධාන දොරටුවට වම්පස විශේෂ බුද්ධාසනයකි. ප්‍රධාන දොරටුවට අමතරව යුගල ජනේල හතකින්ද ලියවැල් කැටයමින් ද පිරිත් මණ්ඩපය අලංකාර කොට ඇත.

1. පරිනිබ්බාන සූත්‍රය

මණ්ඩපයෙහි ලියවැල් කැටයම සඳහා හංසයා එක් කර තිබීමද විශේෂත්වයකි. හංසයා වනාහි නරක දෙයින් හොඳ දේ වෙන්කර ගැනීමේ සංකේතයයි. එය ලියවැල් නිර්මාණය ආශ්‍රිතව යොදාගෙන ඇත. පුරාණ කැටයම් කලාවේ හංස පූට්ටුව හා ලියවැල වෙන වෙනම යොදාගෙන තිබුණ ද මෙම මණ්ඩපයෙහි මෙකී කලා සංකේත දෙකම එකම කැටයමක යොදා තිබීම මෙම නිර්මාණයට පමණක් ආවේණික වූවකි. විශේෂයෙන් පිරිත් මණ්ඩපයෙහි කැටයම් හා ඒ ආශ්‍රිත නිර්මාණ දෙස බලන කල කලාකරුවා උපරිම නිදහසක් ලබාගෙන මෙම නිර්මාණකරණයේ යෙදී ඇති බව පෙනේ.

තවද ලක්දිව පිත්තල කලාවේ ඉතා වැදගත් අවස්ථාවක් මේ නිර්මාණය තුළින් ඉස්මතුකොට පෙන්වා දී ඇත. එනම් පිත්තලෙන් පිරිත් සූත්‍රයන්හි නිදානය නිර්මාණය කර තිබීමයි. එකී පිත්තල නිර්මාණය හෙවත් සිතුවම් සහිත කැටයම පිරිත් මණ්ඩපයෙහි බඳ තුළ සවිකර ඇත. දම්සක් පැවතුම් සූත්‍රය, අටානාටිය සූත්‍රය, ආලවක සූත්‍රය, රතන සූත්‍රය, අංගුලිමාල සූත්‍රය, බොජ්ඣංග සූත්‍ර හා කසීභාරද්වාජ සූත්‍රය මූර්තිමත් කොට ඇත. මෙය ද හෙළ පිත්තල කලාවේ අපට දැකගත හැකි සුවිශේෂී නිර්මාණයකි.

මණ්ඩපයෙහි වට බරාදයේ වඩිම්බුවට සිංහ රූපය පිත්තලෙන් නිර්මාණය කර සවිකර ඇත. පිරිත් දේශනාවේදී පිරිතේ හඬ සතර දිසාවට පමණක් නොව උඩු දිසාවට ද, යට දිසාවට ද පැතිරෙන ආකාරට ද හිස් අවකාශයක් පෙන්නුම් කරයි. මණ්ඩපයට වැඩමවා වැඩසිටින ස්වාමීන් වහන්සේලාගේ පරිභෝජනයට සුදුසු උණු පැන් හා සිසිල් පැන් අවශ්‍ය අවස්ථාවකදී තමන් වහන්සේලාටම ලබාගත හැකි ආකාරයට ඒ සඳහා වෙනමම නවීන යන්ත්‍ර සවිකර තිබීම අගය කළ යුතුය. නූතන තාක්ෂණයට අනුව යමින් මුළු මණ්ඩපයම වායුසමීකරණය කර තිබීම දේශක ස්වාමීන් වහන්සේලාට මහත් වූ පහසුවකි. පත්තිරිප්පුවේ හැඩයටම කොටස් අටකින් යුත් වහලය මුදුනේ අලංකාර පිත්තල කොතකින් අවසන් වන ආකාරයට නිර්මාණය කර ඇත.

මණ්ඩපයෙහි බඳ සවිකර ඇති සෑම පිත්තල මූර්ති නිර්මාණයකම එකී සූත්‍රය කුමක්දැයි සඳහන් කරනවා වෙනුවට පිරිත් සූත්‍රයෙහි එන පාලි පාඨයක කොටසක් පමණක් ප්‍රදර්ශනය කර ඇත. එම පාලි පාඨය කියවා සූත්‍රය කුමක්දැයි හඳුනා ගැනීමට සලස්වා තිබීම අතින් ධර්මය සෙවීමේ පර්යේෂණයකට ශ්‍රාවක මනස යොමු කිරීමට නිර්මාණකරුවා උත්සාහ දරා ඇත. මණ්ඩපයෙහි පිරිත් නූල් මණ්ඩපය වටා ගෙන ගොස් රාජගහ වෙත දැවටීමට සුදුසු ලීයෙන් කරන ලද වළලු සමඟ පිරිතට අවශ්‍ය ඖෂධීය පත්‍ර දැවටීම සඳහා කුඩා මුදු විශේෂයක් සිවිලිම පුරා රඳවා ඇත. මණ්ඩපයෙහි සවිකරන විශේෂ රාජගහ පහසුවෙන් සවිකිරීම සඳහා ලීයෙන් කරන ලද ආධාරකයක් ද අපට හමුවේ. මණ්ඩපයෙහි සිසිලස ආරක්ෂා කරගැනීමට හා අලංකාරය සඳහා ද පියගැට පෙළ සිට බිම මත කුඹුක් ලී අතුරා ඇත.



උපෝසථාගාරය

දෙව් විමනක් ලෙස නම් කොට ඇති මෙම සුවිශේෂී පිරිත් මණ්ඩපය ක්ෂේත්‍ර කිහිපයකම දිවෙන දක්ෂ කලාකරුවන් කිහිප දෙනෙකුගේම සම්මිශ්‍රණයක් යැයි කීම නිවැරදිය. විහාරාධිපති පූජ්‍යපාද උඩුවේ හේමාලෝක මාහිමිපාණන්ගේ 68 වන ජන්ම දිනය සමරමින් ආශීර්වාද පතා තුනුරුවන්ට පූජාකර විවෘතකර ඇත්තේ ශ්‍රී බුද්ධ වර්ෂ 2561 වූ දින දී ය. සියම් මහා නිකායේ කොට්ටේ ශ්‍රී කල්‍යාණි ධර්ම මහා සංඝ සභාවේ මහනායක පදවිය ලැබ කරවන ඉත්තෑපානේ ධම්මාලංකාර ස්වාමීන්ද්‍රයන් වහන්සේ හා කොළඹ නව කෝරළයේ ප්‍රධාන සංඝනායක අතිපූජ්‍ය දිවියාගහ යසස්සි නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ සුරතින් විවෘත කරන්නට යෙදුණු බව ශිලා පලකයේ සඳහන් කර ඇත.

**උපෝසථාගරය**

උපෝසථාගරය බුද්ධ, ධම්ම සංඝ යන ත්‍රිවිධ රත්නයට පමණක් කැපවූ තෙරුවන් වැඩසිටින පූජනීය වූ ද සම්භාවනීය වූ ද බෞද්ධාගමික පාරිශුද්ධ ගොඩනැගිල්ලකි. බුදුන් වහන්සේ වෙනුවට සීමාව තුළ බුද්ධ ප්‍රතිමාවක් තිබිය යුතු අංගයකි. උපෝසථාගරය තුළ කෙරෙන විනය කර්ම කටයුතු සඳහා භාවිතා වන ග්‍රන්ථ තැන්පත් කර තැබීමට ද එක් කොටසක් වෙන් විය. බොහෝ විට පොත් සේප්පුවක් තුළ මෙම ග්‍රන්ථ තැන්පත් කර තිබූ බවට සාධක හමුවේ. අනුරාධපුර යුගයේදී පබ්බත විහාරවල උපෝසථාගරය තුළ මේ සඳහා වෙනම ඉඩ කොටසක් සංවිධානය වී තිබුණි. මෑත කාලයේ උපෝසථාගරවල ද ඉහළ මාලය

පොත් ගුලක් වශයෙන් භාවිතා කර ඇත. භික්ෂූන් වහන්සේලාට වැඩසිටීමට ආසන ද පිළියෙල විය යුතුය. මන්ද විනය කර්ම කටයුතුවලදී දීර්ඝ කාලයක් උපෝසථාගාරයේ වැඩවාසය කරන බැවිනි.

භික්ෂූන් වහන්සේලා මාස පෝයට හා පුර පසළොස්වක පෝයට හෙවත් අව පක්ෂයේ හා පුර පක්ෂයේ පොහෝ දිනයන්හි විනය කර්ම කිරීමටත් විශේෂයෙන් ආපත්ති ආරෝචනයටත් ප්‍රාතිමෝක්ෂය දේශනා කිරීමටත් උපෝසථාගාරයට රැස් වෙති.[1] එහිදී ප්‍රධාන කාර්යය වූ උපෝසථ කර්මය ඇතුළු අනෙකුත් විවිධ සංඝ කර්මයන් ද සිදුකරනු ලබයි. උපෝසථකර්ම සිදු කළයුතු බවත් ප්‍රාතිමෝක්ෂය දේශනා කළ යුතු බවත් ''උපෝසථං කරෙය්‍යය පාතිමොක්ඛං උද්දිසෙය්‍යය'' යනුවෙන් සඳහන් වෙයි.[2]

අමනාපව භේදභින්න වූ සංඝයාගේ සමගිය හා සාමූහිකත්වය ඇති කරනු වස් සාමග්ගී උපෝසථ කර්මයන් ද සිදු කරන්නේ උපෝසථාගාරය තුළය. 'අනුජානාමි භික්ඛවේ සමග්ගං උපොසථ කම්මං'[3] මත භේදයට තුඩු දී ඇති කරුණු නිරාකරණය කර ගැනීම, සාකච්ඡා කර ගැනීම, ඡන්දය විමසීම සඳහා සුදුසුම ස්ථානය වන්නේ ද උපෝසථාගාරයයි. 'අනුජානාමි භික්ඛවේ ඡන්දම්පි දාතුං සන්නිසංඝස්සකරණීයංති'[4] යනුවෙන් සඳහන් වේ.

උපසම්පදා විනය කර්මය වැනි ශාසනික කටයුතු සිදුකරන්නේ ද උපෝසථාගාරයක් තුළ පමණි. මෙම ගොඩනැගිල්ලට මෙපමණ ගෞරවයක් හා සැලකිල්ලක් හිමිව තිබීමට තවත් කරුණක් වන්නේ උපෝසථාගාරය ඇමදීම, පහන් දැල්වීම හා ආසන පිළියෙල කිරීම ආදී කටයුතු භික්ෂූන් විසින්ම සිදුකළයුතු යැයි විනය නීතියක් පැවතීමයි. 'අනුජානාමි භික්ඛවේ උපොසථාගාරං සම්මජ්ජිතුං[5] මේ කරුණු හේතුකොටගෙන උපෝසථාගාරයට විහාරස්ථානයට ප්‍රමුඛස්ථානයක් හිමි වේ.

ඔලබොඩුව රජ මහා විහාරස්ථානයේ උපෝසථාගරයක් ඉදිකිරීමට සීමා සම්මතය සිදුකර ඇත්තේ බු.ව.2437 දීය. එනම් ක්‍රි.ව 1894 දීය. සීමා සම්මතය සිදුකර මේ වන විට වසර 125 ක් පමණ සම්පූර්ණ වී ඇත. මේ සඳහා එවකට මල්වතු මහා විහාරයේ අනුනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ප්‍රධාන කාරක මහා සංඝ සභාවේ භික්ෂූන් වහන්සේලා කිහිප නමක් වැඩමවා ඇත.[6] සීමා සම්මතයට පෙර මෙම ස්ථානයේ ආගන්තුක ස්වාමීන් වහන්සේලා වැඩසිටීමට ඉදිකර තිබූ සංඝාවාසය ඉදිකර තිබුණි. මෙම පූජා භූමිය හරහා වැඩමවන සියලුම ස්වාමීන් වහන්සේලා නේවාසිකව වැඩසිට ඇත්තේ මෙම සංඝාවාසයෙහිය. පුංචි මඩපාත

1. මහාවග්ග පාලිය 24/27/46 ගාථා
2. මහාවග්ග පාලිය 104 පිට
3. මහාවග්ග පාලිය 105 පිට
4. මහාවග්ග පාලිය 112 පිට
5. මහාවග්ග පාලිය 108 පිට
6. සීමා සම්මතය - බොලබොටුවේ ශ්‍රී සුමංගල මාහිමියන්ගේ පැරණි ලේඛන ආශ්‍රයෙනි

සෝනුත්තර ස්වාමීන් වහන්සේට වැඩසිටීමට සංඝාවාස කුටියක් මෙම පෝය සීමාව ඉදිරිපිට ගොඩනැගීමෙන් පසු බොලබොටුවේ ශ්‍රී සුමංගල මාහිමියන්ගේ නේවාසික කුටිය බවට පත් වන්නේ ද එම සංඝාවාසයයි.[1] ආගන්තුක සංඝාවාසය ඉවත් කොට සීමා සම්මතය සිදුකිරීමෙන් පසු දෙමහල් පෝය සීමාවක් (සොල්දරයක් සහිත) ඉදිකර ඇත.

පෝය සීමා සම්මතයෙන් පසු ඉදිකරන ලද නව දෙමහල් සීමා මාලකයේ වැඩ නිමකිරීමට දස වසරක් තරම් කාලයක් ගත වී ඇත. එනම් 1904 වර්ෂයේදී විවෘත කිරීමේ පුණ්‍යෝත්සවයට මහනුවර මල්වතු මහා විහාරයීය අතිපූජ්‍ය ශ්‍රීමත් මහානායක මාහිමිපාණන් වහන්සේගේ සුරතින් විවෘත කොට සම්පූර්ණ ප්‍රාතිමෝක්ෂ දේශනාව ද සිදු කර ඇත. එදා සිට වීදියගොඩ මහා විහාරයීය භික්ෂූන් වහන්සේලා අඩ මසකට වරක් විනය කර්ම කටයුතු සඳහා වැඩමවා ඇත. මේ සඳහා මුල් යුගයේම සුපේශල ශික්ෂාකාමී මහතෙරනමක් වන බොලබොටුවේ ශ්‍රී සුමංගල මාහිමියන්ගේ නායකත්වය හා මගපෙන්වීම වීදියගොඩ පාර්ශ්වීය මහා සංඝයාට විනය කර්ම කටයුතුවලදී මහා ආශීර්වාදයක් වී ඇත.

ක්‍රි.ව.1980 වර්ෂයේදී ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකර නැවත සංරක්ෂණය කළයුතුව තිබුණත් මෙම දෙමහල් උපෝසථාගාර ගොඩනැගිල්ල ඉවත් කර නව උපෝසථාගාරයක් ඉදිකර විවෘත කර ඇත්තේ විහාරධිපතිව වැඩවිසූ ඔලබොඩුවේ ධම්මානන්ද මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසිනි. ඒ සඳහා විහාරාධිකාරී උඩුවේ හේමාලෝක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ මඟපෙන්වීමෙන් දායක සභාව ක්‍රියාත්මක වී ඇත. දායක සභාවේ ගරු සභාපති පිටිපනගේ පබිලිස් මුදලාලි යම් දායකත්වයක් පෞද්ගලිකව ලබා දී ඇත. සතර පේරුවේ දායක පින්වතුන්ගේ ආධාරයෙන් කෙටිකාලයක් තුළ නව උපෝසථාගාරය ඉදිකර 1980 වර්ෂයේ කඨින පූජෝත්සවයේදී කඨින දානය සිදුකර විවෘත කිරීමේ පුණ්‍යෝත්සවය අපගේ මතකයේ තාමත් රැඳී පවති. එදිනද ප්‍රධාන අනුශාසනාව අති පූජ්‍ය තලගල සුමනරතන නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින් විචිත්‍රවත් ලෙස සිදුකරන ලදී. එවකට උන්වහන්සේ 32 වියේ පසු වූ තරුණ යතිවරයාණන් වහන්සේ නමකි.

වර්තමානයේ ඉදිකර ඇති උපෝසථාගාරය පෞරාණික ගෘහ නිර්මාණ ශිල්පයට අනුව යමින් ඉදිකිරීම් ආරම්භ කරන ලද්දේ 2018 වර්ෂයේ දෙසැම්බර් මාසයේදීය. මාස 1 1/2 වැනි කෙටි කාලයක් තුළ මෙම උසස් නිර්මාණය සිදු කිරීමට තරම් වාසනාවන්ත විය. පැරණි ශක්තිමත් පාදමෙහිම කළුගල් කුලුනු 14 ක් මත ඉදිකර ඇත. මහනුවර මඟුල් මඩුවෙහි වහලෙහි කලා සම්ප්‍රදාය පාදක කරගෙන ඇත. බිමට ටෙරාකොටා ගඩොල් මිශ්‍රණයෙන් යුත් ටයිලය අතුරා ඇත. ප්‍රධාන දොරටුව බස්නාහිර දෙසට පිහිටා තිබීමත් කුඩා දොරටු දෙකක් නැගෙනහිර හා උතුරු දෙසටත් පිහිටුවා ඇත. දොරටු තුනෙන්ම උපෝසථාගාරයට ඇතුළුවීම ශෛලමය පියගැට පෙළකින් නිර්මාණය කර

1. ඔලබොඩුව රජ මහා විහාර වතගොත - බොලබොටුවේ ශ්‍රී සුමංගල මාහිමි



ස්කන්ධ කුමාර ටැම්පිට දේවාලය

ඇත. ප්‍රධාන දොරටුවෙහි ශෛලමය මුරගල් දෙක හා ශෛලමය විශේෂ සඳකඩ පහනකින් අලංකාර කර පෞරාණික ගොඩනැගිලි කලාවේ ශ්‍රී විභූතිය ආරක්ෂා කරගෙන ඇත. අනුරාධපුර හා පොළොන්නරු යුග දෙකේම පැරණි කලා ශෛලයෙහි සම්මිශ්‍රණයක් වශයෙන් ශෛලමය සමාධි බුද්ධ ප්‍රතිමාව උපෝසථාගාරයේ නැගෙනහිර කෙළවර තැන්පත් කර තිබීමෙන් විහාරයට පිවිසෙන කාගේත් සිත්වල බුද්ධාලම්බන ප්‍රීතිය ඇතිකරලීම විශේෂත්වයකි.

මෙම උපෝසථාගාරය ඉදිකිරීමේ පූර්ණ දායකත්වය ඉතාලිය මිලානෝහි පදිංචි ශ්‍රීමත් ඇන්තනී පෙරේරා මහතා විසින් භාරගන්නා ලද්දේ කලකට පෙර අභාවයට ගිය තම ආදරණීය ස්වාමි දියණිය වූ චාන්දනී පෙරේරා මහත්මියට පින්දීමේ අරමුණ ඇතිවය. 2019 වර්ෂයේ පැවැත්වෙන සති පිරිත් දේශනය හා පෙරහර මංගල්‍යය සිදුවෙන අතරතුර මෙහි විවෘත කිරීම සිදු වී ඇත. එනම් ජනවාරි මස 31 වන දින අපරභාගයේදීය. ශ්‍යාමෝපාලි වංශික මහානිකායේ අස්ගිරි පාර්ශ්වයේ අතිගරු මහානායක වරකාගොඩ ඤාණරතනාභිධාන නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ හා ශ්‍යාමෝපාලි වංශික මහානිකායේ මල්වතු පාර්ශ්වයේ අතිගරු අනුනායක නියංගොඩ විජිතසිරි නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ඇතුළු සියක් නමකට ආසන්න මහා සංඝරත්නය ඒ සඳහා වැඩමවා ඇත. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා බස්නාහිර පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය ඉසුරු දේවප්‍රිය, හිටපු රාජ්‍ය ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ යන සම්භාවනීය ගිහි ප්‍රභූන්ගේ සහභාගිත්වයෙන් විවෘත කරන ලදී.

## ටැම්පිට දේවාලය

විහාර දේවාල ඉදිකිරීම වනාහි ලක්දිව ඉතිහාසයේ ප්‍රධාන කාර්ය සංසිද්ධිය වන්නේය. මුල්කාලයේ විහාර හා දේවාලයන් වෙන වෙනම ඉදි වූ අතර ආරාමික ගොඩනැගිලි ආශ්‍රිතව දේවාලයක් දක්නට ලැබෙන්නේ පොළොන්නරු යුගයෙන් පසුකාලීනවය. අනුරාධපුර යුගය තුළ ඉදිවූ විහාරාරාම සංකීර්ණයන් තුළ එවැනි දේවාල වැනි ආගමික ගොඩනැගිලි දක්නට ලැබෙන්නේ ඉතා විරල වශයෙනි.

තව ද මුල් කාලයේ ඉදි වූ ආගමික ගොඩනැගිලි අතර බහුලව දක්නට ලැබෙන්නේ භික්ෂු සංඝයාගේ වාසස්ථාන විනය කර්ම ගෘහයන් ස්ථූප හා ප්‍රාකාරයි. පිළිම ගෙවල් හෙවත් බුද්ධ මන්දිරයන් ගැන අසන්නට ලැබෙන්නේ ඉතා අඩුවෙනි. අනුරාධපුර සමාධි පිළිමයත් ඌරු ශිලා පටිමා ලෙස මහා වංශය විස්තර කරතත් එය ස්ථූපයක හෝ බෝධියක් අසල තැන්පත් කර තිබූ බව පෙනේ. අනුරාධපුර මැද භාගය වන විට අභයගිරිය ආශ්‍රිතව කළ දළදා මාලිගාවක් ගැන අසන්නට ලැබේ. එහෙත් එවැනි අයුරින් ඉදිකළ දේවාලයක් ගැන තොරතුරු ඇත්තේ නැත.

විහාර ගෘහයන්, දේවාල, දළදා මාලිගාව හා ධාතු මන්දිරයන් ඉදිවීම පිළිබඳව පැහැදිලි තොරතුරු අපට ඇත්තේ පොළොන්නරු යුගයේ සිටය. පොළොන්නරු ගල් විහාරයේ විද්‍යාධාර ගුහාව වනාහි බුද්ධ මන්දිරයකි. එම පුරාවිද්‍යා සංකීර්ණය තුළම ඉදිකොට තිබුණු ශිව දේවාල කිහිපයක නෂ්ටාවශේෂයන් ගැන අසන්නට ලැබේ. එහෙත් බුද්ධ ප්‍රතිමා හා දේව ප්‍රතිමා එකම ගෘහයේ ඉදිකිරීම පිළිබඳව එම යුගයට සමගාමී තොරතුරු විරලය. එහෙත් පසුකාලීන යුගවලදී එවැනි තත්ත්වයක් දක්නට ලැබේ.

මහනුවර කෝට්ටේ ආදී යුගවල මෙසේ දේවාල හා බුදු මැඳුර එකට ඉදිවන්නේය. එසේ ඉදි වූ විහාර දේවාල අතර ලෙන් ආශ්‍රිතව කළ විහාර දේවාල (දඹුල්ල) ගෘහයන් ඉදිකොට කළ විහාර දේවාල (ලංකාතිලක, ගඩලාදෙණිය) ආදිය දක්නට ලැබෙන අතර මේ යුග කාලයට සමගාමීව දක්නට ලැබෙන තවත් විහාර සම්ප්‍රදායයක් වූයේ ටැම්පිට විහාර ඉදිකිරීමයි. මහනුවර යුගයට හා මධ්‍යතන යුගයට සමකාලීනව ටැම්පිට විහාරයන් රාශියක් දක්නට ලැබෙන අතර ටැම්පිට විහාර සම්ප්‍රදාය කුමක් නිසා ඇති වූයේද යන්න තවමත් සාකච්ඡා වෙමින් පවතී. මෙසේ ටැම්පිට විහාර පැවතිය ද ටැම්පිට දේවාල ගැනනම් අපට අසන්නට ලැබෙන්නේ ඉතා විරල වශයෙනි. එවැනි ඉතිහාසයක් තුළ ස්ඛන්ධ කුමාර හෙවත් කතරගම දෙවියන් වෙනුවෙන් ශිලාමය ටැම්පිට දේවාලයක් ඉදිකිරීමට ඔලබොඩුව රජ මහා විහාර දායක කාරකාදීන් කටයුතු කරගෙනයාම ඉතා ප්‍රශංසනීය වන්නේය.



පිරිත් මණ්ඩපය



උපෝසථාගාරයෙහි ශෛලමය සමාධි ප්‍රතිමා වහන්සේ

## පස්වන පරිච්ඡේදය

# පෙරහර මංගල්‍යය හා චාරිත්‍ර

**5.1 රයිගම්පුර ඓතිහාසික විෂ්ණු දේවාලගත පෙරහර හා පූජා චාරිත්‍ර විධි**

**5.2 ඔලබොඩුව යති පරපුරේ රූපාවලෝකනය**

**5.3 ඔලබොඩුව රජ මහා විහාරයෙහි මතක සංක්ෂිප්තය**

# 5 - 1
# රයිගම්පුර ඓතිහාසික විෂ්ණු දේවාලගත පෙරහර හා පූජා චාරිත්‍ර විධි



පෙරහර කරඬුව තේවාභාර හිමියන්ට භාරදීම

ඔලබොඩුව රජ මහා විහාරානුබද්ධව පවතින උපුල්වන් ශ්‍රී විෂ්ණු මහා දේවාලයේ පවත්වනු ලබන පූජා චාරිත්‍රවල ප්‍රධාන කටයුත්ත වන්නේ වාර්ෂිකව පවත්වනු ලබන පෙරහර මංගල්‍යයයි. සෑම වසරකම පවත්වනු ලබන පෙරහර වනාහි බොහෝ දුරට උඩරට පෙරහර චාරිත්‍රවලට අනුගතව මහා විහාර බෞද්ධාගමික චාරිත්‍ර රකිමින් පැවැත්වීම විශේෂත්වයකි. එසේම මෙම පෙරහරේ ඉතිහාසය ද බොහෝ ඈතට දිවයන බව දක්නට ලැබෙන අතර වර්තමානයේ මෙම පෙරහර මංගල්‍යය ආරම්භ වන්නේ ක්‍රි.ව.1950 වර්ෂයේදී පමණය. එකල ඔලබොඩුව ග්‍රාමයේ ගම්පති පදවිය දරූ යූ.ඩී.ජ්මිස් රාළහාමි හා තලගල ගම්පති පදවිය දරූ කේ.ඩී.ඩබ්.ජයවර්ධන රාළහාමිත්, මිල්ලෑව ගම්පති පදවිය දරූ සයිමන් රාළහාමිත් යන ප්‍රභූ දානපතීන් විසින් පෙරහර නැවත සංවිධානය කොට පැවැත්වූ බවට තොරතුරු ඇත්තේය.

එසේම ඉන් අනතුරුව ක්‍රි.ව.1970 වර්ෂයේදී නැවතත් රයිගම්පුර විෂ්ණු දේවාලගත පෙරහර මංගල්‍යය පවත්වා ඇත. එහෙත් එම අවස්ථාවේද වාර්ෂික



ප්‍රධාන බස්නායක නිළමේතුමා පෙරමුණේ රාලට පෙරහර සන්නස ලබාදීම

පෙරහර පවත්වාගෙන යාම පිණිස වැඩපිළිවෙලක් සකස් නොවූ අතර නැවතත් පෙරහර පවත්වනු ලබන්නේ ක්‍රි.ව.2012 වර්ෂයේදීය. තත් විහාරාධිපති උඩුවේ හේමාලෝක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ අනුශාසනා පරිදි අතිරේක සංස්කෘතිකාංග රාශියක්ද එකතු කරමින් උසස් සංස්කෘතික මංගල්‍යයක් ලෙස දූනට වාර්ෂිකව පෙරහර පවත්වාගෙන යනු ලබන්නේය. තවද මතු කාලයේ බාධාවකින් තොරව පෙරහර පවත්වාගෙන යනු පිණිස විහාරාධිපති අප නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ඇතුළු දායක කාරකාදීන් කරුණු කිහිපයක්ම සකස් කොට ඇත්තේය. ඒ අතර ක්‍රි.ව.2018 මාර්තු මස 18 වන දින අංක 2064/29 දරන රජයේ ගැසට් පත්‍රය මගින් මෙම පෙරහර මංගල්‍යය අනුමත කොට ඇත්තේය. එය මතු පරපුරට මෙම උත්තම කටයුත්ත පවත්වාගෙන යාම පිණිස බලවත් අනුබලයක් වනු ඇත.

කෙසේ වෙතත් ලක්දිව බෞද්ධ සංස්කෘතියේ පෙරහර යන සංස්කෘතික අංගයට හිමිවන්නේ සුවිශේෂී තැනකි. ඒ අතර මුදුන් මල්කඩ ලෙස අප සලකන්නේ ශ්‍රී දළදා පෙරහරයි. දළදා වහන්සේට උපහාර දක්වීම පිණිස වාර්ෂිකව පවත්වන මෙම පෙරහර පූර්වාදර්ශය කර ගනිමින් පවත්වනු ලබන රයිගම්පුර විෂ්ණු දේවාලගත පෙරහර බොහෝදුරට දළදා පෙරහරේ චාරිත්‍ර හා සම්ප්‍රදායයන් ගරු කරමින් වාර්ෂිකව පවත්වාගෙන යාමට කටයුතු කිරීමට පෙරහර හා බැඳුණු සියලු දෙනාගේම සුවිශේෂී අපේක්ෂාවකි.



ඓතිහාසික උපුල්වන් ශ්‍රී විෂ්ණු මහා දේවාලයෙහි
ප්‍රධාන බස්නායක නිළමෙතුමා දේවාභරණ වැඩමවීම

රයිගම්පුර පෙරහර වර්තමානයේ අඛණ්ඩව පවත්වාගෙන ගියද පෙරහරේ ඉතිහාසය බොහෝ ඈතට දිවයන බව අපගේ අදහසයි. දළදා පෙරහැරේ මෙන් රාජකාරී සේවා සම්ප්‍රදායක් මේ වන විට නොපැවතුනත් පෞරාණිකව එවැනි තත්ත්වයක් පැවති බවට තොරතුරු ඇත. ඒ අනුව පැහැදිලි වන්නේ රයිගම්පුර විෂ්ණු දේවාලගත පෙරහරට බොහෝ ඈතට දිවයන ඉතිහාසයක් ඇති බවයි. විශේෂයෙන්ම පෙරහරට අවශ්‍ය යම් යම් සේවා පහසුකම් සපයා ගැනීම පිණිස ශිල්පීය සේවා ක්‍රමයක් දේවාලය ආශ්‍රිතව වූ ගොදුරුගම් කිහිපයකම දක්නට ලැබෙන්නේය.

## විහාරගත නැකැත් චාරිත්‍ර

මේ අනුව විෂ්ණු මහා දේවාලයේ වාර්ෂිකව සිදුකරන පූජා පෙරහර මංගල්‍යය පුරාණයේ සිටම ආරම්භ වී ඇත්තේ එක්තරා ජ්‍යොතිෂමය පදනමක සිටය. ඒ අනුව සියලු සුබ නැකැත් හා වේලාවන් අනුව පෙරහර මංගල්‍යය සියලු පූජා චාරිත්‍රවිධි සිදුවේ. මේ සඳහා සුබ නැකත් පිළියෙල කිරීම පිණිස දෛවඥයන් පිරිසක් සිටි අතර ඔලබොඩුව කලා ගම්මානය ආශ්‍රිතව ඔවුන් තවමත් වාසය කරති. එකී දෛවඥයින් වරින් වර තමන්ට පැවරෙන මේ වගකීම භාරගෙන ඉටු කිරීමේ සම්ප්‍රදාය ඉතා පුරාණ වූවකි. විශේෂයෙන්ම තම සේවා රාජකාරියක් ලෙස සලකන ඔවුන් සියලු පෙරහර නැකත් සකස්කොට විහාරයේ නායක ස්වාමීන් වහන්සේට පිළිගන්වා ජනයාට දැනුම්දීමට කටයුතු කරයි. මෙසේ මහ

දේවාලයේ නැකත් චාරිත්‍ර අනුව ගොඩනැගුණු ඔලබොඩුව ජ්‍යොතිෂ පරපුරේ සේවාව ඔලබොඩුවට පමණක් නොව බොහෝ ප්‍රදේශවලට ව්‍යාප්ත වී ඇත.

### රන් කර්මාන්තය

ඔලබොඩුව ගම රන් කර්මාන්තය අතින් ද ප්‍රසිද්ධියට පත්ව ඇත. රන් කරුවන්ගෙන් සැදුම්ලත් පරම්පරා කීපයක සමාජිකයෝ අදත් එකී කර්මාන්තයේ නියැලී කටයුතු කරති. රයිගම්පුර ඓතිහාසික මහ දේවාලයට අවශ්‍ය රන්, රිදී හා පිත්තල යන ලෝහයෙන් නිමවන ලද පූජා භාණ්ඩ සහිත ද්‍රව්‍යයන් නිම කිරීම හා නඩත්තු කිරීම හැරුණුවිට මහ දේවාලයට භාරවෙන බැතිමතුන්ගේ විවිධ පූජා භාණ්ඩ සාදවා දීම කර ඇත. වාර්ෂික පූජා පෙරහර මංගල්‍යයට පෙර අවශ්‍ය සියලු පූජා භාණ්ඩ හා පෙරහර රාජකාරී භාණ්ඩ නැවතත් පිරිසිදු කර ඔපදමා නැවුම් බවකින් මහ දෙවිඳුන්ට පූජා කිරීමේ කාර්යය සැලකිල්ලෙන් සිදුකර ඇත්තේ තම වගකීමක් සේ සලකාය.

ඔලබොඩුව රජ මහා විහාරාධිපතිව වැඩවිසූ ඔලබොඩුවේ ධම්මානන්ද මාහිමිපාණන්ගේ සාකච්ඡාවකින් උපුටාගත් කොටසක් ඉදිරිපත් කරන්නේ ඔලබොඩුව රන් කර්මාන්තය මහ දේවාලය හා රජ මහ වෙහෙර සමඟ පවත්වාගෙන ගිය සම්බන්ධතාවය කෙතරම් ද යන්න පැහැදිලි කිරීමටය. තලගල ධම්මරතන මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින් පැරණි ගල් කුලක් සහිත පූජා ස්මාරකයක වෙහෙර වහන්සේ නමක් කරවීම ආරම්භ කළහ. එම වෙහෙර වහන්සේගේ ගර්භයෙහි ධාතු නිධානෝත්සවයට පූජා භාණ්ඩ සමඟ ධාතුන් වහන්සේලා ඒකරාශි කිරීමේ වගකීම පැවරෙන්නේ එවකට තරුණ යතිවරයෙක්ව වැඩසිටි උන්වහන්සේගේ ජ්‍යෙෂ්ඨ පැවිදි ශිෂ්‍ය ඔලබොඩුවේ ධම්මානන්ද හිමියන්ටය. උන්වහන්සේ ලංකාවේ සොළොස්මස්ථානය ඇතුළු එවකට වැඩසිටිය චිරප්‍රසිද්ධ මහ තෙරවරුන් කල්‍යාණ මිත්‍රත්වයෙන් ඇසුරු කළ හෙයින් ධාතුන් වහන්සේලා සියක් නමකට අධිකව වැඩම කරවාගෙන ඇත.

අනුරාධපුර ජය ශ්‍රී මහා බෝධින් වහන්සේ වැඩ සිටින ආරාමයෙන් විශේෂ පැරණි පූජා භාණ්ඩයක් ලබා ගැනීමට සිතූ ධම්මානන්ද හිමියන් එවකට එම ආරාමයේ අධිපතිත්වය ලැබ කරවූ මහ තෙරුන් වහන්සේට මේ බව සැළකර ඇත. එවිට උන්වහන්සේ පූජා භාණ්ඩ තැන්පත් කර ඇති විශේෂ මණ්ඩපය විවෘත කර ධම්මානන්ද හිමියන්ට එයින් කැමති පූජා භාණ්ඩයක් ලබා ගැනීමට අවසර දී ඇත. එම අවසරයෙන් ප්‍රයෝජනගත් ධම්මානන්ද හිමියන් අපිරිසිදුව කළු පාටින් දුර්වර්ණ වී තිබුණු ප්‍රතිමාවක් සියතට ගෙන මේ සුදුසු යැයි පවසා ඇත. එවිට නායක ස්වමීන්ද්‍රයන් වහන්සේ ''ඇයි මේ දුර්වර්ණ ප්‍රතිමාවක් තෝරා ගත්තේ මෙයට වඩා අලංකාර හොඳ ප්‍රතිමාවක් තෝරා ගන්න යැයි පවසා ඇත.'' ධම්මානන්ද හිමියෝ සියතටගත් ප්‍රතිමාවම සුදුසු යැයි කැමත්ත පළ කළ හෙයින් එම ප්‍රතිමාවම ලබා ගැනීමට අවසර ගෙන ඇත. ප්‍රමාණයෙන් කුඩා වුවත් නොසිතූ බරක් ඇති මෙම පූජා භාණ්ඩයට පඬුරක් වශයෙන් රුපියල් 10.00 මුදලක් නායක



ඇත් පන්තිය භාර ගජ නායක නිළමේ

හිමියන්ට පිළිගන්වා ප්‍රතිමාව රැගෙන දුම්රියෙන් කොළඹට පැමිණ ඔලබොඩුව රජ මහ වෙහෙරට වැඩම කරවූහ.

පසු දින ඔලබොඩුවේ විසූ රන් කර්මාන්ත ශිල්පීන් අතරින් ප්‍රධානියා වූ විහාරස්ථානයේ ඉදිරිපිට පදිංචිව සිටි ''ගබෝනයිදේ'' නම් ශිල්පියා ගෙන්වා මෙම ප්‍රතිමාව පිරිසිදු කර වර්ණවත් කිරීමට භාර දෙන ලදී. ටික වේලාවකට පසුව ගබෝනයිදේ ප්‍රතිමාවත් රැගෙන ආපසු විහාරයට දුවගෙන විත් කලබලයෙන් ප්‍රකාශ කර ඇත්තේ මේ ප්‍රතිමාව සුළු පටු එකක් නොව තනි දඹ රනින් නිම වූවක් බවයි. එබැවින් මෙය නිවසේ තබා ගැනීමට නොහැකි බවත් විහාරස්ථානයේ සිට පිරිසිදු කර ඔප දැමීමට අවසර ගෙන ඇත. මෙම විශේෂ දඹරන් ප්‍රතිමාව රාත්තල් 7 1/2 බර වූවකි. මෙම ප්‍රතිමාව සහිත පූජා භාණ්ඩ ධාතූන් වහන්සේලා වෙහෙර වහන්සේගේ නිධන් කරන පුණ්‍යොත්සවයේ දී සිදු වූ විශේෂ අසිරිමත් සිදුවීම් පිළිබඳව ලිඛිත ඉතිහාසයේ සටහන් වූවකි.[1]

වර්තමානයේ ද ඓතිහාසික මහ විෂ්ණු දේවාලයේ දෙවිඳුන් උදෙසා නිර්මාණය කරන ලද රන් ඔටුන්න, පළඳවා ඇති සියලු ආභරණ, පෙරහරේ වැඩමවන ආභරණ වැඩමවන කරඬුවේ රන් ආලේපය ආදී බෝහෝ පූජා භාණ්ඩ සිදු කර ඇත්තේ ද මෙම ඔලබොඩුව ශිල්පීය පරම්පරාවේ දක්ෂ රන්කරුවන් විසිනි.

1. ඓතිහාසික ඔලබොඩුව රජ මහා විහාර වෙහෙර වහන්සේ ඉදිකිරීමේ වතගොත - පූජ්‍ය තලගල ධම්මරතන මාහිමි



සති පිරිතෙහි දේව දූත චාරිත්‍ර

## කුඹල් කර්මාන්තය

විෂ්ණු මහා දේවාලයේ විශේෂ පූජා, මුරුතැන් පූජා, දෛනික පූජා ඇතුළු තේවා පූජා කටයුතු සඳහා අවශ්‍ය මැටි බඳුන් නිර්මාණය කර එකී භාණ්ඩ නැවුම්ව පූජා කිරීමේ පරමාර්ථයෙන් කුඹල් කර්මාන්තය පිළිබඳ දක්ෂ නිර්මාණ කරුවන්ගෙන් සැදුම්ලත් පිරිසක් ඔලබොඩුව ගමේ පදිංචිව දේවාල කාර්යයට දායක වී ඇත. විවිධ පළාත්වලින් පැමිණෙන සැදැහැවතුන් විසින් විශේෂ මුරුතැන් සහිත අලුත් සහලින් පිසගන්නා ක්ෂිර ආහාර පූජා පිළියෙල කර ගන්නේ පූජා භූමියට පැමිණීමෙන් පසුවය. එම බැතිමතුන්ගේ අවශ්‍යතා ඉටු කිරීමට ද කුඹල් කර්මාන්තයේ ශිල්පීන් ඉදිරිපත් වී ඇත.

අදත් මේ කර්මාන්තය කරවන දක්ෂ ශිල්පීන් ඔලබොඩුව කනත්තගොඩ ගමේ කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යමින් මහ පරිමාණයෙන් වෙළෙඳ පොලක් ආරම්භ කර ඇත. මෙම කර්මාන්ත පුරයට ගිය පසු විවිධ නිර්මාණයන්ගෙන් සැදුම්ලත් මැටි බඳුන් නිමවන අයුරු දැක බලාගත හැක.

## රජක ග්‍රාමය

ඔලබොඩුව රජමහා විහාරය ඉදිරිපිට ඇති කුඩා ගම්මානය ඔලබොඩුව රදාගම නමින් රජමහා විහාර ඉතිහාසයට එකතු වී ඇත. මහ දේවාල පරිශ්‍රයේ සියලු වතාවත් කටයුතු භාරව වෙන් වී තිබුණේ ආසන්නයේම පදිංචි මෙම ගම්වැසියන් වෙතය. මහ දේවාලයේ තේවා පූජා හා පෙරහැර චාරිත්‍ර සඳහා



තේවාව

යොදා ගන්නා උඩු වියන්, පාවඩ, වටතිර සහිත සියලු පූජා පිරුවට සම්පාදනය කරමින් විෂ්ණු මහා දෙවිදුන් වෙනුවෙන් තම රාජකාරි කටයුතු සිදු කර ඇත. මහ දේවාලයේ නොනිමෙන පහනේ වගකීම දරමින් මහ දේවාලය ඇතුළු සතර වරම් මහ දෙවිදුන් වෙනුවෙන් ද දෛනිකව නොනිමෙන පහන් සිළු පවත්වාගෙන යාම මෙම ගම්වැසියන් විසින් ඉටුකරන ලද වගකීමකී. එය ඔවුන්ට ලැබුණු මහත් භාග්‍යයක් සේ සලකා ඇත.

පෞරාණික චාරිත්‍ර පවත්වන අවස්ථාවේ දී එම පූජා සඳහා අවශ්‍ය පන්දම් විලක්කු සකසා සැපයීමට අමතරව මහ පෙරහර වීථි සංචාරය කිරීමේ දී අවශ්‍ය ආලෝකය සැපයීමේ වගකීමද පැවරී තිබුණේ මෙම ගම්මානයටය. ඒ සඳහා නොනිමෙන විශාල පන්දම් හා පොල් පහන් භාවිතා කර ඇති බව පෙනේ. වර්තමානයේ එකී පහන් හා පන්දම් වෙනුවට විශේෂ කොප්පරා පහනක් දල්වා පෙරහැර මංගල්‍යයට ආලෝකය ලබා දීමට පියවර ගෙන ඇත. මහ දේවාලයේ සිට වැඩමවාගෙන යන දේවාභරණ මංගල හස්ති රාජයාගේ රන්සිවිගෙයි තැන්පත් කිරීමෙන් පසු මඟුල් ඇතු ගමන් කරන්නේ පාවඩ මතිනි. වීථි සංචාරය කර නැවතත් මහ දේවාලයට ගෙවදීම දක්වා එකී ගෞරවණීය වූ කාර්යය මෙම ගම්වැසියන්ට උරුමව තිබූ වටිනා දායාදයකි. එකී චාරිත්‍ර අදත් පෙරහැර මංගල්‍යයේ නොසිඳ පවත්වාගෙන යාම විශේෂත්වයකි.



උපුල්වන් ශ්‍රී මහා දේවාලයේ තේවාව සඳහා යොදාගත් පැරණි භාණ්ඩ

ඉහත සඳහන් රාජකාරි කටයුතු නොපිරිහෙලා සැලකිය යුතු මට්මකින් මෙම ගම්වැසියන් අදත් ඉටු කරනු ලබන්නේ මහත් හර සරින් හා පුරාණ චාරිත්‍ර විධි අනුගමනය කරමිනි. මාසිකව වාර්ෂිකව හා පෙරහැර පූජා අවස්ථා වලදී සිදු කරන වතාවත් සැපයීමේ දී මෙම ගම්මානයෙන් ලබා දෙන සේවය අගය කළ යුත්තකි. එබැවින් ඔලබොඩුව රදාගම ඔලබොඩුව මහ වෙහෙර සතු අගනා සේවා සම්පතකි.

## නර්තන ග්‍රාමය

ඔලබොඩුව රයිගම්පුර විෂ්ණු දේවාල මහ පෙරහැරට රාජකාරී සේවාවන් සැපයූ පිරිස් අතර ප්‍රධාන තැනක් ගනු ලබන්නේ නර්තන ශිල්පීන්ය. මෙසේ පුරාණයේ පෙරහැරේ රාජකාරී කටයුතු කළ නර්තන ශිල්පීන් හා බෙර, තම්මැට්ටම් හා වෙස් මුහුණු නිර්මාණය කළ ශිල්පීන්හට සේවා ගම්වර පවා ලබාදී තිබූ බව ජනප්‍රවාදගත තොරතුරු ඇත. විශේෂයෙන්ම ඔලබොඩුව පෙරහැරගත නැටුම් ශිල්පීන්ගේ නැටුම් සම්ප්‍රදාය තුළ ඔවුන්ටම ආවේණික වූ ලක්ෂණ මෙන්ම උඩරට හා සබරගමු නැටුම්වල ප්‍රවීණත්වයද ඔවුන් තුළ දක්නට ලැබේ. වර්තමානය දක්වාම අසන්නට දකින්න ලැබෙන ඔලබොඩුව කලා පරපුර පිළිබඳව තොරතුරු අල්ප වූවත් ඔවුන්ගේ කාර්යය සංසිද්ධිය සුළුපටු නොවේ. රජවරුන්ට පවා සේවා පහසුකම් සැපයූ නැටුම් ශිල්පීන් ඒ අතර වාසය කොට ඇත. වර්තමාන නැටුම් ශිල්පීන් නිතර සිහිකරන ඔවුන්ගේ ආදී කතෘවරුන් ලෙස පිළිගන්න සාදා

ගුරුන්නාන්සේ සහ සොයියා ගුරුන්නාන්සේ යන දෙදෙනා අතර සොයියා ගුරුන්නාන්සේ සෙංකඩගල ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ අණබෙර කරුවෙකු වශයෙන් සේවය කොට ඇත. මේ අනුව බලන කල ඔලබොඩුවේ සාම්ප්‍රදායික කලා පරපුර තම කලා කුශලතාවයන් රජවරුන්ගේ පවා ප්‍රසාදය දිනාගත් පිරිසක් බවයි. තව ද මොවුන් නාට්‍ය කලාවට පමණක් නොව නාට්‍ය කලාවට සම්බන්ධ උපකරණ නිර්මාණයේද නිපුණයෝය. මහ පෙරහරට අවශ්‍ය වූ බෙර, තම්මැට්ටම් ආදී වූ සියලු උපකරණ ඔවුන් විසින්ම නිර්මාණය කළ බවට තොරතුරු ඇත්තේය. එසේම වර්තමානය වනවිට ද ලෝක පූජිත කලාකරුවන් මෙම පරපුරෙන් බිහිවී ඇත. ඒ අතර සාදිරිස් ගුරුන්නාන්සේ, ලියොන් ගුරුන්නාන්සේ ඔලබොඩුව කලා පරපුරේ රන් සළකුණුය.

## ඔලබොඩුව රජ මහා විහාරානුගත චාරිත්‍රවිධි

**අළුත් අවුරුදු පූජා - අවුරුදු මංගල්‍යය**

- ❖ කිරි ඉතිරවීම - සර්වඥ ධාතු මාලිගාව
- ❖ කිරි ඉතිරවීම - ඓතිහාසික විෂ්ණු මහා දේවාලය
- ❖ කිරි ඉතිරවීම - ෂඩ් මහා දේව මන්දිරය
- ❖ මුරුතැන් පූජාව - ඓතිහාසික විෂ්ණු මහා දේවාලය
- ❖ සම්බුද්ධ පූජාව - සර්වඥ ධාතු මාලිගාව
- ❖ නානුමුර මංගල්‍යය - සර්වඥ ධාතු මාලිගාව
- ❖ නානුමුර මංගල්‍යය - ඓතිහාසික විෂ්ණු මහා දේවාලය
- ❖ හිසතෙල් ගෑමේ ජාතික මහෝත්සවය

**නවම් පූජා පෙරහර මංගල්‍යය**


- ❖ කප් සිටුවීමේ මංගල්‍යය
- ❖ නවම් පූජා පිංකමට පෙර පවත්වන පූජා පිංකම්
- ❖ සති පිරිත් දේශනය
- ❖ පරිවාර පෙරහර මංගල්‍යය
- ❖ දේව දූත පෙරහර
- ❖ සර්වඥ ධාතු කරඬුව වැඩමවීමේ අවසාන මහ පෙරහර
- ❖ ඓතිහාසික විෂ්ණු මහා දේවාලයේ ආභරණ වැඩමවන අවසාන මහ පෙරහර



සියම් විහාරය

- ❖ ඓතිහාසික විෂ්ණු මහා දේවාලයේ සළුපිලි ආභරණ පූජා මංගල්‍යය
- ❖ අගහස් පූජා හෙවත් අළුත් සහල් මංගල්‍යය
- ❖ නානුමුර මංගල්‍යය

මෙසේ විෂ්ණු දේවාලගතව පවතින සියලු චාරිත්‍රයන් හා සම්ප්‍රදායන්ගේ ප්‍රභවය බොහෝ ඈතට දිවයයි. මෙසේ සියලු චිරාගත සම්ප්‍රදායන් බොහෝ කාලයක් තිස්සේ ඒ ආකාරයෙන්ම රැකගෙන පැමිණි සම්ප්‍රදායන් බව පෙනේ. ඒවා මෙතෙක් කලක් ආරක්ෂා වී පැවතීම ඉතා වැදගත්ය. මෙසේ මහා විහාර සම්ප්‍රදායට ගරු කරමින් ථේරවාදී බෞද්ධ මුහුණුවර ද ආරක්ෂා කරගනිමින් රජ මහා විහාරස්ථ විෂ්ණු දේවාලය හා පූජනීය ස්ථානයන්ගේ පුද පූජා සහ වත්පිළිවෙත් පිළිබඳ තොරතුරු විස්තර කිරීම තරමක් සංකීර්ණය. එහෙත් එම කරුණු එක්රැස් කොට තැබීම ද කළ යුත්තකි.




අතිපූජ්‍ය වැලිවිට අසරණ සරණ සරණංකර සංඝරාජ මාහිමිපාණන් වහන්සේ

# 5.2
# ඔලබොඩුව යති පරපුරේ රූපාවලෝකනය



අතිපූජ්‍ය ගිනිගත්පිටියේ ශ්‍රී සංඝරක්ඛිත නාහිමිපාණන් වහන්සේ (ගිරිඋල්ල මැද්දෙපොළ රජමහා විහාරාධිපති සත්කෝරළ මහාදිසාවේ ප්‍රධාන සංඝ නායක පූජ්‍ය වැලිවිට අසරණ සරණ සරණංකර සංඝරාජ මාහිමිපාණන් වහන්සේගේ තෘතිය ශිෂ්‍ය)



අතිපූජ්‍ය කුඩා ගිනිගත්පිටියේ ශ්‍රී දීපංකර මාහිමිපාණන් වහන්සේ (ගිනිගත්පිටියේ සංඝරක්ඛිත නාහිමියන්ගේ ශිෂ්‍ය)



අතිපූජ්‍ය දෝපේ ශ්‍රී ගුණරතන අනුනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ



අතිපූජ්‍ය බෙම්තර ශ්‍රී සුදස්සන මාහිමිපාණන් වහන්සේ (දෝපේ ගුණරතන අනුනායක හිමියන්ගේ ඥාති ශිෂ්‍ය වීදියගොඩ ප්‍රථම විහාරාධිපති ඔලබොඩුව රජමහා විහාරය සඟසතු කොට පූජා කිරීම)

අතිපූජ්‍ය විසිදාගම ශ්‍රී සෝභිත මාහිමිපාණන් වහන්සේ (වීදියගොඩ සඟ පරපුර විකාශනයේ නියමුවාණෝ වීදියගොඩ රජමහා විහාරයේ දෙවන විහාරාධිපති ඔලබොඩුව රජමහා විහාරයේ ප්‍රථම විහාරාධිපති)





අතිපූජ්‍ය පුංචි මඩපාත සෝනුත්තර මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ (වීදීයගොඩ රජමහා විහාරයේ තෙවන විහාරාධිපති ඔලබොඩුව රජමහා විහාරයේ දෙවන විහාරාධිපති)



අතිපූජ්‍ය බොලබොටුවේ ශ්‍රී සුමංගල මාහිමිපාණන් වහන්සේ (ඔලබොඩුව රජමහා විහාරයේ තෙවන විහාරාධිපති හා නිත්‍ය නේවාසික ස්වාමීන්ද්‍රයන් වහන්සේ)

අතිපූජ්‍ය තලගල ශ්‍රී ධම්මරතන මාහිමිපාණන් වහන්සේ (ඔලබොඩුව රජමහා විහාරය, තලගල මංගලාරාමය, හොරගල ගුණතිලකාරාමය, පිටිපන සේනානායකාරාමය යන සිව්මහා විහාරාධිපති)





අතිපූජ්‍ය ඔලබොඩුවේ ශ්‍රී ධම්මානන්ද මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ (ඔලබොඩුව රජමහා විහාරය, තලගල මංගලාරාමය, හොරගල ගුණතිලකාරාමය, පිටිපන සේනානායකාරාමය යන සිව්මහාවිහාරාධිපති



# ස්වර්ණමය යුගයක නියමුවාණන්

අතිපූජ්‍ය උඩුවේ හේමාලෝක මාහිමිපාණන් වහන්සේ
ඔලබොඩුව ශ්‍රී ජයවර්ධනාරාම රජ මහා විහාරය
තලගල විපස්සනා භාවනා මධ්‍යස්ථානය යන විහාරද්වයාධිපති

# 5 - 3
# ඔලබොඩුව රජ මහා විහාරයෙහි මතක සංක්ෂිප්තය

- කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල රජතුමා (ක්‍රි.ව.1187 - 1196) ඔලබොඩුව රජ මහා විහාර භූමියෙහි පැවැත් වූ තුලාභාර දානය
- කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල රජතුමාගේ රාජ්‍ය අනුග්‍රහය යටතේ ප්‍රාන්ත අමාත්‍යවරයෙකුගේ මාර්ගයෙන් ඓතිහාසික විෂ්ණු මහා දේවාලය කරවා පූජා කිරීම (ක්‍රි. ව. 1187 - 1196)
- කුඩා ගිනිගත්පිටියේ දීපංකර මාහිමි, දොපේ ගුණාතරන අනුනාහිමි හා බෙම්තර සුදස්සන මාහිමි ඇතුළු උඩරටින් පහතරටට වැඩම වූ මහ තෙරවරු ප්‍රධාන සංඝරත්නයට විවේකයෙන් වැඩසිටීමට ආවාසයක් කරවා පූජා කිරීම
- වීදියගොඩ මහා විහාරාධිපති බෙම්තර සුදස්සන මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේට ඔලබොඩුව ඓතිහාසික උපුල්වන් ශ්‍රී විෂ්ණු මහා දේවාලය සහිත පූජා භූමිය සඝසතු කර පූජා කිරීම
- ඓතිහාසික උපුල්වන් ශ්‍රී විෂ්ණු මහා දේවාල පූජා භූමි ආරාමයෙහි ප්‍රථම වස් වැසීමට වීදියගොඩ මහා විහාරාධිපති විසිදාගම ශ්‍රී සෝභිත මාහිමිපාණන් වැඩමවීම හා ඔලබොඩුව රජ මහා විහාරස්ථානයේ ප්‍රථම විහාරාධිපති ධුරයට පත්වීම
- පුංචි මඩපාත සෝනුත්තර මාහිමිපාණන් වහන්සේ ඔලබොඩුව රජ මහා විහාරස්ථානයේ දෙවන විහාරාධිපති වශයෙන් පත්වීම හා උන්වහන්සේගේ අනුශාසනා පරිදි ස්ථිර සංඝාවාසයක් ඉදිකිරීම.
- බොලබොටුවේ ශ්‍රී සුමංගල මාහිමිපාණන් ඔලබොඩුව රජ මහා විහාරයට වැඩමවීම හා තෙවන විහාරාධිපති ධුරයට පත්ව නිත්‍ය නේවාසික නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ වශයෙන් කටයුතු කිරීම (ක්‍රි.ව.1863-1914)
- ඔලබොඩුව රජ මහා විහාරස්ථානයෙහි විසිදාගම සෝභිත මාහිමිපාණන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් ජය ශ්‍රී මහා බෝධි අංකුරයක් රෝපණය කිරීම
- දඹදිව ජේතවනාරාම ශුද්ධ භූමියෙහි වැඩසිටින ආනන්ද බෝධීන් වහන්සේගේ ශාඛා අංකුරයක් වැඩමවා එම බෝධි මණ්ඩපයෙහිම රෝපණය කර පෞරාණික බෝධි ප්‍රාකාරය ඉදිකිරීමට බොලබොටුවේ ශ්‍රී සුමංගල මාහිමිපාණෝ මූලික වීම.(ක්‍රි.ව.1863)

- තලගල ශ්‍රී ධම්මරතනාභිධාන මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ ඔලබොඩුව රජ මහා විහාරයෙහි සිවුවන විහාරාධිපති ධුරයට පත්වීම (ක්‍රි.ව. 1914 - 1947).
- තලගල ශ්‍රී ධම්මරතනාභිධාන මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින් ස්වකීය ගුරු දේවොත්තම බොලබොටුවේ ශ්‍රී සුමංගල නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ ශ්‍රී නාමය සිහිගන්වමින් ශ්‍රී සුමංගල දහම් පාසල ආරම්භ කිරීම (ක්‍රි.ව.1926).
- තලගල ධම්මරතන මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ විහාරාධිපති ධුර කාලයෙහි වෙහෙර වහන්සේ, පෞරාණික බණ මඩුව, පෞරාණික සංඝාවාසය පූජා භූමිය වටා ශෛලමය ප්‍රාකාරය ඉදිකිරීම.
- ඔලබොඩුවේ ශ්‍රී ධම්මානන්දාභිධාන මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ ඔලබොඩුව රජ මහා විහාරස්ථානයෙහි පස්වන විහාරාධිපති ධුරයට පත්වීම (ක්‍රි.ව.1947 - 1994).
- 1927 ජුනි මස 09 වන දින ප.ව. 1 පසුවී මිනිත්තු 45 ට වෙහෙර වහන්සේගේ ශෛලමය ආසනයෙහි ධාතු නිදානය 27 වැනිදා රාත්‍රී 10.15 ට යෙදුණු සුබ මොහොතින් නිදන් කටාරම වසා තැබීමේ විශේෂ අවස්ථාව.
- සර්වඥ ධාතූන් වහන්සේලා සමග ධාතූන් වහන්සේලා 84 නමක් සහිත රාත්තල් 7 1/2 බර දඹරන් ප්‍රතිමා වහන්සේ සමග මිල කළ නොහැකි පූජා භාණ්ඩ තැන්පත්කර ධාතු නිදානෝත්සවය සිදුකර ඇත.
- ශ්‍රී බුද්ධ වර්ෂ 2472 ක් වූ දුරුතු මස පුර විසෙනිය ලත් ගුරු දින පෙ.ව. 10.36ට යෙදුණු සුබ මොහොතින් අනුරාධපුර නුවරවැව බුලංකුලමේ වලව්වේ සූරියකුමාර වන්නිසිංහ ලොකුබණ්ඩාර මහදිසා මන්ත්‍රීශ්වරයාණන්ගේ ප්‍රධානත්වයෙන් දේවතා කොටුවේ ධාතු නිදානය සිද්ධ කළාහ.
- ශ්‍රී බුද්ධ වර්ෂ 2472 ක් වූ දුරුතු මස සියම් මහා නිකායේ මල්වතු පාර්ශ්වයේ අතිගරු මහානායක ධුරන්දර පහමුණේ ධර්ම කීර්ති ශ්‍රී සරණංකර සුමංගලාභිධාන ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ සුරතින් වෙහෙර වහන්සේට ප්‍රථම පුෂ්ප පූජාව පවත්වා විවෘත කරන්නට යෙදුණා ඇත.
- ශ්‍රී බුද්ධ වර්ෂ 2437 දී එනම් 1894 දී බොලබොටුවේ ශ්‍රී සුමංගල මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ අනුශාසනා පරිදි සීමා සම්මත කිරීමේ විනය කර්මය සිදුකර ඇත්තේ ස්‍යාමෝපාලි වංශික මහා නිකායේ මල්වතු පාර්ශ්වයේ අතිගරු අනුනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ප්‍රධාන මල්වතු මහා විහාරයෙන් වැඩම වූ මහා සංඝරත්නයේ මූලිකත්වයෙනි.

- තලගල ශ්‍රී ධම්මරතනාභිධාන මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ ගමේ විසූ ප්‍රභූවරුන්ගේත් ප්‍රදේශවාසීන්ගේත් සහයෝගය ලබාගෙන ඔලබොඩුව පාසල රජ මහා විහාර භූමිය තුළ ස්ථාපිත කිරීම (ක්‍රි.ව.1907)

- අභිනවයෙන් ඉදිකරන ලද ඔලබොඩුව මහා විද්‍යාලය උත්සවාකාරයෙන් විවෘත කිරීම සඳහා එවකට ශ්‍රී ලංකාවේ අගමැති වූ ඩී.එස්. සේනානායක මැතිතුමා ප්‍රධාන මැති ඇමතිවරුන් ඔලබොඩුව රජ මහා විහාරස්ථානයේ සිට දර්ශනීය පෙරහරකින් පිටත්වීම (1951 ජුනි මස 23)

- 1950 වර්ෂයේදී බෝධිසත්ව ගුණෝපේත මාහෝ සුමේධ මාහිමිපාණන් වහන්සේ විසින් ඓතිහාසික ඔලබොඩුව රජ මහා විහාරස්ථ චෛත්‍ය රාජයාණන් වහන්සේ මුළුමනින්ම නෙළුම් මලින් වසා කරන ලද අසිරිමත් මල් පූජාව.

- 1951 වර්ෂයේදී බෝධිසත්ව ගුණෝපේත මාහෝ සුමේධ මාහිමිපාණන් වහන්සේ විසින් ඓතිහාසික ඔලබොඩුව රජ මහා විහාරස්ථ චෛත්‍ය රාජයාණන් වහන්සේ විදුලි බල්බ් වලින් සරසා කරන ලද අසිරිමත් ආලෝක පූජාව.

- බොලබොටුවේ ශ්‍රී සුමංගල මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ අනුශාසනා පරිදි රජ මහා විහාරස්ථානයේ අභිවෘර්ධිය පිණිස රජ මහා විහාර දායක සභාව පිහිටුවා ඇත. (ක්‍රි.ව.1863)

- බොලබොටුවේ ශ්‍රී සුමංගල මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ අනුශාසනා පරිදි ශ්‍රී සුධර්මා කුළඟන සමිතිය ස්ථාපිත කර ඇත. (ක්‍රි.ව.1863)

- අභිනව ධර්මශාලා මන්දිරයට තායිලන්තයෙන් වැඩම කරවන ලද තායි සමාධි බුද්ධ ප්‍රතිමා වහන්සේ සමඟ සැරියුත් මුලගන් අග්‍ර ශ්‍රාවක ප්‍රතිමා වහන්සේලා දෙනම තැන්පත් කර සියම් විහාර මන්දිරය විවෘත කිරීම තායිලන්තයෙන් පැමිණි තායි දූත පිරිසකගේ හා සිංගප්පූරුවෙන් පැමිණි චීන ජාතික දූත පිරිසකගේ සහභාගීත්වයෙන් සිදු කිරීම. (2002 ජූලි මස 23 වන දින)

- ජය ශ්‍රී මහා බෝධි අංකුරයක් රජ මහා විහාර පූජා භූමියෙහි ප්‍රධාන පිවිසුම ඉදිරිපිට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු අග්‍රාමාත්‍ය රත්නසිරි වික්‍රමනායක මැතිතුමාගේ සුරතින් රෝපණය කිරීම (ශ්‍රී බු.ව.2553 - 2009.10.03)

- කඳාන ග්‍රෑන්ඩ් හෝම්ස් ආයතනයේ ප්‍රධාන දායකත්වයෙන් ඔලබොඩුව රජ මහා විහාරානුබද්ධ කහටපිටිය ධර්මාශ්‍රමයෙහි ඉදිකරන ලද දෙමහල්

සංඝාවාසය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු අග්‍රාමාත්‍ය රත්නසිරි වික්‍රමනායක මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් විවෘත කරන ලදී. (ශ්‍රී.බු.ව.2553 - 2009.10.03)

- ගම්භාර දේව මන්දිරය විවෘත කිරීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු අග්‍රාමාත්‍ය දි.මු. ජයරත්න මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සිදුවිය. (ශ්‍රී බු.ව.2555 - 2012.02.02)
- ෂඩ් මහා දේවාල මන්දිරය නවම් පෙරහර මංගල්‍යයට සමගාමීව විවෘත කිරීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති ත්‍රිසිංහලාධීශ්වර රෝහණ ජනරංජන මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ සුරතින් සිදුකරන්නට යෙදුණා ඇත.(ශ්‍රී බු.ව.2556 - 2013.02.18)
- අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ අනුග්‍රහය යටතේ රජ මහා විහාර දායක සැදැහැවතුන් විසින් පූජා කරන ලද ගොඩ මඩ ඉඩම් හරහා ඔලබොඩුව රජ මහා විහාරස්ථානයේ සිට ශ්‍රී ධම්මරතන මාවත දක්වා දිවෙන නවම් පෙරහර මාවත හා පූජා භූමිය වටා ඉදිකරන ලද නිශ්ශංකමල්ල රජ මාවත විවෘත කිරීම මහා මාර්ග අමාත්‍ය නිර්මල කොතලාවල මැතිතුමා හා වරාය අමාත්‍ය රෝහිත අබේගුණවර්ධන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සිදුකරන ලදී. (ක්‍රි.ව.2014)
- ප්‍රධාන පිවිසුම ඉදිරිපිට රෝපණය කරන ලද ජය ශ්‍රී මහා බොධි අංකුරය වටා ඉදිකරන ලද බෝධි ප්‍රාකරය සහිත රන්වැට විවෘත කිරීම ජ්‍යෙෂ්ඨ අමාත්‍ය රත්නසිරි වික්‍රමනායක මැතිතුමාගේ සුරතින් සිදු කරන ලදී. (2012.10.29)
- නිශාන්ත ගංගොඩවිල මහතාගේ පූර්ණ දායකත්වයෙන් ඉදිකරන ලද අභිනව මලසුන් ගෘහය විවෘත කිරීම ජ්‍යෙෂ්ඨ අමාත්‍ය රත්නසිරි වික්‍රමනායක මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සිදු කරන ලදී. (2012.10.29)
- ඔලබොඩුව රජ මහා විහාරස්ථ ශ්‍රී සුමංගල ඉංග්‍රීසි දහම් පාසල පූජ්‍ය ඔලබොඩුවේ ධම්මික හිමිපාණන් විසින් ආරම්භ කරන ලදී.(ක්‍රි.ව. 2003)
- ඓතිහාසික උපුල්වන් ශ්‍රී විෂ්ණු මහා දේවාල පෙරහර මංගල්‍යය අඛණ්ඩව පවත්වාගෙන යාමේ අරමුණින් නවම් පෙරහර භාරකාර මණ්ඩලය ස්ථාපිත කිරීම. (ක්‍රි.ව. 2012)
- ඓතිහාසික උපුල්වන් ශ්‍රී විෂ්ණු මහා දේවාලය නැවත ප්‍රතිනිර්මාණය කිරීමෙන් පසු විවෘත කිරීම ඔලබොඩුව රජ මහා විහාරාධිපති පූජ්‍ය උඩුවේ හේමාලෝක මාහිමිපාණන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් සිදුවිය. (ක්‍රි.ව. 2015.01.31)

- ඓතිහාසික උපුල්වන් ශ්‍රී විෂ්ණු මහා දේවාල පෙරහර මංගල්‍යය රජයේ ගැසට් කිරීම ක්‍රි.ව. 2018 මාර්තු මස 18 වන දින අංක 2064/29 දරන රජයේ ගැසට් නිවේදනය මගින් සිදුකර ඇත.
- රන්වත්ත පවුලේ අය විසින් කරවන ලද සර්වඥ ධාතු මාලිගාව විවෘත කිරීම සියම් මහා නිකායේ අස්ගිරි පාර්ශ්වයේ අතිගරු මහානායක උඩුගම ශ්‍රී බුද්ධරක්ඛිත මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ, මල්වතු පාර්ශ්වයේ අතිගරු අනුනායක නියංගොඩ විජිතසිරි නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ, කොට්ටේ ශ්‍රී කල්‍යාණි ධර්ම මහා සංඝ සභාවේ අතිගරු මහානායක ඉත්තෑපාන ධම්මාලංකාර ස්වාමීන්ද්‍රයන් වහන්සේ ප්‍රධාන සියක් නමක් මහ සඟ රුවන වැඩමවා මහනුවර ශ්‍රී දළදා මාලිගාවේ දියවඩන නිලමේ තැන්පත් ප්‍රදීප් නිලංග දැල බණ්ඩාර ශ්‍රීමතාණන්ගේ ප්‍රධානත්වයෙන් සිදුකරන්නට යෙදුණා ඇත.(ශ්‍රී බු.ව. 2558)
- පිරිත් මණ්ඩපය විවෘත කිරීම සියම් මහා නිකායේ කොට්ටේ ශ්‍රී කල්‍යාණි ධර්ම මහා සංඝ සභාවේ මහානායක ධුරන්දර අතිපූජ්‍ය ඉත්තෑපාන ධම්මාලංකාර ස්වාමීන්ද්‍රයන් වහන්සේ සහ කොළඹ නව කෝරළයේ ප්‍රධාන අධිකරණ සංඝ නායක අතිපූජ්‍ය දිවියාගහ යසස්සි නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් හා පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් මහාචාර්ය පී.බී. මණ්ඩාවල මහතා සහ ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය ජගත් මුණසිංහ මහතාගේ සහභාගිත්වයෙන් සිදුකර ඇත.(2018 පෙබරවාරි මස 17 වන දින)
- ඓතිහාසික ඕලබොඩුව නවම් මහා පෙරහරට රන් ආලේපිත විශේෂ කරඬුව මහනුවර පදිංචි ව්‍යාපාරික කෝසල රත්නායක මහතා විසින් විහාරාධිපති නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේට පූජා කිරීම (2012.02.02)
- ඓතිහාසික උපුල්වන් ශ්‍රී විෂ්ණු මහා දේවාල පෙරහරෙහි වැඩමවන විශේෂ විෂ්ණු දේව ප්‍රතිමාව ඇමරිකාවේ පදිංචි ශ්‍රීනාත් සිරිසේන මහතා විසින් මහ දේවාලයට පූජා කරන ලදී.(2012.02.01)
- පූජ්‍ය උඩුවේ හේමාලෝක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ මෙහෙයවීම මත පෞරාණික වෙහෙර වහන්සේගේ ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කරන ලදී. පෞරාණික කලා සම්ප්‍රදාය නොඉක්මවා පැවති ආකාරයටම නැවත ප්‍රතිසංස්කරණය කිරීම විශේෂයෙන් අගය කළ යුතුය.(1986)
- පූජ්‍ය උඩුවේ හේමාලෝක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ අනුශාසනා යටතේ අභිනව සුවිසල් ධර්ම මන්දිරය සාදවා සෑම දායක නිවසකින්ම එක් අයෙක්වත් සහභාගී කරවාගෙන සීල භාවනා වැඩසටහනකින් විවෘත කරන ලදී. (2000)

- පෞරාණික බණ මඩුව නැවත ප්‍රතිසංස්කරණය කිරීම විහාරාධිපති පූජ්‍ය උඩුවේ හේමාලෝක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ අධීක්ෂණය යටතේ සිදු වී ඇත.(2006)
- විහාරස්ථානයේ තැන්පත් කර තිබෙන බක්කුල මහ රහතන් වහන්සේගේ ධාතූන් වහන්සේ විශේෂ කරඬුවක බහා පෙරහරින් වැඩමවා සර්වඥ ධාතු මාලිගාවේ චම්පස මණ්ඩපයෙහි තැන්පත්කර පූජෝපහාර දැක්වීම ශ්‍රී ලංකාවේ පස්වන විධායක ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ සුරතින් සිදුකරන්නට යෙදුණා ඇත.(ක්‍රි.ව. 2018)
- විශේෂ රන් කරඬුවක් සාදවා ඔලබොඩුව රජ මහා විහාරස්ථානයේ සර්වඥ ධාතු මාලිගාවට පූජා කිරීම කඳුබොඩ කහටපිටියේ ශ්‍රී සුමතිපාල අනුස්මරණ ජාත්‍යන්තර භාවනා මධ්‍යස්ථානාධිපති අතිපූජ්‍ය ගම්පහ පේමසිරි නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින් සිදුකර ඇත.(ක්‍රි.ව. 2018)
- ධාතූන් වහන්සේලා තැන්පත් රන් කරඬුව පෙරහර කරඬුවෙහි තැන්පත් කර පූජෝපහාර දැක්වීම පාර්ලිමේන්තු මන්ත්‍රී නාමල් රාජපක්ෂ මැතිතුමා හා පාර්ලිමේන්තු මන්ත්‍රී රෝහිත අබේගුණවර්ධන මහතාගේ ප්‍රධානත්වයෙන් සිදුකරන ලදි. (ක්‍රි.ව. 2019)
- ඓතිහාසික ඇසතු බොධීන් වහන්සේගේ ප්‍රාකාරය වටා හා ඓතිහාසික නා බෝධීන් වහන්සේගේ ප්‍රාකාරය වටා රන්වැට ඉදිකිරීම, පූජා භූමියෙහි ශෛලමය මන්පෙත් තැනීම, වෙහෙර වහන්සේ, බෝධීන් වහන්සේ හා විහාර මන්දිරය වටා සලපතල මළුව සැකසීම, බෝධි මළුවෙහි වන්දනා ශාලාව ඉදිකර පූජා කිරීම (ක්‍රි.ව. 2016)
- අතිපූජ්‍ය උඩුවේ හේමාලෝක මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ ඔලබොඩුව රජ මහා විහාරස්ථානයේ සයවන විහාරාධිපති වශයෙන් පත්වීම (1994 සිට)
- ඓතිහාසික නවම් පෙරහර මංගල්‍යයෙහි සර්වඥ ධාතු කරඬුව වැඩමවන විශේෂ රන්සිවිගෙය අලව්වේ පදිංචි කාවින්ද රණසිංහ මහතා විසින් විහාරස්ථානයට පූජා කිරීම(ක්‍රි.ව. 2015 මාර්තු 06)
- ඔලබොඩුව රජ මහා විහාරස්ථානයේ ප්‍රධාන ශාඛා ආයතන බිහිවීම හොරගල ගුණතිලකාරාමය (ක්‍රි.ව. 1869) පිටිපන උත්තරාරාමය (ක්‍රි.ව. 1908) තලගල මංගලාරාමය (ක්‍රි.ව. 1925) කුරුගල ශෛලන්තරාරාමය (ක්‍රි.ව 1927) සුවාරපොල තපොදාරාමය (ක්‍රි.ව. 1960) කහටපිටිය ධර්මාශ්‍රමය (ක්‍රි.ව. 1962)

- අභිනව උපෝසථාගාරය විවෘත කිරීම ශ්‍යාමෝපාලි වංශික මහානිකායේ අස්ගිරි පාර්ශ්වයේ අතිගරු මහානායක වරකාගොඩ ඤාණරතනාභිධාන නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ හා ශ්‍යාමෝපාලි වංශික මහානිකායේ මල්වතු පාර්ශ්වයේ අතිගරු අනුනායක නියංගොඩ විජිතසිරි නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ වැඩමවීමෙන් සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා බස්නාහිර පළාත් ප්‍රධාන අමාත්‍ය ඉසුරු දේවප්‍රිය මැතිතුමා , හිටපු රාජ්‍ය ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ඇතුළු සම්භාවනීය අමුත්තන්ගේ ප්‍රධානත්වයෙන් සිදුකරන්නට යෙදුණා ඇත. (ක්‍රි.ව.2019 ජනවාරි මස 31 වන දින.



කප්සිටුවීමේ මංගල්‍යය
















ප්‍රතිමා ගෘහයෙහි සිතුවම් කලාව



ප්‍රතිමා ගෘහයෙහි මූර්ති කලාව

## ආශ්‍රිත මූලාශ්‍ර නාමාවලිය

මහාවංශය - රත්න පොත් ප්‍රකාශකයෝ
මහාවංශය - බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය
සංඝරාජ සාධු චරියාව - සමයවර්ධන පොත් ප්‍රකාශකයෝ
දාඨාවංශය - සමයවර්ධන පොත් ප්‍රකාශකයෝ
ලක්දිව මහායාන අදහස් - ඇම්.ඩී.ගුණසේන සහ සමාගම
සද්ධර්ම පුණ්ඩරික සූත්‍රය - ගොඩගේ පොත් ප්‍රකාශකයෝ
සිංහල විනය සාහිත්‍ය - රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව
මජ්ඣිම නිකාය අටුවාව- බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය
විශ්වාදිපති මහා රාවණා - පන්නිපිටිය බුදුමග සංවිධානය
හංස සංදේශය - අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන
සැළලිහිණි සංදේශය - අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන
පුරාණ දේව කන්නලව්ව - වාසනා ප්‍රකාශකයෝ
හෙළබිම පුදලබන දෙවිවරු - වාසනා ප්‍රකාශකයෝ
නිශ්ශංකමල්ල රජතුමා - දයාවංශ ජයකොඩි සහ සමාගම
ඔලබොඩුව අපේගම - සිකුරු පොත් ප්‍රකාශකයෝ
දඹුළු විහාර පර්වත ලිපිය - E.Z. VOI P 121 - 135
කන්තලේ ගල් ආසන ලිපිය E.Z. VOI P 283 - 286
සෙල්ලකතරගම ටැම් ලිපිය - පුරාවිද්‍යා පාලන වාර්තාව
බෝවත්තේගල ශිලා ලිපිය - පුරාවිද්‍යා පාලන වාර්තාව
උපෝසථගරය - සරසවි ප්‍රකාශකයෝ
බෞද්ධ ප්‍රතිමාසරය තුළට පිවිසි හින්දු දෙවියෝ - ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ
රයිගම්පුර යුග මිනි පහන් - සරස ප්‍රකාශන
රයිගම්පුර විත්ති - 1979 රාජ්‍ය සාහිත්‍ය උත්සවයේ ප්‍රකාශනය
සංදේශ විවරණය - සිරිසේන විතානගේ (කතෘ ප්‍රකාශන)
කෝකිළ සංදේශය - ඇන්.ජේ.කුරේ සහ පුත්‍රයෝ මුද්‍රණාලය - කොළඹ
ගිරා සන්දේශය - ඇම්.ඩී.ගුණසේන සහ සමාගම - කොළඹ
මයුර සන්දේශ විවරණය - ඇම්.ඩී.ගුණසේන සහ සමාගම - කොළඹ
පැරකුම්බා සිරිත - ඇම්.ඩී.ගුණසේන සහ සමාගම - කොළඹ
සංඝරාජ සාධු චර්යාව - ලේක් හවුස් මුද්‍රණාලය - කොළඹ
සැළලිහිණි සංදේශ වර්ණණාව - රතනාලංකාර මුද්‍රණාලය - කොළඹ
හංස සන්දේශය - ජේ.ඩී.ප්‍රනාන්දු ග්‍රන්ථ ප්‍රකාශන - කොළඹ
ලංකා විශ්වවිද්‍යාලයීය ලංකා ඉතිහාසය - ද්වතීය කාණ්ඩාය - විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයීය මුද්‍රණාලය
ලංකා විශ්වවිද්‍යාලයීය ලංකා ඉතිහාසය - ප්‍රථම කාණ්ඩාය - විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයීය මුද්‍රණාලය
දෙවුන්දර ඉතිහාසය - ඇම්.ඩී.ගුණසේන සහ සමාගම